330 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 330 - இல. 11
Volume 330 - No. 11

2026 නොවැම්බර් 05වන බ්‍රහස්පතින්දා
2026 நவம்பர் 05, வியாழக்கிழமை
Thursday, 05th November, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 2001]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 2002]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 2003]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු]තීරු 2004-2049]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
මත්ස්‍ය නිෂ්පාදනයේදී පසු අස්වනු හානි අවම කිරීම [තීරුව 2049]
1990දී උතුරෙන් බලහත්කාරයෙන් පලවා හරින ලද මුස්ලිම් ජාතිකයින්ට සියලු අයිතිවාසිකම් ලබා දීම [තීරුව 2051]

මන්නාරම සහ රාමේෂ්වරම් අතර මගී යාත්‍රා සේවාව ආරම්භ කිරීම:
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2056]

නිෂ්පාදන ආයෝජන රට තුළ රඳවා ගැනීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම:
මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2060]

වරප්‍රසාද:
මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීම වැළැක්වීම [තීරුව 2067]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ද ගුඩ්නස් පදනම - (සංස්ථාගත කිරීමේ) [ගරු කේ. කාදර් මස්තාන් මහතා] පළමුවන වර කියවන ලදී [තීරුව 2069]

භාර (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 2070-2172]

පරිපූරක මුදල:
ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නියමුවන් රහිත ගුවන් යානා පද්ධතියක් ස්ථාපිත කිරීම [තීරුව 2172]

කල්තැබීමේ යෝජනාව:
පුනකරි ප්‍රදේශයේ සූර්ය පැනල බලාගාරයක් ඉදි කිරීම සඳහා පෞද්ගලික සමාගමකට ආයෝජන අවස්ථාව ලබා දීමේ ගැටලු [තීරු 2173-2186]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තීරු 2186-2194]

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 2001]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 2002]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 2003]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2004-2049]

தனி அறிவித்தல் மூல வினா:
மீன் உற்பத்தியில் அறுவடைக்குப் பிந்திய இழப்பைக் குறைத்தல் [ப: 2049]
1990இல் வடக்கிலிருந்து பலவந்தமாக வெளியேற்றப் பட்ட முஸ்லிம்களுக்கு சகல உரிமைகளையும் பெற்றுக்கொடுத்தல் [ப: 2051]

மன்னார் - இராமேஸ்வரம் இடையேயான பயணிகள் கப்பல் சேவையை ஆரம்பித்தல்:
துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 2056]

உற்பத்தித் திறன்மிக்க முதலீடுகளை நாட்டில் தக்க வைத்துக்கொள்வதற்கு ஏற்றுமதியாளர்களுக்கு வசதியளித்தல்:
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 2060]

சிறப்புரிமை:
மட்டக்களப்பு, மாவட்ட செயலக வளாகத்துக்குள் நுழைவதற்கு இடையூறு ஏற்படுத்தியமை [ப: 2067]

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
த குட்நஸ் மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு கே. காதர் மஸ்தான்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2069]

நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 2070-2172]

குறைநிரப்புத் தொகை:
இலங்கை விமானப்படைக்காக ஆளில்லா வானூர்தி முறைமையொன்றை நிறுவுதல் [ப: 2172]

ஒத்திவைப்புப் பிரேரணை:
பூநகரியில் சூரிய மின்னுற்பத்தி நிலையத்தை அமைப்பதற்கு தனியார் நிறுவனத்துக்கு முதலீட்டு வாய்ப்பை வழங்குவதிலுள்ள சிக்கல்கள் [ப: 2173-2186]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 2186-2194]

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT [Col. 2001]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2002]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 2003]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2004-2049]

QUESTION BY PRIVATE NOTICE:
Minimization of Post-harvest Losses in Fish Production [Col. 2049]
Grant of All Rights to Muslims Forcibly Evicted from North in 1990 [Col. 2051]

COMMENCEMENT OF FERRY SERVICE BETWEEN MANNAR AND RAMESWARAM:
Statement by Minister of Ports and Civil Aviation [Col. 2056]

FACILITATION OF EXPORTERS TO RETAIN PRODUCTIVE INVESMENTS IN THE COUNTRY:
Statement by Deputy Minister of Finance and Planning [Col. 2060]

PRIVILEGE:
Obstruction of Entry into District Secretariat, Batticaloa [Col. 2067]

PRIVATE MEMBERS' BILLS:
The Goodness Foundation (Incorporation) – [The Hon. K. Kader Masthan] – Read the First time [Col. 2069]

TRUSTS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Cols. 2070-2172]

SUPPLEMENTARY SUM:
Establishment of Unmanned Aerial Vehicle System for Sri Lanka Air Force [Col. 2172]

ADJOURNMENT MOTION:
Issues in Granting Investment Opportunity to a Private Company for Building a Solar Power Plant in Poonakary [Cols. 2173-2186]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 2186-2194]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 නොවැම්බර් 05වන බ්‍රහස්පතින්දා
2026 நவம்பர் 05, வியாழக்கிழமை
Thursday, 05th November, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXXII කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XI, XII, XIII හා XIV කොටස්, සිව්වැනි කාණ්ඩයේ VII හා VIII කොටස්, පස්වැනි කාණ්ඩයේ VIII කොටස සහ හයවැනි කාණ්ඩයේ II හා III කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

II

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXVIII කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVII, XVIII හා XIX කොටස්, තෙවැනි කාණ්ඩයේ XIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XI, XII හා XIII කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I am presenting this Report only in English because we had the Committee Meeting at 8.30 this morning.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Therefore, I present the Report of the Committee on Public Finance on the Supplementary Sum under Head 224 of Programme 01 of the Appropriation Act, No. 23 of 2025 for the services of the financial year commencing on the 01st of January, 2026 and ending on the 31st of December, 2026, which was referred to the said Committee.

Thank you, Sir.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද භාර (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පිළියන්දල, හොන්නන්තර, විජයනන්දනාරාම පාර, අංක 157/78 යන ලිපිනයෙහි පදිංචි ලියනගේ පියදාස මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පිළියන්දල, සිද්දමුල්ල, පාසල් මාවත, අංක 56/2 යන ලිපිනයෙහි පදිංචි එම්.ඒ.එස්.පී. නන්දසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, ගාල්ල, ඉහළකිඹිය, පහළවත්ත යන ලිපිනයෙහි පදිංචි ටී.වී. රොහාන් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නවදගල, මල්වත්ත යන ලිපිනයෙහි පදිංචි දොන් ජේම්ස් විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කරන්දෙනිය, මඩකුඹුර, උඩුමුල්ල පාර යන ලිපිනයෙහි පදිංචි කේ.ඩී.පී.එම්. කුමාර මහතා සහ වෙනත් පස්දෙනෙකුගෙන් ලැබුණු පෙත්සම.

ගරු මංජුල සුගත් රත්නායක මහතා
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අම්පාර, රාජ්‍ය සේවක නිවාස යෝජනා පෙදෙස, බණ්ඩාරනායක මාවත, අංක 14 යන ලිපිනයෙහි පදිංචි එච්.පී. ඉන්ද්‍රසිරි යසරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අම්පාර, 02 වන මාවත, අංක බී.එල්. 63 යන ලිපිනයෙහි පදිංචි රසංගා උදේශනී දුනුවිල මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)

ගරු කථානායකතුමනි, දෙහිඅත්තකණ්ඩිය, මුවපැටිගේවෙල, අංක 31 යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. ජගත් කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පන්නිපිටිය, කොට්ටාව, කුලසෙවන මාවත, අංක 716/1/1 යන ලිපිනයෙහි පදිංචි සී.එල්.එච්. බඹරන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පන්නිපිටිය, ලියනගොඩ, මිඩ්වේ පාර්ක්, අංක 1030/10 යන ලිපිනයෙහි පදිංචි නලින් දිවාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල: විස්තර
மஹபொல உயர் கல்விப் புலமைப்பரிசில் நம்பிக்கைப் பொறுப்பு நிதியம்: விபரம்
MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND: DETAILS

34/2024

1. ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) (i) මහපොළ භාරකාර අරමුදල පිහිටුවීමේ අරමුණු;

(ii) එම අරමුදල සඳහා මුදල් ලැබෙන මූලාශ්‍ර;

(iii) අරමුදලේ වත්කම් උපයෝගී කරගනිමින් රජය විසින් දේපළ මිලදී ගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර;

(iv) එම දේපළ හෝ ආයෝජන මඟින් අරමුදලේ මූල්‍යමය ශක්තිය සහ ආදායම් තත්ත්වය වර්ධනයවී තිබේ නම්, ඒ පිළිබඳ විස්තර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වර්ත්තක, වාණිප, උණවුප් පාදුකාප්පු මර්රුම් කූට්ටුරවු අපිවිරුත්දි අමෙච්චරෛක් කේට්ට වින්නා:

(අ) (i) මහපොල නම්පික්කෛප් පොරුප්පු නිදියම් තාපික්කප්පට්ටදන් නෝක්කංකළ් යාවෛ එන්පදෛයුම්;

(ii) මේර්පඩි නිදියත්දිර්කු නිදිකළ් කිටෛක්කුම් මූලංකළ් යාවෛ එන්පදෛයුම්;

(iii) නිදියත්දින් සොත්තුක්කළෛප් පයන්පටුත්දි අරසාංකත්දිනාල් ආදනංකළ් කොළ්වනවු සෙය්යප්පට්ටිරුප්පින්, අදු පර්රිය විපරංකළ් යාවෛ එන්පදෛයුම්;

(iv) මේර්පඩි ආදනංකළ් අල්ලදු මුදලීට්ටින් මූලමාග නිදියත්දින් නිදි රීදියාන පලම් අල්ලදු වරුමාන මට්ටම් වළර්ච්චියෛටින්දිරුප්පින් අදු පර්රිය විපරංකළ් යාවෛ එන්පදෛයුම්;

අවර් ඉච්චපෛක්කු අදිවිප්පාරා?

(ආ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the objectives of establishing the Mahapola Higher Education Scholarship Trust Fund;

(ii) the sources of funding for the Fund;

(iii) the details of the properties purchased by the Government, if any, using the assets of the Fund; and

(iv) if the financial strength and the income status of the Fund have increased through the said properties or investments, of the details of it?

(b) If not, why?

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල පනතේ 5වෙනි වගන්තියෙහි, අරමුදලෙහි අරමුණු හා පරමාර්ථ දක්වා ඇත. ඒ අනුව,

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම;
- සතුටුදායක ලෙස තම ද්විතීය අධ්‍යාපනය සම්පූර්ණ කර සිටින, ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට තමන්ගේ ශාස්ත්‍රීය, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක හෝ කාර්මික, නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි ඔවුන්ට ආධාර සැලසීම;
- යෞවනයන්ට තමන්ගේ වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩිදියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහාය වීම;
- අධ්‍යාපනය සැලසීමෙහිලා නිරතව ඇති පාසල්, ආයතන, පදනම් සහ වෙනත් එවැනි ආයතන පිහිටුවීම සහ ඒවා කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහාය වීම;
- අධ්‍යාපනය සැලසීමෙහිලා නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලසීම.

(ii)
- ස්ථාවර තැන්පතු පොලිය
- භාණ්ඩාගාර බැඳුම්කර පොලිය
- භාණ්ඩාගාර බිල්පත් පොලිය
- ණයකර පොලී - Debenture
- සංවර්ධන ලොතරැයි ලාභාංශ සියයට 50 කොටස.

  ඒ කියන්නේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් වාර්ෂිකව සියයට 50ක්.
- මාලබේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් ලැබෙන බදු කුලිය
- පරිත්‍යාග
- විශ්වවිද්‍යාල සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදෙන භාණ්ඩාගාර දායක මුදල
- උසස් තාක්ෂණ ආයතන සිසුන්ට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන මුදල

(iii) 1. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය - SLIIT - පිහිටා ඇති වරිපනම් අංක 277 කඩුවෙල, මාලබේ පාරේ පිහිටි ඉඩම.

- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය - SLIIT - පිහිටා ඇති වරිපනම් අංක 277 කඩුවෙල මාලබේ පාරේ පිහිටි ඉඩම 1988 ජූලි මස 06වන දින මහපොළ භාරකාර අරමුදල විසින් මිල දී ගෙන ඇත.
- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය - SLIIT - ආරම්භ කිරීම සඳහා මහපොළ භාරකාර අරමුදල විසින් කටයුතු කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 373.4ක් දරා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, මේ කොටස ඔබතුමා හොඳට අහගන්න.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

- කෙසේ වුවද, 2015 වර්ෂයේදී ඇති කරගත් ගිවිසුමක් මඟින් එහි හිමිකාරිත්වය මහපොළ භාරකාර අරමුදලෙන් ඉවත් කර ඇත. එම අවස්ථාවේදී රුපියල් මිලියන 408.5ක මුදලක් SLIIT ආයතනය විසින් මහපොළ භාරකාර අරමුදල වෙත ගෙවා ඇති අතර එම මුදල ගණනය කිරීමේදී සමාගම විසින් 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවනු ලැබූ ලාභාංශ මුදල වන රුපියල් මිලියන 135.2ක මුදල අඩු කර ඇත. 2017 වර්ෂයේදී එවකට ජනාධිපතිවරයා විසින් අති විශේෂ ගැසට් පත්‍ර අංක 2026/35 (2017 ජූලි මස 06වන බ්‍රහස්පතින්දා) මඟින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය - SLIIT - රජයට අයත් නොවන ආයතනයක් ලෙස ගැසට් පත්‍රයේ පළ කර ඇත.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කරපු තවත් වැඩක්.

2. මිල්ලෑව පිහිටි අක්කර 117ක ඉඩම,

මහපොළ භාරකාර මණ්ඩලයේ තීරණයකට අනුව මෙම ඉඩම 99 අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති අතර, ඉඩමේ තක්සේරු වටිනාකම වන රුපියල් බිලියන 2.249න් රුපියල් මිලියන 340ක් අත්තිකාරම් ලෙස ගෙවා ඇති අතර, මේ දක්වා එම ඉඩමෙන් ආදායමක් අරමුදල වෙත ලැබී නොමැත.

කෙසේ වෙතත්, අරමුදලේ මූල්‍ය තිරසාරත්වය සහතික කිරීමේ අරමුණින් හා ශිෂ්‍යාධාර වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවන ලද මුදලට සීමා වන පරිදි ඉඩම් අත්පත් කර ගැනීමට මහපොළ භාරකාර මණ්ඩලය විසින් තීරණය කර ඇත.

(iv) 01. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය - SLIIT - සමඟ ඇති කරගත් ගිවිසුම අනුව 2015.05.15 සිට 2026.05.15 දක්වා බදු කුලී ලෙස SLIIT ආයතනයෙන් මහපොළ භාරකාර අරමුදලට ලැබී ඇති ආදායම පහත පරිදි වේ.

වර්ෂය	බදුකුලී වටිනාකම (රුපියල්)	ලැබුණු මුදල (රුපියල්)
2015.05.15 - 2020.05.15 (අවු. 05)	20,000,000	100,000,000
2020.05.15 - 2025.05.15 (අවු. 05)	25,000,000	125,000,000
2025.05.15 - 2026.05.15 (අවු. 01)	26,250,000	26,250,000
එකතුව		**251,250,000**

02. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය - SLIIT - 2015 වර්ෂයේදී ඇති කරගත් ගිවිසුමක් මඟින් එහි හිමිකාරිත්වය මහපොළ භාරකාර අරමුදලෙන් ඉවත් කර ඇති නිසා ලැබිය යුතු ලාභාංශ අරමුදල වෙත නොලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

ගරු කථානායකතුමනි, සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ රටේ ජාතික විශ්වවිද්‍යාලයකින් ඉගෙන ගත් සෑම කෙනෙකුටම ඉතාම වටිනාකමක් එකතු කරපු අරමුදලක් තමයි, දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ආරම්භ කරපු මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරවන පළමුවන කාරණාව මෙයයි. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මේ මහපොළ භාරකාර අරමුදල ආරම්භ කරපු කාලයේ ඒ අරමුදලේ භාරකාරත්වය, එම අරමුදල කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම තිබුණේ අග්‍ර විනිශ්චයකාරතුමාට. එය අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් තමන්ගේ හිතෛෂීන්ට ගෙනෙන්න යම් තැනකදී විවිධ ආණ්ඩු මඟින් කටයුතු කරලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහනවා, ඒ සම්බන්ධව පියවරක් අරගෙන අග්‍ර විනිශ්චයකාරතුමාටම එහි කළමනාකරණය භාර දෙන්න කටයුතු කරනවාද කියලා. මොකද, එහි විනිවිදභාවය නැති වෙලා තිබෙනවා.

මගේ ප්‍රශ්නයේ තවත් කොටසක් තිබෙනවා. ඒකටත් එක්කම ඔබතුමා පිළිතුරු දෙන්න, මගේ ප්‍රශ්නයේ තුන්වැනි කොටසට පිළිතුරු දීමේදී එක්තරා තැනකදී ඔබතුමා කිව්වා නේ හොඳින් අහගන්න කියලා. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් ගත්ත ඒ ක්‍රියාමාර්ගයට මමත් පෞද්ගලිකව විරුද්ධයි. ඒක ඇතුළේ ඉන්නේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම එකවර අහනවාද?

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

නැහැ. නැහැ. මේකත් මුලින් අහපු එකට අදාළයි. එහෙම කරන්න එපා, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, එය දේශපාලන අවශ්‍යතාවක් මත වෙච්ච සිදුවීමක් නේ. හිටපු වෙළෙඳ හා වාණිජ කටයුතු ඇමතිවරයෙකුගේ ඥාතියෙකුට තමයි මෙහි කළමනාකාරිත්වය දීලා තිබෙන්නේ. SLIIT එකෙන් එන ආදායම සම්බන්ධයෙන් මම දන්නේ නැහැ, ඔබතුමා සතුටු වනවා ද කියලා. එදා කුණුකොල්ලෙට ඒක දීපු එක ගැන ඒ අවස්ථාවේ පළමු වතාවට පාර්ලිමේන්තු ආපු මන්ත්‍රීවරයෙක් වුණු මම විරුද්ධ වුණා. හැබැයි, දැන් ඔබතුමා කරපු චෝදනාව මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට වැඩිය එදා කළේ වෙන කෙනෙකුට. ඒ චෝදනාවට එදා අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මෙතැන ඉඳගෙන කියපු වූදිතයා අද ඔබතුමන්ලාගේ උපදේශකයෙක් විධියට ඉන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අසා අවසන් කරන්න.

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி*)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

එම නිසා ඒ චෝදනාවෙන් භාගයකට වැඩිය ඔබතුමන්ලාට තිබෙනවා. මලික් සමරවික්‍රම හිටපු ඇමතිතුමාට චෝදනා කළේ වෙන කවුරුවත් නොවෙයි, ගරු අනුර කුමාර දිසානායක මහත්තයාමයි. උපදේශකයෙක් විධියට දැන් එතුමා ඔබතුමන්ලා ළඟ ඉන්නේ. නාමල්ලාට යන නඩු වාගේ මේවාත් නඩු යන්න ඕනෑ කාරණා. ගරු ඇමතිතුමනි, මම අහන්නේ ඔබතුමා මේ කරුණු දෙක වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලායි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, එම අතුරු ප්‍රශ්නය ඇසීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා මතක් කළේ, 2015 ආණ්ඩුව කාලයේ කාරණයක්. 2015දී තිබුණේ විපක්ෂ නායකතුමන්ලාගේ ආණ්ඩුව; ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඒ, ඔබතුමාත් මන්ත්‍රීවරයෙක් විධියට හිටපු ආණ්ඩුව. 2015දී මහපොළ භාරකාර අරමුදලේ භාරකාරිත්වය හිමි වුණේ අග්‍ර විනිශ්චයකාරවරයාට. පනතට අනුව එහි භාරකාරිත්වය හිමි වෙන්නේ, අග්‍ර විනිශ්චයකාරවරයාට. ගරු ශ්‍රීපවන් අග්‍ර විනිශ්චයකාරතුමාගේ Chamber එකේ තමයි මහපොළ භාරකාර අරමුදල කැඳෙව්වේ. ඒ වෙලාවේ තමයි ගාමිණී ජයවික්‍රම පෙරේරායි, සරත් අමුණුගමයි, ඔබතුමන්ලාගේ ඒ ආණ්ඩුව නියෝජනය කරමින් බලහත්කාරයෙන් - සරත් අමුණුගම අදාළත් නැතුව - එතැනට ගිහිල්ලා ගිවිසුම ගහන්නේ. ඒ ගිවිසුම ගහපු නිසා ශ්‍රීපවන් අග්‍ර විනිශ්චයකාරතුමා ඉල්ලා අස් වෙනවා. ඒ, ඔබතුමන්ලාගේ 2015 ආණ්ඩුව. ඒ නිසා වෙන වෙන කට්ටියට ඒ සම්බන්ධව ඇහිල්ල දිගු කරන්න එපා. අපිත් එක්ක ඉන්න කවුරුවත් එයට සම්බන්ධ නැහැ. එයට සම්බන්ධ අපේ උපදේශකයොත් නැහැ. එදා තිබුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. *[බාධා කිරීමක්]* ඒ 2015,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඉන්න මම උත්තරය දෙන්නම්. ඔබතුමාට බොහොම ගෞරවයෙන් මේ උත්තරය දෙන්නේ. *[බාධා කිරීමක්]* ඒ වෙලාවේ ගාමිණී ජයවික්‍රම පෙරේරා හිටියා, ආහාර සුරක්ෂිතතා ඇමතිවරයා හැටියට. සරත් අමුණුගමත් එතැනට ගියා. ඒ දෙන්නා හිටපු ඒ අවස්ථාවේ තමයි ඒක සිදු වුණේ. ඒ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව. *[බාධා කිරීම]* මම දෙන්නම්. ඒ, ඔබතුමන්ලා හිටපු ආණ්ඩුව. එතකොට, හිටපු වෙළඳ ඇමතිතුමා, මේ දැන් ඉන්නේ ඉස්සරහ.*[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, 2015 ආණ්ඩුව කාගේද? තිබුණේ, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක්. ඒ ආණ්ඩුවේ නියෝජ්‍ය නායකයා සජිත් ප්‍රේමදාස මහත්මයා. ඒ ආණ්ඩුවේ හිටපු කට්ටිය තමයි මහපොළ භාරකාර අරමුදල යටතේ පිහිටුවලා තිබ්බිච SLIIT එක හොර ගිවිසුමක් ගහලා දෙන්නේ. ඒක හොර ගිවිසුමක් ගහලා දෙන්නේ. එයට වගකිව යුතු ඇමතිවරු තමයි හිටපු වෙළඳ ඇමතිවරයා සහ අදාළ නැති,- *[බාධා කිරීමක්]* මම ඔබතුමාට ඒ නම අරගෙන දෙන්නම්. වෙළෙඳ ඇමතිවරයා සහ අදාළ නැති සරත් අමුණුගම ඇමතිවරයා කියන දෙන්නාම එතැනට යනවා.

ඒ දෙන්නාම ගිහිල්ලා ගිවිසුම ගහනවා. ඒකට විරෝධතාව පළ කරලා ශ්‍රීපවන් අග්‍ර විනිශ්චයකාරතුමා එහි සභාපති ධුරයෙන් ඉල්ලා අස්වෙනවා. ඒ විතරක් නොවෙයි, මහපොළ භාරකාර අරමුදල අවුරුදු 2ක්ම කැඳවන්නේත් නැහැ. කැඳවන්නේ නැතුව ඉන්නකොට ඔබතුමන්ලාගේ ආණ්ඩුව මොකද කරන්නේ? පනත සංශෝධනය කරනවා. පනත සංශෝධනය කරලා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාරවරයෙකු හෝ හිටපු විගණකාධිපතිවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතුව තමයි ආපහු ඒකේ භාරකාරත්වය පිහිටුවන්නේ. 2015දී තමයි මේ විධියට නීතිවිරෝධී ලෙස ගිවිසුමක් ගහලා ඒක දෙන්නේ. ඔබතුමා අහපු ප්‍රශ්නය හරි. මොකද, එය පවරන වෙලාවේ, 2005-2015 දක්වා කාලය තුළ SLIIT එක රඳවා ගත් ලාභ විධියට මිලියන 1,068ක් තිබුණා. ඒ රුපියල් මිලියන 1,068න් මිලියන 408ක් මහපොළට දීලා තමයි අර ඔබතුමා කියපු යාළුවෝ ටිකට ඒක ලියලා දෙන්නේ. ඒ යාළුවෝ ටිකට ඒක ලියලා දුන්නට පස්සේ ශ්‍රීපවන් අග්‍ර විනිශ්චයකාරතුමා ජනාධිපති කොමිසමට ඇවිල්ලා කියනවා, "මේක මා නොදැනුවත්ව අත්සන් කරපු ගිවිසුමක්" කියලා. ජනාධිපති කොමිසමට ඇවිල්ලා ඒ ගැන එතුමා ඉතා පැහැදිලිව කියනවා. ජනාධිපති කොමිසමට ඇවිල්ලා කිව්වට පස්සේත් අවස්ථා දෙකක ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු සමහර ඇමතිවරු කැබිනට් පත්‍රිකා දැම්මා, ඒක අවලංගු කරන්න කියලා. දැම්පු අවසාන කැබිනට් පත්‍රිකාවටත් මොකද කළේ? ඒ අවසාන එකේදිත් කිව්වා, ඒක පැත්තකින් තියන්න කියලා. එහෙම කියලා තමයි මේ වැඩේ කළේ. ඒ නිසා ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට පිළිතුර ලෙස දෙන්න තිබෙන්නේ, 2015 හිටපු වෙළෙඳ ඇමතිවරයාත්, අදාළ නැති ඇමතිවරයෙකුත් සම්බන්ධ වෙලා ඒ ගිවිසුම නීති විරෝධී ලෙස සකස් කර SLIIT එක පවරා දීම සිදු කර තිබෙනවා කියන එකයි.

SLIIT එක කියන්නේ, මහපොළ භාරකාර අරමුදලට අරමුදල් සම්පාදනයට පමණක් නොවෙයි, දරුවන්ට උදවු කිරීම සඳහා, උසස් අධ්‍යාපන අවස්ථාවලට, වෘත්තීය අධ්‍යාපන අවස්ථාවලට උදවු කිරීම සඳහා හදපු අරමුදලක්. ඒ අරමුදල තමයි මේ විධියට අවභාවිතයේ යෙදවුයේ.

ගරු මන්ත්‍රීතුමා ඇහුවා, මේ සම්බන්ධව ගත්ත නීතිමය ක්‍රියාමාර්ග ගැන. Commission to Investigate Allegations of Bribery or Corruptionහි පැමිණිලි දාලා තිබෙනවා, CID එකේ පැමිණිලි දෙකක් දාලා තිබෙනවා. ඊට අමතරව දැන් කැබිනට් පත්‍රිකාවකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ළඟ එන කැබිනට් මණ්ඩල රැස්වීමට ඒක ඉදිරිපත් වනවා. අපි මේ අවුරුදු දෙකේම මේකට අදාළ තොරතුරු ගත්තා, මේකට අදාළව විමර්ශන කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාර අපේ මලල්ගොඩ මැතිතුමා Human Rights Commission එකට ගියා, සභාපති විධියට. එතුමා පුදුම මහන්සියක් අරගෙන මේ තොරතුරු හෙව්වා. මේ වැරදි ගිවිසුම, සියලු වාර්තා එක්ක දැන් මේ තොරතුරු සියල්ල කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා, SLIIT එකේ කළමනාකාරිත්වය, SLIIT එකේ භිමිකාරිත්වය නැවත මහපොළ භාරකාර අරමුදලට ලබා ගැනීම සඳහා. මොකද, මේ ගිවිසුමත් අත්සන් කරලා තිබෙන්නේ නීති විරෝධී ලෙසයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(*மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி*)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ඉතා සාර්ථක පිළිතුර ඇතුළේ බොරු ටිකක් කියැවුණා. ඒ තමයි, මේ අරමුදල ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ තිබුණේ, ඇමතිවරයා වශයෙන් සිටියේ මලික් සමරවික්‍රම මැතිතුමා කියන එක. ඒ වාගේම සරත් අමුණුගම මහත්මයා ඒ වනකොට පාර්ලිමේන්තුවේ හිටියේත් නැහැ. ඔබතුමාට දීපු පිළිතුර හෝ තිබෙන තොරතුරු නිරවද්‍ය කරගන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව මම ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

මේ ආණ්ඩුව හරි සුජාතයි කියන කාරණය තමයි ඇමතිවරයාගේ උත්තරයේ තිබෙන්නේ. 2015දී තිබුණු ආණ්ඩු, ඊට කලින් ආණ්ඩු වැරදි කළා කියනවා. හැබැයි, සුජාත වෙච්ච

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඔබගේ ආණ්ඩුවට දැන් මාස හයක්, හතක් තිස්සේ මේ අරමුදලට එකතු වන මුදල් ටික විශ්වවිද්‍යාල දරුවන්ට දීගන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, දැන් කරලා තිබෙන ඉතාම කැත වැඩේ, හිරිකිත වැඩේ මේකයි. ඉතිහාසයේ මේවා දුන්නේ නැහැ, අරලියගහ මන්දිරයට ගෙනැල්ලා. ලේඛන හදලා, පක්ෂවල සාමාජිකත්ව අංක අරගෙන මේවා දුන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතාම සද්භාවයෙන්, සුජාතභාවයෙන් කථා කළා, තමුන්නාන්සේලා එහෙම වෙන්නේ නැහැ, එහෙම කරන්නේ නැහැ, වැරදි නැහැ කියලා. එහෙම නේද? අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා පිටුපස පේළියේ ඉන්නවා. තවම හරියට දීගන්න බැරි වෙලා තිබෙනවා, මේ ශිෂ්‍යාධාර ටික, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. හැබැයි, විශ්වවිද්‍යාල බල මණ්ඩලයේ ඉන්න, ඔබතුමන්ලාත් එක්ක සටන් කරපු උදවිය ඇවිල්ලා කිව්වා, මෙහෙමයි හිහමන් ගන්න විධියටයි මේක ගන්න වෙලා තිබෙන්නේ, හැබැයි, මේ අපට උරුම දේ කියලා. මොකද, හැත්තෑහය අවුරුද්දක් තිස්සේ කරපු දේවල් තුළ තමයි ඔබතුමන්ලාට මේ මුදල් අතට දෙන්න පුළුවන් වුණේත්. ඒ වාගේම ඒක අරමුදලක් විධියට කොහේද රැඳෙන්නේ, ආරක්ෂා වෙන්නේ කියන කාරණයත් කිව්වා. ඒ නිසා හිරිකිතයක් නැතුව මේ අරමුදල් දෙන එක දැන් දේශපාලනීකරණය වෙලා තිබෙනවා. ඒක නොවෙයි, මගේ අතුරු ප්‍රශ්නය.

මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. ඊයේ රාත්‍රියේත් ඉන්ධන මිල වැඩි වුණා. ඒ වැඩිවීම නිසා දරුවන්ට මේ ශිෂ්‍යත්ව මුදලේ ප්‍රමාණවත්භාවයක් නැතිව යනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඒ කාලයේ කිව්වේ, දවල් වැඩ කරලා රෑ නිදියගෙන ඉන්න කොට තවත් වැඩි වෙනවා කියලා නේ. *[බාධා කිරීම්]* ප්‍රශ්නය අහනවා. දහලන්න එපා, ඉන්නකෝ. ඔබතුමන්ලාට විතරක් කැටයම් දමන්න පුළුවන්. අපටත් පොඩ්ඩක් කැටයම් දමන්න දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, -

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්ඩලික සමිඳ ඛිජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
කථානායකතුමා, තමුන්නාන්සේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් විනාඩි දෙකක් ගත්තා. ඔබතුමාට අතුරු ප්‍රශ්නය අහන්න තව තත්පර 30ක් දෙනවා. *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්ඩලික සමිඳ ඛිජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
අහගෙන ඉන්න, තමුන්නාන්සේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

අපේ අතුරු ප්‍රශ්නය අහනකොට. ඉන්ධන මිල වැඩි වෙලා තිබෙනවා. ඉන්ධන මිල වැඩි වනකොට පොත පත ගන්න වැඩි වියදමක් දරන්න වෙනවා, ගමන් බිමන්වලට යන වියදම් වැඩි වෙනවා. මෙතෙක් කල් දුන්නේ රුපියල් 5,000යි, දැන් රුපියල් 10,000ක් දෙනවා කියන කාරණය කියනවා වාගේම ඔබතුමන්ලා ඒ වියදමට සාපේක්ෂව ප්‍රමාණවත් නැති මුදල වැඩි කරලා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදනවාද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්ඩලික වසන්ත සමරසිඞ්හ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

තමයි අපට කැටයම් ගැන කියන්න එන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් අහනකොට අදාළ ප්‍රශ්නය අහන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ප්‍රශ්නය අහන්නේ මහපොළ ගැන. ඒ නිසා මහපොළ ගැන තමයි උත්තර දෙන්නේ, අහගෙන ඉන්න දැන්. *[බාධා කිරීමක්]* අනුන්ගේ ප්‍රශ්නයක් පස්සේ එල්ලිලා යනවා, කැටයම් දමන්න. ගරු කථානායකතුමනි, මේ කයිය ගහන මිනිස්සු අවුරුදු කීයක් ආණ්ඩුවල හිටියාද? 1982දී පටන් ගත්තා, මහපොළ ශිෂ්‍යාධාර දෙන්න. 2024 වෙනකම් රුපියල් 5,000යි දුන්නේ. 2024 වෙනකම් රුපියල් 5,000යි කියන්නේ අවුරුදු කීයක්ද? අවුරුදු කීයක්ද? අවුරුදු 42ක්. තව කයියත් ගහනවා. 2025දී අපි ඒ ප්‍රමාණය වැඩි කළා, රුපියල් 10,000 දක්වා. ඒ කියන්නේ, සියයට සියයකින්, මේවා දැනගන්න. රුපියල් 10,000 දක්වා, සියයට සියයකින් වැඩි කළා. ඔයගොල්ලන් නිකම් කයිය ගහනවා. අවුරුදු 40ක් ගිහිල්ලාත් දුන්නේ 5,000යි. *[බාධා කිරීම්]* නමුත් මේ අවුරුදු එකහමාරට අපි 5,000ක් වැඩි කළා. *[බාධා කිරීම්]* මේ කයිය ගහන මිනිස්සු එදාත් මහපොළ නැති කරන්න වැඩ කළා. මේ විපක්ෂය පැත්තේ ඉන්න අය දන්නවා, ඒ අය සාක්ෂිකාරයෝ. එදා මේ සමහර දේවල් කළේ ලලිත් ඇතුලත්මුදලි හිටපු අමාත්‍යතුමාගේ නම ඉස්සරහ තබාගෙන. එතුමා කළ හොඳ වැඩත් තිබෙනවා. එයින් එකක් තමයි මේ අරමුදල හදපු එක. හැබැයි, මේ අරමුදල කොල්ල කෑවේ කවුද? හොරා කන්න ඉඩ දුන්නේ කවුද? මේගොල්ලන්ම තමයි.

බංකොලොත් කළ ආර්ථිකයක් අපට භාර දුන් වෙලාවේ, අපි ඒකත් භාර ගෙන තෙල් මිල වැඩිවීම ගැන විතරක් නොවෙයි, රටේ ආර්ථිකය ගැනත් හිතලායි කටයුතු කළේ. අපි මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කළා විතරක් නොවෙයි, රාජ්‍ය සේවයේ සිටින දෙමව්පියන්ගේ පඩිත් වැඩි කළා. රාජ්‍ය සේවකයින්ගේ පඩිත් වැඩි කළා. ලබන අවුරුද්දේත් රාජ්‍ය සේවකයින්ගේ පඩිය වැඩි වනවා, සියයට 30කින්. ඒ ආකාරයට රාජ්‍ය සේවයේ යෙදෙන දෙමව්පියන්ගේ පඩිත් වැඩි කළා, මහපොළ ශිෂ්‍යාධාරයත් සියයට සියයකින් වැඩි කළා. ඉතිහාසයේ කවදාවත් මහපොළ ශිෂ්‍යාධාරය සියයට සියයකින් වැඩි කළේ නැහැ. රුපියල් 500ක් වැඩි කළේත් බොහොම අමාරුවෙන්. මේ කැටයම් දමන්න එන්නේ අනුන්ගේ ප්‍රශ්නවලට.

ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඇහුවා මේ මහපොළ භාරකාර අරමුදලෙන් ශිෂ්‍යත්ව ලබා දීම ගැන. මම ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. මෙහෙම මහපොළ ශිෂ්‍යාධාර ලබා දීම, ප්‍රධාන සහතිකය ලබා දීම විවිධ

තැන්වලදී කර තිබෙනවා, 2015 වෙනකම්ම. 2015න් පසුව වෙන ප්‍රශ්නයක් ආවා. ඒ ප්‍රශ්නයෙන් පසුව මේක කළේ නැහැ. අපි ගිය අවුරුද්දේත් පදනම් ආයතනයට ගෙන්වා මහපොළ සහතික දුන්නා. විශ්වවිද්‍යාල මට්ටමින් මේක දෙනවා. මේක නොදී ඉන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මහපොළ ශිෂ්‍යත්වලාභීන්ට අදාළ කරන සහතිකය ලබා දීම මූලික කටයුත්තක්. ඒක ලබා දෙනවා. ඒක විශ්වවිද්‍යාල මට්ටමින් දෙනවා; තැන් තැන්වලට ගෙන්වා දෙනවා. ඒවා ඉතිහාසයේ සිටම කරනවා. නමුත් දැන් මෙතැනදි වෙන මොකක්ද එකක් අල්ලාගෙන දඟලන්න හදනවා.

ගරු කථානායකතුමනි, මහපොළ ශිෂ්‍යාධාරවලට ඉතිහාසය තුළ වැඩිම මුදල වැඩි කළ ආණ්ඩුවත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බව මා කියන්න ඕනෑ. SLIIT එකේ අයිතියත් නැවත මහපොළට ලබාගෙන, SLIIT එක ඒ විධියටම ක්‍රියාත්මක කරන්න දීලා SLIIT එකේ අයිතිය සහ එහි ප්‍රතිලාභ මේ රටේ බහුතරයක් ජනතාවට ලබා දෙන්න අපි කටයුතු කරනවා කියන කාරණයත් මම ඉතා වගකීමෙන් කියනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2, ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද, ඔබතුමාගේ Point of Order එක?

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
අවස්ථාව දෙන්න. අවස්ථාව ඉල්ලුවාම බිම බලාගෙන ඉන්නවා නේ. ස්ථාවර නියෝග 91 (උ) අනුව අයුතු ආරෝපණය යටතේයි මේ කාරණය මතු කරන්නේ. කැටයම් දාලා,- *[බාධා කිරීම්]*

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අහற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

ප්‍රශ්න අංක 2 -164/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. ස්ථාවර නියෝග 32 (3) යටතේ,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 32 (3) අනුව, මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ගැනීම සම්බන්ධයෙන් ඔබතුමාව දැනුවත් කරන්න ඕනෑ. මම මේ ප්‍රශ්නයෙන් අහන්නේ අර්ජුන මහේන්ද්‍රන්ට සිතාසියවපු එක ගැනයි. මේ ආණ්ඩුවේ එක ඇමතිවරයෙක්වත් ඒ ගැන දන්නේ නැද්ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒක point of Order එකක් නොවෙයි. Point of Order එක දැනගෙන කථා කරන්න.

ප්‍රශ්න අංක 3 -688/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
කැටයම් පෙන්වන්නම්, ඔහොම යනකොට.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -989/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

විදුලි ජනන ක්‍රම: දායකත්වය
மின்னுற்பத்தி முறைமைகள்: பங்களிப்பு
POWER GENERATION METHODS: CONTRIBUTION

2045/2026

5. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත විදුලි ජනනයෙන් එක් එක් විදුලි ජනන ක්‍රමයේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(ii) වැඩි පිරිවැයක් සහ අවම පිරිවැයක් සහිත විදුලි ජනන ක්‍රම කවරේද;

(iii) වැඩි පිරිවැයක් සහිත විදුලි ජනන ක්‍රම කෙරෙහි ඇති නැඹුරුතාව අවම කිරීම සඳහා සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2025 වර්ෂයේ සිට මේ දක්වා සිදු කරන ලද විදුලි ගාස්තු සංශෝධනය කළ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් ගෘහස්ථ පාරිභෝගිකයන්ට දැරීමට සිදු වූ අමතර ගාස්තුව සාමාන්‍යයක් ලෙස කොපමණද;

(iii) අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் மொத்த மின்னுற்பத்தியில் ஒவ்வொரு மின்னுற்பத்தி முறைமைகளின் பங்களிப்பு சதவீத அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) கூடுதலான கிரயத்தையுடைய மற்றும் குறைந்த கிரயத்தையுடைய மின்னுற்பத்தி முறைமைகள் யாவை என்பதையும்;

(iii) மின்னுற்பத்தி முறைமைகளில் காணப்படும் கூடுதலான கிரயப்போக்கை குறைப்பதற்கான திட்டங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2025ஆம் ஆண்டு தொடக்கம் இதுரையில் மின்கட்டணம் திருத்தம் செய்யப்பட்ட தடவைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மின்கட்டணத் திருத்தம் காரணமாக வீட்டுப் பாவனையாளர்களுக்குச் செலுத்தவேண்டி ஏற்பட்ட மேலதிகக் கட்டணம் சராசரியாக எவ்வளவு என்பதையும்;

(iii) குறைந்த வருமானம் பெறும் குடும்பங்களுக்கான நிவாரண வேலைத்திட்டங்கள் நடைமுறைப் படுத்தப்பட்டு உள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the contribution of each power generation method to the total electricity generation in Sri Lanka, as a percentage, separately;

(ii) the power generation methods with the highest and lowest generation costs; and

(iii) whether there are plans to minimize reliance on high-cost power generation methods?

(b) Will he also inform this House -

(i) the number of times electricity tariffs have been revised from the year 2025 to date;

(ii) the average additional financial cost that domestic electricity consumers have had to bear due to revisions of electricity tariffs; and

(iii) whether relief programmes have been implemented for low-income families?

(c) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2025 වර්ෂයට අදාළ දත්ත අනුව සමස්ත විදුලි ජනනයෙන් එක් එක් විදුලි ජනන ප්‍රභවයේ දායකත්වය පහත පරිදි වේ.

ජනන ප්‍රභවය	ස්ථාපිත ධාරිතාව අනුව (2026 අගෝස්තු වන විට)		ජනනය කරන ලද ඒකක ප්‍රමාණයට අනුව (2025 වර්ෂය තුළ)	
	ධාරිතාව (MW)	ධාරිතාව (MW)	ඒකක ප්‍රමාණය	ප්‍රතිශතය (%)
ප්‍රධාන ජල විදුලි බලාගාර	1,530	1,530	6,306	34.8
කුඩා ජල විදුලි බලාගාර	439	439	1,425	7.9
සුළං බලාගාර	287	287	774	4.3
භූමිය මත සූර්ය බලාගාර	446	446	343	1.9
වහල මත සූර්ය බලාගාර	2,533	2,533	1,979	10.9
ජෛව ස්කන්ධ හා වෙනත්	64	64	203	1.1
තාප (ගල් අඟුරු)	900	900	4,870	26.9
තාප (ද්‍රව ඉන්ධන)	1,188	1,188	2,213	12.2

(ii) ප්‍රධාන ජල විදුලි බලාගාර සහ තාප බලාගාර dispatchable sources වන අතර, ප්‍රධාන ජල විදුලි බලාගාරවල ඒකක පිරිවැය දළ වශයෙන් ඒකකයට රුපියල් 2ක් වෙනවා. තාප බලාගාරවල බලශක්ති පිරිවැය - energy cost - ඒවායේ ඉන්ධන මිල සහ වෙනත් පරාමිතීන් අනුව උච්චාවචනය වන අතර, 2026 ඔක්තෝබර් මාසය සඳහා එම පිරිවැය කිහිපයක් මම සඳහන් කරන්නම්. ගල් අඟුරු ඒකකයක් සඳහා බලශක්ති පිරිවැය රුපියල් 24.19ක්. කැලණිතිස්ස සංයුක්ත වක්‍ර බලාගාරය - combined cycle එක - නැප්තාවලින් ක්‍රියාත්මක වෙන්නේ. එම ඒකකයක් සඳහා බලශක්ති පිරිවැය රුපියල් 55.33ක් ආදී වශයෙන් සඳහන් වෙනවා. අවම අගය රුපියල් 2යි. උපරිම අගය වාර්තා වන්නේ EGL අතිරේක සැපයුම් බලාගාරය - මතුගම. එය ඩීසල්වලින් ක්‍රියාත්මක වන බලාගාරයක්. එම ඒකකයක් සඳහා රුපියල් 123.85ක් වැය වෙනවා. ඒ වාගේම, හම්බන්තොට EGL අතිරේක සැපයුම් බලාගාරයත් ඩීසල්වලින් ක්‍රියාත්මක වෙන්නේ. එම ඒකකයක් සඳහා රුපියල් 129.18ක් වැය වනවා.

ඒ වාගේම, අනෙකුත් ප්‍රභව - non-dispatchable sources - සඳහා 2025 වර්ෂයේ දත්ත අනුව ඒකක පිරිවැය දළ වශයෙන් දක්වන්න පුළුවන්. කුඩා ජල

විදුලි බලාගාර සඳහා රුපියල් 14යි; සුළං බලාගාර සඳහා රුපියල් 16යි; ජෛව ස්කන්ධ හා වෙනත් සඳහා රුපියල් 38යි.

(iii) ඔව්. ජාතික විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය, ආරක්ෂාව සහ පද්ධති ස්ථාවරත්වය තහවුරු කරන අතරම, අධික පිරිවැයක් සහිත හා පොසිල ඉන්ධන මත පදනම් වූ විදුලි උත්පාදනය මත රඳා පැවතීම අවම කිරීම සඳහා සැලසුම් සකස් කර තිබෙනවා. පසුගිය අවුරුදු 10 තුළ අඩු පිරිවැය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් වැඩි ධාරිතාවක් පද්ධතියට එකතු කර ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා.

මේ පද්ධතිය තුළ පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාව ප්‍රස්තාරයක් හැටියට මම ඉදිරිපත් කරනවා.



පද්ධතිය තුල පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාව

විශේෂයෙන් සඳහන් කරන්න පුළුවන්, තවදුරටත් රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැලකිල්ලට අරගෙන තාක්ෂණික වශයෙන් ක්‍රියාත්මක කළ හැකි සහ ආර්ථික වශයෙන් ප්‍රශස්ත විදුලි උත්පාදනය පුළුල් කිරීමේ සැලසුමක් NSO - National System Operator - එක හැටියට ක්‍රියාත්මක කරගෙන යන බව. ඒ අනුව, ඉදිරි වසර තුන සඳහා සාදා ඇති අන්තර්කාලීන විදුලි පද්ධති සංවර්ධන සැලසුම් කෙටුම්පත අනුව තවදුරටත් පද්ධතිය තුළ පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාව පුළුල් කිරීම සඳහා කටයුතු කරනවා. 2027, 2028 සහ 2029 වර්ෂවලදී පහත සඳහන් ආකාරයට පුනර්ජනනීය බලශක්තිය පද්ධතියට එකතු කරන්න බලාපොරොත්තු වෙනවා. එය 2027දී සූර්ය බලයෙන් මෙගාවොට් 642ක්; සුළං බලයෙන් මෙගාවොට් 50ක්. 2028දී සූර්ය බලයෙන් මෙගාවොට් 300ක්; සුළං බලයෙන් මෙගාවොට් 160ක්. 2029දී සූර්ය බලයෙන් මෙගාවොට් 450ක්; සුළං බලයෙන් මෙගාවොට් 160ක්.

(ආ) (i) 2025 වර්ෂය - වාර සංඛ්‍යාව 2යි.

2026 (මේ දක්වා) - වාර සංඛ්‍යාව 2යි.

(ii) ගරු කථානායකතුමනි, අපිට මතකයි, අවසාන වරට විදුලි ගාස්තු සංශෝධනය කළ අවස්ථාවේදී ඒකක 180ට වඩා අඩුවෙන් පාවිච්චි කරන විදුලි පාරිභෝගිකයන්ට ගාස්තු වැඩි කළේ නැහැ කියන එක. ඒ සඳහා රුපියල් මිලියන 15,000ක මුදලක් සහනාධාර හැටියට ලබා දෙන්න රජය කටයුතු කළා. ඒ අනුව ඒ පාරිභෝගිකයන්ට අමතර ගාස්තුවක් දැරීමට සිදුවන්නේ නැහැ.

(iii) ඔව්.

අඩු ආදායම්ලාභීන්ගෙන් අය කරන විදුලි ගාස්තු සඳහා පහත සඳහන් ආකාරයට සහන ලබා දෙනවා.

පරිභෝජනය කළ ඒකක ප්‍රමාණය	ඒකකයට අයකිරීම	ස්ථාවර ගාස්තුව
0-30	5.00	80.00
31-60	9.00	210.00
61-90	14.00	210.00
91-120	20.00	400.00
121-180	28.00	1000.00

(ඇ) අදාළ නැත.

ඉහත ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මා **සභාගත*** කරනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගෙන් මම ඉල්ලපු ගොඩක් කරුණු පිළිතුරෙහි වගු වශයෙන් දීර්ඝව සඳහන් වෙලා තිබෙන නිසා සවිස්තරාත්මක පිළිතුර සභාගත කරනවා කියලා එතුමා කියපු නිසා මට අවශ්‍ය සියලු කාරණා අතුරු ප්‍රශ්න ලෙස අහන්න අපහසුතාවක් තිබෙනවා. ඒකෙන් හඳුනා ගත්ත කාරණයක් පිළිබඳව විතරක් මම අතුරු ප්‍රශ්න අහන්නම්.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළා, මෙගාවොට් 642ක් ලබන අවුරුද්දටත්, ඉන් පසු අවුරුද්දට මෙගාවොට් 300කුත්, ඊට පස්සේ අවුරුද්දට මෙගාවොට් 450කුත් සූර්ය බලය හරහා නිපදවනවා කියලා. ගරු අමාත්‍යතුමනි, සූර්ය බලය හරහා එවැනි මෙගාවොට් ප්‍රමාණයක් නිපදවන්න ආණ්ඩුව plan කළාට, Net Metering සහ Net Accounting ක්‍රමය නැති කිරීමෙන් පස්සේ ඔබතුමා කියන විධියට අපට ඔය targetsවලට යන්න පුළුවන් වෙයි කියලා මම නම් හිතන්නේ නැහැ. ගෙදරක වහලයේ - household rooftops - solar panels සවි කරන මනුස්සයා, solar panels සවි කරන්න ආයෝජනය කරන ආයතන සියල්ලම අධෛර්යවත් වෙලා ඒ බිස්නස් එක වහන තැනට පත්වෙලා තිබෙනවා. මා ළඟ ලිපියක් තිබෙනවා. ඔබතුමාටත් මේ ලිපිය ලැබිලා ඇති. Renewable Energy Development Front එකෙන් ඔබතුමාටත් ලිපියක් යොමු කර තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, වහල උඩ solar panels සවි කරන පුද්ගලයෙකුට දවල් වරුවේ නිපදවන විදුලිය, ඒ මිලටම CEB එකට දෙන්න ඕනෑ කියලා කියනවා. එහෙම පදනමක් යටතේ වියදම් කරලා solar panel එකක් ගහන්නේ කවුද? Unit ගණනට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

unit ගණන දෙනවා නම්, ඒක වෙනම දෙයක්. නමුත් ඔබතුමන්ලාගේ සාධාරණීකරණය කිරීම තමයි රාත්‍රී කාලයේ භාවිත කරන එකට වැඩි වියදමක් යනවා, ඒ නිසා කරන්න දෙයක් නැහැයි කියන එක. ගරු අමාත්‍යතුමනි, අද වනතුරු rooftop solar panelsවලට එක නීතියකුත්, මහා පරිමාණයේ ව්‍යාපාරිකයින්ට ground-mounted මෙගාවොට් 5, 10, 15 වශයෙන්,- ගරු අමාත්‍යතුමනි, මඩකලපුවේ මිනිස්සුන්ට ගොවිතැන් කරන්න දීපු ඉඩම්වල පර්මිට් අයින් කරලා solar companiesවලට ලබා දෙන තත්ත්වයක් තිබෙනවා. ත්‍රිකුණාමලයේ මුතූර්වලත් එවැනි සිද්ධියක් සිදුවෙලා තිබෙනවා. ආණ්ඩුවේ මේ ක්‍රමවේදය තුළින් අපට අවශ්‍ය සූර්ය බලය නිපදවා ගන්න බැරිවෙයි. ඒ වාගේම සාමාන්‍ය ජනතාවට මේකෙන් අසාධාරණයක් සිදු වෙනවා. ඒ නිසා මේ ප්‍රතිපත්තිය වහාම reconsider කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා, ගරු අමාත්‍යතුමනි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ Net Metering සහ Net Accountingවල තිබෙන ගැටලු ගැන අපි පාර්ලිමේන්තුවේදී වාර කිහිපයක් සාකච්ඡා කළා. දවල් දවසේ අඩු පිරිවැයකින් ජනනය කරලා දෙන ඒකක වෙනුවට රාත්‍රී කාලයේ දෙන්න සිද්ධ වුණොත්, - ඔබතුමා තේරුම් ගත් විධියට - අපට දෙන්න වෙන්නේ වැඩි ජනන පිරිවැයක් තිබෙන විදුලි ඒකක ප්‍රමාණයක්. ඒකට යන අතිරේක මුදල දරන්න වෙන්නේ solar panels නැති සාමාන්‍ය විදුලි පාරිභෝගිකයාට. ඒ නිසා තමයි අපි solar panels සවි කරලා තිබෙන අයට අසාධාරණයක් නොවන විධියටත්, ඔවුන්ට සාධාරණ ලාභයක් ලබා ගන්න පුළුවන් විධියටත්, අනෙකුත් විදුලි පාරිභෝගිකයින්ට අසාධාරණයක් නොවන විධියටත් Net Plus ක්‍රමය යෝජනා කරලා තිබෙන්නේ. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, Net Plusවලට අමතරව තවත් ක්‍රමයක් හඳුන්වා දෙන්න. ඒ තමයි, දහවල් කාලයේදී ඒ අය ඒකක ප්‍රමාණයක් පද්ධතියට දුන්නාට පස්සේ, දහවල් කාලයේදී ඒගොල්ලන් පාවිච්චි කරනවා නම් කිසියම් විදුලි ඒකක ප්‍රමාණයක්, දහවල් කාලයේදී ඒගොල්ලන් දෙන ඒකක ප්‍රමාණයෙන් අදාළ ඒකක ප්‍රමාණය අඩු කරලා, ඉතිරි ඒකකවලට මුදල් ටික ගෙවන්න. එතකොට දහවල් කාලයේදී අපට ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ, ඒ ඒකකවලට ඒ ඒකකවලින්ම set off කරන්න පුළුවන්. හැබැයි, රාත්‍රී කාලයේදී ජනන පිරිවැයේ වෙනස නිසා අපට ගැටලුවක් තිබෙනවා. ඒකට අතිරේක මුදලක් අය කරන්න සිද්ධ වෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කියන කාරණය මම පිළිගන්නම්. රාත්‍රී කාලයේදී යන පිරිවැය නිසා අසාධාරණයි කියලා කියමුකෝ. හරි. ගරු අමාත්‍යතුමා, ගිය අවුරුද්දේ අය වැය ලේඛනය තුළින් ආණ්ඩුව යෝජනා කළා, බැටරි පද්ධතියක් හරහා තමන් නිපදවන විදුලිය තමන් store කරගෙන ඒ බැටරි පද්ධතිය හරහා ලබාදෙන ක්‍රමයක් හඳුන්වා දෙන්න. දැන් ඊළඟ අවුරුද්දේ අය වැයත් ඇවිල්ලා තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. මේ වෙනකල් ඒ බැටරි පද්ධතියට දෙන්න ඕනෑ tariff එක දීලා නැහැ. ඒ බැටරි පද්ධතියට අදාළ agreements දීලා නැහැ. දැන් අගෝස්තු 11වැනි දාට පෙර සූර්ය පැනල පද්ධති සඳහා අයදුම් කළ අයට මේකෙන් අසාධාරණයක් වෙනවා. මඩකලපුව දිස්ත්‍රික්කයේ - මම මඩකලපුව ගැන නිතරම කියන්නේ, මම එහේ තිබෙන ගැටලුව ගැන දන්න නිසා. අනෙක් දිස්ත්‍රික්කවලත් එහෙමයි - 2021, 2022, 2023, 2024 අවුරුදුවල වහලේ solar panel එකක් සවි කරගන්න application එකක් දමපු මිනිසුන්ට කියන්නේ මොනවාද? "අපේ grid එක full, ඉඩ නැහැ, දෙන්න බැහැ, දෙන්න බැහැ" කියලා කියනවා. ඒක හැම දිස්ත්‍රික්කයේම වෙනවා. හැබැයි, ඒ කාලයේදීම 5 MW, 10 MW වාගේ ලොකු ලොකු මහා පරිමාණ ව්‍යාපෘතිවලට රජයේ ඉඩම්වල ඉඩ දීලා තිබෙනවා. එතකොට ඒ මිනිස්සු grid එක පුරවලා තිබෙන නිසා ගෙදර ඉන්න සාමාන්‍ය මනුස්සයාට grid එකට ඒ විදුලිය ටික දෙන්න විධියක් නැහැ. ඒක එකක්.

දෙවැනි කාරණය මේකයි ගරු අමාත්‍යතුමනි. මහා පරිමාණයේ ආයතන සහ ගෙවල්වල solar panels සවි කරපු නිසා තමයි අද ඔබතුමා කියන ආකාරයට මේ සූර්ය බලය හරහා අපේ අවශ්‍යතාව සපුරා ගන්න grid එකට මෙච්චර ප්‍රමාණයක් එකතු වෙලා තිබෙන්නේ. නමුත් දැන් අපි කරන්නේ මොනවාද? තමන්ගේ වියදමෙන් solar panels සවි කරපු මනුස්සයාගෙන්, තමන්ගේ වියදමෙන් solar panel එකක් හයි කරලා, රටට, අපේ අවශ්‍ය capacity එකට දායකත්වය දීපු මනුස්සයාගෙන් පළිගන්නවා. ඒ නිසා ඒකේ සාධාරණත්වය පිළිබඳව කරුණාකරලා නැවත හිතා බලන්න, ගරු අමාත්‍යතුමනි. එහෙම නැත්නම් වහාම මේ battery system එක දීලා, ඒගොල්ලන්ට tariff එකක් දීලා, ඒ battery එකේ ඒගොල්ලන් store කරගෙන ලබා දෙන ක්‍රමයක් හඳුන්වා දෙන්න. නැත්නම්, මේකෙන් වෙන්නේ ඔබතුමා සඳහන් කළ targetsවලට අපට යන්න බැරි වෙන එකයි, ගරු අමාත්‍යතුමනි. ඒක තමයි අවසානයේදී වෙන්නේ. ඒ නිසා මේ ගැටලුව පිළිබඳව කාරුණිකව සලකා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණා දෙකක් වැරදියි. පළමුවැනි එක, මේක පළිගැනීමක් නොවෙයි. මම කලින් සඳහන් කළා වාගේ ඒ අයටත් සාධාරණ ලාභයක් ලැබෙන විධියට සහ අනෙක් විදුලි පාරිභෝගිකයන්ටත් බරපතළ අසාධාරණයක් නොවන විධියට තමයි මේ අලුත් ක්‍රමය හඳුන්වා දීලා තිබෙන්නේ. ඒ වාගේම, අලුත් ක්‍රමයේ deviation එකක් ළඟදීම හඳුන්වා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අපි ගිය අවුරුද්දේ battery system එක ගැන කථා කළා. එතැන ප්‍රධාන වශයෙන් තිබෙන්නේ අපේ grid එකේ availability එක නැති එක. Transformer එකේ capacity එක exceed වෙලා තිබෙන නිසා, BESS එක හඳුන්වා දුන්නාට පසුව, දහවල් කාලයේ අතිරික්තව තිබෙන විදුලියෙන් ඒ බැටරි පද්ධතිය ආරෝපණය කරලා රාත්‍රී කාලයේ භාවිත කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ අවුරුද්දේ මෙගාවොට් 160ක්, ලබන අවුරුද්ද වෙනකොට ඒක 540 දක්වා වැඩි කරන්නත් සහ 2029 වෙනකොට ඒක 1,240 දක්වා වැඩි කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ හරහා දැනට තිබෙන transformersවල පවතින ගැටලුව, ඒ කියන්නේ capacity එක නැති එක යම් ප්‍රමාණයකින් අඩු කරගෙන අලුතෙන් solar panelsවලට අවස්ථාව දෙන්න අපි කටයුතු කරමින් යනවා.

ගරු කථානායකතුමනි, දැනටමත් අපි දන්නවා battery systems සඳහා, - ඒ කියන්නේ විශේෂයෙන් වහල මත solar panels හයි කරලා තිබෙන අයගේ- tax එක වැඩියි කියන එක. අපි ඒක පිළිගන්නවා. අපි ඒක වරින් වර කිව්වා. හැබැයි ඒ කිසිම tax එකක් අපි විසින් impose කරපු ඒවා නොවෙයි, කලින් පැවති රජයන් විවිධ අවස්ථාවල, සියයට 47ට වාගේ දාපු tax. අපි මේක තේරුම් අරගෙන මේ අය වැයෙන් ඒ tax එකෙන් කොටසක් අයින් කරනවා. ඒ වාගේම තමයි අලුතෙන් වහල මත solar panels සවි කරන, battery systems භාවිත කරන අයට දිරිගැන්වීමේ දීමනාවක් ලබා දෙන්න කටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමා තමන්ගේ අය වැය ප්‍රකාශනයේදී ඒ පිළිබඳව වැඩි විස්තර ඉදිරිපත් කරාවි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය: බස් ඇණිය
இலங்கை போக்குவரத்துச் சபை: பேருந்துத் தொகுதி
SRI LANKA TRANSPORT BOARD: BUS FLEET

2327/2026

6. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතරින් සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී සහ සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2026 වර්ෂයේදී මෙරටට ආනයනය කරන ලද මෙට්‍රෝ බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ධාවනය වන පෞද්ගලික බස් රථ සංඛ්‍යාව පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් බලපත්‍ර නිකුත් කර ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) බලපත්‍ර නිකුත් කිරීම සහ අනෙකුත් අදාළ සේවාවන් මඟින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වාර්ෂිකව ලබන ආදායම දළ වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கை போக்குவரத்து சபைக்குச் சொந்தமான பேருந்துகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பேருந்துகளில் சொகுசு பேருந்துகள், அரை சொகுசு பேருந்துகள் மற்றும் சாதாரண பேருந்துகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) 2026ஆம் ஆண்டில் இந்நாட்டிற்கு இறக்குமதி செய்யப்பட்ட மெட்ரோ பேருந்துகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையில் சேவையில் ஈடுபடும் தனியார் பேருந்துகளின் எண்ணிக்கை மாகாண வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) தேசிய போக்குவரத்து ஆணைக்குழுவினால் அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ள தனியார் பேருந்துகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அனுமதிப்பத்திரங்களை வழங்குதல் மற்றும் ஏனைய தொடர்புடைய சேவைகள் மூலம் தேசிய போக்குவரத்து ஆணைக்குழு வருடாந்தம் ஈட்டிவரும் வருமானம் அண்ணளவாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of buses currently owned by the Sri Lanka Transport Board;

(ii) separately, the number of luxury, semi-luxury and normal (standard) buses among them; and

(iii) the number of Metro Buses imported into the country in the year 2026?

(b) Will he also inform this House -

(i) separately, on a provincial basis, the number of private buses operating in Sri Lanka;

(ii) the number of private buses for which permits have been issued by the National Transport Commission; and

(iii) the approximate annual revenue received by the National Transport Commission through the issuance of permits and other related services?

(c) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 7,130කි.

(i) සාමාන්‍ය බස් රථ - 6,987
සුඛෝපභෝගී - 143
අර්ධ සුඛෝපභෝගී - නැත

(iii) බස් රථ 114කි.

(ආ) (i)

පළාත	බස් රථ ගණන
බස්නාහිර පළාත	5,520
මධ්‍යම පළාත	2,433
දකුණු පළාත	1,326
උතුරු පළාත	976
නැගෙනහිර පළාත	520
වයඹ පළාත	1,324
උතුරුමැද පළාත	509
ඌව පළාත	1,043
සබරගමුව පළාත	1,816

(ii) 2026.10.01 දින වන විට 2,966කට නිකුත් කරලා තිබෙනවා. එයින්, සාමාන්‍ය සේවා සඳහා 1,826ක්, අර්ධ සුඛෝපභෝගී සේවා සඳහා 257ක්, සුඛෝපභෝගී සේවා සඳහා 651ක් සහ අධි සුඛෝපභෝගී සේවා සඳහා 232ක් වශයෙන් නිකුත් කරලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

(iii) මේකෙදි, ලැබෙන ආදායම අහන්නේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව බලපත්‍ර නිකුත් කිරීම මඟින් සහ අනෙකුත් අදාළ සේවාවන් මඟින් ලැබූ ආදායම

විස්තරය	2025 වර්ෂය (රුපියල්)	2026.01.01 සිට 2026.09.30 දක්වා (රුපියල්)
බලපත්‍ර නිකුත් කිරීම මඟින්	546,695,018.46	439,157,062.25
අනෙකුත් ආදායම් (Administrative revenue, Bastiyan Mawatha lavatory income, Miscellaneous)	170,336,194.64	216,813,768.77
වෙනත් ආදායම් (Interest on deposits, interest on distress loan)	68,380,104.82	17,143,526.23
මුළු ආදායම	**785,411,319.92**	**673,114,357.25**

(ඇ) අදාළ නොවේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණු, SLTB එකේ බස් රථ සංඛ්‍යාව පොඩ්ඩක් කියනවාද?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
7,130යි.

සාමාන්‍ය බස් රථ - 6,987යි, සුඛෝපභෝගී - 143යි, semi-luxury buses - නැත.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
දැනට ධාවනය වන ඒවා නේද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ධාවනය වන ඒවා නොවෙයි, register වෙලා තිබෙන ඒවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ධාවනය වන ප්‍රමාණය නැද්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ඒක ඔබතුමා අහලා නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔබතුමාට දළ වශයෙන්වත් කියන්න බැරිද?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
5,000ක් විතර.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු කථානායකතුමනි, හරි අසාධාරණයි නේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙලාව ඉතිරි කර ගන්න ඉතාම ඉක්මනින් උත්තරය කියවාගෙන ගියා. ඒ නිසායි මම එතුමාගෙන් ඒ කාරණා ගැන ඇහුවේ. මම පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න හදනකොටම ඔබතුමා කෑගහනවා නේ. මට ප්‍රශ්නය අහන්න දෙන්නකෝ. ඇයි මේ එකපාරටම නිකම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

උදේ පාන්දර. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමා එක්ක බොහොම සුහදව වැඩේ කරන්න යනකොට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔළුව කෑමක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට මම ඉතාම කාරුණිකව කිව්වේ, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කියලා. ඔබතුමාට ඒක තේරුම් ගන්න අපහසුතාවක් තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අහන්නේ කොහේද,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] ඉතින්, ඉන්නේ නැහැ නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,-

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Cool down, cool down.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මම නොවෙයි, එතුමායි cool down වෙන්න ඕනෑ. මම මේ ප්‍රශ්නය අහන්න නේ නැඟිටලා ඉන්නේ. නැත්නම් ඉඳගෙන ඉන්නවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය කා දමන්නේ නැතිව ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
කථානායකතුමා උදේ පාන්දර බොහොම පිරිසිදු මනසකින් එන්න ඕනෑ. ඒ මනසින් එන්නේ නැතිව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

හරියනවාද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් හැමදෙනාටම පෙනෙනවා කවුද හොඳ මනසකින් ඇවිල්ලා ඉන්නේ සහ කවුද එහෙම නැත්තේ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]* කාලය කා දමන්න එපා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අපි දෙන්නා ගනුදෙනුවට කැමැතියි. කථානායකතුමා අකමැතියි. මාර කෙළියක් නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,- *[බාධා කිරීම්]* මම නොවෙයි ඇදෙන් වැටිලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාම කියපු විධියට ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ 5,000ක් පමණ තමයි දැන් ධාවනය වෙන්නේ. අපි දන්නවා, අපේ ආණ්ඩු කාලයේත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේත් ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් එකක් කැඩුණාම මොකද වෙන්නේ කියලා. සමහර වෙලාවට ඒ බස් එකේ බැටරිය අරගෙන අනෙක් බස් රථයට දමනවා. එතකොට ඒ බස් රථය එහෙමම නතර වෙනවා. අනෙක් බස් රථය ධාවනය කළ හැකි තත්ත්වයට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ අනුව ඔබතුමාට බොහොම පැහැදිලිව පෙනෙනවා ඇති, අද මගී ප්‍රවාහන සේවාව ක්‍රියාත්මක වෙන්නේ පෞද්ගලික බස් රථවලින් බව. එහෙම නම්, පෞද්ගලික බස් රථ සංඛ්‍යාව ඉදිරියේදී තවත් වැඩි කළ යුතුයි. පෞද්ගලික බස් රථවලට route permits නොදෙන සමහර තැන් තිබෙනවා. ඒ කියන්නේ, සමහර තැන්වල පෞද්ගලික බස් රථවලට route permits දෙන්නේ නැහැ. ඒ තැන්වල ධාවනය වන්නේ SLTB බස් රථ විතරයි. ගම්බද ප්‍රදේශවල සමහර පාරවල SLTB බස් රථ යන්නේ පැය දෙකකට තුනකට සැරයක්. ඒ වාගේ තැන්වලට අදාළව මාර්ග බලපත්‍ර ලබා දීමක් කරන්න බලාපොරොත්තු වෙනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු මන්ත්‍රීතුමනි ඇත්තටම ගත්තොත්, දෛනික ධාවනයේ යෙදෙන්නේ පෞද්ගලික බස් රථ 5,000-12,000 අතර ප්‍රමාණයක්. ඒ කියන්නේ register වෙලා තිබුණාට, බලපත්‍ර අරගෙන තිබුණාට ඒ සියලු බස් රථ ධාවනය වෙනවා කියන එක ඒකෙන් අර්ථකථනය වෙන්නේ නැහැ. මොකද, කොවිඩ්-19 කාලය ඇතුළත බස් හිමියන් අර්බුදයකට ලක් වුණා. ඒගොල්ලන්ට තිබුණු මුදල් අපහසුතා හේතුවෙන් බස් රථ විකුණපු නිසා දැන් බස් රථ ප්‍රමාණය 12,000කට වාගේ අඩු වෙලා තිබෙනවා. SLTB එකේත් බස් රථ 7,130ක් register වෙලා තිබුණාට දෛනිකව ධාවනය වෙන්නේ 5,000ක් විතර තමයි. එතකොට දළ වශයෙන් SLTB එක පොදු ප්‍රවාහනයට තුනෙන් එකක contribution එකක් දක්වනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය විධියට ඇහුවේ permits issue කරනවාද කියන එකයි. ඔව්, අපි ඒ ගැන සලකා බලා තිබෙනවා. නමුත් ඒවා කලින් විධියට issue කරන්නේ නැහැ. බලපත්‍රයක් නිකුත් කරන කොට බලපත්‍රය ඉල්ලුම් කරන පුද්ගලයා තෝරා ගැනීමේදී ලකුණු දෙන ක්‍රියා පටිපාටිය මොකක්ද, තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය මොකක්ද කියන එක සම්බන්ධව අපි කැබිනට් පත්‍රිකාවක් දාලා ඒ සඳහා අනුමැතිය ලබා ගත්තා. එයට අනුව අපි බලාපොරොත්තු වෙනවා උපරිම-

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, NTC එකයි, පළාත් සභාවයි කියන්නේ දෙකක්.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ඔව්, ඒක තමයි. මම NTC එක ගැනයි කියන්නේ. පළාත් සභාව මගේ විෂය පථයෙන් පිටත නිසා මට ඒකට උත්තර දෙන්න බැහැ. ජාතික ගමනාගමන කොමිෂන් සභාව - NTC - ගැනයි මම මේ කථා කරන්නේ. එහිදී අපි ලකුණු දීමේ පටිපාටියක් තීරණය කළා. ඒක බොහෝ විට permits 89ක් වාගේ ප්‍රමාණයක්. මම විශ්වාස කරනවා, නොවැම්බර් මාසය ඇතුළත පුවත් පත් දැන්වීම් දාලා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව අපට permits පිරිනැමීමේ හැකියාව තිබෙනවා කියලා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ප්‍රවාහන ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. ඔබතුමා හෝ මේ ගැන එතුමාව දැනුවත් කරන්න. අද වනකොට මේ රටේ පෞද්ගලික බස් රථ හිමියන් ඉතාම අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. මොකද, අමතර කොටස්වල මිල දවස ගාණේ ඉහළ යනවා. හැබැයි, ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රමිතියක්, නියමිත මිලක් මේ වනතුරුත් ප්‍රකාශ කර නැහැ. බස් රථ හිමියන්ට බලපාන ප්‍රශ්නවලට පිළිතුරක් හැටියට, විශේෂයෙන් ටයර්, අමතර කොටස් සහ අනෙකුත් දේවල් ගැන පළාත් සභාවත් එක්ක එකතු වෙලා ඉදිරියේදී වැඩ පිළිවෙළක් යොදනවාද කියා මම අහනවා.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. බස් ගාස්තු තීරණය කරන්නේ මොන සාධක මතද කියන එක බලන්න ඕනෑ. ඒ අනුව තමයි බස් ගාස්තු තීරණය කරන්න ඕනෑ. ඉන්ධන මිල මත පමණක් බස් ගාස්තු තීරණය කරනවා නම්, එතැනදී බස් රථ හිමියාට වාගේම රාජ්‍ය මැදිහත්වීම තිබෙන ලංගම, මෙට්‍රෝ වාගේ ආයතනවලට යම්කිසි අවදානමක්

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

තිබෙනවා. ඒ නිසා අපි හදමින් පවතිනවා, බස් ගාස්තු තීරණය කරන කොට බස් එකේ maintenanceවලට යන වියදම, spare partsවල මිල ආදි සියල්ල ගණනය කරලා හදන ක්‍රමවේදයක්. එසේ බස් ගාස්තු තීරණය කරන ක්‍රමවේදයකට මාරු වෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ සංවර්ධනය සහ නඩත්තු කටයුතු: වෙන් කළ අරමුදල්

வவுனியா தேசிய கல்வியியற் கல்லூரியின் அபிவிருத்தி மற்றும் பராமரிப்பு : ஒதுக்கப்பட்ட நிதி

DEVELOPMENT AND MAINTENANCE OF VAVUNIYA NATIONAL COLLEGE OF EDUCATION: FUNDS ALLOCATED

2354/2026

7. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් ජෙකදීස්වරන්)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ආරම්භ කළ දින සිට මේ දක්වා වාර්ෂිකව සංවර්ධන හා නඩත්තු කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදන, වැය කළ මුදල සහ සිදු කළ කාර්යයන්, භාවිතයට නොගත් ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අබලන් තත්ත්වයට පත් වී ඇති සිසු නේවාසිකාගාර, විද්‍යාපීඨ ගොඩනැගිලි සහ පරිහානියට පත් වී ඇති ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) නොඑසේ නම්, ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) අමාත්‍යාංශයේ නිලධාරීන් මෑතකදී විද්‍යාපීඨය නිරීක්ෂණය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී නිරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) ඉහත සඳහන් ගැටලු නිරාකරණය කිරීම සඳහා කඩිනම් පියවර ගනු ලබන්නේද;

යන්න එතුමිය තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) வவுனியா தேசிய கல்வியியற் கல்லூரி ஆரம்பிக்கப் பட்டது தொடக்கம் இதுவரையில் அதன் அபிவிருத்தி மற்றும் பராமரிப்பு நடவடிக்கைகளுக்காக வருடாந்தம் ஒதுக்கீடு செய்யப்பட்ட மற்றும் செலவு செய்யப்பட்ட நிதித்தொகைகள், மேற்கொள்ளப்பட்ட பணிகள், பயன்படுத்தப்படாத ஒதுக்கீட்டுத் தொகை ஆகியன ஒவ்வொரு வருட அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சேதமடைந்த நிலையிலுள்ள மாணவர் விடுதிகள், கல்வியியற் கல்லூரியின் கட்டடங்கள் மற்றும் சீர்குலைந்துள்ள விளையாட்டு மைதானம் ஆகியவற்றை புனரமைப்பதற்காக நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நிதி ஒதுக்கீட்டின் அளவு யாது என்பதையும்;

(iii) இன்றேல், நிதி ஒதுக்கீடு மேற்கொள்ளப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) கல்வி மற்றும் கல்விசாரா பணியாட்டொகுதியினரின் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) அமைச்சின் உத்தியோகத்தர்கள் அண்மையில் கல்வியியற் கல்லூரியை மேற்பார்வை செய்துள்ளனரா என்பதையும்;

(iii) இன்றேல், எதிர்காலத்தில் மேற்பார்வை செய்யப்படுமா என்பதையும்;

(iv) மேற்படி பிரச்சினைகளைத் தீர்ப்பதற்குத் துரித நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House of the amount of funds allocated annually for development and maintenance activities of the Vavuniya National College of Education from its establishment up to now, the amount expended, the activities carried out, and the amount of funds that remained unutilized, separately for each year?

(b) Will she also inform this House -

(i) whether funds have been allocated for the renovation of the student hostels, college buildings and the deteriorated playground;

(ii) if so, the amount that has been allocated; and

(iii) if not, the date on which the said funds will be allocated?

(c) Will she further inform this House -

(i) the steps that will be taken to address the shortage of academic and non-academic staff;

(ii) whether officials of the Ministry have recently inspected the National College of Education;

(iii) if not, whether an inspection will be carried out in the future; and

(iv) whether prompt measures will be taken to resolve the aforementioned issues?

(d) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය 1993 වර්ෂයේ ආරම්භ කර ඇත. විද්‍යාපීඨයේ 2014 වර්ෂයේ සිට වැය කළ මුදල් සහ සියලු කාර්යයන්හි තොරතුරු ඇමුණුම I මඟින් දක්වා ඇත.

ඇමුණුම I:

Vovuniya National College of Education

වර්ෂය	වෙන් කළ ප්‍රතිපාදන (රු.)	වැය කළ මුදල	සිදු කළ කාර්යයන්	භාවිතයට නොගත් ප්‍රතිපාදන (රු.)
2014		2,040,000.00	Repair's to quators bath room and toilets	නිශ්චිතව හඳුනා ගත නොහැක
2015		7,247,998.00	Improvement of Sanitary Facilities	නිශ්චිතව හඳුනා ගත නොහැක
2018		4,069,896.00	Refurbishment of Guest House	නිශ්චිතව හඳුනා ගත නොහැක
		70,363,300.00	Repairs to buildings (Phase - 01)	
		8,388,000.00	Improvements to Auditorium painting, Electrical instolation and Sound system	
		8,896,000.00	Improvement to Auditorium - Interierworks and Landscaping	
		1,612,000.00	Instolation of new water pump with plumbing work	
		624,795.00	Construction of Single Productive Type Tube Well	
Total		**93,953,991.00**		
2019		8,924,000.00	Construction of two toilet blocks	නිශ්චිතව හඳුනා ගත නොහැක
		8,924,000.00	Improvements to the Auditorium - Curtain, Lighting and AC System	
		10,669,000.00	Extension to a building for a rest room for academic staff	
		2,526,000.00	Construction work of vehical gurage, cement benches	
		14,583,000.00	Repairs to drainage system	
		115,200.00	Supply & fixing chicken mesh to window to prevent mice to enter dormitories	
		1,989,000.00	Improvements to access roads asphalting sub road	
		1,999,000.00	Improvements to access roads - asphalting main road	
		1,989,000.00	Tilling of lobby of the Auditorium	
		1,979,000.00	Tilling of the Auditorium	
		1,984,000.00	Repairs to Admin unit	
Total		**55,681,200.00**		
2024		8,843,000.00	The Renovation Of Office Building Roofing At National College Of Vavuniya	නිශ්චිතව හඳුනා ගත නොහැක
		2,924,000.00	Essential Repairs Dome 01 - National College Of Vavuniya	
		620,000.00	Essential Repairs Dome 02 - National College Of Vavuniya	
		386,000.00	Essential Repairs Dome 03 - National College Of Vavuniya	
		4,786,000.00	Essential Repairs Dome 04 - National College Of Vavuniya	
		2,096,000.00	Essential Repairs Dome 05 - National College Of Vavuniya	
		2,238,000.00	Essential Repairs Dome 06 - National College Of Vavuniya	
		367,000.00	Essential Repairs Dome 07 - National College Of Vavuniya	
		310,000.00	Essential Repairs Dome 08 - National College Of Vavuniya	
		1,790,000.00	Essential Repairs Dome 09 - National College Of Vavuniya	
		2,025,000.00	Essential Repairs Dome 10 - National College Of Vavuniya	
Total		**26,385,000.00**		
2025		15,354,992.78	Over roofing on hostel building	22,915,366.55
		9,340,250.00	Repair of Dining hall	
		4,167,640.00	Repair of kitchen	
		1,019,030.00	Repair of water tank	
Total		**29,881,912.78**		
2026	59,220,000.00	10,735,955.04	Repairing of dining hall	
		5,000,000.00	Blance work for Renovation of kitchen **(Sanction Amount- 11,221,677.30)**	
		5,000,000.00	Renovation of class rooms **Sanction amount- 17,594,397.99**	
		16,915,689.15	Builk Electricity Supply	
		3,000,000.00	Renovation for class rooms **Sanction Amount 17,594,397.99**	
Total		**40,651,644.19**		

වවනියා විද්‍යා පීඨය සඳහා වෙනම ප්‍රතිපාදන ලබා නොදෙන අතර ලබා දෙනු ලබන ප්‍රතිපාදන විද්‍යාපීඨ 20 * සඳහාම වේ.

* භාවිතයට නොගත් ප්‍රතිපාදන ලෙස 2025 වර්ෂය සඳහා රු.22,915,366.55ක් වන අතර 2024 වර්ෂයේ සියලු ප්‍රතිපාදන අවසන්ව ඇත. අනෙකුත් වසරවල නිශ්චිතව හඳුනා ගත නොහැකි වේ.

(ආ) (i) ඔව්.

සිසු නේවාසිකාගාර සහ විද්‍යාපීඨ ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණයට මුදල් වෙන් කර ඇත.

ගරු කථානායකතුමනි, 2025 වර්ෂයේදී over-roofing on hostel building, repair of dining hall, repair of kitchen and repair of water tank කියන කොටස්වලටත්, 2026 වර්ෂයේදී repairing of dining hall, balance work for renovation of kitchen, renovation of classrooms and electricity supply ආදී වශයෙන් කොටස් කිහිපයකටත් මුදල් වෙන් වෙලා තිබෙනවා. මේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් තමයි පවතින්නේ.

(ii) 2026 වර්ෂය සඳහා එම කටයුතු වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 59,220,000.00යි.

(iii) අදාළ නොවේ.

(ඇ) (i) <u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි අනුමත, දැනට සිටින හා පුරප්පාඩු සංඛ්‍යාව ඇමුණුම II මඟින් නිශ්චිතව, සංඛ්‍යාත්මකව දක්වා තිබේ.

ඇමුණුම II:

ACADEMIC CARDER 2026.10.22

College of National Eduction :-

	Subject	Sinhala				Tamil				English			
		Approved Number	Existing Number	Excess	Vacancies	Approved Number	Existing Number	Excess	Vacancies	Approved Number	Existing Number	Excess	Vacancies
1	Professional Subject	2	2	_	_	16	12	_	4	_	_	_	_
2	Sinhala language (Mother Tongue)	1	_	_	1	_	_	_	_	_	_	_	_
3	Sinhala language (Second Language)	3	2	_	1	_	_	_	_	1 officer Attached 2 days galewela T.C			
4	Tamil language (Mother Tongue)	_	_	_	_	6	4	_	2	_	_	_	_
5	Tamil language (Second Language)	_	_	_	_	3	3	_	_	_	_	_	_
6	English	_	_	_	_	_	_	_	_	4	3	_	1
7	Health and Physical Education	1	_	_	1	4	4	_	_	_	_	_	_
8	Dancing (Oriantle)	1	_	_	1	_	_	_	_	_	_	_	_
9	Dancing (Bharath)	_	_	_	_	1	1	_	_	_	_	_	_
10	Music (Oriantle)	1	_	_	1	_	_	_	_	_	_	_	_
11	Music (Karnatic)	_	_	_	_	1	1	_	_	_	_	_	_
12	Western Music	_	_	_	_	_	_	_	_	_	_	_	_
13	Art	1	_	_	1	1	2	1	_	_	_	_	_

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

ACADEMIC CARDER 2026.10.22

College of National Eduction :-

	Subject	Sinhala				Tamil				English			
		Approved Number	Existing Number	Excees	Vacancies	Approved Number	Existing Number	Excees	Vacancies	Approved Number	Existing Number	Excees	Vacancies
14	Drama and Performing Arts	1	_	_	1	1	1	_	_	_	_	_	_
15	Information and Commucation Technology	1	1	_	_	2	2	_	_	_	_	_	_
16	Primary Education	_	_	_	_	1	1	_	_	_	_	_	_
17	Buddhism	_	_	_	_	_	_	_	_	_	_	_	_
18	Cathalisam	_	_	_	_	3	2	_	1	_	_	_	_
19	Christanity	_	_	_	_	1	_	_	1	_	_	_	_
20	Hindusm	_	_	_	_	3	3	_	_	_	_	_	_
21	Islam	_	_	_	_	_	_	_	_	_	_	_	_
22	Mathematics	_	_	_	_	3	1	_	2	_	_	_	_
23	Biology	_	_	_	_	2	1	_	1	_	_	_	_
24	Chemistry	_	_	_	_	2	1	_	1	_	_	_	_
25	Physics	_	_	_	_	2	1	_	1	_	_	_	_
26	Mechanicle Technology	_	_	_	_	_	_	_	_	_	_	_	_
27	Construction Technology	_	_	_	_	_	_	_	_	_	_	_	_
28	Electric and Electronic Technology	_	_	_	_	_	_	_	_	_	_	_	_
29	Art and Craft (Pottery and Handicraft)	_	_	_	_	_	_	_	_	_	_	_	_
30	Textiles and Technology	_	_	_	_	_	_	_	_	_	_	_	_
31	Education of Citizentry	1	_	_	1	2	2	_	_	_	_	_	_
32	History	_	_	_	_	_	_	_	_	_	_	_	_
33	Geography	_	_	_	_	_	1	_	_	_	_	_	_
34	Agriculture Science	_	_	_	_	2	1	_	1	_	_	_	_
35	Special Education	_	_	_	_	_	_	_	_	_	_	_	_
36	Home Economics	_	_	_	_	2	_	_	2	_	_	_	_
37	French	_	_	_	_	_	_	_	_	_	_	_	_
38	Entrepenurial Studies	_	_	_	_	_	_	_	_	_	_	_	_
39	Management Studies	_	_	_	_	1	1	_	_	_	_	_	_
40	Buisiness and Accounting Studies	_	_	_	_	_	_	_	_	_	_	_	_
41	Social Science	_	_	_	_	_	_	_	_	_	_	_	_
42	Primary Maths	_	_	_	_	2	2	_	_	_	_	_	_
43	Primary physical Education	_	_	_	_	1	1	_	_	_	_	_	_
44	Primary(Environment Related Activities)	_	_	_	_	1	3	2	_	_	_	_	_
45	Primary (Aesthetics Edu& Creative Skill)	_	_	_	_	1	1	_	_	_	_	_	_
46	Primary Christanity	_	_	_	_	_	1	_	_	_	_	_	_
	Primary Tamil	_	_	_	_	1	1	_	_	_	_	_	_
	Total	13	5	_	8	64	54	3	16	4	3	_	1

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා 2019/2020 බඳවා ගැනීමෙන් 2025 ස්ථානගත කිරීම් කර ඇති අතර, ඉදිරියේදී 380ක් බඳවා ගැනීමට නියමිතය. ඒ අනුව, අධ්‍යයන පුරප්පාඩු හිඟය සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි අනුමත, දැනට සිටින හා පුරප්පාඩු සංඛ්‍යාව ඇමුණුම III මඟින් දක්වා ඇත.

Information of the Non Academic Employees as at 30.09.2026

Seria	Designation	Approved Cader	Exiting Cader	Vacancies
1	Registrar	1	1	-
2	Translator (sinhala - tamil)	1	-	1
3	Development officer	3	5	-
4	Building Supervisor	1	-	1
5	Audio visual Assistant	1	-	1
6	Librarian (special)	1	-	1
7	Librarian -I	1	-	1
8	Librarian -II	1	-	1
9	Librarian -III	3	-	3
10	Public Management Officer	6	-	6
11	Information and communication technology assistant	1	-	1
12	Document assistant	1	-	1
13	Hostel Superintendent (Female)	2	1	1
14	Hostel Superintendent (male)	2	1	1
15	Assistant Hostel Superintendent (Female)	2	-	2
16	Assistant Hostel Superintendent (male)	2	-	2
17	Laboratory Assistant	3	-	3
18	Sport Coach	1	-	1
19	Driver	3	-	3
20	Mason	1	-	1
21	Electrician	1	-	1
22	Plumber	1	-	1
23	Carpenter	1	-	1
24	Tractor Driver	1	-	1
25	Cook	13	11	2
26	Pumper	1	1	_
27	K.k.s /Duplo machine operator / Record keeper	3	5	-
28	Library Attendant	4	1	3
29	Sick attendant (female)	1	1	-
30	Sick attendant (male)	1	1	-
31	Laboratory attendant	3	2	1
32	Watcher	8	3	5
33	Laborer	10	4	6
34	sanitary laborer	4	1	3
35	Work shop attendant	1	-	1
36	Bungalow Keeper	1	-	1
	Total	91	38	57

අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ED/5/67/17/30 හා 2025.05.27, 2026.02.11 හා 2026.06.12 දිනැති ලිපි මඟින් ඉදිරිපත් කර ඇත. එම තොරතුරු මත බඳවා ගැනීමට අනුමැතිය ලද පසුව මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී (විවෘත හා සීමිත) බඳවා ගැනීම් සඳහා ගැසට් පත්‍රය පළ කර ඇති අතර, විභාග දෙපාර්තමේන්තුව මඟින් විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කළ පසු අදාළ බඳවා ගැනීම් සිදු කර අඩුපාඩු පිරවීමට කටයුතු කෙරේ.

විදුලි කාර්මික සහ ජලනළ කාර්මික තනතුරු සඳහා බාහිර සේවා සැපයුම්කරුවන්ගෙන් සේවා ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

(ii) 2025 හා 2026 වර්ෂයන්හී වසරකට අවස්ථා දෙක බැගින් ගොඩනැඟිලි පරීක්ෂාව, ඉදිකිරීම් ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ නඩත්තු කටයුතු නිරීක්ෂණය සඳහා ගොස් ඇත.

(iii) තවදුරටත් ඉදිරියේදී ද නිරීක්ෂණය කිරීමට සැලසුම් කර ඇත.

(iv) ඔව්.

(ඇ) අදාළ නොවේ.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கல்வியியற் கல்லூரிகளுக்கு ஆசிரிய மாணவர்களை உள்வாங்கும்பொழுது, பொதுவாக ஓய்வுபெற்றுச் செல்லும் ஆசிரியர்களின் எண்ணிக்கையின் அடிப்படையில் மாவட்ட ரீதியாகவே அவர்கள் தெரிவுசெய்யப்படுகிறார்கள். கடந்த காலங்களில் இலங்கை கல்வி நிருவாக சேவை, இலங்கை கல்வியியலாளர் சேவை, இலங்கை அதிபர் சேவை, இலங்கை ஆசிரிய ஆலோசகர் சேவை போன்றவற்றுக்கு போட்டிப் பரீட்சைகள்மூலம் ஆசிரியர்கள்தான் கூடுலாக உள்வாங்கப் பட்டார்கள். இவ்வாறு ஆசிரியர்கள் உள்வாங்கப் படும்பொழுது, பாரிய ஆசிரியர் வெற்றிடங்கள் நிலவுகின்றன. நான் நினைக்கின்றேன், கடந்த 4-5 வருட காலப்பகுதியில் மேற்படி சேவைகளுக்கு 10,000க்கும் மேற்பட்டோர் ஆசிரியர் சேவையிலிருந்து சென்றிருக்கிறார்கள் என்று. எனவே, கல்வியியற் கல்லூரிகளுக்கு ஆசிரிய மாணவர்களை உள்வாங்கும்பொழுது, மேற்குறித்த வெற்றிடங்களும் கருத்திற் கெள்ளப்படுகின்றதா? அவ்வாறு இல்லையெனில், எதிர் காலத்தில் அதற்கான ஏற்பாடுகள் செய்யப்படுமா? எனக் கேட்க விரும்புகின்றேன்.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, මේ මොහොත වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව මතම බඳවා ගැනීමක් සිදු වෙන්නේ නැහැ. එම පද්ධතියෙන් එළියට යන ප්‍රමාණය සංඛ්‍යාත්මකව ගත්තොත්, විශේෂයෙන්ම සේවාවල උසස්වීම් මත යම් ප්‍රමාණයක් එළියට යනවා.

මේ අවුරුද්දේ බඳවා ගැනීම් කිහිපයක් තිබෙනවා. එකක්, උපාධිධාරීන් බඳවා ගැනීම. උපාධිධාරීන් 23,000කට අධික ප්‍රමාණයක් බඳවා ගන්න තිබෙනවා. ඊළඟට, විද්‍යාපීඨ සඳහා බඳවා ගැනීම. විද්‍යාපීඨ සඳහා 6,000කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගන්න තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීමත් කරනවා. මෙන්න මේ බඳවා ගැනීම් තුළින් අපට පුළුවන් උසස්වීම් මත හෝ ශ්‍රේණිගතව පද්ධතියෙන් එළියට යන පිරිසගේ පුරප්පාඩු සැලකිය යුතු ප්‍රමාණයකින් පිරවීමට.

ගරු කථානායකතුමනි, මෙතැනදී ගැටලුවක් එන්නේ මෙන්න මේ කාරණා නිසායි. ඒ තමයි, පද්ධතියෙන් යම් කිසි ප්‍රමාණයක් එළියට යනවා. ඒ දත්ත සම්බන්ධයෙන් අපට යම් කිසි ගැටලුවක් තිබෙනවා. අනෙක් එක තමයි, කාලයක් තිස්සේ නිශ්චිතව අවුරුදු පතා - වාර්ෂිකව - බඳවා ගැනීමක් සිදු නොවීම. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, පවතින පුරප්පාඩු සංඛ්‍යාව නිශ්චිතව ගණනය කරලා, ඒ නිශ්චිත පුරප්පාඩු සංඛ්‍යාවට වාර්ෂික බඳවා ගැනීම් කරන්න. එතකොට ඔය කියන ගැටලුව මතු වෙන එකක් නැහැ. යම්කිසි ප්‍රමාණයක් පද්ධතියෙන් එළියට ගියත්, ඒ දත්තය මතම බඳවා ගන්න අපට පුළුවන් වෙනවා.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கல்வியியற் கல்லூரிகளில் கல்வி கற்கின்ற மாணவர்களின் நலன்புரி விடயங்களில் அவதானம் செலுத்தவேண்டிய தேவைப்பாடு இருக்கின்றது. அண்மையில் நீங்கள் வவுனியா கல்வியியற் கல்லூரிக்கு வருகைதந்தபோது, அவர்கள் முகங்கொடுக்கும் அசௌகரியங்களை நேரடியாகவே கண்டீர்கள். எனவே, அவர்களுடைய நலன்புரி நடவடிக்கைகளை மேம்படுத்துவதற்குரிய ஏதாவது ஏற்பாடுகள் எதிர்வரும் காலங்களில் மேற்கொள்ளப்படுமா? குறிப்பாக, அதற்காக விசேட நிதி ஒதுக்கீடுகள் ஏதும் இருக்கின்றதா? என்பதை அறிய விரும்புகின்றேன்.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ඇත්තටම ගත්තොත්, වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ සුවිශේෂ ගැටලු කිහිපයකුත් තිබුණා. අපි එය නිරීක්ෂණය කළා. නිලධාරිනුත්, අපිත් කථා කරලා නිරීක්ෂණ කිහිපයකුත් සිද්ධ කළා. මා සඳහන් කළ පරිදි, වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ප්‍රතිසංස්කරණ සඳහා යම්කිසි මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. පොදුවේ ගත්තාම, අධ්‍යාපන විද්‍යාපීඨවල යම්කිසි ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, සියලු අධ්‍යාපන විද්‍යාපීඨයන්හි සනීපාරක්ෂාව, විශේෂයෙන්ම hostels සහ අනෙකුත් යටිතල පහසුකම්වල ගැටලු තිබෙනවා. නිශ්චිතව හඳුනා ගත් සියලු ගැටලු සම්බන්ධයෙන් අපි ලබන අවුරුද්දෙත් ප්‍රතිපාදන වෙන් කරනවා. මේ අවුරුද්දේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා, විශේෂයෙන් ඔය කියපු සුබසාධන කටයුතු සඳහා.

ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. අධ්‍යාපන විද්‍යාපීඨ ඩිජිටල්කරණයේදී ඒ සියලු අධ්‍යාපන විද්‍යාපීඨ ජාලගත කිරීමටත්, smart classroom එකක් හෝ සම්පූර්ණ smart classrooms සියලු විද්‍යාපීඨවලට සපයන්නත්, ඒක ආදර්ශ පන්ති කාමරයක් විධියට සකස් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අධ්‍යාපන පද්ධතියේ සුබසාධනය සම්බන්ධයෙන් ගත්තොත්, විශේෂයෙන්ම අපට අනධ්‍යයන කාර්ය මණ්ඩලය වැදගත් වෙනවා, ගරු කථානායකතුමනි. මේ වෙනකොට ශිෂ්‍ය නිවාස අධිකාරි, තාක්ෂණ පීඨ සහකාර සහ ජෛව පද්ධති තාක්ෂණ සහකාර කියන තනතුරුවලට බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදන නිකුත් වෙලා තිබෙනවා. සමහර ඒවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවලා තිබෙනවා, අනුමැතිය සඳහා.

ඒ වාගේම තමයි රසායනාගාර සහායක, රසායනාගාර සහකාර, තාක්ෂණ පීඨ සහායක, සේවා සහයක, පාසල් ආරක්ෂක, සේවා සහායක, සනීපාරක්ෂක, විදුලි කාර්මික සහ ජලනළ කාර්මික කියන තනතුරුවල සියලු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 2026 පෙබරවාරි මාසයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරලා තිබෙනවා. ඉතින්, මේ කටයුතුත් අවසන් කරද්දී සුබසාධන කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීමට හෝ සෑහීමකට පත්වෙන ලෙස එහි යම්කිසි වෙනසක් කිරීමට හෝ පුළුවන් වෙයි, විශේෂයෙන් විද්‍යාපීඨ සඳහා බඳවා ගත්තාට පසුව.

මින්නේරිය සහ කවුඩුල්ල ජාතික වනෝද්‍යාන: සංචාරක පැමිණීම් සහ පහසුකම්
மின்னேரியா மற்றும் கவுடுல்ல தேசிய வனப்பூங்காக்கள்: சுற்றுலாப் பயணிகளின் வருகை மற்றும் வசதிகள்
MINNERIYA AND KAUDULLA NATIONAL PARKS: TOURIST ARRIVALS AND FACILITIES

2403/2026

8. ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හබරණ, මින්නේරිය සහ කවුඩුල්ල ප්‍රදේශ ආශ්‍රිතව ක්‍රියාත්මක වන උද්‍යාන සහ ඒවා පාලනය කරනු ලබන ආයතන කවරේද;

(ii) 2026 වර්ෂයේ මේ දක්වා එම උද්‍යාන නැරඹූ දේශීය සහ විදේශීය සංචාරකයන් සංඛ්‍යාව සහ ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මින්නේරිය ජාතික වනෝද්‍යානයට පැමිණෙන දේශීය සහ විදේශීය සංචාරකයන් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ සහ සංචාරකයන් උද්‍යානයට ඇතුළත් කිරීමේ ක්‍රමවේදයේ දුර්වලතා පවතින බව පිළිගන්නේද;

(iii) එම වනෝද්‍යානය තුළ ඇති සත්ව කෞතුකාගාරය මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) දෛනිකව පැමිණෙන සංචාරකයන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් තිබේද;

(vi) එසේ නම්, පවතින වැසිකිළි හා කැසිකිළි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹபரண, மின்னேரியா மற்றும் கவுடுல்ல பிரதேசங்களில் செயற்படும் பூங்காக்கள் மற்றும் அவற்றை நிருவாகம் செய்கின்ற நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) 2026ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை குறித்த பூங்காக்களை பார்வையிட்டுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டு சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கை மற்றும் ஈட்டிக்கொண்ட வருமானம் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மின்னேரிய தேசிய வனப்பூங்காவுக்கு வருகை தருகின்ற உள்நாட்டு மற்றும் வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகளுக்கு நுழைவுச்சீட்டு வழங்குகின்ற முறைமை யாது என்பதையும்;

(ii) குறித்த நுழைவுச்சீட்டுக்களை வழங்குவதிலும் சுற்றுலாப் பயணிகளைப் பூங்காவுக்குள் அனுமதிக்கும் முறைமையிலும் பலவீனங்கள் காணப்படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) குறித்த வனப்பூங்காவில் காணப்படுகின்ற மிருகவியல் நூதனசாலை தற்போது செயற்பாட்டில் உள்ளதா என்பதையும்;

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) நாளாந்தம் வருகை தருகின்ற சுற்றுலாப் பயணிகளுக்குப் போதுமானளவு சுகாதார வசதிகள் உள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், அங்குள்ள மலசல கூடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -
  (i) the parks operating in the Habarana, Minneriya and Kaudulla areas and the institutions that manage them; and
  (ii) separately, the number of local and foreign tourists who have visited the aforesaid parks so far in 2026 and the amount of income received?

(b) Will he also inform this House -
  (i) the method of issuing tickets for the local and foreign tourists who visit the Minneriya National Park;
  (ii) whether he accepts that there are weaknesses in the method of issuing the aforesaid tickets and admitting tourists to the park;
  (iii) whether the zoological museum in the aforesaid park is currently operational;
  (iv) if not, the reasons therefor;
  (v) whether adequate sanitary facilities are available for tourists who visit daily; and
  (vi) if so, separately, the number of toilets and urinals available?

(c) If not, why?

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මින්නේරිය ජාතික උද්‍යානය හා කවුඩුල්ල ජාතික උද්‍යානය. මෙම උද්‍යානය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ.

(ii) ලැබුණු ආදායම් තත්ත්වය සම්බන්ධයෙන් ගත්තොත්, 2026 සැප්තැම්බර් මාසය වන විට කවුඩුල්ල ජාතික වනෝද්‍යානයට දේශීය සංචාරකයන් 18,803ක්ද, සාර්ක් කලාපයෙන් 602ක්ද, විදෙස් සංචාරකයින් 21,133ක්ද පැමිණ තිබෙනවා. ඒ වාගේම මින්නේරියට දේශීය සංචාරකයන් 73,371ක්ද, සාර්ක් කලාපයෙන් 4,412ක්ද, විදේශීය සංචාරකයින් 68,163ක්ද පැමිණ තිබෙනවා. මින්නේරියට ලැබුණු ආදායම රුපියල් මිලියන 591.2යි. ඒ වාගේම කවුඩුල්ල ජාතික වනෝද්‍යානයට ලැබුණු ආදායම මිලියන 180යි. මේ මම ඉදිරිපත් කළේ 2026 සැප්තැම්බර් මාසය වන විට තත්ත්වය. මුළු ආදායම වශයෙන් ලැබී තිබෙනවා, රුපියල් මිලියන 5,513ක්.

විස්තරාත්මක තොරතුරු ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර තිබෙනවා. දීර්ඝ විස්තරයක් සඳහන් වන බැවින් ඇමුණුම 01 **සභාගත***කරනවා.

(ආ) (i) මුදල් මඟින් ටිකට් පත් මිලදී ගන්න පුළුවන්. ඒ වාගේම credit cardsවලින් ගන්න පුළුවන්. Online මිලදී ගැනීමේ හැකියාවත් තිබෙනවා.

(ii) සංචාරක සමයේදී සුළු වශයෙන් වාහන තදබදයක් පවතිනවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ සංචාරකයන් වැඩිවශයෙන් පැමිණෙන season එකත් - නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරිවලත් - ඒ වාගේම පාසල් නිවාඩු කාලයේදී දේශීය සංචාරකයන් වැඩිවීමත් මේකට විශාල වශයෙන් බලපානවා. විශේෂයෙන්ම දෙසැම්බර්වල ලොකු තදබදයක් තිබෙනවා. අපි ඒකට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා.

(iii) ක්‍රියාත්මකව ඇත. තවදුරටත් ඒක දියුණු කරන්න ඕනෑ කියලා අපි පිළිගන්නවා.

(iv) අදාළ නොවේ.

(v) ඔව්. නමුත් සංචාරක සමයේ ඇතිවන තදබදය සඳහා නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේ අවශ්‍යතාවක් ඇත. ඒ සඳහා කටයුතු කරමින් පවතිනවා.

(vi) පහත ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

ජාතික උද්‍යානවල පවතින සංචාරකයින්ගේ භාවිතයටගත හැකි වැසිකිළි සංඛ්‍යාව පිළිබඳ විස්තර ලබා ගැනීම

ස්ථානය	වැසිකිළි සංඛ්‍යාව			වර්තමාන තත්වය
	ස්ත්‍රී	පුරුෂ	පොදු	
යාල ජාතික උද්‍යානය I. පලටුපාන මූලස්ථාන කාර්යාලය	කොමඩ- 06	කොමඩ -03	-	ක්‍රියාකාරී තත්වයේ පවතී. නමුත් සුළු අළුත්වැඩියා සිදු කළ යුතුව ඇත.
II. පටනංගල මධ්‍යස්ථානය මධ්‍යස්ථානය i. අළුතින් ඉදිකරන ලද වැසිකිළි පද්ධතිය	කොමඩ-04	කොමඩ -02		ක්‍රියාකාරී තත්වයේ පවතී
ii. පැරණි වැසිකිළි පද්ධතිය -	කොමඩ-02 පෝච්චි - 01	කොමඩ -01 පෝච්චි - 01		සියළු වැසිකිළි පෝච්චි කැඩී අබලන්ව ඇත. වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කළයුතුව ඇත.
II. පරණතොටුපොළවිවේක ස්ථානය	කොමඩ -02 පෝච්චි- 01	කොමඩ -01 පෝච්චි - 01	-	සියළු වැසිකිළි පෝච්චි කැඩී අබලන්ව ඇත. වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කළයුතුව ඇත.
යාල කලාප IV. ගල්ගේ උද්‍යාන පිවිසුම	කොමඩ -03 පෝච්චි- 01	කොමඩ - 02 පෝච්චි - 01		ක්‍රියාකාරී තත්වයේ පවතී. සුළු අළුත්වැඩියා කටයුතු සිදු කළයුතුව ඇත.
යාල කලාප VI. තණමල්විල	02	03	-	ක්‍රියාකාරී තත්වයේ පවතී.
උඩවලව ජාතික උද්‍යානය- පිවිසුම අසල	07	06		භාවිතයේ පවතී
උඩවලව ජා.උ. අදාල කඳවුරු බිම - 5			05	
විල්පත්තු ජාතික උද්‍යානය උද්‍යාන මූලස්ථානය	03	03		ක්‍රියාකාරී තත්වයේ පවතී
තුඹුක්විල විවේක ස්ථානය	04	04	01	
අනෙකුත් සියළුම සංචාරක ස්ථානවල	-	-	24	ක්‍රියාකාරී තත්වයේ පවත
මින්නේරිය ජාතික උද්‍යානය	කොමඩ - 02 පෝච්චි - 01	කොමඩ - 01 පෝච්චි - 01 යුරිනල් - 03	02	ක්‍රියාකාරී තත්ත්වයේ පවතී..
හෝර්ටන් තැන්න ජාතික.උද්‍යානය • උද්‍යාන මූලස්ථාන/ආපනශාලාව අසල වැසිකිළි පද්ධතිය	03	03	03	සම්පූර්ණ අළුත්වැඩියා කළයුතුව ඇත.
• පට්ටිපොළ උද්‍යාන පිවිසුම	03	03	-	
• තොටුපොල කන්ද අසල වැසිකිළි පද්ධතිය	01	01	-	
• ඔහිය උද්‍යාන පිවිසුම අසල වැසිකිළි පද්ධතිය	-	-	04	
• කුඩා ලෝකන්තය අසල වැසිකිළි පද්ධතිය	03	03	-	
• බෙකර් ඇල්ල අසල වැසිකිළි පද්ධතිය	03	03	-	
• වන නිවහන අසල වැසිකිළි පද්ධතිය	02	02	-	
• උද්‍යාන මූලස්ථානය වාහන අංගනය අසල වැසිකිළි පද්තිය	02	02	-	ඉතා හොඳ තත්වයේ පවතී.
• ඩයගම උද්‍යාන පිවිසුම අසල	02	02	-	සම්පූර්ණ අළුත්වැඩියා කළයුතුව ඇත.
• කඳවුරු බිම -06	-	-	03	
කවුඩුල්ල ජා.උ.	03	03	නැත	ක්‍රියාකාරී තත්වයේ පවතී.

(ඇ) අදාළ නොවේ.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර ඇතුළේ තිබුණා, online ක්‍රමය, QR ක්‍රමය ක්‍රියාත්මක වනවා කියලා. මම මෙහෙම කියන්නේ ඔබතුමා අපහසුතාවට පත්කරන්න නොවෙයි. වර්තමානය වන විට බොහෝදුරට ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මින්නේරිය, කවුඩුල්ල සහ ගල්ඔය කියන ජාතික වනෝද්‍යානත්, හුරුළු පරිසර උද්‍යානයත් eco parks විධියට තමයි ක්‍රියාත්මක වන්නේ. පසුගිය දිනවල මෙම ස්ථානවලට පැමිණි සංචාරකයින් පිළිබඳව ඔබතුමාගේ පැත්තෙන් අදහසක් ඉදිරිපත් කළා, ඒ තුළින් රුපියල් බිලියන පහකට ආසන්න ආදායමක් ලැබිලා තිබෙන බවට. නමුත්, මෙන්න මේ වන සංරක්ෂණ කලාප තුළට, එහෙම නැත්නම් වනජීවී උද්‍යාන තුළට වාහන ඇතුළු කිරීමේදී විධිමත් වැඩ පිළිවෙළක් මේ වනකොටත් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ සඳහා ඉක්මන් දියුණු ක්‍රමයක් හදන්න ඕනෑය කියලා විශ්වාසයක් තිබෙනවා. එතැන රැකියාව කරන අයත් දිනපතා එවැනි ඉල්ලීම් කරනවා. ඒ නිසා online සහ වෙනත් දියුණු ක්‍රම භාවිත කරලා ඒ සඳහා යම් ක්‍රමයක් හදන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එහෙම ක්‍රමයක් හැදීම සඳහා කොපමණ කාලයක් ගතවෙයිද?

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු කථානායකතුමනි, ඇත්තටම online ක්‍රමය මෙහිදී භාවිත වනවා. අදාළ දවසට කලින් දවස වෙනකම් online ක්‍රමයට tickets book කිරීමේ, මිලදී ගැනීමේ හැකියාව තිබෙනවා. නමුත් අදාළ දිනයට පෙර දින උදේ ඒක cancel වනවා. ගරු මන්ත්‍රීතුමා මතු කළා වාගේ අපි සංචාරක කලාපයටම අදාළ වන පරිදි හබරණ කේන්ද්‍ර කරගෙන පොදු මධ්‍යස්ථානයකින් ticket එකක් issue කරන්න දැනට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ සංචාරක අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. ඕනෑම තැනකට යන්න පුළුවන් විධියට එම ticket එක නිකුත් කරලා, ඊට පසුව එය cancel වන විධියට මේ කටයුත්ත කරන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. අපි ඒ ගැන සාකච්ඡා කරමින් යනවා. ඉදිරියේදී අපි විශේෂ අවධානයක් යොමු කරලා ඒ වෙනුවෙන් කටයුතු කරනවා.

ඒ වාගේම තදබදය වැඩිවන අවස්ථාවල අමතර ticket counter එකක් අපි දමනවා. ඒ වාගේම cashවලට, credit card ක්‍රමයට tickets මිලදී ගැනීමේ පහසුකම් ද සපයා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මින්නේරිය ජාතික වනෝද්‍යානයේ යම් තදබදයක් තිබුණු වකවානුවේ ඒ ගැන සොයා බලන්න මමත් එතැනට ගියා. එතකොට අපි එතැනින් එළියට එන වාහනවලට වෙනත් මාර්ගයකින් එළියට එන්න අවශ්‍ය පහසුකම් සැලසුවා. එවැනි ක්‍රියාදාම අපි සිදු කරනවා. ඔබතුමා මතු කරපු කාරණය අනුව අපි online tickets මිලදී ගැනීමේ හැකියාවත් ඉස්සරහට ඇති කරනවා. ඉතාම ඉක්මනට ඒ කටයුතු සකස් කර අවසන් කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම ස්ථානවල පවතින වැසිකිළි සහ කැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නැහැ කියන එක ඔබතුමාට මතක් කරන ගමන්, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහනවා.

[ගරු තිළිණ සමරකෝන් මහතා]

වනඅලි සම්බන්ධව විශේෂයෙන්ම කථා බහට ලක් වුණු කාල සීමාවක් තමයි, මේ කාල සීමාව. විශේෂයෙන්ම වනඅලින්ට යම් හානි වාර්තා වුණු කාල සීමාවක් තමයි, මේ කාල සීමාව. විශේෂයෙන්ම කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මහදිවුල්වැව කියන ග්‍රාම නිලධාරි වසම ආශ්‍රිතව රිටිගල කන්දට ආසන්නයෙන් "යාන් ඔය යෝජිත ඇත් අතුරු සෙවණ" කියලා 2019 වර්ෂයේ අගෝස්තු මාසයේදී ඇත් අතුරු සෙවණක් විවෘත කරලා තිබෙනවා. එතැන ඒ ඇත් අතුරු සෙවණට අදාළ මූලික පහසුකම් ටික හදලා තිබෙනවා. අලි ඇතුන් බලා ගැනීමට සහ පැටවුන් බලා ගැනීමට අදාළව ගොඩනැඟිලි සහ අලි නැවීමට අදාළ පොකුණු, ඒ වාගේම වනජීවී ඒකකයක් පවා ස්ථාපිත කරලා තිබෙනවා. හැබැයි, ඒක යම් කිසි කෙටි කාලයක් එම ස්ථානයේ ක්‍රියාත්මක කිරීමෙන් පස්සේ, ආපහු නව වනජීවී ඇමතිවරයෙක් පත් වුණාට පස්සේ, ඒ ඇත් අතුරු සෙවණේ හිටපු අලි ටික සහ ඒ ආශ්‍රිත උපකරණ ටික නැවත එතුමාගේ දිස්ත්‍රික්කයට අරගෙන ගිහින් ඒ දිස්ත්‍රික්කයේ ඒක පිහිටුවා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වනඅලින්ගේ ප්‍රශ්නය යම් කිසි විධියකට කළමනාකරණය කිරීම සඳහා ඒක නැවත සක්‍රිය කිරීමට හැකියාවක් නැද්ද?

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, මට මතක විධියට එම ඇමතිවරුන් දෙපළම නියෝජනය කරන්නේ අනුරාධපුරය දිස්ත්‍රික්කය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සොයා බැලීමේදී මහදිවුල්වැව අලි සුරක්ෂිත මධ්‍යස්ථානය, එහෙම නැත්නම් ඇත් අතුරු සෙවණ පිළිබඳව නිසි අධ්‍යයනයක් කර නොමැති බව දැනගන්න ලැබුණා. *[බාධා කිරීමක්]* මහදිවුල්වැව ප්‍රදේශයේ තිබෙන ජල ප්‍රශ්නයක් නිසා තමයි, ඒක දිගටම එතැන පවත්වා ගෙන යෑමේ අපහසුතාවක් මතු වෙලා තිබෙන්නේ. ඊට පස්සේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒ ජල මූලාශ්‍ර සම්බන්ධයෙන් ටිකක් ලොකු පරීක්ෂණයක් කරලා තිබුණා. නමුත් අවශ්‍ය කරන ජල මූලාශ්‍ර සොයා ගැනීමේ අපහසුතාව තිබුණා. මොකද, එතැන තිබෙන මහදිවුල්වැව කියන වැව පදනම් කරගෙන මෙම ස්ථානය පිහිටුවා තිබුණත්, පායන කාලයේදී ජලය හොඳටම අඩු වුණාම ජලය ලබා ගැනීමේ අපහසුතාව නිසා තමයි ඒක එතැනින් ඉවත් කර තිබෙන්නේ. නමුත්, ඔබතුමා මතු කරපු ආකාරයට වනජීවී අමාත්‍යවරයාගේ දිස්ත්‍රික්කය මාරුවීමත් ඒකට උත්තේජනයක් වෙන්න ඇති. ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් මේ වනකොට අපි උඩවලවේ වාගේම පොළොන්නරුවේත් ඇත් අතුරු සෙවණක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරගෙන යනවා. එතැනට ජලය ලබා ගන්නේ පරාක්‍රම සමුද්‍රයෙන්. සංචාරක ව්‍යාපාරයත් කේන්ද්‍ර කර ගනිමින් මෙම ඇත් අතුරු සෙවණ නිර්මාණය කරන්න අවශ්‍ය කටයුතු අපි මේ වනකොට සූදානම් කරමින් පවතිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -2471/2026- (1), ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුත්තලම දිස්ත්‍රික්කය: ආර්ථික මධ්‍යස්ථානයක් නොමැතිකම
புத்தளம் மாவட்டம்: பொருளாதார மத்திய நிலையம் இன்மை
PUTTALAM DISTRICT: LACK OF ECONOMIC CENTRE

2506/2026

10.ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අස්වනු කළමනාකරණය සඳහා නිසි ආර්ථික මධ්‍යස්ථානයක් නොමැති වීම හේතුවෙන් ගොවීන්ට සහ ධීවරයන්ට සිදුවන ආර්ථික පාඩුව පිළිබඳ අමාත්‍යාංශය සතුව දත්ත වාර්තා පවතින්නේද;

(ii) බහුල වශයෙන් අස්වනු ලැබෙන කාලවලදී මෙම ප්‍රදේශවල ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් ආහාර නාස්තිය සිදුවන බවත්, එය ජාතික ආහාර සුරක්ෂිතතාවට සෘජුවම බලපාන බවත් පිළිගන්නේද;

(iii) පුත්තලම දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් නවීන පහසුකම් සහිත ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එවැනි ආර්ථික මධ්‍යස්ථානයක් මඟින් අස්වනු නාස්තිය අවම කිරීමට සහ අතිරික්ත අස්වනු අගය එකතු කළ නිෂ්පාදන බවට පත් කිරීමට ඇති සැලසුම් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය සහ ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் அறுவடை முகாமைத்துவத்துக்கான முறையான பொருளாதார மத்திய நிலையமொன்று இன்மையால் விவசாயிகள் மற்றும் மீனவர்கள் எதிர்நோக்கும் பொருளாதார ரீதியான நட்டம் தொடர்பில் அமைச்சிடம் தரவு அறிக்கைகள் காணப்படுகின்றனவா என்பதையும்;

(ii) பெருமளவில் அறுவடை செய்யப்படும் காலப்பகுதிகளில் இப்பிரதேசங்களில் களஞ்சிய

வசதிகள் இன்மையால் உணவு வீண்விரயம் ஏற்படுவதுடன், அது தேசிய உணவுப் பாதுகாப்பை நேரடியாகப் பாதிக்கின்றது என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) புத்தளம் மாவட்டத்தை மையமாகக்கொண்டு நவீன வசதிகளுடன்கூடிய பொருளாதார மத்திய நிலையமொன்றை நிறுவுவதற்காக அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அவ்வாறான பொருளாதார மத்திய நிலையமொன்றின் மூலம் அறுவடை வீண்விரயத்தை குறைப்பதற்கும் மேலதிக அறுவடைகளை பெறுமதி சேர்க்கப்பட்ட உற்பத்திப் பொருட்களாக மாற்றுவதற்கும் உள்ள திட்டங்கள் யாவை என்பதையும்;

(ii) அத்திட்டத்தை ஆரம்பிப்பதற்கு எதிர்பார்க்கப் படும் திகதி மற்றும் அதற்கான நிதி ஒதுக்கீட்டின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether the Ministry possesses data regarding the economic losses incurred by farmers and fishermen in the Puttalam District due to the absence of a suitable Economic Centre to manage their harvest;

(ii) whether he admits that wastage of food occurs during high-yielding seasons owing to the lack of storage facilities in these areas, and that this directly impacts national food security; and

(iii) the steps that have been taken by the Government to establish an Economic Centre in the Puttalam District equipped with modern facilities?

(b) Will he also inform this House the -

(i) plans to minimize post-harvest wastage and to convert surplus yield into value-added products through such an Economic Centre; and

(ii) expected date of commencement of the said project and the amount of funds allocated for it?

(c) If not, why?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය මත මට පොඩි කාරණයක් කියන්න තිබෙනවා. මම මැදින් බාධා කරන්න හදනවා නොවෙයි. අද දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ අපේ නීතිඥ හේෂා විතානගේ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්න අංක 01 යටතේ අතුරු ප්‍රශ්නවලදී යම් පැහැදිලි කර ගැනීමක් ගැන ඇහුවා. එම පැහැදිලි කිරීම සඳහා මම මේ වෙලාවේ විනාඩියක කාලයක් ලබා ගන්නවා, ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න කලින්.

ගරු කථානායකතුමනි, 2015 යහ පාලන ආණ්ඩුව පැවති කාලයේ හිටපු ඇමතිවරුන් කිහිප දෙනෙකු ගැන මා සඳහන් කළා. විපක්ෂ නායකතුමා සහ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, ඒ ඇමතිවරුන් ඒ කාලයේ හිටියේ නැහැ කියලා. නමුත් ගාමිණී ජයවික්‍රම පෙරේරා තමයි 2015 ජනවාරි සිට නොවැම්බර් දක්වා Minister of Food Security විධියට කටයුතු කර තිබෙන්නේ. එතුමා යටතේ තමයි Mahapola Higher Education Scholarship Trust Fund තිබුණේ. Dr. Sarath Amunugama තමයි Minister of Higher Education and Research. ඒ නිසා තමයි එතුමා අතැනට යන්නේ. එතුමාත් ඒ Board එකේ member කෙනෙක්. මේගොල්ලන් මලික් සමරවික්‍රම කෙනෙක් ගැන අපට කියන්න හැදුවා. මලික් සමරවික්‍රම 2015 නොවැම්බර් මාසයේ තමයි Minister of Development Strategies and International Trade වෙන්නේ. අදාළ පනත අනුව වෙළෙඳ අමාත්‍යාංශය යටතේ තමයි මහපොළ භාරකාර අරමුදල තිබෙන්න ඕනෑ. 2015 නොවැම්බර් මාසයෙන් පසුව තමයි මලික් සමරවික්‍රම මෙම අමාත්‍යාංශය භාරව එන්නේ. එතකොට 2015 මැයි මාසයේ සීල් එක කරලා ඉවරයි. විජයදාස රාජපක්ෂ මහත්තයා 2018දී උසස් අධ්‍යාපන විෂය භාරව පත් වෙනවා. එතුමා කැබිනට් පත්‍රිකා දමනවා. එතකොට යහ පාලන ආණ්ඩුව ඒක ප්‍රතික්ෂේප කර තිබෙනවා. 2018-2019 කාලයේ රවුල් හකීම් මහත්මයාත් පොඩි කාලයකට ඉන්නවා. ඒ නිසා හේෂා විතානගේ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාව තුළ නැති වුණත්, එතුමා කොහේ හරි ඉඳගෙන මේක අහගෙන ඉන්නවා ඇති කියලා මම හිතනවා. මොකද, මේගොල්ලන් එතුමාත් නොමහ යවනවා; රටත් නොමහ යවන්න හදනවා. කෙසේ වෙතත්, ගාමිණී ජයවික්‍රම පෙරේරා සහ සරත් අමුණුගම කියන දෙදෙනා ගිහින් තමයි ඒ කැත සීල් එක කළේ.

ගරු කථානායකතුමනි, ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) ඔව්.

(iii) පුත්තලම දිස්ත්‍රික්කයේ එළවලු හා පලතුරු අස්වනු ගබඩා කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම මෙන්ම ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතුව ඇත. මේ වන විට ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම සඳහා පූර්ණ රාජ්‍ය සමාගමක් වන සී/ස නැෂනල් ඇග්‍රි මාර්කට් සර්විසස් සමාගම ස්ථාපිත කර ඇති අතර, එම සමාගම විසින් ශක්‍යතා අධ්‍යයනයක් ඉදිරියේදී සිදු කරනු ඇත.

(ආ) (i) අදාළ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමෙන් පසු ඉදිරි සැලසුම් සකස් කරනු ඇත.

(ii) මෙතෙක් ඒ සඳහා තීරණයක් ගෙන නොමැත.

(ඇ) අදාළ නොවේ.

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, රටේ කෘෂිකාර්මික නිෂ්පාදිතය ගැන කථා කිරීමේදී මා විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ කාරණය. දළ දේශීය නිෂ්පාදිතයට වැඩි දායකත්වයක් සපයන වයඹ පළාතේ,

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි එකම සහ ප්‍රධානම ආර්ථික මධ්‍යස්ථානය තමයි නොරොච්චෝල කෘෂි ආර්ථික මධ්‍යස්ථානය. නමුත් මේ ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අව්, වැසි ආවරණ සහිතව නිසි සැලැස්මකට අනුව සිදු නොවීමේ අඩුපාඩු සහ කාලයක් තිස්සේ එය නිසි ලෙස නඩත්තු නොකිරීමත් හේතුවෙන් වර්තමානය වනවිට එහි යටිතල පහසුකම් සහ පොළක මට්ටමක තරමිවත් නොමැති තත්ත්වයකට පත්ව තිබෙනවා. මේ හේතුවෙන් දිනපතා එළවලු විශාල ප්‍රමාණයක් නාස්ති වන තත්ත්වයක්ද උද්ගත වෙලා තිබෙනවා. ඒ අනුව, මෙම නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මේ වනවිට අමාත්‍යාංශය හැටියට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා ගරු අමාත්‍යතුමාගෙන් දැනගැනීමට කැමැතියි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)

ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමියනි. ඔබතුමියගේ අවධානය සඳහා මම ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරන්නම්. නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන National Agri Marketing Services Limited එක යටතට ගැනෙන්නේ නැහැ. රට පුරා ආර්ථික මධ්‍යස්ථාන 18ක් තිබෙනවා. වයඹ පළාතේ, වාරියපොල මේ වාගේ හදපු තවත් ආර්ථික මධ්‍යස්ථානයක් තිබෙනවා. එම ආර්ථික මධ්‍යස්ථානයට මේ වනවිට අයිතිකාරයෙක් නොමැති නිසා එය අප වෙත පවරා ගන්න කියලා පළාත් සභාව විසින් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, හැබැයි නොරොච්චෝලේ තිබෙන ආර්ථික මධ්‍යස්ථානය පළාත් පාලන ආයතන හරහා අදාළ ප්‍රාදේශීය සභාවට තමයි භාර දීලා තිබෙන්නේ.

ඔබතුමිය සඳහන් කළ කාරණය නිවැරදියි. පළාත් පාලන ආයතනයකට මෙම ආර්ථික මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා අවශ්‍ය රුපියල් මිලියන 100ක හෝ 150ක පමණ ප්‍රාග්ධන වියදමක් එකවර දැරීම අපහසුයි. ගරු කථානායකතුමනි, නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය අදාළ පළාත් පාලන ආයතනයට ආදායම් උපදවන ප්‍රභවයක් ලෙස තමයි තිබෙන්නේ. කෙසේ වෙතත්, විශාල වශයෙන් එළවලු නිෂ්පාදනය සිදු වන ප්‍රදේශයක් හැටියට පුත්තලම දිස්ත්‍රික්කයේ නොරොච්චෝලේ පිහිටි මෙම ආර්ථික මධ්‍යස්ථානය නිසි ලෙස කළමනාකරණය කිරීමත්, නඩත්තු කිරීමත්, ඊට අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කිරීමේ අවශ්‍යතාවත් තිබෙන බව අපි පිළිගන්නවා. එම නිසා මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට නම් පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලන කොමසාරිස්වරයා හරහා ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම සිදු කළ යුතුයි. ඒ අනුව, පළාත් පාලන අමාත්‍යාංශයට වෙන් කරන මුදල් ප්‍රතිපාදනවලින් කල්පිටිය ප්‍රාදේශීය සභාවට අවශ්‍ය මුදල් වෙන් කරවාගෙන, එම ආයතනය හරහා මෙහි සංවර්ධන කටයුතු සිදු කළ හැකියි. එසේ නොහැකි නම්, ඔබතුමියලා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙන් මේ සම්බන්ධ යෝජනාවක් සම්මත කරගන්න. ඉන් අනතුරුව ඉදිරියේදී ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට අපට හැකියාව තිබෙනවා. අපි අදාළ පළාත් පාලන ආයතනයත්, පළාත් පාලන කොමසාරිස්වරයාත් සම්බන්ධ කරගෙන, National Agri Marketing Services Limited එකත් එක්ක ඒකාබද්ධව මේ පිළිබඳව සාකච්ඡා කරලා ඉදිරි වැඩ පිළිවෙළක් සකස් කර ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරමු. ඒ වාගේම, එම යෝජනාවට අනුව අපි ඉදිරියේදී කටයුතු කරමු. එහෙම වුණොත් මෙම ආර්ථික මධ්‍යස්ථානයේ පවතින ගැටලු විසඳීමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා අපට උදව් කරන්න පුළුවන්.

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(*மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ*)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

පිළිතුරු ලබා දුන්නාට ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. නිෂ්පාදන තොග වෙළෙඳාම සම්බන්ධයෙන් ගත්තාම, නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය බොහෝ වෙලාවට පුත්තලම, කල්පිටිය ප්‍රදේශයේ නිෂ්පාදන කටයුතු සඳහා තමයි සීමා වෙලා තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය වාගේ ඒවා ස්ථාපනය කිරීම දිස්ත්‍රික්කයට දැඩි අවශ්‍යතාවක්ව තිබෙනවා. විශේෂයෙන්ම ආණමඩුව තමයි ඊළඟට මෙම දිස්ත්‍රික්කයේ වැඩිපුරම නිෂ්පාදන දායකත්වයක් සපයන්නේ. ඔබතුමා සඳහන් කරපු ආකාරයට රටේ අවශ්‍යතාව අනුව ආණමඩුව ප්‍රදේශය ආශ්‍රිතව ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් දැන් ඉදිරි සැලසුම් සකස් කරගෙන යනවා.

විශේෂයෙන් ඔබතුමා කිව්වා වාගේ නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය තවදුරටත් ප්‍රාදේශීය සභාව සතුව තබමින් ඒ සංවර්ධන කටයුතුවලට පළාත් සභා මට්ටමින් මැදිහත් වීම වෙළෙඳ අමාත්‍යාංශයත් සම්බන්ධ කරගෙන අපට සිදු කරලා දෙන්න. ඒ විධියටම ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයක් දිස්ත්‍රික්කයේ ස්ථාපනය කිරීමටත් අපිට අවශ්‍ය කටයුතු සලසා දෙන්න. නිසි අයිතිකාරයෙක් සහිතව සහ වෙළෙඳ අමාත්‍යාංශයේ භාරකාරත්වය සහිතව එය ලබා දෙන්න කියන එකයි අවසානයේදී යෝජනාවක් හැටියට කරන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඉදිරිපත් කළ යෝජනාව වැදගත්. නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය පළාත් සභා සහ පාලන අමාත්‍යාංශය යටතේ, කල්පිටිය ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වීම පිළිබඳව අපිට ගැටලුවක් නැහැ. ඒ අයගේ ආදායම් ප්‍රභවයක් ලෙස තමයි මෙම ආර්ථික මධ්‍යස්ථානය පවත්වාගෙන යන්නේ. ඒ ආර්ථික මධ්‍යස්ථානය දියුණු කරන්න අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ මුදල් වෙන් කරදීමක් සඳහා වෙච්ච මැදිහත් වීම අමාත්‍යාංශය හැටියටත් අපේ පැත්තෙන් සිදු කරන්න අපි කටයුතු කරන්නම්.

ඒ වාගේම, ඔබතුමිය මතු කරපු දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. කල්පිටිය සහ නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථාන එහෙමම තිබියදී දිස්ත්‍රික්කයේ සිටින එළවලු සහ පලතුරු නිෂ්පාදකයන්ට එම දිස්ත්‍රික්කය මූලික කරගෙන ආර්ථික මධ්‍යස්ථානයක් ගොඩනැඟෙනවා. ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මේ සමාගම ගොඩනඟන්න කටයුතු කරනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා යටතේ තමයි මේ National Agri Marketing Services Limited එක තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ වෙලාවේදී මුදල් අමාත්‍යාංශය පැත්තෙන් ගරු ජනාධිපතිතුමා ලබා දුන් උපදෙස තමයි, රටේ ශක්‍යතා අධ්‍යනයක් සිදු කර ඒ අවශ්‍යතා බලලා නව ආර්ථික මධ්‍යස්ථාන ඇති කරන්න වුවමනා තැන්වල ඒවා ඇති කරන්න කියන එක. එහෙම නැත්නම් ආණමඩුව, පල්ලම සහ හලාවත ආදී ප්‍රදේශවල ජනතාවට එක්කෝ කල්පිටියට හෝ තඹුත්තේගමට, නැත්නම් දඹුල්ලට යන්න වෙනවා. ප්‍රවාහනයේදී මේ පසු අස්වනු හානිය විශාල ලෙස අපේ රටේ සිද්ධ වෙනවා. ඉදිරියේදී පසු අස්වනු තාක්ෂණය කොහොමද තව දියුණු කරන්නේ කියලා අපි සොයා බලනවා. ඒ වාගේම, මේ supply chain එකේ සිටින ගොවියාත්, මේ ආර්ථික මධ්‍යස්ථානත්, වෙළෙඳ පොළත්, අපනයන වෙළෙඳ පොළත් ඒකාබද්ධ කරගත්ත වැඩ පිළිවෙළකට යන්න අපි දැන් කටයුතු කරමින් ඉන්නවා.

මේ සමාගම ළඳරු සමාගමක්. මොකද, මේ ආර්ථික මධ්‍යස්ථාන රාජ්‍ය ආයතන 5ක්, 6ක් යටතේ තිබුණා. ගරු කථානායකතුමනි, දැන් මේ සියල්ල එක ආයතනයක් යටතට ගෙනැල්ලා තිබෙනවා. ඒ ආයතනය හරහා ඉදිරියේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවතද, ආණමඩුවද ඒ සඳහා සුදුසු ආදී වශයෙන් සාකච්ඡා කරලා, එම ශක්‍යතා අධ්‍යයනයෙන් පසුව නව ආර්ථික මධ්‍යස්ථානයක් ගොඩනඟන්න අවශ්‍ය කටයුතු කරන්න අපි අමාත්‍යාංශයක් විධියට සූදානම්. ඉදිරියේදී ඒ පිළිබඳව ඔබතුමියත් දැනුවත් කරලා, ඒකාබද්ධව මේ ගැන වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි කටයුතු කරමු. මේ ශක්‍යතා අධ්‍යයනයේදීත් අපට අවශ්‍ය සහාය ලබා දෙන්න. අපි ඒ සඳහා ඉදිරියේදී ඒකාබද්ධව කටයුතු කරලා දිස්ත්‍රික්කයට අවශ්‍ය ආර්ථික මධ්‍යස්ථානයක් සකස් කරන්න අවශ්‍ය කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

2024 සිට අස්වැසුම ප්‍රතිලාභය සඳහා වන අයදුම්පත්: වර්තමාන තත්ත්වය

2024 முதல் அஸ்வெசும நலன்புரி சலுகைகளுக்கான விண்ணப்பங்கள்: தற்போதைய நிலை

APPLICATIONS FOR ASWESUMA BENEFITS FROM 2024: CURRENT STATUS

688/2025

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අස්වැසුම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2024 වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම අයදුම්පත් අතරින් ක්‍රියාමාර්ග ගෙන ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මේ වනවිට එක්රැස්වී ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අයදුම්පත් නිසි පරිදි ඇගැයීමට ලක් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அஸ்வெசும நன்மைகளைப் பெற்றுக் கொள்வதற்காக 2024ஆம் ஆண்டிலிருந்து இதுவரையில் கிடைக்கப்பெற்றுள்ள விண்ணப்பங்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி விண்ணப்பங்களுள் இதுவரையில் நடவடிக்கை எடுக்கப்பட்டுள்ள விண்ணப்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) பிரதேச செயலகங்களில் இன்றளவில் நடவடிக்கை எடுக்க வேண்டியுள்ள விண்ணப்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி விண்ணப்பங்களை உரிய முறையில் மதிப்பீடு செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the number of applications that have been received by each Divisional Secretary's Division from the year 2024 to date to obtain Aswesuma benefits;

(ii) the number of applications on which action has been taken to date, out of the said applications;

(iii) the number of applications currently pending at the Divisional Secretariats; and

(iv) the measures that will be taken to properly evaluate the said applications?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)
- අස්වැසුම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2024 වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 4,651,471ක් වේ.
- මේ දක්වා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුමෙහි** දක්වා ඇත.

(ii) 3,702,229කි.

(iii) මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයදුම්පත් කිසිවක් එක්රැස් වී නොමැත.

(iv)
- 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතට අනුව 2022 අංක 01 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම සඳහා පනවන ලද නියෝග මාලාවෙහි මෙම ක්‍රමවේදය දක්වා තිබේ. ඒ අනුව, එම නියෝග පළවන උපලේඛනයෙහි සඳහන් කර ඇති තේරීම් උපමාන යටතේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සඳහා ඉල්ලුම් කිරීමට කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තෙකු වෙත ඉල්ලීමක් කරමින් යටත් පිරිසෙන් සිංහල හා දෙමළ භාෂාවෙන් දැන්වීමක් පළ කරනු ලැබේ.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

- එම නියෝගයෙහි ඉල්ලුම් කිරීමට ඇති සුදුසුකම්, ඉල්ලුම් කරනු ලබන ආකාරය සහ කාල සීමාව සඳහන් කරනු ලැබේ.
- ඒ අනුව, සුදුසු තැනැත්තන් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලුම් පත්‍රයක් දෙවන උපලේඛනයෙන් දක්වා ඇති ආකෘතියෙන් ඉදිරිපත් කරනු ලැබේ.
- එම ඉල්ලුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිහිටුවන ලද තේරීම් කමිටු මඟින් සලකා බලනු ලැබේ. එම නියෝගයෙහි දෙවන කොටසෙහි දක්වා ඇති පරිදි සුබසාධක ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය. (ඉලෙක්ට්‍රොනිකව සහ අන්‍යාකාරයකින්)
- එම තේරීම් කමිටුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර අධ්‍යක්ෂ හෝ ගණකාධිකාරිවරයා යටතේ පිහිටුවනු ලැබේ.
- තේරීම් කමිටුව විසින් ඉල්ලුම්කරුගේ ප්‍රකාශවල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම හා නිශ්චය කිරීම පිණිස සමීක්ෂණ නිලධාරියෙකු ලවා තහවුරු කර ගැනීමෙන් අනතුරුව සුදුසු නිර්දේශ සහිතව ලැයිස්තුවක් පිළියෙළ කර ප්‍රාදේශීය ලේකම්ගේ පිටසන සහිතව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.
- සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පනතේ 11වන වගන්තිය ප්‍රකාරව ඉල්ලුම්කරුවන්ගේ ලැයිස්තුවක් ඇතුළත් දැන්වීමක් පළ කරනු ලැබේ.
- එම දැන්වීමේ පළවන නාම ලේඛනය සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට පනතේ 11වන වගන්තිය ප්‍රකාරව දින 10ක කාලයක් ලබා දෙනු ලැබේ.
- එම අභියාචනා පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයාගේ මූලිකත්වයෙන් පිහිටුවනු ලබන අභියාචනා කමිටුව විසින් මසක කාලයකදී පරීක්ෂා කර බලා සුදුසු තීරණය සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස් වෙත දැනුම් දෙනු ලැබේ. ඒ අනුව, මණ්ඩලයේ අනුමැතිය ලබා දීමට කටයුතු කරනු ලැබේ.
- මෙම තෝරා ගැනීම සඳහා යටෝක්ත නියෝගවල සඳහන්, පළමුවන උපලේඛනයෙහි සඳහන් තේරීම් උපමාන පදනම් කරගෙන ප්‍රධාන මානයන් 6ක් හා දර්ශක 22ක් යටතේ සිදු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

විදේශ ශ්‍රමිකයන් සඳහා විද්‍යුත් වාහන ආනයනය කිරීමේ විශේෂ වැඩසටහන: අක්‍රමිකතා

புலம்பெயர் பணியாளர்களுக்காக மின்சார வாகனங்களை இறக்குமதி செய்யும் விசேட வேலைத்திட்டம்: முறைகேடுகள்

SPECIAL PROGRAMME FOR MIGRANT WORKERS TO IMPORT ELECTRIC VEHICLES: IRREGULARITIES

989/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදේශ ශ්‍රමිකයන් සඳහා විද්‍යුත් වාහන ආනයනය කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) ඒ යටතේ මෙරටට ආනයනය කර ඇති විද්‍යුත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) වැඩසටහන සඳහා අනුගමනය කළ සුදුසුකම් ලැබීමේ නිර්ණායක කවරේද;

(iv) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අක්‍රමිකතා හෝ දූෂණ සිදුවී ඇති බවට ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புலம்பெயர் பணியாளர்களுக்காக மின்சாரத்தில் இயங்கும் வாகனங்களை இறக்குமதி செய்யும் விசேட வேலைத்திட்டமொன்று நடைமுறைப் படுத்தப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) அதன்கீழ் இந்நாட்டுக்கு இறக்குமதி செய்யப் பட்ட மின்சாரத்தில் இயங்கும் வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இவ்வேலைத்திட்டத்துக்காக பின்பற்றப்பட்ட தகைமைகளைப் பூர்த்திசெய்யும் அளவு கோல்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி வேலைத்திட்டத்தை நடைமுறைப் படுத்தும்போது முறைகேடுகள் அல்லது ஊழல்கள் இடம்பெற்றுள்ளதாகக் கிடைக்கப் பெற்றுள்ள முறைப்பாடுகள் சம்பந்தமாக விசாரணையொன்று நடத்தப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அதற்காகப் பொறுப்புக்கூற வேண்டிய நபர்களுக்கு எதிராக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House-

(i) whether he is aware that a special programme for the importation of electric vehicles for migrant workers has been implemented;

(ii) the number of electric vehicles that have been imported into the country under the said programme;

(iii) the eligibility criteria that were adopted for the said programme;

(iv) whether an investigation has been conducted into complaints received alleging that irregularities or acts of corruption have occurred in the implementation of the said programme; and

(v) if so, the measures that will be taken against the persons responsible therefor?

(b) If not, why?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 920කි.

(iii) 2022.05.01 දින සිට 2023.09.15 දින හෝ වාහන බලපත්‍රය අයදුම් කරන දින දක්වා මිලදී ගැනීමට අපේක්ෂා කරන වාහනයේ CIF වටිනාකම මෙන් දෙගුණයක හෝ ඊට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ප්‍රේෂණය කළ විදේශ රැකියාවක නියුතු පුද්ගලයෙකු වීම.

(iv) මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනයක්ද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ දෙකක්ද සිදු කරමින් පවතී.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.04.02 සිදු කරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඇතුළත් 2025.10.24 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 318 දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 119(4) හි විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත.

(v) ඉහත පරීක්ෂණවලින් අනතුරුව එම ආයතන විසින් මෙම ක්‍රියාවලියේදී යම් අක්‍රමිකතාවක් හෝ දූෂණයක් හෝ සිදු කර ඇත්නම් ඊට අදාළ නෛතික පියවර ගනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මත්ස්‍ය නිෂ්පාදනයේදී පසු අස්වනු හානි අවම කිරීම
மீன் உற்பத்தியில் அறுவடைக்குப் பிந்திய இழப்பைக் குறைத்தல்
MINIMIZATION OF POST-HARVEST LOSSES IN FISH PRODUCTION

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

2026.10.27වන දින ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනයෙන් ආසන්න වශයෙන් සියයට 40ක් පසු අස්වනු හානි - post-harvest losses - හේතුවෙන් අහිමි වන බව අනාවරණය කරන ලදී.

වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 360,000 ඉක්මවන තත්ත්වයක් තුළ මෙවැනි හානි හේතුවෙන් රුපියල් බිලියන ගණනක ආදායමක් අහිමි විය හැකි අතර, එය ධීවර ජනතාවගේ ආදායමට, පාරිභෝගිකයන්ට, ආහාර සුරක්ෂිතතාවට සහ අපනයන ආදායමට අහිතකර ලෙස බලපායි. මෙම හානි අවම කිරීම තුළින් සාගර සම්පත් මත අතිරේක පීඩනයක් ඇති නොකර මත්ස්‍ය සැපයුම සහ ආර්ථික ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය හැකිය.

ඒ අනුව, ධීවර අමාත්‍යතුමා පහත සඳහන් කරුණු පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කරන්නේද?

1. 2021 සිට 2025 දක්වා එක් එක් වර්ෂයේදී සහ 2026 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය කොපමණද? වෙරළාසන්න, අක්වෙරළ, ගැඹුරු මුහුදු, අභ්‍යන්තර ජල ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව වශයෙන් වෙන් වෙන්ව එම දත්ත ඉදිරිපත් කරන්නේද? 2027 සහ 2028 වර්ෂ සඳහා නිෂ්පාදන ඉලක්ක මොනවාද? නිල වශයෙන් ලියාපදිංචි වී සිටින ධීවරයන් සංඛ්‍යාව කොපමණද?
2. ජනාධිපතිතුමා ප්‍රකාශ කළ සියයට 40ක පසු අස්වනු හානිය තහවුරු කරන විද්‍යාත්මක සමීක්ෂණය - scientific process - හෝ පර්යේෂණ වාර්තාව කුමක්ද? මෙම ප්‍රතිශතය සාගර ධීවර කර්මාන්තයට, අභ්‍යන්තර ජල ධීවර කර්මාන්තයට සහ ජලජීවී වගාවට එක සේ අදාළ වන්නේද? එක් එක් අංශයේ සිදු වන හානි ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් සහ ප්‍රතිශතයක් ලෙස කොපමණද?
3. 2021 සිට 2026 දක්වා එක් එක් වර්ෂයේදී පසු අස්වනු හානි හේතුවෙන් සිදු වූ සමස්ත මූල්‍යමය පාඩුව ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද? භෞතික වශයෙන් අපතේ යෑම, ගුණාත්මකභාවය පහත වැටීම සහ වෙළෙඳ පොළ වටිනාකම අඩු වීම යන අංග වෙන් වෙන්ව ගණනය කර තිබේද? එමඟින් ධීවර ජනතාවට අහිමි වූ ආදායම කොපමණද?
4. 2025 වර්ෂයේදී සහ 2026 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන අපනයනයෙන් උපයා ගත් විදේශ විනිමය ප්‍රමාණය සහ අපනයන පරිමාව කොපමණද? නැවුම්, ශීත කළ, සැකසූ මත්ස්‍ය නිෂ්පාදන සහ ජලජීවී වගා නිෂ්පාදන වශයෙන් එම දත්ත වෙන් වෙන්ව ඉදිරිපත් කරන්නේද? පසු අස්වනු හානි අවම කිරීමෙන් අතිරේකව උපයා ගත හැකි විදේශ විනිමය ප්‍රමාණය කොපමණද?
5. මත්ස්‍ය අස්වනු නෙළීමෙන් පසු ඒවා ධීවර යාත්‍රා තුළ, ගොඩබෑමේ ස්ථානවල ගබඩා කිරීමේදී, ප්‍රවාහනයේදී, තොග වෙළෙඳාමේදී සහ සිල්ලර වෙළෙඳාමේදී වැඩිම හානි සිදු වන්නේ කුමන අවස්ථාවලදීද? ශීතකරණ පහසුකම්, අයිස් නිෂ්පාදනය, ශීතාගාර, මත්ස්‍ය හැසිරවීම සහ සැකසුම් යටිතල පහසුකම්වල පවතින ප්‍රධාන අඩුපාඩු මොනවාද?

   ජනාධිපතිතුමා කියපු කාරණයට මේක වැදගත් වෙනවා. මොකද, මාළු නිෂ්පාදනය අඩු වීමට මේවා හේතු වෙලා තිබෙනවා.
6. මෙම හානි අවම කිරීම සඳහා නවීන මත්ස්‍ය සංරක්ෂණ තාක්ෂණය, ශීතකරණ සහිත ප්‍රවාහන පහසුකම්, ධීවර වරාය හා ගොඩබෑමේ පහසුකම් වැඩිදියුණු කිරීම, මත්ස්‍ය සැකසුම් කර්මාන්තය, ධීවර පුහුණුව සහ පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම සම්බන්ධයෙන් රජය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන නිශ්චිත වැඩ පිළිවෙළ කුමක්ද?
7. 2021 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා පසු අස්වනු හානි අවම කිරීම සඳහා රජය වැය කළ මුදල කොපමණද? එම ව්‍යයම් මඟින් ලබා ගත් ප්‍රතිඵල මොනවාද? 2028 වර්ෂය වනවිට පසු අස්වනු හානි - post-harvest losses - සියයට

[ගරු රවී කරුණානායක මහතා]

40 සිට සියයට 20 දක්වා අඩු කිරීමේ ජාතික වැඩසටහනක් ස්ථාපිත කිරීමට රජය සූදානම්ද? එසේ නම්, වාර්ෂික ඉලක්ක, වගකිව යුතු ආයතනවලට සහ කීවරයන්ට, පාරිභෝගිකයන්ට හා අපනයනකරුවන්ට ලැබෙන අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ මොනවාද?

8. පසු අස්වනු හානි ලෙස ගණනය කර ඇති මත්ස්‍ය ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් කරවල ඇතුළු වියළි මත්ස්‍ය නිෂ්පාදන සහ වෙනත් අගය එකතු කළ නිෂ්පාදන බවට පරිවර්තනය කර තිබේද? නැවුම් මත්ස්‍ය ලෙස අළෙවි කිරීමේදී ලැබිය හැකි වටිනාකම සහ කරවල හෝ වෙනත් සැකසූ නිෂ්පාදනයක් ලෙස අළෙවි කිරීමෙන් ලැබෙන වටිනාකම අතර වෙනස ගණනය කර තිබේද? එසේ නම්, සැබෑ පසු අස්වනු හානිය සහ අගය එකතු කළ නිෂ්පාදනය අතර වෙනස පැහැදිලිව හඳුනාගෙන සියයට 40ක හානි ඇස්තමේන්තුව සකස් කර තිබේද?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

II

1990දී උතුරෙන් බලහත්කාරයෙන් පලවා හරින ලද මුස්ලිම් ජාතිකයින්ට සියලු අයිතිවාසිකම් ලබා දීම

1990 இல் வடக்கிலிருந்து பலவந்தமாக வெளியேற்றப் பட்ட முஸ்லிம்களுக்கு சகல உரிமைகளையும் பெற்றுக்கொடுத்தல்

GRANT OF ALL RIGHTS TO MUSLIMS FORCIBLY EVICTED FROM NORTH IN 1990

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

1990ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் தமிழீழ விடுதலைப் புலிகள் அமைப்பினர் வட மாகாணத்திலிருந்து 80,000க்கும் மேற்பட்ட முஸ்லிம்களை ஆயுதமுனையில் பலவந்தமாக வெளியேற்றினர். அதனை அவர்களே பத்திரிகையாளர் சந்திப்பொன்றில் ஏற்றுக்கொண்டதோடு, மீண்டும் அவர்கள் அம்மக்களுக்குச் சொந்தமான இடங்களில் குடியமரலாமெனவும் கூறியிருந்தனர். அவர்களில் பெரும்பாலானோர் புத்தளம், அநுராதபுரம், குருநாகல் உள்ளிட்ட பல மாவட்டங்களில் அடைக்கலம் தேடினர். அன்றிலிருந்து தொடர்ந்து ஆதரவளித்துவரும் மேற்குறித்த மாவட்ட மக்களையும் ஏனையோரையும் அரச அதிகாரிகளையும் தனியார் நிறுவனங்களையும் நான் நன்றியுடன் நினைவுகூருகின்றேன்.

36 ஆண்டுகள் கடந்த பின்னரும் அவர்களின் மீள்குடியேற்றம் இன்னும் முழுமையடையவில்லை. ஏனைய யுத்தம் சார்ந்த இடப்பெயர்வுகளில் இருந்து வேறுபட்ட இந்த வெளியேற்றமும் நீடித்த இடப்பெயர்வும் கௌரவமான மீள்திரும்புகை, ஒருங்கிணைவு, நல்லிணக்கம், சகவாழ்வு ஆகியவற்றை உள்ளடக்கிய அவற்றுக்கே உரித்தான நிலையான தீர்வுகளை வேண்டிநிற்கின்றன. ஆயினும், இப்பெரும் தேசியப் பேரவலம் அரசால் இன்னும் அங்கீகரிக்கப்படாமலும், தேசிய உரையாடலில் இடம்பெறாமலும் உள்ளது. இது தொடர்பில் இதுவரை எந்தவோர் அரச விசாரணையும் நடத்தப்படவில்லை. இருப்பினும், சர்வதேசத்தால் மிகவும் மதிக்கப்படுகின்ற இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவால் 2026 ஒக்ரோபர் மாதத்தில் வெளியிடப்பட்ட அறிக்கையின் 32ஆம் பக்கத்திலிருந்து 37ஆம் பக்கம் வரையான பகுதியில் இந்த இடப்பெயர்வு சம்பந்தமான அநீதிகளும் தீர்வின்மையும் பற்றி குறிப்பிடப்பட்டுள்ளது.

இந்த அறிக்கையுடன், நோர்வே அகதிகள் பேரவையின் வேண்டுகோளுக்கிணங்க கொள்கை மாற்றத்துக்கான நிலையம் 2013ஆம் ஆண்டு வெளியிட்ட அறிக்கை, NRC/ iDMC - நோர்வே அகதிகள் பேரவையின் உள்ளக இடப்பெயர்வு கண்காணிப்பு நிலையத்தால் 2014இல் யுத்தம் முடிந்து 5 வருடங்களாகியும் இன்னமும் இடம்பெயர்ந்த மக்களின் பிரச்சினைக்குத் தீர்வு காணப்படாமல் உள்ளமை சம்பந்தமாக வெளியிட்ட அறிக்கை ஆகியவற்றின் பிரதிகளை நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

இடப்பெயர்வுக்குள்ளான குடும்பங்கள் பல உப குடும்பங்களாகப் பெருகி எவ்வித அரச ஒதுக்கீட்டுக் காணியும் ஏனைய நிவாரணங்களும் பெறாமை மற்றும் அவர்களின் விருப்பத்துக்கு மாறாக பூர்வீகப் பிரதேசங்களில் இருந்து வாக்குரிமையை நீக்கியமை இச்சமூகத்துக்குத் திட்டமிட்டுச் செய்த அநீதியாகும்.

பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்.

i. சனாதிபதி விசாரணை ஆணைக்குழு ஒன்றை நியமித்து, அதன்மூலம் வெளியேற்றத்தையும் தனித்துவத்தையும் ஆவணப்படுத்தி, 1990க்கு முன்னர் இச்சமூகம்

கொண்டிருந்த பொருளாதார, சமூக, கலாசார, கல்வி, காணிகள், உடைமைகள் ஆகியவற்றையும், பின்னர் ஏற்பட்ட அனைத்து இழப்புகளையும் பாதகமான தாக்கங்களையும் மதிப்பீடு செய்து, கடந்த அரசாங்கம் உள்நாட்டில் இடம்பெயர்ந்த எவரும் இல்லையென மீள்குடியேற்ற அமைச்சுமூலம் தவறாகப் பிரகடனப்படுத்தியதையும், நீடித்த இடப்பெயர்வு தொடர்பான 2013ஆம் ஆண்டின் அறிக்கையையும் மீளாய்வு செய்து, 18 மாதங்களுக்குள் இழப்பீடுகளையும் நிலையான தீர்வுகளையும் பரிந்துரைப்பீர்களா?

ii. சனாதிபதி செயலணி ஒன்றை மீள நிறுவி, பாதிக்கப்பட்ட மக்களின் பங்கேற்புடன், காலவரையறைக்கு உட்பட்ட தேசிய செயற்றிட்ட மொன்றை நடைமுறைப்படுத்தி கௌரவமானதும் நிலையானதுமான மீள்குடியேற்றத்தை உறுதிப்

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පටුත්තුම් වකෙයිල්, මීළත් තිරුම්ප විරුම්පුවෝරුක්කු කාණි උරිමෙකළෙප් පෙට්රුක්කොටුප්පතුටන්, වීටමෙප්පු මට්රුම් ඒනෙය උට්කට්ටමෙප්පුකළෙප් පූරණප්පටුත්ති කල්වි, සුකාතාරම්, වාළ්වාතාරම් ආකියවට්රෙයුම් වළුංක නටවටික්කෙ එටුක්කප්පටුමා?

iii. පුත්තළම්, අනුරාතපුරම්, කුරුනාකල් උල්ළිට්ට ඒනෙය මාවට්ටංකළිල් වාළ විරුම්පුවෝරින් උරිමෙකළෙප් පාතුකාප්පතුටන්, අවර්කල් කුටියමර්ත්තප්පට්ට අරස කාණිකළුක්කාන උරිත්තෙයුම්, ඒනෙය සේවෙකළෙයුම් සමමාකප් පෙරුවතර්කාන වාය්ප්පෙයුම් උරුතිප්පටුත්ත ඒර්පාටුකල් මේර්කොල්ළප්පටුමා?

iv. ඉළප්පීටුකළුක්කාන අලුවලකත්තින් ඌටාක ඉළප්පීටුකළෙ වළුංකුවතුටන්, අවෙ ඒනෙය ඉටම්පෙයර්න්තෝරුක්කු වළුංකප්පටුවනවට්රුක්කුච් සමමානවෙයාකවුම්, ඒර්පට්ට අනෙත්තු ඉළප්පු කළුක්කුම් පාතකමාන තාක්කංකළුක්කු ඒර්පුටෙයවෙ යාකවුම් අමෙවතෙ උරුතිප්පටුත්තුවීර්කළා?

v. ඉටප්පෙයර්වුක්කුළ්ළාන කුටුම්පංකළින් වාක්කුරිමෙ, සොන්ත ඉටංකළිලිරුන්තු අවර්කළින් විරුප්පත්තුක්කු මාරාක 2010ආම් ආණ්ටු මුතල් නීක්කප්පට්ටුළ්ළතු. එන්ත මාවට්ටත්තිලුම් වාක්කාළර් පතිවිල් ඉටම්පෙරාතවර්කළෙයුම් සොන්ත මාවට්ටත්තිල් වාක්කළික්ක විරුම්පුම් මක්කළෙයුම් අටෙයාළඞ් කණ්ටු, තමතු සොන්ත මාවට්ටත්තිල් වාක්කළික්කුම් උරිමෙයෙය උරුතිප්පටුත්තුවතර්කු අරසාඞ්කම් නටවටික්කෙ එටුක්කුමා?

vi. තමිල් - මුස්ලිම් මක්කළින් නල්ලිණක්කත්තෙ වළුප්පටුත්තුවතුටන්, ඒනෙය අනෙත්තු චට්ටපූර්වමාන මට්රුම් පරිකාර නටවටික්කෙකළෙයුම් මේර්කොණ්ටු, වටක්කු මුස්ලිම්කළින් කෙළරවම්, සමත්තුවම්, වාය්ප්පුකළ් ආකියවට්රෙ මීට්ටෙටුක්ක එටුක්කප්පටුම් නටවටික්කෙකළ් එන්න?

இது வெறுமனே மீள்குடியேற்றம் சார்ந்த விடயம் மட்டுமல்ல. மாறாக, காணி, தாயக அடையாளம், வாழ்வாதாரம், கௌரவம், எதிர்காலச் சந்ததியினர் ஆகியவை தொடர்பான நீதிக்கும் சமத்துவத்துக்குமான நீண்டகாலக் கோரிக்கையாகும். இக்கோரிக்கையின் ஊடாக, மீளத் திரும்புவோரையும் தாம் வாழும் இடங்களிலேயே தொடர்ந்து வாழ்வோரையும் சமமாக மதிக்க வேண்டுமென வலியுறுத்துகிறேன். சனாதிபதி விசாரணை ஆணைக்குழுவை நியமித்து உரிய தீர்வுகளை வழங்க வேண்டுமென நான் இங்கு கோரிக்கை முன்வைக்கின்றேன். நன்றி!

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

2026.09.09 දින ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඇත්තටම විශ්වාස කළේ නැහැ කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වෙලා යයි කියලා. මම මේ කාරණය ඔබතුමාට යොමු කරන්න කැමැතියි. මමත්, අපේ තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත් ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) යටතේ මතු කළා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, the Hon. Minister is on his feet; his name has already been called.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳවයි කියන්නේ. Please, give me a hearing; කරුණාකර මට අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, make it very short, please.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකර මට අවස්ථාව දෙන්න. එහෙම මාව වාඩි කරවන්න හදන්න එපා. ඒක වැරැදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, not that. The Hon. Minister is already on his feet.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා මට අවස්ථාව දෙන්න. ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) යටතේ මමත්, තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත් වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. තවම ඒකට උත්තරයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Minister's name has already been called and he is on his feet.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමන්ලා තවම උපදෙස් දීලා නැහැ, ඒකට උත්තරයක් දෙන්න. ඒක ප්‍රතික්ෂේප කරනවා කියලාද දැන් කියන්නේ? ඒක ප්‍රතික්ෂේප කරනවා කියලාද උත්තර දීලා තිබෙන්නේ? මොකක්ද ඒකට කරන්න යන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you may continue, but the Hon. Minister is on his feet. You understand that, too.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
[බාධා කිරීමක්] මොකක්ද, bad practice එක? *[බාධා කිරීම්]* වරප්‍රසාද ප්‍රශ්නය ගැන අහන්න බැරිද? වරප්‍රසාද ප්‍රශ්නයක් ගැන මා අහන්නේ. වරප්‍රසාද ප්‍රශ්නයට උත්තරය මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you can certainly speak, but the Hon. Minister is already on his feet.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමා ප්‍රකාශ කළා, පිළිතුර ලබා දීමට මට නැඟිටින්න කියලා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමා එක්ක නොවෙයි, ගරු විපක්ෂ නායකතුමා එක්ක කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, I will listen to you, once the Minster finishes.

මන්නාරම සහ රාමේෂ්වරම් අතර මගී යාත්‍රා සේවාව ආරම්භ කිරීම: වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
மன்னார் - இராமேஸ்வரம் இடையேயான பயணிகள் கப்பல் சேவையை ஆரம்பித்தல்: துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று
COMMENCEMENT OF FERRY SERVICE BETWEEN MANNAR AND RAMESWARAM: STATEMENT BY MINISTER OF PORTS AND CIVIL AVIATION

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් 2026.09.09වන දින අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1, 2. මන්නාරම හා ඉන්දියාව අතර සෘජු මගී හා භාණ්ඩ සේවයක් ආරම්භ කිරීම සඳහා එම භූමි සේවයේ ඇති තාක්ෂණික, වෙළෙඳ පොළ, ආර්ථික හා පාරිසරික හා මූල්‍ය අංශ ආවරණය විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් හරහා සිදු කිරීමට කටයුතු කරමින් පවතිනවා.

3. මා ඉහත පිළිතුරේ සඳහන් කළ ආකාරයට, එකී ශක්‍යතා අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව, එම නැව් සේවාව ආරම්භ වනවා කියා තීරණය වනවා නම්, එම ශක්‍යතාව තිබෙනවා නම් එම අධ්‍යයනය තුළින්ම සංවර්ධනයට යෝජිත කාල රාමුව, යටිතල පහසුකම් සංවර්ධනය, රේගු හා අනෙකුත් අදාළ රජයේ ආයතන පිහිටුවීමට අදාළ සියලු පහසුකම් සම්බන්ධයෙන් යෝජනා ලබා ගැනීමට නියමිතයි.

4. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර මුහුදු මාර්ගයෙන් මගී ප්‍රවාහන සේවා ආරම්භ කිරීම සහ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් දෙරට අතර අවබෝධතා ගිවිසුමක් 2011 වර්ෂයේදී අත්සන් කර තිබෙනවා. මෙම අවබෝධතා ගිවිසුමේ - MoU - දෙවන වගන්තියේ තිබෙන්නේ, එම පාර්ශ්වයන් දෙරටෙහි පිහිටි තූත්තුකුඩිය සහ කොළඹ වරාය අතර මෙන්ම රාමේෂ්වරම් සහ තලෛයිමන්නාරම අතර මගී ප්‍රවාහන සේවය ආරම්භ කිරීම ගැනයි.

එමෙන්ම, දෙරටෙහි වරායන් අතර මගී ප්‍රවාහනයට සහ එම සේවා ස්ථාපිත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සිදු වන්නේ කොහොමද කියලා එහි සඳහන්ව වෙනවා.

මගී ප්‍රවාහන සේවයට අදාළ තාක්ෂණික හා මෙහෙයුම්මය කරුණු සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද පිළිබඳ සාකච්ඡා කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා නාවික කටයුතු භාර අමාත්‍යාංශවල අදාළ ලේකම්වරුන් විසින් නම් කරන ලද නියෝජිතයන්ගෙන් සමන්විත ඒකාබද්ධ කම්ටුවක් ස්ථාපිත කර තිබෙනවා. ඉහත සඳහන් කළ ශක්‍යතා අධ්‍යයනය පදනම්ව ඉහත සංවර්ධන කටයුතු සිදු වන්නේ නම්, මගී ප්‍රවාහන සේවාව ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි අභියෝග ඒකාබද්ධ කම්ටුව හරහා සාකච්ඡා කර, සම්බන්ධීකරණය කර විසඳා ගැනීමට පුළුවන්.

5. ඉහත ශක්‍යතා අධ්‍යයනය පදනම්ව - ඒ ශක්‍යතා අධ්‍යයනයෙන් තමයි මේ පිළිබඳ තොරතුරු ලැබෙන්නේ - ඉහත සංවර්ධන කටයුතු සිදු වන්නේ නම්, එමඟින් එම පළාතේ, විශේෂයෙන්ම උතුරු පළාතේ ජනතාවට සෘජු හා

වක්‍රව රැකියා හා ආයෝජන අවස්ථා සැලසෙනවා. තවද, උතුරු පළාතේ ජනතාවට වාගේම ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ද්වීපාර්ශ්වික සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහාත් අත්කර ගත හැකි සියලුම ප්‍රතිලාභ පිළිබඳව පුළුල් ලෙස හඳුනාගෙන නිශ්චිතව තීරණය කළ හැක්කේ ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කිරීමෙන් පසුවයි.

ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sajith Premadasa?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පුළුවන්ද වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, may I speak on that?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (1), 29 (2) යටතේ මමත්, මගේ සහෝදර මන්ත්‍රීවරු ගණනාවකුත් වරප්‍රසාද ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම එහි මූලික අරමුණ වුණේ මේකයි. අප ඉදිරිපත් කළ විශ්වාසභංග යෝජනාව සාකච්ඡාවට, විවාදයට භාර නොගැනීම තුළ අපේ භාෂණයේ අයිතිය, විවාද කිරීමේ අයිතිය ඇත්ත වශයෙන්ම අහිමි වී තිබෙනවා. කථානායකවරයා කෙරෙහි විශ්වාසය පලවූ වීමේ අදහස අපට ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්නේ නැතිව ස්ථාවර නියෝගවලට පටහැනිව, ඒ වාගේම පාර්ලිමේන්තු ක්‍රියාදාමයට, සම්ප්‍රදායයට පටහැනිව අපේ විශ්වාසභංග යෝජනාව ඉවත දමා තිබෙනවා. ඉතින් අපි ඒ පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කටයුතු කළා. දැන් ඒ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අපට අවස්ථාව දෙන්න. එහෙම නැත්නම්, ඔබතුමන්ලා ලේකම් මණ්ඩලයට හෝ වෙනත් නිලධාරියෙකුට උපදෙස් දීලා තිබෙනවාද, මේකට අවස්ථාව ලබා දෙන්න හැකියාවක් නැහැ කියන උත්තරය හදන්න? මොකක්ද උත්තරය? දෙන්න, දැන් උත්තරය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, with regard to what you raised here, a request was made on 03.11.2026 by five Members of Parliament seeking leave to raise Questions of Privilege. Those five Members of Parliament are you yourself, Hon. Sajith Premadasa, Leader of the Opposition, the Hon. Dayaisiri Jayasekara - in fact, both of you handed them over to me personally while I was in the Chair - the Hon. Mano Ganesan, the Hon. Mujibur Rahuman and the Hon. Chanaka Madugoda. I wish to state that an Announcement will be made at the start of the Proceedings tomorrow morning under Announcements by the Chair with regard to this matter.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ඒ ගැන නිවැරැදිව ප්‍රකාශ කරන්නම්. එම වරප්‍රසාද ප්‍රශ්නය අපි අහහරුවාදා දවසේ ඉදිරිපත් කළ මොහොතේ ඔබතුමා ඔබතුමාගේ වචනයෙන්ම කිව්වා, එදා දවස තුළ - ඒ කියන්නේ අහහරුවාදා දවස තුළ - තීන්දුවක් ලබා දෙනවා කියලා. මා බොරුවක් කියනවාද කියලා unedited හැන්සාඩ් වාර්තාව ගෙන්වා බලන්න. ඔබතුමා කිව්වා, අනිවාර්යයෙන්ම අහහරුවාදා දවස තුළ ඔබතුමන්ලා ඒ ගැන තීන්දුවක් දෙනවා කියලා. දැන් එය අහහරුවාදා දවසට නොව සිකුරාදා දවසට කල් ගිහිල්ලා තිබෙනවා. එහෙම කොහොමද වෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, I agree. The Secretary-General's Office and the Legislative Department concerned have to have time to study this. So, as I said, an Announcement with regard to this matter will be made tomorrow morning at the start of the Proceedings of this House.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝගවලවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේවත් සඳහන් වෙලා නැහැ, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන කොට ඒකට Legislative Department එකෙන් උත්තරය ලියා එවනකල් බලාගෙන ඉන්න ඕනෑ කියලා. එවැන්නක් නැහැ, ස්ථාවර නියෝගවල. එවැන්නක් නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The contents of those have to be studied.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කැමැතියි දැනගන්න, මොන ස්ථාවර නියෝගය යටතේද - *[බාධා කිරීමක්]* ඇයි මේ මයික් එක off කරන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, I did not switch off the mike.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ මයික් එක off කරන පුද්ගලයාට කරුණාකර කියන්න, mike එක දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, your mike is on.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර උපදෙස් දෙන්න, එහෙම මයික් එක off කරන්න එපා කියලා. ඒක වැරැදියි.

අපි කථානායකතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන කොට Legislative Department එකෙන් උත්තරයක් එනකල් බලාගෙන ඉන්න කියලා මොන ස්ථාවර නියෝගයේද තිබෙන්නේ කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒක මොන ස්ථාවර නියෝගයේද තිබෙන්නේ, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Speaker or I have to make a decision in consultation -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ පිළිබඳව තීන්දුවක් ලබා දෙන්න ඔබතුමා පොරොන්දු වුණේ අහහරුවාදා දවසේ. ඇයි ඒක කල් දමන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
There are five matters of Privilege to be gone through. That is the reason, Hon. Leader of the Opposition. තාක්ෂණික ප්‍රශ්නයක්ද දන්නේ නැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I would like to bring to your kind consideration Standing Order No. 118.(2)(a) and (b).

I submitted a couple of weeks ago a matter of Privilege, which was struck through and sent back to me by an officer called Jahath. I believe it is a violation of the Standing Orders. When I want to raise a matter of Privilege, no officer shall instruct me to strike off certain things I have written in it. Therefore, let me raise that Question of Privileg again, which was struck off by Mr. Jahath and the Secretary-General's Office. Sir, I still have a copy of that and I will bring it to your consideration. That had been cut, chopped, struck off by the SG's Office and they gave it back to me saying, "You cannot read this." There is no such provision in the Standing Orders to say that an officer working in Parliament have the right to remove the words I have spelt in my matter of Privilege.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Archchuna, yes, I understand. Did you submit it in writing recently? How long ago was it submitted?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
They chopped, struck it off and gave it back to me. I have a copy of that. That is a Privilege matter. So, let me raise it tomorrow.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Could you please submit it again in writing once more?

The next Ministerial Statement, the Hon. Minister (Dr.) Anil Jayantha.

නිෂ්පාදන ආයෝජන රට තුළ රඳවා ගැනීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

உற்பத்தித் திறன்மிக்க முதலீடுகளை நாட்டில் தக்க வைத்துக்கொள்வதற்கு ஏற்றுமதியாளர்களுக்கு வசதியளித்தல்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

FACILITATION OF EXPORTERS TO RETAIN PRODUCTIVE INVESTMENTS IN THE COUNTRY: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
Hon. Deputy Speaker, on behalf of the Minister of Finance, Planning and Economic Development, I answer the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 08th September, 2026.

1. There is no such capital flight, as highlighted in the Question, but business expansion can move to regional hubs for strategic, market-driven decisions aimed at near-shoring supply chains and securing direct access to vast domestic raw material ecosystems and regional labour pools. This may be due to global diversification

strategies, where Sri Lanka serves as the high-value innovative, administrative and design hub while scaling lower-margin assembly operations would take place regionally.

The Government has systematically addressed operational costs and policy stability. We have stabilized energy tariffs through ongoing renewable integration, rationalized industrial tax policy to preserve fiscal stability while encouraging growth and streamlined logistics. Simultaneously, domestic facilities are actively realigning from basic assembly toward high-value-added textile engineering, research and development and technical innovation maintaining Sri Lanka's edge over regional peers.

Furthermore, the expansion of Sri Lankan investors into overseas markets is primarily driven by business diversification and international expansion, reflecting the strong performance and growth of these companies. Rather, these companies have generally maintained and expanded their operations in Sri Lanka while establishing additional operations overseas as part of their diversification and global growth strategies.

2. Sri Lanka has not lost core industrial capacity. Rather, our export sector has demonstrated remarkable resilience and structural evolution following the 2022 economic collapse. While global market adjustments forced temporary realignments in basic assembly, Sri Lanka's overall export sector performance up to September, 2026 amounted to US Dollars 16,011 million comprising goods amounting to US Dollars 10,754 million and services amounting to US Dollars 5,257 million.

Where basic sewing operations restructured, facilities are now converted into advanced, capital-intensive manufacturing centres such as high-value textile finishing to protect high-paying, skilled local jobs. Any overseas expansions by local multinational brands represent complementary capacity additions to tap market access rather than a reduction in Sri Lanka's domestic export potential.

3. The Government is rolling out a comprehensive investor retention and Competitiveness Framework:

Accordingly, a Competitive Energy Framework has been introduced. It transitions industrial zones to solar and renewable micro grids to reduce electricity costs for top exporters.

We have streamlined fiscal support, which enforces expedited VAT refunds and maintains capital allowance and duty exemptions on capital machinery and raw materials for high-value manufacturing.

Targeted Export Incentives are also provided.

In addition to that, the following investment incentive package is available for both existing and new investments under the Board of Investment:

- 100-200 per cent Enhanced Capital Allowance with 10-year loss carry forward period for investments over US Dollars 250,000. Expansions over US Dollars 3 million are eligible for the same Enhanced Capital Allowance.
- Customs Duty exemptions for import of construction items and project-related capital items which reduces the upfront cost of the investors.
- PAL and CESS exemptions for importation of construction items and project-related capital items for investments over US Dollars 50 million.
- Corporate Income Tax holidays for five to10 years for investments over US Dollars 50 million under Strategic Development Projects Act with Import Duty exemptions including CID, VAT, PAL and CESS for importation of construction items and project-related capital items during project implementation period.
- Import Duty exemptions for raw materials for export-oriented companies.

4. To streamline investor facilitation, the Board of Investment guarantees the issuance of investment approvals within 14 days for projects located within BoI-administered Export Processing Zones, as all required pre-approvals are facilitated and issued by the BoI.

For projects located outside BoI-administered Export Processing Zones, the timeframe for granting investment approval depends on the processing time of the relevant line agencies responsible for issuing the necessary statutory approvals.

The Ministry of Finance, Planning and Economic Development has initiated implementation of the Trade National Single Window System to enable a single entry point for traders to submit required data and documents during border trade processes and to notify the relevant approval to the trader through the automated system with the purpose of minimizing the clearance time and transaction cost. The Trade National Single Window System is being developed by the GovTech Sri Lanka (Pvt.) Ltd. with the support of the private sector local IT experts. I would like to highlight here that the pilot project would be on live today with the support of selected exporters.

5. The conclusion of the EU-India FTA negotiations is expected to have an impact on the competitiveness of Sri Lankan exports to the EU, as Indian exporters will obtain preferential or duty-free access similar to that enjoyed by Sri Lanka at present under EU GSP Plus. This could affect the level playing field in the EU market for Sri Lankan exports vis-à-vis Indian exports. The EU-India FTA negotiations were concluded on 27th January, 2026. The Agreement has not yet entered into force and remains subject to completion of the respective internal procedures.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

Further, Sri Lanka currently benefits from regional cumulation provisions, mainly sourcing fabrics from India under SAARC cumulation under the EU GSP framework. The availability and scope of such cumulation could be affected following the implementation of the EU-India FTA. However, a two-year transition period is provided following the implementation of the EU-India FTA, during which Sri Lanka will continue to be able to use the existing regional cumulation provisions.

The Government is closely monitoring these developments, together with the trade chambers and product associations in Sri Lanka such as with JAAF and, is working to ensure that Sri Lankan exporters are able to maintain a competitive position in the EU market. Recently, at a trade chamber meeting held by the Department of Commerce, this was discussed mainly with the JAAF on the impact analysis etc.

6. Sri Lanka's GSP Plus access will continue beyond 2027. The EU has adopted the new GSP Regulation in another 10-year cycle, which will be applicable from 01st January, 2027.

Accordingly, Sri Lankan exporters will continue to enjoy preferential access under the new EU GSP/ GSP Plus framework, subject to a new application for the facility and acceptance of it by the EU under the new GSP Plus framework before 31st December, 2028. The Government is working to ensure the continued availability of GSP Plus benefits to Sri Lanka under the new GSP framework with the arrangement to re-apply it between 01st January, 2027 to 31st December, 2028.

In the meantime, it is expected to examine and report on possible options for securing long-term and sustainable market access to the EU through a deeper economic arrangement through a possible comprehensive trade agreement, in case of Sri Lanka's economic graduation from the GSP Plus scheme if Sri Lanka to be classified as an upper-middle income GNI category by the World Bank consecutively for three years, whereas it has recorded such GNI higher-middle-income status in 2026.

7. It is proposed to attract investment in fabric manufacturing in Sri Lanka to strengthen the backward integration of the country's garment manufacturing industry. The establishment and expansion of domestic fabric manufacturing facilities would enable Sri Lankan apparel manufacturers to source a greater proportion of their raw materials locally, thereby reducing dependence on imported fabrics, improving supply chain efficiency, and enhancing the competitiveness of the apparel sector.

This initiative would also support the development of a more integrated and resilient textile and apparel value chain, covering yarn, fabric, dyeing, finishing, and other essential manufacturing processes. Increased domestic production of fabrics would create opportunities for technology transfer, skills development, employment generation, and the introduction of value-added and sustainable textile products.

Furthermore, strengthening backward integration would enable Sri Lanka to maximize the benefits available under preferential trade arrangements, particularly the European Union's GSP Plus scheme and the United Kingdom's Developing Countries Trading Scheme - UK DCTS. By increasing domestic value addition and improving compliance with the applicable rules of origin, Sri Lankan apparel manufacturers would be better positioned to meet the requirements for preferential market access and enhance the utilization of these trade concessions.

8. The Government has addressed this concern through the National Export Development Plan - NEDP - 2026-2030, which provides the national framework for improving Sri Lanka's competitiveness and retaining higher-value economic activities within the country. The National Export Development Plan is built around six cross-sectoral enablers and eight priority export sectors.

Accordingly, the National Export Development Plan highlights the following key areas:

- Shift the export structure towards higher-value and knowledge-intensive activities. The National Export Development Plan identifies eight priority sectors: automotive components, mineral-based industries, rubber -based industries, marine industries, spices and concentrates, digital products and services, electrical and electronic components, and processed food and beverages to increase diversification, domestic value addition and participation in regional and global value chains.
- Improve the investment environment and retain productive investment by developing an enabling trade finance and investment ecosystem, reducing business frictions, improving access to serviced investment space and strengthening investment facilitation.
- Improve quality and international standards, including ESG compliance, so that Sri Lankan firms can remain integrated into demanding international supply chains and meet increasingly stringent market requirements.
- Diversify the export markets and reduce concentration risk by expanding market access, particularly in emerging markets in Asia, Africa and the Middle East, while strengthening existing markets.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, you may seek a brief clarification on that extensive Answer by the Hon. (Dr.) Anil Jayantha.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Hon. Deputy Speaker.

My intention is to ensure that there exists in Sri Lanka a favourable environment for our manufacturers. The Answer was given, more or less, from a theoretical aspect, Hon. Minister. I am sure that you, as the Minister of Labour, would agree that mobility of labour is an accepted competitive input. But, it is not a one-way direction process. It is a matter which basically has ins and outs.

What we are seeing at this particular moment is that MAS - my Question was framed based on that - a big, world-recognized company, is moving to India owing to input costs being high. The reasons given in your Answer did not have the actual content as to why they are moving out. Many of the reasons attributed to that, Sir, include interest costs and other input costs such as electricity, water, labour and taxes. At the drop of a hat, they are being taxed from 6.00 in the morning till 6.00 in the evening. So, as a result, their taxability is making the company ill afford to compete with its other regional peers. Therefore, Sir, through your intervention, I would request the Government to ensure that that competitive element exists in this country because we are losing companies fast. You take the HSBC. When I was the Minister of Trade, we brought down the HSBC operating from the UK to Sri Lanka. There were 4,800 seats at the HSBC here. Now, it is moving to India. Then, you had R.R. Donnelley, an American company, which had about 5,000 seats. It is moving out to the Philippines at the end of this year.

Hon. Minister, the Government said that it is going to achieve US Dollars 36 billion of exports by 2030. But now, we are in November, 2026, with an export value of only US Dollars 19 million So, how on earth are you going to have a 15 per cent growth rate in this country to achieve that? So, my intention is to decolourize and depoliticize it because, at the end of the day, governments come and go, but the economy must be able to withstand the pressures that are there.

And, my question was very pointed with regard to the FTA between India and the EU, which is starting in the first week of April next year. While that happens, Hon. Minister, we are losing the EU's GSP Plus status at the end of 2026 officially. Then, you will have a gestation period until 31st December, 2028. But, that does not mean that we are ready to achieve it, owing to the new Acts such as the PSTA and POCA which are coming in and which go against the grain, affecting the assistance they give to countries like ours to get out of poverty. So, it is concerning, Hon. Minister.

You gave an Answer based on a brief provided by others. I would appreciate it if you would put your practical knowledge into this and protect the industries. I had the chance to speak to many people from chambers of commerce and they asked, "What is going on? We are not being heard. We are not even being given an opportunity to speak." I respect the Hon. Minister acting in the capacity of both the Minister of Labour and Deputy Minister of Finance and Planning. But, he is certainly not speaking about what is practically happening on the ground. So, I would ask you to awaken to the reality and protect our industries so that we would be competitive with our peer countries, which are fighting for their survival as well.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Hon. Member, in fact, I highlighted the strategies, policies and initiatives the Government has taken to create a level playing field and to facilitate the exporters. In addition, if we take today's global scenarios and realities, they are not the same as the global situations we experienced several decades ago. Now, we are having a global supply chain situation, where there is no theoretical or practical reason why investment should be placed at a particular location. So, investment can flow around the world. As for international finance, if you take big global companies such as high-tech companies from China, the European Union and the United States, it is flowing around the world.

What matters is the value chain and how best we are connected to that value chain. Actually, we are connected to that particular value chain from our end. That is what we are really focusing on to get more benefits in the future. Particularly, when it comes to MAS, it is not a multinational company, but a locally-based company. It is always good for that particular company to find new locations and investment avenues in other parts of the world rather than only being in our country. So, that is what they are doing, not only MAS but also other local investors. So, what we do is to facilitate local investors to go beyond the local boundaries and find their investments in other parts as well. We look for long-run advantages. In the long run, we could get more dividends and have repatriation of profits. So, that is how we look at that matter.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have got to be brief as we have move on to the next Item.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Just give me 30 seconds, Sir.

Then, moving on to labour movements and the GSP Plus requirement, of course, we have time until the 31st of December, 2028. We are complying with their requirement of implementing 32 Conventions We have

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

paid more attention to the Prevention of Organised Crimes Bill to create an environment where there is peace, there are no organised crimes and no corruption. Then only, we could say that our country is not a haven for money laundering and terrorist financing. Now, the Third Mutual Evaluation is going on, Sir. Within a couple of days' time, we hope we would not be in the Grey List. Therefore, all these things are done for the betterment of the country.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, let us move on to the Question of Privilege to be raised by the Hon. Gnanamuththu Srineshan.

වරප්‍රසාද: මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීම වැළැක්වීම
சிறப்புரிமை: மட்டக்களப்பு, மாவட்ட செயலக வளாகத்துக்குள் நுழைவதற்கு இடையூறு ஏற்படுத்தியமை
PRIVILEGE: OBSTRUCTION OF ENTRY INTO DISTRICT SECRETARIAT, BATTICALOA

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Formal joint complaint regarding gross breach of Parliamentary Privileges and obstruction of duties by the District Secretary of Batticaloa on the 02nd of November, 2026.

Sir, we are writing to bring to your urgent attention a serious and deliberate breach of Parliamentary Privileges committed against us in our capacity as elected Members of Parliament representing the Batticaloa District.

On the 2nd of November, 2026, a public protest was conducted in front of the District Secretariat Office, Batticaloa by civil society members, local farmers and members of the public regarding the ongoing pasturage issues in Mayilaththamadu and Madhavanai. Responding to urgent requests from our constituents, we proceeded to the venue to facilitate a peaceful dialogue and seek an administrative resolution.

Upon arriving at the scene,

1. we attempted to contact the District Secretary of Batticaloa via telephone to discuss the matter constructively. However, the GA responded in an unprofessional, irresponsible and dismissive manner.
2. Subsequently, when we attempted to meet the GA in person at his office to represent the grievances of the public, the GA issued explicit instructions to the Police to deny us entry into the District Secretariat premises.

This intentional obstruction of elected Members of Parliament during the execution of our public duties constitutes a clear violation of:

The Parliament (Powers and Privileges) Act No. 21 of 1953, Chapter 383, specifically Part II and Section 1 of Part A of Schedule, which prohibits the willful obstruction and molestation of a Member of Parliament while discharging his public responsibilities.

Sections 330 and 331 of the Penal Code of Sri Lanka states regarding wrongful restraint and confinement. If elected Members of Parliament representing the district are arbitrarily blocked from entering a public administrative office by an appointed bureaucrat, it severely undermines the institution of Parliament and sets a dangerous precedent regarding the rights of the general public.

Sir, the relief sought is as follows:

1. We respectfully request that you refer this matter immediately to the Committee on Ethics and Privileges for inquiry for disciplinary proceedings.
2. Direct the District Secretary of Batticaloa to provide a formal explanation regarding this unlawful order to the police.

Thank you.

Yours sincerely, Hon. G. Srineshan. Member of Parliament and Hon. (Dr.) Elayathamby Srinath. Member of Parliament from Batticaloa District.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் இவ்விடயம் சம்பந்தமாக சற்று விளக்கமளிக்க விரும்புகின்றேன். உண்மையில், கடந்த -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Srineshan, please make it very brief because what you stated was very clear.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Okay.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Do you want to read it in Tamil again?

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Sir, I want to clarify that.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. Make it very brief please.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Okay. கடந்த 02ஆம் திகதி மட்டக்களப்பு கச்சேரிக்கு முன்பாக சிவில் சமூகத்தினரும் விவசாயிகளும் -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you are reading the same thing in Tamil.

Anyway, with regard to your matter of Privilege, an inquiry and a formal explanation will be called from officers concerned as the relief sought by you, and the matter, thereafter, will be referred to the Committee on Ethics and Privileges.

Thank you.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27ඒ විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ද ගුඩ්නස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
த குட்நஸ் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
THE GOODNESS FOUNDATION (INCORPORATION) BILL

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் பின்வரும் சட்டமூலத்தைச் சமர்ப்பிக்கின்றேன்.

"த குட்நஸ் மன்றத்தைக் கூட்டிணைப்பதற்கான சட்டமூலத்தைக் கொண்டுவர அனுமதி வழங்கப்படுமாக"

ගරු නීතිඥ හබීබ් රිෆාන් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹபீப் றிபான்)
(The Hon. Habeeb Rifan, Attorney-at-Law)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education, Higher Education and Vocational Education for report.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Public Business.

Item Nos. 1 and 2 in today's Order Paper - the Second Reading of the Trusts (Amendment) Bill and Supplementary Sum - Head 224 - Programme 01 - the Hon. Anura Karunathilaka.

භාර (සංශෝධන) පනත් කෙටුම්පත
நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்
TRUSTS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 -පරිපූරක මුදල - ශීර්ෂය 224 - වැඩසටහන 01 ද අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
The Hon. Major General (Rtd.) Aruna Jayasekera to start the Debate. You have 12 minutes.

[පු.භා. 11.41]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(*மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்*)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විශේෂයෙන් විෂය පථ දෙකක් පිළිබඳව කථා කරනවා. එකක් තමයි, අපේ භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත. අනෙක තමයි, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නියමුවන් නොමැති ගුවන් යානා මිලදී ගැනීමට අදාළව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති පරිපූරක මුදල සම්බන්ධ යෝජනාව.

මේ අවස්ථාවේදී මා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නියමුවන් නොමැති ගුවන් යානා මිලදී ගැනීම - හදිසි මිලදී ගැනීම - සම්බන්ධයෙන් වන පරිපූරක මුදල පිළිබඳ යෝජනාව ගැන කථා කිරීමට බලාපොරොත්තු වෙනවා. අපේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ, ත්‍රිවිධ හමුදාවට විශාල වගකීමක් පැවරී තිබෙනවා. ඒ වාගේම ඔවුන් විශාල මෙහෙවරක් ඉටු කරනවා. ඒ අතරිනුත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට විශේෂ වගකීමක් පැවරී තිබෙනවා. අපේ රටේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීත්වය තහවුරු කරගැනීම වස් අපේ භූමියේ, අපේ ජල තීරයේ සහ අපේ ගුවන් කලාපයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව මහඟු දායකත්වයක් ලබා දෙමින් විශාල කාර්යභාරයක් හා වගකීමක් ඉෂ්ට කරමින් සිටිනවා. ඒ නිසා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නියමුවන් රහිත ගුවන් යානා පද්ධතියක් හදිසියේ මිලදී ගැනීමේ කාරණය සම්බන්ධයෙන් මේ පරිපූරක ඇස්තමේන්තුව අද ඉදිරිපත් කර තිබෙනවා.

අපේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියමුවන් නොමැති යානාවලින් 1996 වසරේ සිට මහඟු දායකත්වයක් ලබා දී තිබෙනවා. ඒ මඟින් බුද්ධි තොරතුරු රැස් කිරීම, ඔත්තු බැලීම වැනි කටයුතු සිදු කර තිබෙනවා. පසුගිය කාලවකවානුවල උතුරු-නැඟෙනහිර නිබුණු අර්බුදයේදී - යුද්ධයේදී - අපේ ගුවන් යානාවලින් ජාතික ආරක්ෂාව තහවුරු කරගැනීම සඳහා විශාල දායකත්වයක් ලැබී තිබෙනවා. අපේ රටේ මුහුදු තීරය ගත්තාම, අපේ භූමිය වාගේ විසිහත් ගුණයක් විශාල කලාපයක් අයත් වෙනවා, අපේ අනන්‍ය ආර්ථික කලාපයට. ඒ කලාපයට වර්ග කිලෝමීටර 517,000ක මුහුදු සීමාවක් අයත් වෙනවා. ඒ කලාපයේ සැකකටයුතු නැව්, විශාල යාත්‍රාවල තොරතුරු ලබා ගැනීම මූලික වෙනවා. ඒ වාගේම ධීවරයින් අතුරුදහන් වුණාම, ධීවර කටයුතු සම්බන්ධයෙන් කරුණු කාරණා සහ තොරතුරු රැස් කරගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව කටයුතු කරනවා.

ගිය අවුරුද්දේ මූලිකව මුදල් වෙන් වුණේ ගුවන් හමුදාවට අයත් හෙලිකොප්ටර් යානාවල නඩත්තු කටයුතු සඳහායි. ගුවන් හමුදාවේ වෙනත් කාර්යයක් සඳහා, නියමුවන් නොමැති ගුවන් යානා මිලදී ගැනීම සම්බන්ධ ව්‍යාපෘතියකට මුදල් යොදා ගැනීමේ අවශ්‍යතාව නිසා තමයි මුදල් රෙගුලාසි 66 යටතේ පාර්ලිමේන්තුවේ අනුමැතියට මේ පරිපූරක මුදල යොමු වෙන්නේ. මේ අවස්ථාවේදී අපේ අවශ්‍යතාව සනාථ කර ගත යුතුයි. ලංකාව ආපදා බහුලව ඇති වන රටක්. කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහාත්, සූදානම් වීම සඳහාත්, සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් කටයුතු තීව්‍ර කිරීම, විධිමත් කිරීම සඳහාත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඒ උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය වෙනවා. සමුද්‍ර නිරීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහාත් මේ උපකරණ, මේ යානා වැදගත් වෙනවා. ආපදා අඩු කර ගැනීම සඳහා අපි පෙර සූදානම්ව සිටිය යුතුයි. අපේ හමුදා, අපේ හමුදා විසින් භාවිත කරන උපකරණ, අධිතාක්ෂණික මෙවලම් පිළිබඳව පුහුණුවීම් කටයුතු සිද්ධ කරලා සූදානම් කරලා තැබිය යුතුයි. විශේෂයෙන්ම ආපදා එන්න කලින් සූදානම් කර ගැනීම සඳහා තමයි මේ විශේෂ මෙවලම් උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාව අපට තිබෙන්නේ.

ඊශ්‍රායල් රට සමඟ රටෙන් රටට, නැත්නම් රාජ්‍යයෙන් රාජ්‍යයට සිදු වෙන ගනුදෙනුවක් විධියට තමයි අපි මේක යෝජනා කරලා තිබෙන්නේ. Israel Aerospace Industries සමාගම කොටස් හිමිකාරිත්වයක් දරන BlueBird Aero Systems Limited එකට තමයි ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඒ යෝජනාව කරලා තිබෙන්නේ. ඊශ්‍රායල් රජයට අයත් ඒ සමාගම මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා නාවික, ගුවන් සහ යුද හමුදාවට විශේෂ උපකරණ සැහෙන කාලයක් තිස්සේ, වසර ගණනාවත් තිස්සේ සපයලා ලොකු විශ්වාසයක් තබා ගෙන තිබෙනවා. ගුවන් හමුදාවේ තාක්ෂණික සහ මෙහෙයුම් අවශ්‍යතාවලට ගැළපෙන ආකාරයට, අපේ හමුදා ශක්තිමත් කිරීම සඳහා තමයි මේ යෝජනාව ඉදිරිපත් කරලා මේ ඉල්ලීම කරන්නේ.

Hon. Deputy Speaker, the Government plans to procure four advanced unmanned aircraft - drones - for the Sri Lanka Air Force through Government-to-Government arrangements with Israel Aerospace Industries. The main purpose of this project is to strengthen Sri Lanka's maritime surveillance, national security, search and rescue operations and especially, disaster response capabilities.

As we all are aware, under the Constitution, the Sri Lanka Air Force is responsible for monitoring a large maritime area, as I mentioned earlier. Continuous surveillance using conventional aircraft is very costly. Therefore, instead, we are requesting or proposing to acquire or purchase these unmanned aerial aircraft. These aircraft would enhance identification of suspicious vessels, locate missing persons and vessels, support search and rescue operations and assist during natural disasters such as floods and cyclones. And, these could remain airborne for extended periods of time.

This procurement consists of two ThunderB aircraft with an endurance of up to 14 hours and two other aircraft with an endurance of up to 20 hours. These facilitate Vertical Take-Off and Landing or Short Take-Off and Landing within a limited land area. The cost of this project is Rs. 4,261 million. According to our analysis, it is affordable. That means, the money allocated as maintenance cost of helicopters, which we have suspended by approval of the Cabinet, and saved by the Sri Lanka Air Force will be utilized for this purpose. So, there is no additional amount requested for or allocated.

Sir, we seek approval of Parliament for it. Once Parliamentary approval is granted, the agreement will be finalized, reviewed by the Attorney-General's Department and submitted to the Cabinet for final approval. And, we are aiming or targeting to sign the agreement by mid-December or during the month of December.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මේ ව්‍යාපෘතිය මඟින්, එනම් නියමුවන් රහිත ගුවන් යානා මිල දී ගැනීමේ කටයුත්ත මඟින් අපට අවුරුදු 3ක නඩත්තු කටයුතු සඳහා product support එක ලැබෙනවා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් පුහුණුවීම් ද ලැබෙනවා. ඒකත් විශාල වාසියක්. ගිය අවුරුද්දේ අප මේ යෝජනාව කළාම, මේ ඉල්ලීම කළාම අපට ගන්න පුළුවන් කිව්වේ ගුවන් යානා 2ක් පමණයි. නමුත්, මෙහිදී අපට ගුවන් යානා 4ක් මිල දී ගන්න පුළුවන් වෙනවා. ඒකත් අපට ලැබුණු විශේෂ සහනයක්, විශේෂ වාසියක් හැටියට තමයි කරුණු සංසන්දනය කර බලන විට අපට හැඟෙන්නේ. ශ්‍රී ලංකා ආරක්ෂක අංශයේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ඊශ්‍රායල් රජය සහ එයට අනුබද්ධිත ආරක්ෂක නිෂ්පාදන කර්මාන්ත ආයතන සමඟ පසුගිය යුද සමයේ අපි විශාල ලෙස ගනුදෙනු කළා. මෙම සමාගම එසේ විශාල ලෙස ගනුදෙනු කළ ආයතනයක් වන නිසා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා, මේ උපකරණ ගැන.

ඒ වාගේම තමයි, අපේ ගරු ජනාධිපතිතුමා පසුගිය වසරේ අය වැය විවාදය අවස්ථාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී කිව්වා, අපි ආරක්ෂක හමුදාව නවීකරණය කරනවා, තාක්ෂණික මෙවලම්වලින් අන්තර්ග්‍රහණය කරලා ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් අභියෝග, තර්ජනවලට මුහුණ දීමට හැකි වන ආරක්ෂක හමුදාවක්, ත්‍රස්තීයමයභාවයෙන් උසස්, වැඩිදියුණු වෙච්ච ආරක්ෂක හමුදාවක් බවට අපේ ආරක්ෂක හමුදාව පත් කරනවා, ඒක තමයි අප බලාපොරොත්තු වන්නේ කියලා. මෙවැනි මෙවලම්, මෙවැනි උපකරණ, අධීතාක්ෂණික නියමුවන් රහිත ගුවන් යානා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක් කිරීමෙන් 2030 වනකොට අප බලාපොරොත්තු වන target එකට යන්න පුළුවන් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, "දිවිවා" සුළි කුණාටුව ආපු වෙලාවේ ගුවන් හමුදාව විශේෂ මෙහෙයුම් කටයුතු රාශියක් කළ බව. ඒ අය සෑහෙන මිනිස් ජීවිත ප්‍රමාණයක් ගලවාගත්තා. මේ ලබා ගන්නා උපකරණ මුහුදු තීරයේත්, ගැඹුරු මුහුදේත් සිදු වන අනීතික වැඩ කටයුතු, අනීතික දේවල් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා සෑහෙන උපකාර වෙනවා කියන මතයේ තමයි අප සිටින්නේ. ගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ 2030 වනකොට අපේ ආරක්ෂක හමුදා විශේෂ ඇගයීමකට ලක් කර, ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමයි අපේ බලාපොරොත්තුව. ඒ සඳහාත් මේ උපකරණ ප්‍රයෝජනවත් වනවා. මේ උපකරණ ලබාගෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අන්තර්ග්‍රහණය කිරීමෙන් සමස්තයක් හැටියට ත්‍රිවිධ හමුදාවටම හැකියාව ලැබෙනවා, විශේෂයෙන් අපේ ජාතික ආරක්ෂාව සම්බන්ධව තිබෙන වගකීම් අනුව අපේ ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාව පවත්වා ගැනීමට සහ ශ්‍රී ලංකාවේ සාමය වාගේම මේ කලාපයේ සාමය ස්ථාපිත කිරීම උදෙසා සහයෝගය ලබා දීම වෙනුවෙන් කටයුතු කිරීමට.

අපි මෙතැනදී අපේ විනිවිදභාවය පෙන්වා තිබෙනවා. ඒ වාගේම තමයි මෙහි quality එක ඇගයීමට ලක් කර තිබෙනවා. මෙහි තිබෙන හැකියාවලින් අපට ගන්න පුළුවන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සම්බන්ධයෙනුත් අපි කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අපට කියන්න තිබෙන්නේ, මේ ගන්නා උපකරණවල මිල ඉතාම සාධාරණ බවයි; ඒවා ඉතාම වටිනා බවයි. අපේ ආරක්ෂක හමුදාවල කටයුතු තවත් ශක්තිමත් කරන්න, විධිමත් කරන්න මේ උපකරණ ඉතාම වැදගත් වනවා. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට යෝජිත නියමුවන් රහිත ගුවන් යානා 4ක් මිල දී ගැනීමට ඉදිරිපත් කර තිබෙන රුපියල් මිලියන 4,261ක පරිපූරක මුදලට අනුමැතිය ලබා ගැනීම සඳහා වන කරුණු ඉදිරිපත් කිරීමට මාහට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Ajith P. Perera. This is the moment to speak on the Bill before the House and you have 10 minutes, Hon. Member.

[පූ.භා. 11.54]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාර (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අපගේ එකඟතාව අපි ප්‍රකාශ කරනවා. මේ පනත් කෙටුම්පතේ තිබෙන ඉතා වැදගත්ම පරමාර්ථය තමයි භාර ලියාපදිංචි කිරීම. මෙහි ආකෘතිය අනුව යම් භාරයක් නිශ්චල දේපළක් පිළිබඳව වන විට නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කළ යුතුයි. එය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනවා. හැබැයි, චංචල දේපළ - මුදල් වෙන්න පුළුවන්, කොටස් වෙන්න පුළුවන්, රත්‍රන් වෙන්න පුළුවන්, දියමන්ති වෙන්න පුළුවන්, වටිනා චිත්‍ර වෙන්න පුළුවන්, වෙනත් කෞතුක වස්තු වෙන්නත් පුළුවන් - පිළිබඳව ඒ අදාළ භාර ලේඛනය හෙවත් භාර ඔප්පුව නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කළ යුතු බව මේ පනත් කෙටුම්පතේ දක්වා නැහැ. මම ඊයේ මේ විෂය භාර ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මේ පිළිබඳව කරුණු දැක්වූවා. ඒ සඳහා සංශෝධනයක් ගෙන ඒම කළ යුතු දෙයක්. මොකද, භාර ලියාපදිංචි කිරීම අනිවාර්යය කරනවා නම් විධිමත් ලියවිල්ලක් තිබිය යුතුයි. ඒ වාගේම, භාරයේ පාර්ශ්වකරුවන්ගේ අනන්‍යතාව හඳුනාගත යුතුයි. ඒක සහතික කරන්න පුළුවන් වන්නේ නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කරනු ලැබූ විට පමණයි. මේ පනත් කෙටුම්පතේ දැනට තිබෙන 5වන වගන්තිය සමඟ කියවන විට නිශ්චල දේපළවලට භාර ඔප්පුවක් නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කළ යුතුයි. නමුත්, චංචල දේපළක් සම්බන්ධයෙන් වන විට එය එසේ වන්නේ නැහැ. මෙය බරපතළ ඌනතාවක්. මේ ඌනතාව පිළිබඳ ගැටලුව අද විසඳිය යුතුයි. එය අද විසඳන්නේ නැත්නම් ඉක්මනින් ගෙන එන සංශෝධනයක් මඟින් විසඳිය යුතුයි. එහෙම නැත්නම් මේ පනත් කෙටුම්පතින් බලාපොරොත්තු වන මුදල් විශුද්ධිකරණය පිළිබඳ ප්‍රශ්න විසඳීමට පිටුවහලක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය යුක්තිය පිළිබඳ රටේ අවධානය යොමු වන වෙලාවේ මූල්‍ය නීති, අපරාධ වැළැක්වීම සඳහා වන නීති පනත් කෙටුම්පත් අරගෙන එන වෙලාවේ මේ රජය විසින් සංවිධානාත්මක අපරාධ වැළැක්වීම සඳහා පනත් කෙටුමතක් ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත පටන් ගන්නේ, "ජාතික සීමා ඉක්ම වූ සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය බලාත්මක කිරීම...." යනුවෙනුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත මේ මාතෘකාව අනුව ඉදිරිපත් කළා කියා රජය දැන් කිව්වාට, එක්සත් ජාතීන්ගේ සංවිධානය 2026.10.30වන දා පිටු 31කින් යුතු නිවේදනයක් නිකුත් කරලා කියනවා, මෙම පනත් කෙටුම්පත එක්සත් ජාතීන්ගේ අරමුණුවලට, ප්‍රඥප්තිවලට, ප්‍රමිතීන්වලට ගැළපෙන්නේ නැහැ කියලා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුද, මේ පනත් කෙටුම්පත කෙටුම්පත් කළේ? මම නම කියන්නේ නැහැ. මොන කමිටුවද මෙය කෙටුම්පත් කළේ? මොන විශේෂඥයන්ගෙන්ද විමසුවේ? ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් විමසුවාද? මේ රටේ ප්‍රවීණ විනිශ්චයකාර මණ්ඩලයක් මඟින් විමසුවාද? ඒ සඳහා ජාත්‍යන්තර නීතිය පිළිබඳ විශාරදයන් සම්බන්ධ කර ගත්තාද? ඒ කිසිවක් කර නැහැ. මෙයට සම්බන්ධ වූ අයගේ නම් මා කියන්නේ නැත්තේ ඒ අය අප දන්නා හඳුනන අය නිසා. නමුත්, ඉතාම පටු විධියට කෙටුම්පත් කරලා අවසානයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය කියනවා, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව නැහැ, මෙය මානව හිමිකම් කඩ කරන නීතියක් කියලා. ඒ නිසා මෙය පටන් ගන්නේම බොරුවකින්; හිතුවක්කාර විධියට මේ රට පාලනය කරන්න, නීතියේ ආධිපත්‍යය යටපත් කරලා රට පාලනය කරන්න තිබෙන වුවමනාවකින්.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2026.10.21වන දා නිවේදනයක් නිකුත් කර තිබෙනවා සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත පිළිබඳව. එහි සභාපතිවරයා ලෙස කටයුතු කළ හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එල්.ටී.බී. දෙහිදෙනිය මැතිතුමා අත්සන් කර ඉදිරිපත් කර තිබෙන එම ලිපිය මම **සභාගත*** කරනවා.

මෙය හැන්සාඩ්ගත විය යුතුයි; ඉතිහාසගත විය යුතුයි. මේ ලිපියේ තිබෙනවා, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ ප්‍රමිතියට නොමැති බව; මේ පනත් කෙටුම්පත වහාම ඉල්ලා අස්කර ගත යුතු බව; ඉදිරිපත් කරනවා නම් නැවත සලකා බලා නිසි ලෙස කෙටුම්පත් කළ යුතු බව. කවුද මේ කියන්නේ? මේ රටේ මිනිසුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරලා තිබෙන, ගරු ජනාධිපතිතුමා පත් කරන සාමාජිකයන් ඉන්න, ස්වාධීනව කටයුතු කරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවයි. මට පුදුමයි, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ස්වාධීන, අප කවුරුත් පිළිගන්නා, වැදගත් සාමාජිකයන් ඉන්න ආයතනයක් විසින් නිසි ලෙස සලකා බලා 2026.10.21වන දින ඉදිරිපත් කර තිබෙන මේ නිර්දේශ නොතකා මේ පාර්ලිමේන්තුවේදී එම පනත් කෙටුම්පත පළමුවර කියවීමට ඉදිරිපත් කිරීම ගැන. එය ඉතා කනගාටුදායක කාරණයක්. මානව හිමිකම් රකිනවා, පුරවැසි අයිතිය රකිනවා කියලා තමයි ඔබතුමන්ලා ඡන්ද ව්‍යාපාරය කළේ. මේ රටේ පුරවැසියන්ගේ අයිතිය ආරක්ෂා කරනවාය කියපු, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා කරනවාය කියපු පක්ෂයක් බලයට පත් වුණු වෙලාවේ මොනවාද මේ අරගෙන එන නීති? ලජ්ජයි! ලෝකය ඉස්සරහට ගිහිල්ලා අපේ රටේ අලුත් නීති මෙවායි කියලා කියන්න බැරි තරම් ලජ්ජා සහගතයි. කවුරු හරි මන්ත්‍රීවරයෙක් ඉන්නවාද, එම පනත් කෙටුම්පතේ තිබෙන වැදගත්කම ගැන කියන්න, ඒක හොඳයි කියලා කියන්න, එය කෙටුම්පත් කරපු අය කවුද කියලා කියන්න? ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එම පනත් කෙටුම්පත ප්‍රමිතියට නැහැ කියලා කියනකොට, එක්සත් ජාතීන්ගේ සංවිධානය නිශ්චිතව, විස්තරාත්මකව එම පනත් කෙටුම්පත ලෝක ප්‍රමිතියට නැත්තේ ඇයි කියලා විස්තර කරලා තිබෙනකොට ඇයි, තවමත් එම පනත් කෙටුම්පත ඉදිරියට අරගෙන යන්නේ? ඊයෙත් පාර්ලිමේන්තුවේදී සමහර මන්ත්‍රීවරු අගක් මුලක් නැතිව සංවිධානාත්මක අපරාධ වැළැක්වීමට එවැනි නීතියක් අවශ්‍යයි කියලා කිව්වා. රටේ සංවිධානාත්මක අපරාධ වළක්වන්න ඕනෑ. ඒ සඳහා නිසි ප්‍රමිතියෙන් යුතු, පුරවැසි අයිතිය රකින නීති අරගෙන එන්න ඕනෑ. නමුත්, පුරවැසි අයිතිය කඩාකප්පල් වන නීති අරගෙන එනවා නම් එය රට ආපස්සට අරගෙන යාමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පනත් කෙටුම්පතේ බරපතළ අපරාධ අර්ථ නිරූපණය කර තිබෙනවා. එම අර්ථ නිරූපණයේ පුළුල්කම කොච්චරද කිව්වොත්, බුද්ධිමය දේපළ පිළිබඳ වැරැදිත් ඒකට අයිති වෙනවා, වෙළෙඳ ලකුණු පිළිබඳ වැරැදිත් අයිති වෙනවා, සූරා බදු පිළිබඳ වැරැදිත් අයිති වෙනවා. මත්ද්‍රව්‍ය සම්බන්ධ කාරණාවලට විශේෂිත වූ නීති අවශ්‍ය බව අපි පිළිගන්නවා. ඒ වාගේම ජාත්‍යන්තර ත්‍රස්තවාදය පිළිබඳව විශේෂිත වූ නීති අවශ්‍ය බව අපි පිළිගන්නවා. හැබැයි, දැනටමත් නීති ප්‍රමාණවත් ලෙස තිබෙන ක්ෂේත්‍ර සඳහාත් නීති ගෙන ඒම අවශ්‍යද?

දණ්ඩ නීති සංග්‍රහයට අනුව වසර හතකට වැඩියෙන් දඬුවම් ලැබෙන හැම වරදක්ම පනත් කෙටුම්පතේ පළමු වන උපලේඛනයේ ඇතුළත් කර තිබෙනවා; ඔක්කෝම තිබෙනවා. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා, මේ අපි කවුරුත් ආරක්ෂිත නැහැ. මේ ආණ්ඩුව හැමදාම තිබෙනවා කියලා එකක් නැහැ නේ. සදාකාලික ආණ්ඩු නැහැ. අපේ ආණ්ඩුව සදාකාලිකව තිබෙනවා, අපි හැමදාම ඇමතිවරු වෙනවා, ආණ්ඩුවේ පොලීසිය, ආණ්ඩුවේ ආයතන, ආණ්ඩුවේ පොලිස් ඇමති අපිත් එක්ක ඉන්නවා, අපට මේක ප්‍රශ්නයක් නැහැ කියලා මේ ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරු කල්පනා කරනවා නම් ඒක සම්පූර්ණයෙන් වැරැදියි. මේ රටේ මීට වඩා ශක්තිමත්, මීට වඩා බලගතු ආණ්ඩු තිබුණා. හැබැයි, පුරවැසියා විසින් ඒ හැම ආණ්ඩුවක්ම ගෙදර යවා තිබෙනවා. ඒ ගෙදර යවපු දවසට තමුන්නාන්සේලාටත් එම පනත් කෙටුම්පතේ ප්‍රතිවිපාක විඳින්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පනත් කෙටුම්පත මඟින් සාක්ෂි ආඥාපනතේ 24, 25 හා 30 කියන වගන්ති යටපත් කරනවා. 24වැනි වගන්තියේ තිබෙන්නේ, පොලිස් නිලධාරීන්ට දෙන පාපොච්චාරණය සම්බන්ධයි. 30වැනි වගන්තියෙන් කියන්නේ මොකක්ද? එක් පාපොච්චාරණයක් තවත් පුද්ගලයෙකුට විරුද්ධව පාවිච්චි කරන්න පුළුවන් කියන එක. අවුරුදු සිය ගණනක් පාවිච්චි වෙච්ච සාක්ෂි ආඥාපනතේ 24, 25, 30 වගන්ති යටපත් කරනවා කියන්නේ මොන නීතියක්ද, මොන සාධාරණයක්ද, මොන ප්‍රමිතියක්ද? මෙහෙම නීති හදන්න උපදෙස් දීපු කෙනා කවුද? එසේ වෙනස් කරන්න තිබෙන ප්‍රායෝගික අවශ්‍යතාව මොකක්ද? එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එපා කියනවා නම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමත් එපා කියලා කියනවා නම්, තිබෙන හැම වරදක්ම - දණ්ඩ නීති සංග්‍රහයේ තිබෙන ඒවායි, පුරාවස්තු ආඥාපනතේ තිබෙන ඒවායි, බුද්ධිමය දේපළ පනතේ තිබෙන ඒවායි සියල්ලම - ඇතුළත් කරලා පොලීසියට ලොකු බලයක් දෙනවා.

ඒ විතරක් නොවෙයි. මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රශ්නය ගනිමු. මේ රටේ පුරවැසියාට තොරතුරු දැන ගැනීමට තිබෙන අයිතිය අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් 14වැනි ව්‍යවස්ථාවට එකතු කළා. තොරතුරු දැන ගන්න තිබෙන අයිතිය මූලික අයිතියක්. අපි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගෙනාවා. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතට අනුව දැන් මාධ්‍යවේදීන්ට තොරතුරු ලැබුණු ක්‍රමය පිළිබඳව දැන ගැනීමට ඔවුන්ට බල කරන්නට පුළුවන්කම තිබෙනවා. මේ රටේ මාධ්‍යවේදීන් ඇතුළු ලෝකයේම මාධ්‍යවේදීන් පිළිගත් මූලධර්මයක් තමයි, තමන්ගේ මූලාශ්‍රය හෙළි නොකිරීම. මාධ්‍යකරණය සඳහා නිවැරදිව, රහසිගතව මූලාශ්‍රය ලබා ගැනීම අත්‍යවශ්‍යයි. එම පනත් කෙටුම්පතට අනුව එම

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මාධ්‍යවේදීන්ව අත්අඩංගුවට ගන්න වුණත් පුළුවන්, රඳවා ගැනීමේ නියෝග තබා ගන්න පුළුවන්, රැඳවීම් නියෝග - DO - ගහලා දීර්ඝ කාලයක් රඳවා තබා ගන්න පුළුවන්. එතකොට මාධ්‍ය නිදහස මොන තැනටද යන්නේ? තමුන්නාන්සේලාගෙන් සමහර අය, - අලුතින් ආපු අය මම දන්නේ නැහැ - පරණ සියලු දෙනාම අපිත් එක්ක කී සැරයක් එකම වේදිකාවල මාධ්‍ය නිදහස වෙනුවෙන් කථා කරලා තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට අවස්ථාව දෙන්න, කථාව අවසන් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පනත් කෙටුම්පත මාධ්‍ය නිදහස වළ පල්ලට දමන, මාධ්‍යකරුවෝ හිරේ යවන නීතියක්. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බරපතළම දේ මෙයයි. ඔබතුමාටත්, අපටත් එහෙම වෙන්න පුළුවන්. නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට හැකියාව තිබෙනවා, අධිකරණ නියෝගයක් නැතිව ඔබතුමාගේ දුරකථන ඇමතුමට සවන් දෙන්න, මේ ඕනෑම මන්ත්‍රීවරයෙකුගේ දුරකථන ඇමතුමට සවන් දෙන්න.

ඉන්දුනීසියාවේ ජනාධිපතිතුමාගේ දුරකථන ඇමතුමකට සවන්දීලා අද ඉන්දුනීසියාවේ පොලිස් නිලධාරියෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මතක තබා ගන්න, මෙතෙක් කල් තිබුණේ එහෙම තොරතුරක් ගන්නවා නම්, phone hacking කරනවා නම් එහෙම කළේ අධිකරණයේ අවසරය මත පමණක් බව. ඒකත්, විශේෂ අවස්ථාවක. හැබැයි, මේ නීතිය මඟින් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට එම හැකියාව ලැබෙනවා. නියෝජ්‍ය පොලිස්පතිවරු මිනී මරලා එල්ලුම්ගස් ගිය රටක, පොලිස්පතිවරු මරණීය දඬුවමට ලක්වෙච්ච රටක, ප්‍රමිතියක් නැති පොලීසියක් තිබෙන රටක පොලිස් නිලධාරීන්ට මේ රටේ හැම පුරවැසියෙකුගේම දුරකථන hack කරන්න පුළුවන් අයිතිය නීතියෙන් දෙනවා නම්, ඒක මොන නීතියක්ද? මොන සාධාරණත්වයක්ද? මේක මොන ආණ්ඩුවක්ද?

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sunil Watagala. You get 12 minutes.

[අ.භා. 12.05]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට කේන්ති යෑම සාධාරණයි. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, අපිත් දන්නවා, සදාකාලික ආණ්ඩු නැහැ කියලා. නමුත්, මේ ආණ්ඩුව ගෙදර යවලා වෙන ආණ්ඩුවක් බලයට එන්න නම්, අපි හැම තිස්සේම කියනවා වාගේ අපට වඩා හොඳ වෙන්න. එතකොට ඔබතුමන්ලාට පුළුවන් ආණ්ඩුවක් පිහිටුවන්න. හැබැයි, අපි විශ්වාස කරනවා, ඔබතුමන්ලාට එහෙම වෙන්න බැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එළිදැක්වූවා, මෙම භාර (සංශෝධන) පනත් කෙටුම්පත නිශ්චල දේපළවලට පමණයි අදාළ වන්නේ කියලා. එය මම- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. හරි හරි, කලබල වෙන්න එපා. මෙය ලියාපදිංචි කරන්න පුළුවන් නිශ්චල දේපළ සම්බන්ධයෙන් පමණයි, වංචල දේපළවලට අදාළ වෙන්නේ නැහැ කියලා, ඔබතුමා කිව්වා. *[බාධා කිරීමක්]* ඔබතුමා බාධා කරන්න එපා. මගේ කථාවෙන් පසුව කථා කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ඒක guidelinesවලින් ගන්න පුළුවන් කියලා රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ රැඳී සිටින අර නිලධාරිනිය කිව්වා. ඒක නිසා කලබල වෙන්න එපා. ඔබතුමන්ලා සතුටු වෙන්න, 1917 අංක 9 දරන භාර ආඥාපනතට ලක් ඉතිහාසයේ එකම සංශෝධනයයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ, 2018 වසරේදී. ඊට පසුව අපි අද දවසේ තමයි මේ සංශෝධන ගෙන එන්නේ. අඩු ගණනේ ඒ ගැනවත් හිතලා සතුටු වෙන්නකෝ.

2018දී ගෙනාපු සංශෝධන පනත මඟින් ලියාපදිංචිය අනිවාර්ය කරලා නැහැ. මේ පනත් කෙටුම්පතෙන් තමයි ලියාපදිංචිය අනිවාර්ය කරලා තිබෙන්නේ. ලියාපදිංචිය අනිවාර්ය කිරීම තුළ ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා. භාර හරි, පදනම් හරි, මොනවා හරි හදා ගත් ඉතිහාසය ඇතුළේ අමු බොරුවක් තිබුණේ කියන එක අපි දන්නවා. දැන් බලන්න, හත්වැනි පාර්ලිමේන්තුවේදී පෞද්ගලික මන්ත්‍රී පනත් මඟින් පදනම් ඇවිල්ලා තිබෙනවා 199ක්. අටවන පාර්ලිමේන්තුවේදී 169ක්, නවවන පාර්ලිමේන්තුවේදී 125ක් ලෙස එක එක අය එක එක නම්වලින් එක එක පදනම් හදලා තිබෙනවා. ඒ පදනම්වල හරය මම එකකින් කියන්නම්. අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පනත කියලා එකක් හදලා තිබෙනවා. මම මේ සමහර දේවල්වල බහුතර අදහස කියන්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පනතේ එක තැනක සඳහන් වෙනවා, "අරමුදල් රැස්කිරීම සහ දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම" කියලා. ඒ, පනතේ එක අරමුණක්. එම පනත් කෙටුම්පත ඉදිරිපත් කළ එක්කෙනා තමයි, දිසානායක මුදියන්සේලාගේ ජයරත්න. ඒ කියන්නේ, දි.මු. ජයරත්න. ඒ, හිටපු අගමැතිවරයෙක්. එතුමා ඒ පනතට වගන්තියක් දමාගන්නවා, මුදල් රැස් කරන්න පුළුවන්, විදේශ පරිත්‍යාග ගන්න පුළුවන් කියලා. එම පනතේ 16වන වගන්තියේ තිබෙනවා, "නිර්මාතෘවරයා මිය ගිය අවස්ථාවක දී, නිර්මාතෘවරයාගේ පුතා වන තැනැත්තා නිර්මාතෘවරයාගේ ධුරයට අනුප්‍රාප්ත විය යුතුය" කියලා. එතකොට එය එම, පරම්පරාවට හදපු පනතක්. පරම්පරාවට පනතක් හදලා ආරක්ෂක භාරය ලෙස මහා භාරකාරයාව නම් කරලා තිබෙනවා. හැබැයි, මුදල් ආදායම එකතු කිරීම ඔහුට ලබා දී නැහැ. ඒ කියන්නේ, පවුලට පනතක් හදාගෙන තිබෙනවා. මුදල් රැස් කරන්න මේ විධියට ඉතිහාසයේ නොයෙක් පනත් හදාගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙන්න මේවා තමයි වෙනස් කරන්නේ.

ඒ අනුව භාර (සංශෝධන) පනත් කෙටුම්පතේ 5වන වගන්තිය යටතේ අපි යම් කොටසක් ඇතුළත්කොට තිබෙනවා. මේක තමයි හරයාත්මක කොටස. ඒ අනුව භාර (සංශෝධන) පනත් කෙටුම්පතේ 5වන වගන්තිය යටතේ සෑම භාරයක් පිළිබඳවම පහත සඳහන් පුද්ගලයන් හෝ ආයතන තොරතුරු ඉල්ලන වෙලාවට ඒවා ලබා දෙන්න ඕනෑ. ඒ අය කවුද? එක, නීතිපතිවරයා. නීතිපතිවරයා තොරතුරු ඉල්ලුවොත් දෙන්න ඕනෑ. දෙක, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය. මේ ආයතනයෙන් තොරතුරු ඉල්ලුවොත් දෙන්න ඕනෑ. තුන, විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුවොත් තොරතුරු දෙන්න ඕනෑ. හතර, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉල්ලුවොත් තොරතුරු දෙන්න ඕනෑ. පහ, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා ඉල්ලුවොත් තොරතුරු දෙන්න ඕනෑ. හය, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ වෙනත් යම් සාපරාධී වරදක් විමර්ශනය කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ වගකීම ඇති යම් පොදු අධිකාරියක් ඉල්ලුවොත් මේ තොරතුරු දෙන්න ඕනෑ. හය, රාජ්‍ය ප්‍රසම්පාදන අධිකාරියක් ඉල්ලුවොත් මේ තොරතුරු දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ පුද්ගලයන් හෝ ආයතන තොරතුරු ඉල්ලුවොත් ලබා දෙන්න ඕනෑ. මෙහි අරමුණ මෙන්න මේ කොටසින් හරියටම පැහැදිලි වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකේ කියනවා, "The proposed amendments were submitted by the Financial Intelligence Unit - FIU - of the Central Bank of Sri Lanka based on a request made by the Department of Registrar General in view of securing Sri Lanka's readiness for the recent Third Mutual Evaluation based on the observations made by the Task Force on Anti-Money Laundering and Countering the Financing of Terrorism" යනුවෙන්.

ත්‍රස්තවාදයට මුදල් එකතු කිරීමට, එහෙම නැත්නම් මුදල් විශුද්ධිකරණයට අදාළව මේ භාර පවත්වා ගෙන ගියොත් මොකද වෙන්නේ? ඇත්තවශයෙන්ම මේ ගොඩක් භාර, භාර කියලා පෙන්නුවාට මේවා කටයුතු කරන්නේ කොහොමද? ඒක හරියට වාහනයේ ඉදිරිපස "බුදු සරණයි" කියලා ගහගෙන ඇතුළේ ගෙරිමස් ගෙනියනවා වාගේයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අම්බුලුවාව භාරයෙන් පෙනෙන්නේ අක්කා පෙන්වා නංගී දිග දෙනවා වාගේ වැඩක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුණ්‍ය භාරයක් පෙන්වා, ඒක ඇතුළෙන් යන්නේ වෙන අරමුණක්. දැන් අපි ඒ දේවල් නතර කරලා තිබෙනවා. ඒකට අදාළ නීති මේ අවස්ථාවේ ගෙනැල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් මේ කරන්න හදන්නේ මොකක්ද? මේ සෑම නීතියකින්ම හදන්නේ රටේ ස්ථාවරත්වයක් ඇති කරන්නයි. මීට පෙර කළ කථාවේදී අපි ජාත්‍යන්තර නීතියට ගරු කරන්නේ නැහැ, ජාත්‍යන්තර ප්‍රතිපාදනවලින් නොවෙයි මේ දේවල් කරගෙන යන්නේ වාගේ කථා කිව්වාට අපි පසුගිය කාලයේ ගෙනාපු නීති අණ පනත් සැලකිය යුතු ප්‍රමාණයක් ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට අනුගතව, ඒවාද මූලධර්ම කොටගෙන තමයි ගෙනාවේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත - Proceeds of Crime Act එක - ගෙනාවා. මත්ද්‍රව්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ධනයක් උත්පාදනය වනවා නම්, අපරාධයකින් යම් අයුතු ධනයක් උත්පාදනය කර ගන්නවා නම් ඒ පිළිබඳව ප්‍රශ්න කරන්නයි මේ පනත ගෙනාවේ. ඒ වාගේම පනතක් තමයි මේ භාර (සංශෝධන) පනතත්. යම් භාරයක් ඇති කරලා ඒ භාරය පෙන්වා අයුතු ධනයක් උපයනවා නම්, ඒක අයුතු අරමුණකට යනවා නම්, ඒක හෙට්ටු කරන්න, මට්ටු කරන්න තමයි මේ පනත අරගෙන ඇවිල්ලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ විවාදය ඇතුළේ කරපු ගොඩක් කථා මම අහගෙන හිටියා, ඊයේ දවසේත්, අද දවසේත්. අපේ ලක්මාලි හේමචන්ද්‍ර සහෝදරිය මේ කාරණය හරියටම, හොඳටම මේ ගරු සභාවට පැහැදිලි කළා. මෙතැනදී ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත පිළිබඳව චතුර වීදුරුවේ කිඹුල්ලු මවනවා; බොරු බිල්ලෝ මවනවා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි අපට ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනතක් අද දවසේ අවශ්‍ය වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජයේ ලොකු කතිකාවක් ඇති වෙලා තිබෙනවා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුයි කියලා. අපි ඒ පනත අහෝසි කරනවා. ඒක හරියට හරි. දැන් ඒ වෙනුවට ගෙන ඒමට නියමිත පනත තිබෙන්නේ කෙටුම්පත් අවස්ථාවේ. ඒ ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ තර්ක කරලා තිබෙන්නේ. දැන් ඒ නිගමනය පාර්ලිමේන්තුවට එන්න නියමිතව තිබෙනවා. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනතක් ගේන්නේ ඇයි? රටේ ජාතික ආරක්ෂාව ඉලක්ක කරලා ත්‍රස්තවාදයෙන් රට මුදා ගැනීමට අදාළව තමයි තිබෙන පනත repeal කරලා අලුත් එකක් අරගෙන එන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඇයි අපට සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනතක් අවශ්‍ය වන්නේ? පසුගිය වකවානුව පරීක්ෂණයට ලක් කළාට පස්සේ ඔබතුමාත් දන්නවා, මේ ආණ්ඩුවට යටින් ක්‍රියාත්මක වන කළු ආණ්ඩුවක් තිබෙන බව. ඒ කළු ආණ්ඩුව තමයි මත්ද්‍රව්‍ය ආශ්‍රිතව ඇති වී තිබෙන තත්ත්වය. මේ මත්ද්‍රව්‍ය ආශ්‍රිතව එන තත්ත්වය සංවිධානාත්මකයි. එතකොට මේ සංවිධානාත්මක අපරාධ ජාලයට වැටෙන මේ මත්ද්‍රව්‍ය ජාලය දේශීය සහ විදේශීය වශයෙන් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, you have two minutes left.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේදී ගරු අනිල් ජයන්ත ඇමතිතුමාට වෙන් වී තිබෙන කාලයෙන් විනාඩි දෙකක කාලයක් මා ලබා ගන්නවා. ඒ සඳහා එතුමා අනුමැතිය දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ සංවිධානාත්මක අපරාධ කියන එකට, මත්ද්‍රව්‍ය ජාලය ආශ්‍රිතව පවතින තත්ත්වයන්වලට එරෙහිව කටයුතු කරන්න අපට පනතක් අවශ්‍ය වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ මත්ද්‍රව්‍යවලට සම්බන්ධයි, අවි ජාවාරම; අවි ජාවාරමට සම්බන්ධයි, පාතාලය; පාතාලයට සම්බන්ධයි, කප්පම්. එතකොට මෙන්න මේ දම්වැලේ පුරුකක් සේ දිවෙන සංවිධානාත්මක ජාලයට අදාළ කරලා අපට අවශ්‍ය වෙලා තිබෙනවා, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනතක් ගෙන එන්න. ඒක ගෙන එන්න අවශ්‍ය වන්නේ නිකම්ම නොවෙයි. මේක ජාතික සීමා ඉක්ම වූ සංවිධානාත්මක අපරාධවලට එරෙහි

එක්සත් ජාතීන්ගේ සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද, ඵලදායී ජාතික හා ආර්ථික සහයෝගීතාව මඟින් බරපතළ අපරාධ වැළැක්වීම, විමර්ශනය සහ නඩු පැවරීම සඳහා ද අදාළ වනවා. එතකොට මේක අදාළ වන්නේ දේශීය තත්ත්වයන් සඳහාම නොවෙයි. මේක ජාත්‍යන්තර නීතියත් ආශ්‍රයෙන් ඇති කර ගත් තත්ත්වයක්. මොකද, අපි එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනවලට, එතැනින් ගියාම අන්තර් ජාතීන්ගේ සම්මුතිවලට බැඳිච්ච රටක්. ඒ ආශ්‍රිතව සංවිධානාත්මක අපරාධ කියන කාරණය දිවෙන්නේ ලංකාවේ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මත්ද්‍රව්‍ය ජාවාරම දේශීය සහ විදේශීයව; අවි ජාවාරම දේශීය සහ විදේශීයව පවතිනවා. මංකොල්ලය කියන එකත් ඒ වාගේයි. එතකොට මේ සියල්ල බැඳිලා තිබෙන්නේ ජාත්‍යන්තරයත් එක්ක. ඒ අනුව ඒ සියල්ල ආශ්‍රිතව තමයි අපි මේ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත දියුණු පනතක් හැටියට ගේන්නේ.

මේ අවස්ථාවේ මේ කෑ ගහන මහත්වරුන් කවුද? මේ කෑ ගහන මහත්වරුන්ට අපි කියනවා, දැන් මේක තමයි අවස්ථාව කියලා. තවම මේක draft එකක් විතර නේ. අපි මේ කථා කරන මොහොතේත් ශ්‍රේෂ්ඨාධිකරණය සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත පිළිබඳව කරුණු විමසනවා. ඒකට එරෙහිව පෙත්සම් ඉදිරිපත් කරපු මහත්වරුන් මේ වනකොටත් ශ්‍රේෂ්ඨාධිකරණය ඉස්සරහ කරුණු දක්වනවා. ඒ වාගේම ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතට එරෙහිව ඉදිරිපත් වූ පෙත්සම් විභාග කරලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ගරු කථානායකතුමා වෙත එම නිගමනයත් ලබා දීමට නියමිතව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට වගකීමෙන් කියන්නම්, මෙවැනි ආකාරයටම ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් යොමු වූ පනත් කිහිපයක් මීට කලිනුත් තිබුණා. මේ ගරු සභාවේ දැනට අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ අපි සම්මත කරගෙන තිබෙනවා, 2025දී පනත් 26ක්, 2026දී පනත් 25ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් 25 ඇතුළේ කොයිම වෙලාවක හරි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අපට කිව්වා නම්, මේක එක්තරා ආකාරයකට සුදුසු නැහැ; එහෙම නැත්නම් ජන මත විචාරණයකට යා යුතුයි කියලා, එවැනි ආකාරයේ දෙයක් indicate කරපු හැම අවස්ථාවකම එක්කෝ ඒ සංශෝධනය අපි ඉවත් කරලා තිබෙනවා, නැත්නම් යළිත් ඒකට ගැළපෙන විධියට ඒ සංශෝධනය කරලා තිබෙනවා. ඒක නිසා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිට අපේ කථාවක් තිබුණේ නැහැ. විශේෂයෙන්ම Inland Revenue Act එක, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ Anti-Corruption Act එක සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය අපට බොහෝ යෝජනා ඉදිරිපත් කළා. එක්කෝ ශ්‍රේෂ්ඨාධිකරණය කරපු දෙයට අපි අනුගත වෙලා ඒ සංශෝධනය කර ගත්තා, එහෙම නැත්නම් අපි ඒක අයින් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී රටක ඒක නේ වෙන්න ඕනෑ. රටේ ජනතාවට සවන් දෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය කියලා ආයතනයක් තිබෙනවා. ඒ ආයතනයට සවන් දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, you have exhausted the Hon. (Dr.) Anil Jayantha's two minutes also.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Okay, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ වෙන්න ඕනෑ දේ මේකයි. අපි ජනතාවට සවන් දුන්නා. ජනතාවගෙන් ජන වරමක් ආවා. ජනතාවගේ ජන වරම පදනම් කරගෙන නීතියක් හැදුවා. ඒ නීතිය challenge වෙලා තිබෙනවා. ඒ නීතිය ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ගරු මූලාසනය වෙත තීන්දුවක් එවනවා. ඒ තීන්දුවට අනුගතව අපි නීතියක් සම්මත කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කල්ලි ටිකක් බිහි වෙලා ඉන්නවා. ඒ කල්ලි යනවා, ගෝල් ෆේස් එකට. ඒ කල්ලි යනවා, Viharamahadevi Park එකට. එයින් සමහර කල්ලියක් ඊයේත් මෙතැනට ආවා. අපි පාර්ලිමේන්තුවේ ගේට්ටුවත් ඇරලා දුන්නා, ඕනෑ නම් ගිහිල්ලා විරෝධතාව දක්වන්න කියලා. ඒක නේ, ප්‍රජාතන්ත්‍රවාදය. ප්‍රජාතන්ත්‍රවාදය දීලා තිබෙනවා, දෝරේ ගලන්න. අද කඳුළු ගෑස් expire වෙලා. අපේ ආණ්ඩුව යටතේ කාටද කඳුළු ගෑස් ගැහුවේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, would you wind up, please?

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුවක් යටතේවත් විවේචනයට නිදහසක් නැත්නම් වැඩක් නැහැ නේ. ඕනෑ කෙනෙක් අපේ ආණ්ඩුව විවේචනය කරන්න. ඕනෑ කෙනෙක් තමන්ට ඕනෑ තරම් විරෝධතාවයේ එන්න. ඊයේත් ආවා, විරෝධතා පෙළපාළියක්. ඒ මහත්වරු අපෙන් ඇහුවා, "කවදාද මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ?" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මහත්වරු කියනවා මම අහගෙන හිටියා, අපි ඒගොල්ලන් එන එකට භය වෙලා තමයි පනත් කෙටුම්පත කල් දාලා තිබෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පනත් කෙටුම්පත දැන් තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙන පනත් කෙටුම්පතක් මෙහේ ගෙනැල්ලා වාද කරන්නේ කොහොමද? ඒක නිසා බොරු බිල්ලෝ මවලා, මිනිස්සු භය කරලා, බොරු භීතියක් ඇති කරලා මේක එහාට දමන්න හදන්නේ. ඒක නිසා ජන වරම අතරේ ඉල්ලපු දේ ඔය කවුරු කිව්වත් මේ කල්ලි කණ්ඩායම්,-

මම දැක්කා, ලක්මාලි සහෝදරිය සජබ මන්ත්‍රීවරයෙකුට උත්තර දෙනවා. පදනම් විරහිත කරුණු ගෙනැල්ලා නිකම් බොරු ඇදබාලා, මේ ගරු සභාවත් නොමඟ යවලා, රටේ ජනතාවත් නොමඟ යවන්න හදනවා. දියුණු පනත් කෙටුම්පත් දෙකක් අපි අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරලා, පැහැදිලිවම අපි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් එන guideline යටතේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා. ඊට වඩා දෙයක් නැහැ. ඕක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition. You have allocated seven minutes for yourself and the Floor is yours.

[අ.භා. 12.22]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාරයන් ගැන සහ trusteeships ගැන කථා කරනකොට මම කියන්න කැමැතියි, රජය ජනතාවත් එක්ක ඇති කර ගත්ත ඒ භාරය ගැන, ඒ සමාජ ගිවිසුම ගැන, ඒ social contract එක ගැන. රජය ඇත්තවශයෙන්ම ජන වරමක් ලබා ගත්තා. ඒ ජන වරම ලබා ගත්තේ සංවර්ධනය ක්‍රියාත්මක කරන්න, මර්දනය ක්‍රියාත්මක කරන්න නොවෙයි. මර්දනය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිරීති, අණපනත් ගෙනෙන්න නොවෙයි ඒ ජන වරම ලබා ගත්තේ. ජන වරම ලැබුණේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රසාරණය කරන්න, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වැඩි කරන්න. හැබැයි, මේ අය ඒ ඇති කර ගත්ත සමාජ ගිවිසුම අමු අමුවේ උල්ලංඝනය කරලා, අද ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මර්දනය කරන්න නීතිරීති ගෙන එනවා. මානව අයිතිය, මූලික අයිතිය, භාෂණයේ අයිතිය, රැස්වීමේ අයිතිය, පක්ෂ දේශපාලනය කිරීමේ අයිතිය පලුදු කරන්න තමයි මේ නීතිරීති ගෙනෙන්නේ.

ඊට අමතරව අද අපි අහගෙන හිටියා, රජය නියෝජනය කරන මුදල් නියෝජ්‍ය ඇමතිවරයා ආර්ථික ක්ෂේත්‍රය ගැන කරුණු කාරණා ඉදිරිපත් කරනවා. ඒ කරුණු කාරණා ඉදිරිපත් කරනකොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, සැප්තැම්බර් මාසයේ දරිද්‍රතා රේඛාව රුපියල් 17,742 කියලා. මම පැහැදිලිවම ප්‍රකාශ කරන්න කැමැතියි, අද වනකොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැරැදි දත්ත කේන්ද්‍ර කරගෙන තමයි මේ දරිද්‍රතා රේඛාව සකස් කරන්නේ කියන එක. පුරවැසියෙකුට දිනකට කිලෝ කැලරි 2,030ක අවශ්‍යතාවක් තිබෙනවා කියන දත්තය පදනම් කරගෙන තමයි ඔවුන් දරිද්‍රතා රේඛාව ගණනය කරන්නේ. හැබැයි, වෛද්‍ය පර්යේෂණ ආයතනයට කථා කළාම ඒගොල්ලන් මොකක්ද කියන්නේ? පිරිමින්ට සහ කාන්තාවන්ට අවශ්‍ය කිලෝ කැලරි ප්‍රමාණය ඒ අයගේ ක්‍රියාශීලීත්වය තුළ වෙනස් කියා ඔවුන් කියනවා. ඒ කියන්නේ ක්‍රියාශීලීත්වයෙන් අඩු පිරිමියෙකුට කිලෝ කැලරි 2,340ක් අවශ්‍යයි. ක්‍රියාශීලී පිරිමියෙකුට කිලෝ කැලරි 3,340ක් අවශ්‍යයි. ක්‍රියාශීලී කාන්තාවකට කිලෝ කැලරි 2,680ක් අවශ්‍යයි. ක්‍රියාශීලීභාවයෙන් අඩු කාන්තාවකට කිලෝ කැලරි 1,890ක් අවශ්‍යයි. කවුද මේක කියන්නේ? සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන MRI එක. හැබැයි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ගණනය කර තිබෙන්නේ අපේ රටේ පුරවැසියෙකුට දිනකට අවශ්‍ය කිලෝ කැලරි 2,030ක් කියායි. එසේ වැරදි දත්ත, බොරු දත්ත මත පදනම්ව 2026 සැප්තැම්බර් මාසය සඳහා දරිද්‍රතා රේඛාව සකස් කරගෙන තමයි ඔවුන් කියන්නේ එක පුද්ගලයෙකුට දින 30කට තම මූලික අවශ්‍යතා වෙනුවෙන් රුපියල් 17,742ක් ඇති කියලා. මම පැහැදිලිවම කියනවා, මෙතැනින්ම මේ ආණ්ඩුව ෆේල් කියලා. මේ රටේ දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නටවත් බැරි ආණ්ඩුවක්, මේක. කොටින්ම කියනවා නම්, දරිද්‍රතා රේඛාවවත් සකස් කරගන්නට බැරි ආණ්ඩුවක් අද රට පාලනය කරන්නේ.

මේ සභාවේ රජය නියෝජනය කරන සහෝදර, සහෝදරියන්, මව්වරුන්, පියවරුන්, ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාගෙන්ම මම අහන්න කැමැතියි, අද මේ රටේ දරුවන්ට ප්‍රමාණවත් පෝෂණයක් ලැබෙනවාද, මේ රටේ මව්වරුන්ට ප්‍රමාණවත් පෝෂණයක් ලැබෙනවාද කියලා. අද අපේ රටේ දුප්පත්කම සියයට 30ත්, 40ත් අතර ප්‍රමාණයක තිබෙනවා. වතු ප්‍රජාව දුක් විඳිනවා; මැද පන්තිය දුක් විඳිනවා; වෘත්තියවේදීන් දුක් විඳිනවා; ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් දුක් විඳිනවා. රැකියා බිහි වෙනවා වෙනුවට විරැකියාව නිර්මාණය වෙනවා. අපේ රටේ තිබෙන කර්මාන්තශාලා වසා පිට රට ගිහින් ඒවා විවෘත කරනවා. ගොවි, කම්කරු, ධීවර ජනතාව අද සහමුලින්ම අසහනයට පත් වෙලා. ඔබ ගෙන එන්නට හදන මර්දනකාරී ප්‍රතිපත්ති තුළ යුරෝපා හවුල ලබා දෙන GSP Plus සහනයත් අපේ රටට අහිමි වීමේ අවදානම නිර්මාණය වීමට බොහෝ ඉඩකඩ තිබෙනවා.

ඇත්තටම මේ ආණ්ඩුවට හැඟීමක් නැද්ද, මේ රටේ ජනතාව පිළිබඳව? සහකම්පනයක් නැද්ද, සංවේදීභාවයක් නැද්ද? මට ටිකකට කලින් ඇහුණා, රජය නියෝජනය කරමින් සංවිධානාත්මක අපරාධ ගැන කථා කරනවා. රජය තමයි ලොකුම සංවිධානාත්මක අපරාධ ක්‍රියාත්මක කරන්නේ, බොරු කියලා. රුපියල් ලක්ෂ 12ට විටිස් කාර් ගෙනෙනවා කිව්වා, මේ රටේ තරුණ පරපුර වෙනුවෙන්. වරායෙන් ගොඩබාන මිලටම තෙල් ටික දෙනවාය කිව්වා. සියයට 33කින් විදුලි බිල අඩු කරනවාය කිව්වා. ජනාධිපතිකම ගන්න, පාර්ලිමේන්තුවේ 2/3ක බලය ගන්න "බොරුව" කියන සංවිධානාත්මක අපරාධය කරන්නේ මේ රජයයි කියන එක මම පැහැදිලිව කියන්නට කැමැතියි.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මගේ මේ කෙටි ඉදිරිපත් කිරීම අවසන් කරන්නේ වෙන කාගේවත් කථාවකින් නොවෙයි, අපේ විජිත හේරත් මැතිතුමා විපක්ෂයේ ඉන්නකොට කියපු කථාවකින්. මම වටගල නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ආදරණීය ඉල්ලීමක් කරනවා, විජිත හේරත් මැතිතුමා එදා පැවසූ මේ වචනවලට පොඩ්ඩක් සවන් දෙන්න කියලා. *[බාධා කිරීමක්]* එතුමා එදා කිව්වේ මොකක්ද? "ඇත්තටම ගත්තොත් ත්‍රස්තවාදය පැරදවීම සඳහා යැයි කියමින් ආණ්ඩු විරෝධී කොටස් මර්දනය කරන්න, ඔවුන් අත්අඩංගුවට ගන්න, ඔවුන්ට හිංසා පීඩා කරන්න මේ පනත පාවිච්චි කළා" මේ කියන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන. දැන් ගෙනෙන්න යන පනත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටත් එහා ගිය පනතක්. ඊළඟට කියා තිබෙනවා, "තමන්ට එරෙහිව කථා කරන, තමන්ට එරෙහිව සංවිධානය වන, තමන්ට එරෙහිව උද්ඝෝෂණය කරන සියලු දෙනා මර්දනය කරන්න මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කළා" කියලා. කවුද මෙහෙම කියන්නේ? ගරු විජිත හේරත් වර්තමාන ඇමතිතුමා එවකට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට සිටියදීයි. "මේක ආණ්ඩුවට එරෙහි, ආණ්ඩුව විවේචනය කරන අය මර්දනය කරන්න ගෙන එන පනතක්. ඒ නිසා මේක මතුපිටින් පෙන්නුවාට ත්‍රස්තවාදයට එරෙහි කියලා, ඒ ත්‍රස්තවාදය කියන එක දඩමීමා කරගෙන තමයි ආණ්ඩු විරෝධීන්ව මැඩපවත්වන්න පාවිච්චි කරන්නේ. ඉතින් ඒ නිසා අපි මේක අහෝසි කළ යුතුයි කියන ස්ථාවරයේ ඉතා පැහැදිලිව ඉන්නවා" කියලාත් එතුමා සඳහන් කර තිබෙනවා.

දැන් මේ ගෙන එන පනත් කෙටුම්පතත්, තිබෙන පනතත් - මේ ඔක්කෝම - අහෝසි කරන්න ඕනෑ කියන ස්ථාවරයේ තමයි ගරු විජිත හේරත් ඇමතිතුමා එදා විපක්ෂයේ ඉන්නකොට හිටියේ. එතුමා ඒ කාලයේ විපක්ෂයේ සිටියදී කොහොමද කිව්වේ? "අදත් අපි කියන්නේ මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුයි කියලා. ඒක කියන්න හේතුව තමයි, මේ පනත මඟින් ඕනෑම පුද්ගලයෙක්ව පොලීසියට පුළුවන්, පොලීසියේ සහකාර පොලිස් අධිකාරිවරයෙකු ඉදිරිපිට ඒ පුද්ගලයා ලබා දෙන කට උත්තරය ඔහුට විරුද්ධව සාක්ෂියක් විධියට පාවිච්චි කරන්න" කවුද මෙහෙම කියන්නේ? විජිත හේරත් වත්මන් ඇමතිතුමා. එතුමා මේක කියන්නේ කවදාද? එදා විපක්ෂයේ ඉන්නකොට. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව එතුමා එදා මේ ආකාරයටත් කියනවා. "අපි කවුරුත් දන්නවා, පොලීසිවලින් බොහෝ අවස්ථාවලදී පහර දීලා, අමානුෂික ලෙස වද දීලා, බලහත්කාරයෙන් ප්‍රකාශවලට අත්සන් ගන්නවා. එතකොට

අකැමැත්තෙන් - බලහත්කාරය නිසා - යම් පුද්ගලයෙකුට පොලීසිය හඳුන කට උත්තරයකට අත්සන් තියන්න වෙනවා" කවුද මේ කියන්නේ? විජිත හේරත් වත්මන් ඇමතිතුමා. කවදාද මේක කියන්නේ? විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වෙලා හිටපු පසුගිය කාලයේ.

අවසානයට එතුමා මෙන්න මෙහෙම කියනවා. "ඕනෑම ආණ්ඩුවක් බලයට පත් වන මුල් අවස්ථාවේදී හරි ජනතාවාදීයි. හැබැයි, ප්‍රශ්න විසඳා ගන්න බැරිව, ආර්ථික ප්‍රශ්න උග්‍ර වෙනකොට, ආණ්ඩුවට එරෙහිව ජනතා විරෝධතාවන් පැන නඟිනකොට, ආණ්ඩුවේ පැවැත්ම කඩාගෙන වැටෙනකොට මෙවැනි මර්දන පනත් ගේනවා. ඒක තමයි ඉතිහාසයේ හැම ආණ්ඩුවක්ම කළේ. අද මේ ආණ්ඩුව කරන්නෙත් ඒකම තමයි" කවුද මෙහෙම කියන්නේ? විජිත හේරත් වත්මන් ඇමතිතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා එදා ඒ කියපු කථාව මගේ දුරකථනයෙන් අහන්න කැමතිද? මගේ දුරකථනයේ එම කථාව තිබෙනවා. ඕනෑ නම් මම ඒක අහන්න සලස්වන්නද? ඒක අහන්න අවශ්‍යද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have exhausted your time, and we have to suspend the Sitting for lunch.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා කළු ආණ්ඩුවක් පිළිබඳව කථා කළා. මම එතුමාගෙන් අහන්න කැමතියි, මේ කළු ආණ්ඩු ක්‍රියාත්මක කරන්නේ කවුද කියන එක. කෙනෙකු ගැන කොණ්ඩා මෝස්තරවලින් තීන්දු කරන අණපනත් ගෙන එන එක හරිද? තමන් අඳින ඇඳුම පැලඳුමෙන් ඒක තීන්දු කිරීම හරිද? එය යුක්ති සහගතද? ඇඟේ පච්චයක් කෙටූ පමණින් ඒ අය සංවිධානාත්මක අපරාධ කල්ලිවලට සම්බන්ධ වුණා කියලා අනුමාන කරන එක හරිද?

ඒ නිසා මම මේ ආණ්ඩුවට මේ කාරණයත් කියන්න කැමතියි. විජිත හේරත් මැතිතුමා එදා විපක්ෂයේ සිටියදී කියපු ඒ මසුරන් වචන අඩංගු ලේඛනය මම **සභාගත*** කරනවා, මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් වන 159දෙනාටම කියවන්න.

මේ, එතුමා එදා කියපු මසුරන් වචන. විජිත හේරත් මැතිතුමා විපක්ෂයේ ඉන්නකොට මේ කරපු ප්‍රකාශය අනුගමනය කරමින් ජනතා විරෝධී, ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී අණපනත් දෙකම කරුණාකරලා හකුළා ගන්න කියලා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of this House shall stay suspended until 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව නාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි මේ පාර්ලිමේන්තුව තුළ විවාද කරන්නේ වසර 100කට වඩා පැරණි නීතියකට කෙරෙන සංශෝධනයක් ගැන. 1917 අංක 9 දරන භාර ආඥාපනතට කෙරෙන වැදගත් නීති සංශෝධනයක් පිළිබඳවයි අද අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ. හැබැයි, මේක අවුරුදු 100කට වඩා පරණ නීතියකට කෙරෙන සංශෝධනයක් කියලා විතරක් අපට මේක ලඝු කරන්න බැහැ. හේතුව, අද අපි කථා කරන මේ විෂය, -මේ මාතෘකාව - මේ නීතියට කෙරෙන සංශෝධනය මඟින් මේ රටේ මහජනතාවගේ භාරකරුවන් විධියට අපි තහවුරු කරන්න බලාපොරොත්තු වෙන්නේ, විශේෂයෙන්ම රටේ ආර්ථිකය පිළිබඳ විශ්වාසය සහ රටේ ජනතාව උපයා ගත්ත මහජන දේපළවල, අරමුදල්වල ආරක්ෂාවයි.

නීතිය ඉදිරියේ සියලුදෙනා සමාන විය යුතුයි කියලා අපි කියනවා, නීතියේ ආධිපත්‍යය කියන සංකල්පය හරහා. නීතියේ ආධිපත්‍යය පිළිබඳව තමයි අපි මේ නීතිමය සංශෝධනය හරහා සාකච්ඡා කරන්නේ. අපේ රටේ පසුගිය දශක ගණනාවක අතීතයට ගියොත්, ඒ පැවති තත්ත්වය ගැන අපට අදහසක් තිබෙනවා, අපට අත්දැකීමක් තිබෙනවා. දශක ගණනක් මේ රටේ දේශපාලන අධිකාරීන්ගේ ක්‍රියාකලාපයන් සහ ප්‍රතිපත්තිමය තීන්දු - තීරණවල වැරදි භාවිතාවන් නිසා අපේ රටේ මිනිස්සු දුක් මහන්සියෙන් හම්බ කරගත් මිල මුදල්වල, එහෙම නැත්නම්, ඒ දේපළවල අර්ථලාභය තමන්ගේ අනාගත පරම්පරාවට ලැබෙයිද කියන ප්‍රශ්නාර්ථය ඔවුන්ට තිබුණා. ඒකේ ආරක්ෂාව ගැන, අවිශ්වාසයක්, අවිනිශ්චිතතාවක් මේ රටේ පොදු මහජනතාවට තිබුණා. අපට ඒ අතීතය අමතක කරන්න අපහසුයි.

ඒ වාගේ රටක මේ රටේ පොදු මහජනතාවගේ වර්තමාන භාරකරුවන් විධියට අපිට ගොඩ නහන්න වෙලා තිබෙන්නේ ආර්ථික වශයෙන් ශක්තිමත් රටක්ම කියන එක නොවෙයි. අපි එතැන නැහැ. "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළේ අපි කතා කරන්නේ, අපි අවධානයට ලක් කරන්නේ, ආර්ථිකය කියන කොටස විතරක් නොවෙයි. අපට එතැනින් එහාට පුළුල් දැක්මක් තිබෙනවා. අපි කථා කරන්න ඕනෑ නීතිය පිළිබඳව විශ්වාසයක් තබන්න පුළුවන් රටක් ගැන. අපේ රටේ රාජ්‍ය ආයතන කෙරෙහි මහජනතාවගේ පලුදු වෙච්ච විශ්වාසය නැවත ගොඩ නහන්න පුළුවන් පද්ධතියක් - ක්‍රමයක් - ගැන තමයි අපි කථා කරන්න ඕනෑ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

ඒ නිසා 1917 අංක 9 දරන භාර ආඥාපනතට කරන්න යන සංශෝධනය ගත්තොත්, මේක ඇතුළේ භාරකාරත්ව ක්‍රමය නියාමනය කිරීමක්, විධිමත් කිරීමක්, එහි පරිපාලන කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලිතාවක්, නිශ්චිතතාවක් ඇති කිරීම ඇතුළේ අපි කථා කරන්නේ ඇත්තටම, මේ රටේ මහජනතාවට අභිමි වෙච්ච ආර්ථික විශ්වාසය සහ මේ රටේ අනාගත පරම්පරාවට තමන්ගේ අනාගතය පිළිබඳ අභිමි වෙච්ච විශ්වාසය නැවත ඇති කිරීම ගැනයි. මේ පනත් කෙටුම්පත හරහා ඒ ගැන අපි කථා කරනවා.

මීට කලින් මේ පාර්ලිමේන්තු සභා ගැබේ කථා කරපු විපක්ෂයේ ඇතැම් මහජන නියෝජිතයන් - මන්ත්‍රීවරුන් - භාර ආඥාපනතට අදාළ විවාදය තුළදීත් සංවිධානාත්මක අපරාධ මැඩලීම සම්බන්ධයෙන් සිද්ධ කෙරෙන නීතිමය වෙනස්කම් පිළිබඳව යම් යම් අදහස් ඉදිරිපත් කළා. ඒගොල්ලන් කොහොමත් දක්ෂයි, බිල්ලෝ මවන්න. හැබැයි, ඒ කරපු කථාවලට පිළිතුරක් විධියට මම මේ වෙලාවේ මේ කාරණය කියන්න කැමැතියි. අපට මේ රටේ පොලීසිය නැත්නම්, පොලිස් බලතල අවභාවිත කරන්න, එහෙම නැත්නම්, රාජ්‍ය බලය අවභාවිත කරන්න, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අවභාවිත කරන්න -පාගා දමන්න- අලුතින් නීති හදන්න අවශ්‍ය නැහැ. ඉතිහාසයට ගිහින් බලන්න. මේ රටේ සුදු වැන් සංස්කෘතිය හැදුවේ නීතිවල අඩුවක් තිබිලාද? නැහැ, නීති හොඳට තිබුණා. මේ රටේ මාධ්‍යවේදීන්ව නිහඬ කළේ අලුත් නීති හදලාද? එහෙම නැත්නම්, මේ රටේ මිනිස්සුන්ව පැහැර ගෙන ගියේ, අතපය කඩලා දැම්මේ අලුත් නීති හදලාද? නැත්නම් තිබුණු නීතිවල අඩු පාඩු නිසාද? එහෙම එකක් නොවෙයි. මේ රටේ අතීතයට ගියොත්, ඉතිහාසය පුරාම පාලකයෝ නීති නැති රටක් නිර්මාණය කරා - නීතිය අවභාවිත කළේ නැහැ; නීතිය හොඳට තිබුණා. හොඳට නීති පද්ධතියක් තිබුණු රට ඇතුළෙම තමයි ඒ නීතිය පාගලා දාලා වැඩ කළේ. ඒ නිසා ආණ්ඩුවක් විධියට - පාලකයෝ විධියට - අපට විපක්ෂය කියන විධියට මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අවභාවිත කරන්න, ඒවා පාගලා දාලා මේ රට ඉස්සරහට කරගෙන යන්න අලුත් නීති හදන්න ඕනෑ නැහැ. අපි ආණ්ඩුවක් විධියට හැම තිස්සේම උත්සාහ කරන්නේ මහජනතාවගේ පැත්තේ ඉඳගෙන ජනතාවාදී පාලනයක් ගැන කථා කරන්න. ඒ නිසා රටක ප්‍රජාතන්ත්‍රවාදය මනින්න ඕනෑ නීති පොත් කීයක් තිබෙනවාද, ඒ නීති පොත්වල නීති කොච්චරක් තිබෙනවාද කියන එකෙන්ම නොවෙයි. ඒ නීතිය ක්‍රියාත්මක කරන පාලක පන්තිය; රටේ භාරකරුවන්; පාලකයන් තමන්ගේ සීමාව මොකක්ද කියලා දැනගෙන ඒ සීමාව තුළ හිඳිමින් මිනිසුන් වෙනුවෙන් වැඩ කරන්නේ කොහොමද කියන එකෙන් තමයි මනින්න පුළුවන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය මොකක්ද කියන එක. ඒ නිසා විපක්ෂයට මේක ගැන නැවත නැවත හිතා බලන්න කියන එක තමයි අපිට කියන්න තිබෙන්නේ.

දැන් මම නැවත මාතෘකාවට එනවා. භාර ආඥාපනතට සිදු කෙරෙන මේ සංශෝධනය ගත්තොත්, මේක ඇතුළේ සංවාදයක් ගොඩනැහෙන්න අවශ්‍යම නැහැ, මේ සංශෝධනය හරහා භාරකාරත්ව ක්‍රමය අහෝසි කෙරෙනවාද කියන ප්‍රශ්නයට. භාරකාරත්ව ක්‍රමය කිසිසේත්ම අහෝසි කෙරෙන්නේ නැහැ.

ඒ වාගේම, මෙන්න මේ ප්‍රශ්නයටත් අපි පැහැදිලිව පිළිතුරක් දෙන්න ඕනෑ. ඒ තමයි, පුද්ගලයන්ට නීත්‍යානුකූල අරමුණු වෙනුවෙන් මේ භාරය, භාරකාරත්වයන් නිර්මාණය කිරීම කියන එක මේ සංශෝධන හරහා තහනම් කිරීමක් කෙරෙනවාද කියන එක. නැහැ. මේ සංශෝධනය හරහා එහෙම එකක් කිසිසේත්ම කෙරෙන්නේ නැහැ. අපි දන්නවා, ආණ්ඩුවක් විධියට මේ භාරයන් නිර්මාණය කිරීම හරහා අපිට අරමුණු කිහිපයක් සම්පූර්ණ කරගන්න පුළුවන්. කෙනෙකුට පුළුවන් තමන්ගේ පවුලේ දේපළ ආරක්ෂා කරගන්න භාරයන් නිර්මාණය කරන්න. ඒ වාගේම, තමන්ගේ පවුලේ පරම්පරාවේ, ඊළඟ පරම්පරාවන්, අනාගත පරම්පරාවන් වෙනුවෙන් මේ වත්කම්, දේපළ පරිස්සම්සහගතව කළමනාකරණය කරන්න, ඒ අයගේ අර්ථලාභය පිණිස මේවා නිර්මාණය කරන්න පුළුවන්. පුණ්‍ය කටයුතු සහ වෙනත් සමාජ සුභසාධන කටයුතු වෙනුවෙන් මේ භාරයන් නිර්මාණය කරන්න පුළුවන්. විශේෂයෙන් අපි දන්නවා, අපි වාගේ ආසියාතික රටවල දුප්පත් මිනිස්සුන්ට සහන සලසන්න; නිවාස, ආහාර, වෛද්‍ය පහසුකම් සහ වෙනත් සහනාධාර දෙන්න මේ භාරකාරත්වයන් නිර්මාණය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

සෞඛ්‍ය සේවාවන්ට දායක වෙන්න; වෛද්‍ය උපකරණ දෙන්න, රෝහල්වල පහසුකම් වර්ධනය කරන්න, නිදහස් අධ්‍යාපනයට; විශේෂයෙන්ම දුප්පත් දරුවන්ට, අධ්‍යාපනයට දක්ෂතා තිබෙන දරුවන්ට ශිෂ්‍යත්ව අරමුදල්, අධ්‍යාපනාධාර, පොත්පත්, පාසැල් උපකරණ දෙන්න, ඒ වාගේම මුස්ලිම් පල්ලි, විහාරස්ථාන, කෝවිල් ඇතුළු ආගමික සිද්ධස්ථාන ආරක්ෂා කරගන්න, සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගන්න මේ භාරකාරත්වයන් නිර්මාණය වනවා. ඒක හොඳයි. හැබැයි නීත්‍යානුකූල අරමුණක් සහිතව සිද්ධ කෙරෙන මේ ප්‍රකාශිත භාරකාරත්වයන් හරහා සිද්ධ කෙරෙන නීතිවිරෝධී දේ යටපත් කරන්න තමයි අපි මේ නීතිය වෙනස් කරන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ මේ ප්‍රකාශිත භාරයන් කියන එක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හරහා ලියාපදිංචියක් කෙරෙන්න අවශ්‍යයි කියලා. භාරකරුවන් කවුද, අර්ථලාභීන් කවුද, මේ භාරය නිර්මාණය කරන කෙනා කවුද කියන එක සම්බන්ධයෙන් මේ රටේ පොදු මහජනතාවට තොරතුරු දැන ගැනීම සඳහා සහ පරිපාලන කටයුතු ක්‍රමවත්ව සිදු කර ගැනීම සඳහා මේක අවශ්‍යයි. අන්න ඒ නිසා තමයි මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම පිළිබඳ කාර්ය සාධක බලකාය ඉදිරිපත් කරපු නිර්දේශවලට යටත්ව මේ සංශෝධනය කළ යුතුයි කියන තැනක අපි ඉන්නේ.

අපි මේ සංශෝධනය හරහා කරන්නේ මේකයි. අපරාධවලින් උපයා ගත්ත වත්කම් සඟවා ගත්ත දේශපාලන අධිකාරින් ඉන්නවා. නීතිය යටයි. ඒ දේශපාලන අධිකාරින් උඩිනුයි හිටියේ. ඒ වාගේම, දූෂණයෙන් උපයා ගත්ත මුදල් තිබෙනවා. ඒවා මේ රටේ පොදු මහජනතාව අතරට දාන්න ක්‍රමයක් හොයා ගත්තා. ඒ තමයි මේ භාරයන්. ඒ වාගේම, මූල්‍ය ගනු දෙනුවල සැබෑ ස්වරූපය මහජනතාවට හෙළිදරව් කරන්න බැරි නිසා භාරයන් හරහා ඒවා සඟවා ගත්තා. ඒ නිසා හොඳ වැඩක් කරන්න ක්‍රියාත්මක කරගෙන ආපු මේ භාරකාරත්ව සංකල්පය හරහා නීති විරෝධී දේ සිදු වුණා නම් ඒ දේවල් මැඩ පවත්වන්න වර්තමාන ආණ්ඩුව විධියට අපිට අත්‍යවශ්‍යතාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මොකද, අපි තමයි මේ රටේ පොදු මහජනතාවගේ පැත්තේ ඉඳගෙන ඒ අය වෙනුවෙන් ඒ අයගේ උපරිම අර්ථලාභය පිණිස මේ පාලන ක්‍රමය කරගෙන යන්නේ. ඒ නිසා අපිට භාරකරුවන් විධියට විශේෂයෙන්ම යුතුකමක් තිබෙනවා, මේ අවශ්‍ය නීති සංශෝධනවලට අවධානය යොමු කරන්න. ඒ නිසා පොදු ජනතාව වෙනුවෙන් කෙරෙන මේ සංශෝධනයට විපක්ෂ නායකතුමා ප්‍රමුඛ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලැබෙයි කියන එක තමයි අපි බලාපොරොත්තු වන්නේ. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.10]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள 81/2026 எனும் எண்கொண்ட அறக்கட்டளைகள் திருத்தச் சட்டமூலத்தின் இரண்டாம் வாசிப்பு மீதான விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துகளை எடுத்துரைக்க விழைகின்றேன்.

அறக்கட்டளை அல்லது நம்பிக்கைப் பொறுப்பு என்பது, ஒருவர் தனது சொத்துக்களை அல்லது நிதி வளங்களை மற்றொருவரது பொறுப்பில் ஒப்படைத்து, குறிப்பிட்ட பயனாளிகளின் நலனுக்காக நிருவகிக்க ஏற்படுத்தும் ஒரு சட்ட உறவாகும். அறக்கட்டளைகள் திருத்தச் சட்டமூலமானது, 1917ஆம் ஆண்டின் 09ஆம் எண் கொண்ட அறக்கட்டளைகள் கட்டளைச் சட்டத்தின் 87ஆம் அத்தியாயம், 2018ஆம் ஆண்டின் 06ஆம் எண் கொண்ட திருத்தச் சட்டம் ஆகியவற்றின்கீழ் ஒழுங்குபடுத்தப்பட்ட அறக்கட்டளை நிருவாகக் கட்டமைப்பில் ஒரு முதன்மையான சீர்திருத்தத்தை முன்மொழிகின்றது. அறக்கட்டளைகளின் வெளிப்படைத் தன்மையையும் உண்மையான பயனாளிகளைக் கண்டறிவதையும் உறுதிசெய்வதே இச்சட்டமூலத்தின் முதன்மை நோக்கமாகும்.

வரலாற்று அடிப்படையில் தனிப்பட்ட வரம்புக்குள் இருந்த அறக்கட்டளை நிருவாகத்தை, முறைப்படுத்தப்பட்ட பொது ஒழுங்குமுறைக் கட்டமைப்புக்குள் கொண்டுவருகின்றது. இதன் வழியாகச் சட்டத்துக்கு முரணான நிதிப் பாய்ச்சல்கள், வரி ஏய்ப்புகள், பணச்சலவை மற்றும் பயங்கரவாதத்துக்கு நிதியளித்தல் ஆகியவற்றைத் தடுப்பதை இச்சட்டம் இலக்காகக் கொண்டுள்ளது. இச்சட்டமூலத்தின் முதன்மைச் சிறப்புக்கூறுகள், பழைய சட்டத்துடனான ஒப்பீடு, இதிலுள்ள பொருளாதார மற்றும் அரசியலமைப்பு அடிப்படையிலான கவலைகள் மற்றும் குழு நிலையில் மேற்கொள்ளப்பட வேண்டிய திருத்தங்கள் குறித்து பார்ப்பது பொருத்தமாக இருக்குமென நம்புகின்றேன்.

இத்திருத்தச் சட்டமூலத்தில் முன்மொழியப்பட்டுள்ள சீர்திருத்தங்கள் நான்கு முதன்மையான தூண்களில் கட்டமைக்கப்பட்டுள்ளன. முதலாவதாக, இச்சட்டத்தின் பிரிவு 5(1) அல்லது 5(2)இன்கீழ் ஒரு பொது அறக்கட்டளையை உருவாக்கும் அறங்காவலர்கள், அத்தகைய அறக்கட்டளை ஆவணம் நிறைவேற்றப்பட்டு ஒரு மாதத்துக்குள் பதிவாளர் நாயகத்திடம் அதனைப் பதிவுசெய்ய வேண்டும். வெளிநாட்டுச் சட்டத்தின்கீழ் உருவாக்கப்பட்டு இலங்கைக்குள் செயற்படும் எந்தவொரு வெளிநாட்டு அறக்கட்டளையும் உள்ளூர் வைப்பகக் கணக்குகளைத் தொடங்குதல், உள்ளூர் சொத்துக்களை வைத்திருத்தல், உள்ளூர் அறங்காவலரைப் பராமரித்தல் முதலிய தனது செயற்பாடுகளைத் தொடங்கிய நாளிலிருந்து மூன்று மாதங்களுக்குள் பதிவுசெய்ய வேண்டும். இச்சட்டமூலத்தின் பிரிவு 5A நடைமுறைக்கு வருவதற்கு முன்னர் தொடங்கப்பட்ட அனைத்து அறக்கட்டளைகளும், அப்பிரிவு நடைமுறைக்கு வரும் நாளிலிருந்து ஆறு மாதங்களுக்குள் கட்டாயமாகப் பதிவுசெய்ய வேண்டும். பதிவாளர் நாயகத்தால் வழங்கப்படும் பதிவுச் சான்றிதழ் ஐந்து ஆண்டுகள் வரை செல்லுபடியாகும். சான்றிதழ் முடியுறுவதற்குக் குறைந்தது மூன்று மாதங்களுக்கு முன்னர் புதுப்பித்தலுக்கு விண்ணப்பிக்க வேண்டும்.

இரண்டாவதாக, இச்சட்டத்தின் 6A மற்றும் 6B பிரிவுகளுக்கு அமைய பதிவு செய்யப்பட்ட அறக்கட்டளை விபரங்களில் ஏதேனும் அமைப்பு அல்லது செயற்பாட்டு மாற்றங்கள் ஏற்பட்டால், அறங்காவலர்கள் அதனை 14 வேலை நாட்களுக்குள் பதிவாளர் நாயகத்துக்குத் தெரிவிக்க வேண்டும். சட்டமா அதிபர், நிதிப் புலனாய்வுப் பிரிவு, கணக்காய்வாளர் நாயகம், சுங்கப் பணிப்பாளர் நாயகம், உள்நாட்டு இறைவரி ஆணையாளர் நாயகம், பணச்சலவை எதிர்ப்பு அதிகாரசபை ஆகியவற்றுக்கு அறக்கட்டளைப் பதிவு தொடர்பான விபரங்கள் பகிரப்படும். அறக்கட்டளையை உருவாக்கியோர், அறங்காவலர்கள், பயனாளிகள் மற்றும் பயனுறு உரிமையின் எல்லை முதலியவற்றைப் பார்வையிட பொதுமக்களுக்கு அணுகல் வழங்கப்படும்.

மூன்றாவதாக, 19A பிரிவின்கீழ் ஓர் அறங்காவலர் அல்லது அறக்கட்டளை அமைப்பில் நேரடி அல்லது மறைமுகப் பங்குரிமை, வாக்குரிமை அல்லது நிதி உரிமைமூலம் 10% அல்லது அதற்கு மேற்பட்ட பங்கைக் கொண்டிருக்கும் எந்தவொருவரும் "பயனளிக்கும் உரிமையாளர்" என வரையறுக்கப்படுகிறது. அறக்கட்டளையின் நிருவாகம், முதலீட்டு முடிவுகள் அல்லது அறங்காவலர் நியமனங்கள்மீது நேரடி அல்லது மறைமுக கட்டுப்பாடு செலுத்தும் எந்த ஒருவருக்கும் இச்சட்டம் பொருந்தும்.

நான்காவதாக, இச்சட்டத்தின் 19C பிரிவின்கீழ் பதிவுசெய்யத் தவறுதல் அல்லது தவறான விபரங்களை வழங்குதல் குற்றவியல் குற்றமாகக் கருதப்படும். இதற்கு நீதவான் நீதிமன்றத்தால் மூன்று மில்லியன் ரூபாய் வரை தண்டப்பணம் மற்றும் பத்து ஆண்டுகள் வரையிலான சிறைத் தண்டனை அல்லது இரண்டும் விதிக்கப்படலாம். இச்சட்டத்தின் 19D மற்றும் 19E பிரிவுகளின்கீழ் சிறிய நடைமுறைத் தவறுகளுக்கு நேரடியாக நிருவாகத் தண்டப்பணத்தை விதிக்கப் பதிவாளர் நாயகத்துக்கு அதிகாரம் அளிக்கப்பட்டுள்ளது. நிருவாகத் தண்டப்பணத்தைச் செலுத்துபவருக்கு குற்றவியல் வழக்குகளிலிருந்து சட்ட அடிப்படையிலான விலக்களிப்பு வழங்கப்படும். நிருவாகத் தண்டப்பண விதிப்புக்கு எதிராக அமைச்சின் செயலாளருக்கும் மேன்முறையீட்டு நீதிமன்றத்துக்கும் 30 நாட்களுக்குள் மேன்முறையீடு செய்யலாம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இச்சட்டமூலத்தின் நன்மைகளை ஏற்கும் அதேவேளையில், இதிலுள்ள சில அறைகூவல்களையும் நாம் கவனத்திற்கொள்ள வேண்டும். முதலாவதாக, வணிக அறக்கட்டளைகள், சிறிய

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

කුටුම්ප අපරාධ කට්ටලෙකි, පොදුත්තොම්බු අපරාධ කට්ටලෙකි ආකිය අනෙත්තුක්කුම් ඔරේමාතිරියාන පතිවු මරුත්රුම් 5 ආණ්ටු පුතුප්පිත්තල් කට්ටණංකළෙ විතිප්පතු ඉවරෙප්පෙ පාතික්කුම්. ඉරණ්ටාවතාක, වෙලිනාට්ටු අපරාධ කට්ටලෙකළෙ 3 මාතංකළුක්කුළ් පතිවු සෙය්ය වේණ්ටුම් මරුත්රුම් අවර්කළතු විපරංකළෙ වෙලිප්පටුත්ත වේණ්ටුම් එන්ර විති, තනියුරිමෙයෙ විරුම්පුම් පන්නාට්ටු මුතලීට්ටාළර්කළෙ ඉලංකෙයිල් මුතලීටු සෙය්වතිලිරුන්තු පින්වාංකච් සෙය්යුම්. මූන්රාවතාක, ආයිරක්කණක්කාන අපරාධ කට්ටලෙකළෙ ආරු මාතංකළුක්කුළ් පතිවු සෙය්වතුම්, 14 නාට්කළුක්කුළ් මාර්රංකළෙච් චරිපාර්ප්පතුම් පතිවාළර් නායකත් තිණෙක්කළත්තුක්කු ඔරු පෙරුම් අරෙකූවලාක ඉරුක්කුම්. නාන්කාවතාක, ඉච්චට්ටත්තින් 6B(1A) පිරිවින්කීළ් පයනාළිකළින් විපරංකළෙ පොතුමක්කළ් පාර්වෙයිට අනුමතිප්පතු, අරචියලමෙප්පින් 14(1) උරුප්පුරෙයින්කීළ් තනියුරිමෙ තොටර්පාන කවලෙකළෙ එළුප්පුකිරතු. ඈන්තාවතාක, 14 වේලෙ නාට්කළුක්කුළ් මාර්රංකළෙ අරිවික්කත් තවරුවතු මුතලිය චිරිය නටෙමුරෙ තවරුකළුක්කුප් 10 ආණ්ටුකළ් චිරෙත්තණ්ටනෙ මර්රුම් මූන්රු මිල්ලියන් රූපාය් තණ්ටප්පණම් එන්පතු මිකවුම් කටුමෙයානතු.

ඉච්චට්ටමූලත්තෙ මේලුම් වලුප්පටුත්ත පින්වරුම් තිරුත්තංකළෙ කුළුනිලෙයිල් චේර්ක්කුමාරු නාන් මුන්මොළිකින්රේන්: මුතලාවතාක, චිරිය කුටුම්ප අපරාධ කට්ටලෙකළුක්කු එළිමෙයාන ආණ්ටු අරික්කෙයිටල් නටෙමුරෙයෙ අරිමුකප්පටුත්ත වේණ්ටුම්. තොණ්ටු මර්රුම් චමූක අපරාධ කට්ටලෙකළුක්කු ඉණක්කක් කාලක්කෙටුවෙ 6 මාතංකළිලිරුන්තු 12 මාතංකළාක උයර්ත්ත වේණ්ටුම්. ඉරණ්ටාවතාක, පොතුමක්කළ් පාර්වෙයිටුම් තළත්තිල් අපරාධ කට්ටලෙයිනි පතිවු එණ් මර්රුම් තොටර්පු විවරංකළෙ මට්ටුමේ කාට්ට වේණ්ටුම්. පයනාළිකළින් පෙයර්කළ් මර්රුම් නිති ඔතුක්කීටුකළෙක් කාට්ට වේණ්ටියතිල්ලෙ. මූන්රාවතාක, තණ්ටම් අල්ලතු කුර්රවියල් වලක්කුත් තොටර්වතර්කු මුන්නර්, තවරුකළෙච් චරිචෙය්ය 30 නාට්කළ් කාලක්කෙටු වලංකි අරිවිත්තල් අනුප්ප වේණ්ටුම්. නාන්කාවතාක, තිට්ටමිට්ට නිතික් කුර්රංකළ් මර්රුම් පණච්චලවෛක්කු මට්ටුමේ 10 ආණ්ටුකළ් චිරෙත්තණ්ටනෙ විතික්කප්පට වේණ්ටුම්. චාතාරණ තාමතංකළුක්කුච් චිරිය නිති තණ්ටංකළ් මට්ටුමේ විතික්ක වේණ්ටුම්. ඈන්තාවතාක, පතිවාළර් නායකම් තිණෙක්කළත්තිල් ඉණෙයවලි මින් පතිවුත් තළත්තෙ නිරුවුවතෝටු, කුලුමංකළින් පතිවාළර්, නිතිප් පුලනාය්වුප් පිරිවු මර්රුම් උළ්නාට්ටු ඉරෙවරිත් තිණෙක්කළම් ආකියවර්රෝටු තරවුත් තළංකළෙ එණ්මිය මුරෙයිල් ඉණෙක්කවුම් වේණ්ටුම්.

මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිචාළර් අවර්කළේ, 2026ආම් ආණ්ටින් අරක්කට්ටළෙකළ් තිරුත්තච් චට්ටමූලමානතු, නිතික් කුර්රංකළෙත් තටුප්පතර්කුම් පන්නාට්ටුත් තරනිලෙකළෙ එට්ටුවතර්කුම් මිකවුම් තේවෛයාන ඔරු චට්ටමූලමාකුම්. ඉරුප්පිනුම්, චට්ට නටෙමුරෙප්පටුත්තලුක්කුම් අරචියලමෙප්පු වලංකුම් තනියුරිමෙකළුක්කුම් ඉටෙයේ චරියාන චමනිලෙයෙයිප් පේණුවතු එමතු කටමෙයාකුම්. මේර්කුරිප්පිට්ට තිරුත්තංකළෙ කුළු නිලෙයිල් උළ්ළටක්කුවතන්මූලම්, ඉලංකෙයින් නිති අමෙප්පෙප් පාතුකාක්කුම් අතේවේලෙයිල්, නේර්මෙයාන අරක්කට්ටළෙ නිරුවාකත්තෙයුම් උරුතිචෙය්යුම් ඔරු චිරන්ත චට්ටත්තෙ ඉච්චපෙ උරුවාක්ක මුටියුමෙනක් කූරි, එනතු උරෙයෙයි නිරෛවු චෙය්කින්රේන්. නන්රි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)

මීළහට, ගරු නීතිඥ සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.16]

ගරු නීතිඥ සරත් කුමාර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි චරත් කුමාර)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1917 අංක 09 දරන භාර ආඥාපනතට සංශෝධන ගෙනැවිත් තිබෙන මේ අවස්ථාවේ, ඒ පිළිබඳ විවාදයට අදහස් කිහිපයක් එකතු කරන්න මා සූදානම්.

දීර්ඝ කාලයක් තිස්සේ චෞර වළල්ලක ග්‍රහණයට හසුව තිබූ රටක්, ඉන් මුදා ගැනීම සඳහා අදියරෙන් අදියර නෛතික ප්‍රතිපාදන ගෙන එමින් නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම සඳහා අප ගෙන යන ක්‍රියාවලියේ තවත් එක් වැදගත් පියවරක් හැටියට අද ගෙන ආ මෙම සංශෝධන හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම, අප මෙම සංශෝධන ගෙන එන්නේ භාර ආඥාපනත සඳහායි. 1917 වර්ෂයේදී තමයි එය ආරම්භ කරලා තිබෙන්නේ.

"භාරය" කියලා අප හඳුන්වන්නේ මොකක්ද? "භාරය" යන්නෙන් අප අදහස් කරන්නේ, "යම් පුද්ගලයකු විසින් වත්කමක් හෝ දේපළක් නිශ්චිත අරමුණක් හෝ ප්‍රතිලාභයක් සඳහා පුද්ගලයකු හෝ ආයතනයක් වෙත භාර දී, එය කළමනාකරණය කිරීමට සලස්වන නීතිමය සම්බන්ධතාවක්". එය තමයි "භාරය" යන්නට තිබෙන අර්ථ දැක්වීම. නමුත්, මෙන්න මේ අර්ථ දැක්වීමට යටත් වන "භාරය" කියන ප්‍රතිපාදනය උපයෝගි කර ගනිමින් විවිධ අවස්ථාවලදී අපේ රටේ බලයේ සිටි කණ්ඩායම් එය අවභාවිත කරමින් තමන්ට අවශ්‍ය ආකාරයට මුදල් විශුද්ධිකරණය සඳහා යොමු වූ ආකාරය අපි දැක්කා. ඒ වාගේම, අතීතයේදී ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහාත් මෙම අවස්ථාව උපයෝගී කරගෙන තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවට වග කියන, ඒ ජනවරමේ අභිලාෂයන් අනුව කටයුතු කරන රජයක් හැටියට අපි හිතනවා, භාර ආඥාපනත සංශෝධනය කිරීම මේ අවස්ථාවේ අප විසින් ගෙන ඇති වඩාත් කාලෝචිත පියවරක් කියලා.

විශේෂයෙන්ම, ලෝක ත්‍රස්තවාදයට මුදල් සැපයීමට සහ මුදල් විශුද්ධිකරණයට එරෙහිව ජාත්‍යන්තර ප්‍රමිතීන් සකස් කරන ආයතනයක් තිබෙනවා. ඒ තමයි, මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකාය හෙවත් FATF. එම FATF ආයතනය විසින් අපට ලබා දුන් නිර්දේශ තිබෙනවා. එහි 25වන නිර්දේශය මඟින්, ප්‍රකාශිත භාර සහ වෙනත් සමහර නීතිමය සැකසුම් සම්බන්ධව විනිවිද පෙනෙන නෛතික රාමුවක අවශ්‍යතාව අවධාරණය කර තිබෙනවා. එහෙම නම්, FATF ආයතනය විසින් අපට ලබා දී ඇති නිර්දේශ අනුව තමයි භාර ආඥාපනතට අද අපි මේ සංශෝධන අරගෙන එන්නේ. විශේෂයෙන්ම, ලෝකය පුරා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම විශාල අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි, මේ ආකාරයෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් සකස් කිරීමට FATF ආයතනය පියවර ගෙන තිබෙන්නේ.

අපේ රටේ භාර ක්‍රියාත්මක වන ආකාරය දිහා බැලුවාම අපට පෙනෙනවා, යහපත් අරමුණු පදනම් කරගෙනත් එම භාරයන් ක්‍රියාත්මක වුණු අවස්ථා තිබෙන බව. අධ්‍යාපනික අරමුණු

ඉලක්ක කරගෙන, සමාජ සේවා අරමුණු ඉලක්ක කරගෙන, ක්‍රීඩාවේ උන්නතිය ඉලක්ක කරගෙන, එවැනි යහපත් අරමුණු ඉලක්ක කරගෙන භාර ආරම්භ කර පවත්වාගෙන යන අවස්ථා අපි දකිනවා. ඒ වාගේම, වංචනික අරමුණු ඉලක්ක කරගත් අවස්ථාත් අපි දකිනවා.

විශේෂයෙන් පසුගිය කාලයේ අපේ රටේ විශාල ආන්දෝලනයන්ට තුඩු දුන් එවැනි ඕනෑ තරම් කරුණු සඳහන් කරන්න අපට පුළුවන්. රිජ්වේ ආර්යා ළමා රෝහලට සීටී ස්කෑන් යන්ත්‍රයක් අවශ්‍ය වුණා. එම රෝහලට සීටී ස්කෑන් යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් - NSB එකෙන් - රුපියල් මිලියන 10ක මුදලක් ලබා ගත්තා. ඒ රුපියල් මිලියන 10 ලබාගත් ආයතනය, 'X' කියලා අපි හිතමු. 'X' කියන ආයතනය ඒ මුදල අතුරුදහන් කළා. ඒ අනුව, භාර නීතියේ පවතින ප්‍රතිපාදන අවභාවිත කරමින් වංචනික ක්‍රියාවල අපේ රටේ බලය සහිත පුද්ගලයන් පසු ගිය කාලයේ නිරත වුණු බව අපි දන්නවා. අද වන විට අපේ අධිකරණ පද්ධතිය මුදල් විශුද්ධිකරණයට අදාළ නඩුවලින් පිරිලායි තිබෙන්නේ. ඇයි ඒ? අපේ රටේ පූර්වගාමී පාලකයෝ අපේ රටේ මහ ජනතාවට අයත් ජාතික ධනය සහ දේපළ සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය අපි දන්නවා. එම නිසා මේ ආඥාපනතට සංශෝධන ගෙන ඒම ඉතාම වැදගත් වන බවයි අපේ අදහස.

මීළඟට මා කැමැතියි, මෙම පනත් කෙටුම්පත මඟින් අප හඳුන්වා දෙන සංශෝධන කිහිපයක් පිළිබඳව ඔබේ අවධානය යොමු කරවන්න. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පතේ 2 වන වගන්තිය මඟින් සාධන පත්‍රයක් ලිඛිත විය යුතු බව සඳහන් කර තිබෙනවා. ඒ වාගේම නඩු පැවරීමේ අධිකරණ බලය මහෙස්ත්‍රාත් අධිකරණය වෙත පැවරීම නිශ්චිත කරන්න කටයුතු කර තිබෙනවා, ඒ සංශෝධනය හරහා. අපි හිතනවා, ඒක ඉතාම වැදගත් දෙයක් කියලා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් නෛතික කටයුතු කරනකොට අපි නිශ්චිතවම යා යුතු අධිකරණය කුමක්ද කියන එකත් අර්ථ නිරූපණය කර තිබෙනවා. ඒ නිසා අපට ඒ අනුව කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම මෙම සංශෝධන පනත් කෙටුම්පතේ 3 වන වගන්තිය ඉතාම වැදගත්. ඕනෑම ප්‍රකාශිත භාරයක් අනිවාර්යයෙන්ම ලියාපදිංචි කළ යුතු බවට ප්‍රතිපාදන එහි දක්වා තිබෙනවා. මම කලින් කියපු විධියට අර්බුද මතු වෙන්නේ, ප්‍රකාශිත භාරයන් පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට තිබෙන නොහැකියාව නිසායි. නමුත් මේ 3 වන වගන්තිය හරහා අපට ප්‍රකාශිත භාරයක් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම හඳුනා ගන්න පුළුවන්කම තිබෙනවා, අධීක්ෂණය කරන්න පුළුවන්කම තිබෙනවා, නියාමනය කරන්න පුළුවන්කම තිබෙනවා. අන්න ඒ අවශ්‍යතා තෘප්ත කරන සංශෝධනයක් තමයි මේ 3 වන වගන්තියෙන් ලබා දීලා තිබෙන්නේ.

ඊළඟට, මෙම පනත් කෙටුම්පතේ 4 වන වගන්තිය පිළිබඳව අපි සලකා බලමු. ඕනෑම ප්‍රකාශිත භාරයකට භාරකරුවෙක් ඉන්නවා. ඒ භාරකරු හෝ බලයලත් තැනැත්තා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත තොරතුරු ලබා දීමට වගකීමෙන් බැඳෙනවා. ඒ නිසා පැනලා යන්න බැහැ, ප්‍රකාශිත භාරයක් ස්ථාපනය කළාට පස්සේ. ඒකේ භාරකරු, එහෙම නැත්නම් බලයලත් තැනැත්තා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ඒ තොරතුරු ලබා දීමට වගකීමෙන් බැඳෙනවා.

ඊළඟට, මෙම සංශෝධන පනත් කෙටුම්පතේ 5 වන වගන්තියේ ප්‍රතිපාදනය ගත්තොත් එහි පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, භාරයන් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි රාජ්‍ය ආයතන මොනවාද කියලා. අපේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී වැදගත් වන ආයතන තිබෙනවා. වංචනික ක්‍රියාවලට එරෙහිව ක්‍රියාත්මක වන ආයතන තිබෙනවා. ඒ අනුව නීතිපතිවරයාට, මූල්‍ය බුද්ධි ඒකකයට, විගණකාධිපති දෙපාර්තමේන්තුවට, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනුවත් ප්‍රවේශය ලබා දී තිබෙනවා, මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්න. ඒ නිසා අපි හිතනවා, මේක ඉතාම වැදගත් සංශෝධන ඇතුළත් කරන ලද පනත් කෙටුම්පතක් කියලා.

මෙම සංශෝධන පනත් කෙටුම්පතේ 6 වන වගන්තිය කෙරෙහි අපේ අවධානය යොමු කළොත්, එමඟින් ප්‍රකාශිත භාරයක භාරකරු විසින් තොරතුරු වාර්තා තබා ගැනීම අනිවාර්ය කර තිබෙනවා. පසුගිය දවස්වල විමර්ශන කටයුතු කරනකොට සමහර අයට තොරතුරු තිබුණේ නැහැ. මුදල් විශුද්ධිකරණය සම්බන්ධ විමර්ශන කටයුතුවලට ගිහිල්ලා තොරතුරු අනාවරණය කරගන්න හැදුවත්, තොරතුරු කොහේවත් සඳහන් වෙලා නැහැ. ඒ නිසා මෙම පනත් කෙටුම්පතේ 6 වන වගන්තියෙන් තොරතුරු වාර්තාගත කිරීම අනිවාර්ය කර තිබෙනවා, භාරකරුට. ඒ වාගේම ඒ තොරතුරු යාවත්කාලීන කිරීමේ වගකීමත් පැවරිලා තිබෙනවා. ඒ නිසා මෙක, පවතින නීතිය වඩාත් විධිමත් කිරීම සඳහා දරන ලද උත්සාහයක් කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. සංශෝධන පනත් කෙටුම්පතේ 7 වන වගන්තිය කෙරෙහි අවධානය යොමු කළොත්, භාරයක් සම්බන්ධ තොරතුරු අදාළ බලධාරීන් වෙත සැපයීමේ වගකීම භාරකරුට අමතරව බලයලත් තැනැත්තා වෙතත් පවරා තිබෙනවා. භාරකරුවෙක් නොවන්නේ නම්, බලයලත් තැනැත්තෙකු පත් කර තිබෙනවා නම්, අන්න ඒ තැනැත්තාටත් මේ සම්බන්ධයෙන් වගකීම් පැවරිලා තිබෙනවා.

මෙම සංශෝධන පනත් කෙටුම්පතේ 8 වන වගන්තියෙන් වගකීම් සහ දණ්ඩන විධිවිධාන හඳුන්වා දී තිබෙනවා. මම කලින් කිව්වා, මේ සම්බන්ධයෙන් අධිකරණ බලය මහෙස්ත්‍රාත් අධිකරණය වෙත පැවරිලා තිබෙනවා කියලා. මහෙස්ත්‍රාත් අධිකරණය වෙත වගකීම් පැවරිලා තිබෙනවා වාගේම දණ්ඩන කොහොමද ක්‍රියාත්මක වෙන්නේ, වගකීම් කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණා පිළිබඳවත් සවිස්තරාත්මකව ඇතුළත් කර තිබෙනවා, 8 වන වගන්තියේ. භාර ආඥාපනතට ගෙනෙන මේ සංශෝධනය, එම ආඥාපනත අවභාවිත කරමින් ඉතිහාසය පුරා අපේ රටේ මහ ජනතාවට අයිති ජාතික දඩය සොරකම් කරන ලද චෞරයන්ට එරෙහිව ක්‍රියාත්මක වන ඉතාම වැදගත්, ශක්තිමත් නෛතික පියවරක් හැටියට අපි දකිනවා.

ඒ වාගේම මම කැමැතියි, මෙම සංශෝධන පනත් කෙටුම්පතේ 9 වන වගන්තිය ගැනත් කියන්න. දඩ මුදල් පැනවීමේ සහ අයකර ගැනීමේ ක්‍රියාවලිය, නඩු පැවරීමේ ක්‍රියාවලියට අදාළ සියලු ප්‍රතිපාදන මෙම වගන්තියට ඇතුළත් කර තිබෙනවා. මේ ගන්නා ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් යම්කිසි තැනැත්තෙකුට අභියාචනයක් කරන්න අවශ්‍ය නම් ඒ සඳහාත් අවස්ථාව ලබා දීලා තිබෙනවා. අපි දැක්කා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේකේ තිබෙන අඩු පාඩු ගැන කියමින් උඩ පනිනවා. ඒවා ගැන මොනවා හරි දෙයක් කියලා කලබල වෙන්න ඕනෑ නැහැ. මන්ත්‍රීතුමෙක් කිව්වා, සාධන පත්‍රයක් සම්බන්ධයෙන් නොතාරිස් සහතිකයක් ලබා දීම ගැන. සාධන පත්‍රයක් තිබෙනවා නම්, ඒකේ නොතාරිස් සහතිකයක් අනිවාර්යයෙන්ම අන්තර්ගත වෙනවා. ඒක මේ පනත් කෙටුම්පතට අදාළ කාරණයක් නොවෙයි. ඒ සඳහා වෙනත් නීති අපේ රටේ තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් තිබෙන අනවබෝධයට වඩා අපි මේ පනත් කෙටුම්පත ගෙන ඒම සම්බන්ධයෙන් එතුමාගේ තිබෙන අකමැත්ත, උරණවීම තමයි මම හිතන්නේ එතුමා ඒ සඳහන් කළේ. හැබැයි, ඒකට ප්‍රතිපාදනය හොයා ගන්න බැරි වුණාට කෝප් කමිටුවේ කෝප් වාර්තාවට footnote එකක් දමන්න නම්

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

එතුමන්ලා ඉතා නිර්මාණශීලියි. ඒ නිසා අපි එතුමන්ලාට කියන්න කැමැතියි, ඔබතුමන්ලා හිතන විධියේ දුර්වල පනත් කෙටුම්පත්කරණයක් අපි කරන්නේ නැහැ; අපි බොහොම විධිමත්ව මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවාය කියලා. ඒ වාගේම වංචල දේපළ සම්බන්ධයෙන් මේ තුළ ප්‍රතිපාදනයක් නැහැ කියලා එතුමා කිව්වා. එහෙම එකක් නැහැ. හොඳට කියවා බලන්න. වංචල දේපළ සම්බන්ධයෙන් මේ තුළ ප්‍රතිපාදන අන්තර්ගත කරලා තිබෙනවා. ඉතින්, ඒ ප්‍රතිපාදන අන්තර්ගත කරමින්, අඩු පාඩු හැකිතාක් දුරට අවම කරමින් තමයි දීර්ඝ කාලයක් තිස්සේ සංශෝධනයට ලක් නොවුණු භාර ආඥාපනතට මේ ඉතා වැදගත් සංශෝධන සිදු කරලා අපි මේ භාර (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම නිසා මෙම පනත් කෙටුම්පත සඳහා විපක්ෂයේත් සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මාගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.27]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ හිතවත් ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා භාර අරමුදල් ගැන කථා කළා. අපි දන්නවා, මේ රටේ නොයෙක් ස්ථානවල, විශේෂයෙන්ම ආගමික ස්ථානවල - පන්සල්වල, ඉස්ලාම් දේවස්ථානවල, කතෝලික පල්ලිවල හා හින්දු දේවස්ථානවල - ඒ ආගම අදහන අය එතැන දියුණු කරන්න දෙන ආධාර -භාර- තිබෙනවා. මම හිතන්නේ ඒවායේ අයිතිය තිබුණේ, එතැන ඉන්න ආගමික නායකයින්ට. දැන් මට මෙතැනදී සැකයක් එනවා. මොකද, ආණ්ඩුව කවදාවත් ඒවා පාලනය කරන්න ගියේ නැහැ. මට සැකයක් එනවා, ආණ්ඩුව පන්සලේ පිං කැටෙටත් ගහන්නද යන්නේ කියලා. අපි කියනවා, ආගමික ස්ථානවලට නිදහසේ ඒ කටයුත්ත කරගෙන යන්න දෙන්න කියලා.

ඒ වාගේම තවත් කාරණයක් ගැන මම කථා කරන්න කැමැතියි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ජනතාවගේ ස්වාධීනත්වය නැති කරන්න අද පනත් කෙටුම්පත් දෙකක් ගෙනැල්ලා තිබෙනවා. එකක් තමයි ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත. අනෙක් එක, සංවිධානාත්මක අපරාධ වැළක්වීමේ පනත් කෙටුම්පත. මට මතකයි, තමුන්නාන්සේලා විපක්ෂයේ සිටියදී ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතට, ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පතට ප්‍රසිද්ධියේ විරෝධය ප්‍රකාශ කළා. වත්මන් අගමැති හරිනි අමරසූරියත්, විජිත හේරත් ඇමතිතුමාත්, වසන්ත සමරසිංහ ඇමතිතුමාත් එදා ඒවාට විරුද්ධ වෙලා උසාවි ගියා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, ඒවා අයින් කරලා ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය භුක්ති විඳින්න අවස්ථාව දෙනවාය කියලා. විජිත හේරත් මැතිතුමා එදා කිව්වා, ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත සම්මත වුණොත් ජනතාවට කට අරින්න වෙන්නේ කන්නයි, ආණ්ඩුවේ ගුණ ගයන්නයි විතරයි කියලා. එදා ඒක එතුමා පැහැදිලිව කිව්වා. අපේ නායකතුමා, විපක්ෂ නායකතුමාත් කිව්වා. ආණ්ඩුවක කඩා වැටීම පටන් ගනිද්දී ජනතාව පාලනය කරන්න තමයි ආණ්ඩුව ඒවා ගෙනෙන්නේ, ආණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණ කරනවා නම්, ආණ්ඩුවට විරුද්ධව අරගළ කරනවා නම්, ආණ්ඩුවට විරුද්ධව විපක්ෂය කටයුතු කරනවා නම්, ඒවා පාලනය කරන්නයි ගෙනෙන්නේ කියලා එතුමා එදා කිව්වා. මම හිතන්නේ එතුමා අදට ඔබින කථාවක් කිව්වේ.

එම පනත් කෙටුම්පත් සම්බන්ධව අපි අධිකරණයට ගියා. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අද පාර්ශ්ව 26ක් නඩු මාර්ගයට ගිහිල්ලා තිබෙනවා. ඒක මතුපිටින් බොහොම ලස්සනයි. නමුත්, ඇතුළට ගියාම බොහොම භයානකයි. ඒක ඇතුළේ පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා, ජනතාව නීතියෙන් බය කරලා තමුන්නාන්සේලා රට පාලනය කරන්න හදන විධිය. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙද්දී විපක්ෂයේ අපි පැහැදිලිව කිව්වා, මේ රටේ නීතිඥවරු කිව්වා, වෛද්‍යවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, ත්‍රෛනිකායික මහා සංඝරත්නය කිව්වා, මේකෙන් අධිකරණයේ ස්වාධීනත්වයට ප්‍රශ්නයක් වෙනවාය කියලා. මේ රටේ ජනතාවට විශ්වාසයක් තිබුණා, මොන ප්‍රශ්නය ආවත් අසාධාරණයක් වුණොත් අධිකරණයට යන්න පුළුවන් කියලා. අද ඒ විශ්වාසය නැති වෙලා තිබෙනවා. ඒකෙන් තවදුරටත් ඒ ජනතාවගේ නිදහස, වෘත්තිය සමිතිවල අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදීව දේශපාලනය කිරීමේ අයිතිය නැති වෙලා තිබෙනවා. මොනවාද, "ත්‍රස්තවාදී ක්‍රියා" කියලා මේ අර්ථකථනය කරන්නේ? මම දන්නේ නැහැ, පනත කෙටුම්පත් කරපු - draft කරපු - පාර්ලිමේන්තුවට ගෙනාපු අයට අදහසක් තිබෙනවාද කියලා. පව්චයක් කෙටුවත් ත්‍රස්තවාදී වැඩක් ලු. එහෙම නම් අපේ Cricket Team එකේ ඔක්කෝම ත්‍රස්තවාදීන් වෙන්න ඕනෑ. ඒ වාගේම තරුණයන්ගෙන් වැඩි කොටසක් ත්‍රස්තවාදීන් වෙන්න ඕනෑ. ඇඳුම් ඇන්දත්- අද තරුණ ළමයි, Gen Z එක අලුත් මෝස්තරවලට අඳිනවා.

ඒ වාගේම Gen Z එක තමයි වැඩියෙන්ම පව්ව - tattoos - කොටන්නේ. මේ පනත් කෙටුම්පත Gen Z එකත් භය කරන එකක්ද කියලා අපට හිතෙනවා. ඇයි මේ විධියට කරන්නේ? අපි රටක නීතිය ක්‍රියාත්මක කිරීමේ බලතල දෙන්නේ පොලීසියට. මේ පනත් කෙටුම්පත හරහාත් පොලීසියට වැඩි බලතල ප්‍රමාණයක් ලබා දෙනවා. සැකකරුවෙකු වැඩි කලක් රඳවා ගැනීම, ASP කෙනෙකු ඉස්සරහ කටඋත්තරයක් දුන්නොත් ඒක අධිකරණයේදී වලංගුවීම වාගේ දේවල් මෙහි තිබෙනවා. මේ රටේ පොලීසියට බලය දෙනවා කියන්නේ, ආණ්ඩුවට බලය දීම, අනුර කුමාර දිසානායක මහත්තයාට බලය දීම, මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට බලය දීම. ඒක තමයි මේ පනතෙන් කරලා තිබෙන්නේ.

පසුගිය කාලයේ පොලිස් ස්ථානවලදී 17දෙනෙකු මැරිලා තිබෙනවා. ඊයේ-පෙරේදා හෝමාගම සහ කොබෙයිගනේ පොලිස් සිර මැදිරි තුළ දෙන්නෙක් මැරුණා. ඒ වාගේම ඉස්කෝලේ යන දාහත් හැවිරිදි ළමයෙකුට වෙඩි 7ක් තබා ඇති බවටත් පසුගිය දිනක වාර්තා වුණා. ඒ අම්මා අද යනවා, මානව හිමිකම් කොමිෂන් සභාවට. ඒ විතරක් නොවෙයි.

මේකේ තවත් භයානක පැත්තක් තිබෙනවා. අපි දන්නවා, සිවිල් ජනතාව ගැන කටයුතු කරන්නේ පොලීසිය බව. පොලීසිය පුරුදු පුහුණු කරලා තිබෙන්නේ සිවිල් ජනතාව ආරක්ෂා කරන්න. මේ පනතින් පොලීසියටයි, හමුදාවටයි, වෙරළ ආරක්ෂක නිලධාරීන්ටයි වැඩි බලයක් දෙනවා. හමුදාව පුහුණු කරලා තිබෙන්නේ යුද්ධ කරන්න. ඒක නිසා තමයි සමහර අවස්ථාවලදී හදිසි නීතිය යටතේ, 1971, 1989 වාගේ කාලවලදී ත්‍රස්තවාදී කැරලි එද්දි හමුදාවට බලය දුන්නේ.

අපි අහනවා, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත ගේන්න හේතු වුණේ අද මේ රටේ මොන ත්‍රස්තවාදයක් තිබෙන නිසාද කියලා. තමුන්නාන්සේලාම පාර්ලිමේන්තුවේ කියනවා, අද තිබෙන්නේ සාමකාමී රටක් කියලා. මේ රටේ ත්‍රස්තවාදී ක්‍රියා වළක්වන්න මේ වෙලාවේ පනතක් ගේන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද? ආණ්ඩුව කඩා වැටෙනකොට, ආණ්ඩුව සියලු යෝජනා, සියලු පොරොන්දු කඩ කරනකොට, මැතිවරණ සිතියම හකුළනකොට, පළාත් සභා මැතිවරණය නැති වනකොට, තෙල් මිල වැඩි වනකොට, තෙල් පෝලිම් ඇති වනකොට, ගෑස් නැති වෙලා ගෑස් පෝලිම් ඇති වනකොට ජනතාව මර්දනය කරන්න තමයි මේ පනත් දෙක ගේන්නේ. මම අහන්නේ මේකේ අර්ථය මොකක්ද කියලායි. මේ පනත් 88-89 කාලයේදී ගෙනාවා නම් හරි, තිස් අවුරුදු යුද්ධය කාලයේ ගෙනාවා නම් හරි. දැන් මේ රටේ ත්‍රස්තවාදයක් නැහැ කියලා ආණ්ඩුව කියනවා. මොකද, ත්‍රස්තවාදීන් ආණ්ඩු කරනකොට එහෙම වෙනවානේ. මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ මේ වාගේ පනතක් මේ වෙලාවේ ගේන්නේ ඇයි කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම හිතනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මට වැඩිපුර කාලය ලබා දෙයි කියලා.

අද සම්පූර්ණ බලතල දෙනවා, පොලීසියට. මමත් පොලීසිය භාර ඇමතිවරයෙකු විධියට හිටියා. නමුත් අපි පොලීසියට ඒ බලය දෙන්න ඕනෑ යම් සීමාවක් ඇතුවයි. මොකද, ඒකෙන් අයුතු ප්‍රයෝජන ගන්න පුළුවන්. හොඳ නිලධාරීන් සියයට 90ක් ඇති. නමුත් සියයට 10ක් ඉන්න පුළුවන්, නොයෙක් චෝදනාවලට ලක් වෙච්ච. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේම පොලීසියේ එක්දහස් ගාණකගේ වැඩ අද වන විට තහනම් කරලා තිබෙනවා, කොටසක් අයින් කරලාත් තිබෙනවා. මේ රටේ හිටපු පොලිස්පතිවරුන්ගෙන් එක්කෙනෙක් හිරේ, එක්කෙනෙක් සිය දිවි නසාගත්තා, තව එක්කෙනෙකුට නඩු ගොඩක් තිබෙනවා. වැඩියෙන්ම FR cases දාන්නේත් පොලීසිය වාගේම ඒගොල්ලන්ට විරුද්ධවත් වැඩිපුර FR cases ගොනු වනවා. මේ රට අද ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේත් අද ප්‍රජාතන්ත්‍රවාදය නැහැ.

අපි කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. මොකක්ද, පක්ෂ නායක රැස්වීමේදී කිව්වේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියත් එතැන හිටියා. එතැනදි කිව්වේ ආණ්ඩුවට ඕනෑ විධියට ඒ යෝජනාව සංශෝධනය කරන්න කියලායි. ඒ යෝජනාව විවාද කරන්න න්‍යාය පත්‍රයටත් ඇතුළු කරලා දිනත් නියම කරලා තිබුණේ. මම අහන්නේ ලෝකයේ කොයි රටද ආණ්ඩුවට ඕනෑ විධියට විශ්වාස භංග යෝජනා ගේන්න කියලා විපක්ෂයට කියන්නේ? අද විපක්ෂයට කියනවා, ආණ්ඩුවට ඕනෑ විධියට ඒ යෝජනාව සංශෝධනය කරන්නලු. අපි ඒ යෝජනාව සංශෝධනය කරන්නේ නැහැ. අපි කථානායකට විරුද්ධව ඒ යෝජනාව ගෙනාවේ මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්නයි. මේ කථානායක තමයි ප්‍රධාන පුටුවේ ඉන්නේ.

පාර්ලිමේන්තුවේම නිලධාරීන්ගේ කමිටුවකින් මොකක්ද කියන්නේ? කියන්න ලජ්ජයි, ඇඳ ඇතිරිලි, කොට්ට උර ගැනත් ඒකේ තිබෙනවා. ගෙවල් ගන්නේ නැහැ කියලායි ආවේ. මහා ලොකුවට ආණ්ඩුව කිව්වේ අපි නිවාස ගන්නේ නැහැ, මැති ඇමතිවරුන්ගේ නිල නිවාස ටිකත් වෙනත් කටයුතුවලට දෙනවා කියලායි. එහෙම කියලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අපි අහනවා, රටේ ජනතාවට දුන් පොරොන්දු ද මේ ඉෂ්ට කරන්නේ කියලා. මෙච්චර බොරු කිව්ව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නැහැ, මෙච්චර ලජ්ජා සහගත වෙච්ච

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නැහැ. ගරු ජනාධිපතිතුමනි, කරුණාකර මේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය භුක්ති විඳින්න ඉඩ දෙන්න. ඒ වාගේම සාධාරණත්වය, ස්වාධීනත්වය ජනතාවට ලබා දෙන්න කියලා අපි ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.36]

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඉතාම වැදගත් සංශෝධන පනත් කෙටුම්පතක් විවාද කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ භාර ආඥාපනතට අදාළ සංශෝධන ඉදිරිපත් කරන අද දවස අපටත් විශේෂ දවසක්. මීට අවුරුද්දකට පෙර ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරපු "රටම එකට" වැඩ පිළිවෙළට මේ වන විට වර්ෂයක් ගෙවී අවසන්. ඒ සම්බන්ධයෙන් සමාලෝචනයක් කරන්න අද ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් සර්ව ආගමික සමුළුවක් රැස්වෙලා තිබෙනවා. මම මේක එතැනට අදාළ කරන්නේ, වත්මන් රජයේ අපේ අරමුණ, අභිලාෂය වන්නේ මේ රටේ දූ දරුවන්, තරුණ ප්‍රජාව, ව්‍යාපාරිකයින් ඇතුළු සෑම දෙනාටම හොඳ යහපත් රටක් හැදීම නිසායි.

පැවති යහ පාලන ආණ්ඩුවත්, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු ඇතුළු අනෙකුත් සියලු ආණ්ඩුත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වළපල්ලට දැම්මේ කොහොමද, නීතිය අවභාවිත කළේ කොහොමද කියන එක මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා වත්මන් ආණ්ඩුවට පැවරී තිබෙන කාර්යභාරය ඉතාම පැහැදිලිව, නිරවුල්ව තේරුම් ගත් රජයක් විධියට මේ රට අපරාධ රාජ්‍යයක් බවට පත් කරපු සියලු ව්‍යසන අවසන් කිරීම සඳහා අපි විද්‍යාත්මකව, නිවැරදිව, නීත්‍යානුකූලව පියවර ගනිමින් තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය දවස්වල "රටම එකට" ජාතික වැඩසටහන ඇතුළේ විශාල කාර්යභාරයක් ඉටු කරන්න අපට පුළුවන්කම ලැබුණේ.

[ගරු වන්දන සූරියආරච්චි මහතා]

ඒ නිසා තමයි ගෙවුණු 2025.10.30 සිට 2026.10.29 දක්වා වූ කාලය ඇතුළත අපි මේ "රටම එකට" වැඩසටහන ඇතුළේ හෙරොයින් කිලෝග්‍රෑම් 2,836ක්, අයිස් කිලෝග්‍රෑම් 3,553ක්, කොකේන් කිලෝග්‍රෑම් 302ක්, ගංජා කිලෝග්‍රෑම් 11,173ක් ආදී වශයෙන් අත්අඩංගුවට අරගෙන මේ රටේ තරුණ ප්‍රජාව, පාසල් දරුවන් අනතුරේ හෙළපු මේ ව්‍යසන මැඩලන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. ඒ අනුව "රටම එකට" ජාතික මෙහෙයුම දවයින පුරා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සමස්ත වාර්තාවක් පොලිස් මාධ්‍ය කොට්ඨාසය නිකුත් කර තිබෙනවා. කාලය ගතවන නිසා මා එය කියවන්නේ නැහැ. මා මේ අවස්ථාවේදී එම වාර්තාව **සභාගත*** කරනවා.

මා එම කාරණය අදාළ කර ගත්තේ වත්මන් ආණ්ඩුව මේ රට නිවැරදිව ඉස්සරහට ගෙනයන්න කටයුතු කරන ආකාරය පෙන්වන්නයි. මෙතෙක් පැවති නීතිවල අඩුපාඩු, අණ පනත්වල තිබෙන අඩුපාඩු සංශෝධනය කරගෙන අපි මේ වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යනවා. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට අදාළවත්, මුල් පනතේ 3වන වගන්තියටත්, 5වන වගන්තියටත්, 6වන වගන්තියටත්, 19වන වගන්තියටත් අදාළව තමයි මේ භාර ආඥාපනතට අලුතින් සංශෝධන එකතු වෙලා තිබෙන්නේ කියලා අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනතේ මූලික අරමුණ වන්නේ භාරකාරත්වයන්හි හිමිකාරිත්වය සහ පාලනය සම්බන්ධයෙන් පවතින විනිවිදභාවය වැඩිදියුණු කිරීමයි. මීට කලින් කරුණු දක්වපු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා පන්සල්වල පින්කැට කථාවක් මේකට අදාළ කර ගත්තා. අපි එතුමාගෙන් අහනවා, මේවා කියවන්න දන්නේ නැද්ද, මේවායේ අරමුණු පැහැදිලි කරගෙන නොවෙයිද මේ උත්තරීතර සභා ගැබට එන්නේ කියලා. මේ ආඥාපනත සංශෝධනය කිරීමේ අරමුණ මොකක්ද? මෙහි අරමුණ තමයි, මෙහි භාරකාරත්වය, හිමිකාරිත්වය සහ පාලනය සම්බන්ධයෙන් පවතින විනිවිදභාවය වැඩිදියුණු කිරීම. එහෙම නැතිව මේවා නැති කරන්න නොවෙයි මේ සංශෝධන ගෙනෙන්නේ. අනික් එක, එතුමා කියපු පන්සල්වල පින්කැට කථාව මේකට අදාළම නැහැ. අද එතුමන්ලා උත්සාහ කරනවා, ජාතිවාදය, ආගමිවාදය අවුස්සලා එතුමන්ලාගේ අසාර්ථකභාවය වහගන්න. ඒගොල්ලන් අද උත්සාහ කරනවා, ඉතිහාසයේ හැංගුණා වාගේ අදත් මේ නීතිවලින් හැංගෙන්න පුළුවන්ද කියලා බලන්න. එවැනි තක්කඩි අදහස් මේ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන්න එපා කියලා අපි එතුමන්ලාට අවධාරණය කරනවා.

ඒ වාගේම මෙහි අරමුණ මොකක්ද? මුදල් විශුද්ධිකරණයට එරෙහිව, ත්‍රස්තවාදයට මූල්‍ය පහසුකම් සැපයීමට එරෙහිව සහ අනෙකුත් මූල්‍ය අපරාධවලට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම තමයි මෙහි අරමුණ වන්නේ. ඒ නිසා අද විපක්ෂයට ලොකු ප්‍රශ්නයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව මේ රටේ අනාගතය වෙනුවෙන් අවශ්‍ය නීති සංශෝධනය කරලා අණ පනත් විධිමත් කරනකොට, මේ රටේ නීතිය ශක්තිමත් කරන්න, නීතියේ විධානයේ ආධිපත්‍යය ශක්තිමත් කරන්න, මේ රටේ මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න කටයුතු කරනකොට, ඒවා වැරදි විධියට අර්ථ කථනය කරලා, සමාජයට බිල්ලෝ නිර්මාණය කරලා මේවාට මහජන විරෝධයක් ගොඩනඟන්න පුළුවන්ද කියලා බලන්න ඒගොල්ලන් අද try කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒවා අසාර්ථක උත්සාහයන්.

අද විවාද කරන භාර (සංශෝධන) පනත් කෙටුම්පත තුළ ඉතා පැහැදිලිව ප්‍රධාන ක්ෂේත්‍ර 5ක් පිළිබඳව මූලිකව සඳහන් වනවා. භාර ලියාපදිංචිය විධිමත් කිරීම, තොරතුරු හෙළිදරව් කිරීම හා විනිවිදභාවය, සැබෑ ප්‍රතිලාභ හිමිකාරිත්වය හඳුනා ගැනීම, නීතිමය වගකීම ශක්තිමත් කිරීම, නීතිය ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය ශක්තිමත් කිරීම, ඒ හරහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට පරිපාලන දඩ පැනවීමේ බලය ලබා දීම සහ එම දඩ අය කර ගැනීමේ ක්‍රියා පටිපාටිය හඳුන්වා දීම වැනි අරමුණු ගණනාවක් එක්ක තමයි භාර ආඥාපනතට අදාළ සංශෝධන ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මම ඒ පනත් කෙටුම්පත පිළිබඳව ඊට වඩා යමක් කියන්න උත්සාහ කරන්නේ නැහැ. අපරාධ අවම කිරීම, ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් යෙදවීම වැනි කටයුතු මැඩලීමේ ක්‍රියාදාමය ඇතුළු සංවිධානාත්මක අපරාධ, විෂ මත්ද්‍රව්‍ය ව්‍යසනය අවසන් කිරීම සඳහා ආණ්ඩුව ගෙන යන මේ වැඩ පිළිවෙළ තවතවත් තහවුරු කරන, ශක්තිමත් කරන පනත් සංශෝධනයක් විධියට තමයි අපි මෙය තේරුම් ගන්නේ සහ ඒ පිළිබඳව මේ රටේ ජනතාවට පැහැදිලි කරන්නේ.

මට පෙර කරුණු දැක්වූ විපක්ෂ නායකතුමා කිව්වා, සංවර්ධනය වෙනුවට මර්දනය කරනවා ලු කියලා. මම එතුමාට සිහිපත් කර දෙන්න කැමැතියි, මර්දනය ජාතික ජන බලවේගයේ පාර නොවෙයි, මර්දනය ජාතික ජන බලවේගයේ වැඩ පිළිවෙළ නොවෙයි කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දශක ගණනාවක් මේ රට පාලනය කරපු එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු විශේෂයෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මෙතෙක් පැවතුණු පාලනය තුළ තමයි මර්දනය වැඩ පිළිවෙළ බවට පත් කර ගත්තේ. 1983 කළු ජූලිය නිර්මාණය කරලා, මේ රටේ සිංහල, දෙමළ ජනතාව මරන්න අවශ්‍ය පාර කැපුවේ එදා එක්සත් ජාතික පක්ෂයේ හිටපු ප්‍රේමදාස මහත්තයලාගේ, රංජිත් මද්දුම බණ්ඩාර මහත්තයලාගේ යුගයේදීයි. ඒක තමයි මර්දනයේ පාර. ඒ චිතරක් නොවෙයි. මට කලින් කථා කළ මොනරාගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒ දිස්ත්‍රික්කවල ජනතාව කියයි, එදා රාජ්‍ය ත්‍රස්තවාදය මේ රටේ සියලු දිස්ත්‍රික්ක වෙළා ගත්තේ කොයි විධියටද කියලා. අද එතුමන්ලා මෙතැනට ඇවිල්ලා මර්දනය ගැන කථා කරනවා, මැරිලා ඉපදිලා වාගේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඒවා අවධාරණය කරන්න කැමැතියි.

පාස්කු ප්‍රහාරය හරහා සිංහල, මුස්ලිම් ජනයා මරන්න පාර කැපූ, කතෝලික ප්‍රජාව විනාශ කරන්න පාර කැපූ අය අද මේ සභාවට ඇවිල්ලා මර්දනය ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඒ අයට කියනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පාර මර්දනය නොවෙයි, මේ රටේ මිනිස්සුන්ගේ ජීවත් වීමේ අයිතිය සහතික කිරීම, වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් තොර සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ මේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍ය ශක්තිමත් කරමින් යහපත් රටක්, සංවර්ධිත රටක් නිර්මාණය කිරීමයි කියන එක. *[බාධා නිරීමක්]* මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම අද වැඩ කරන ජනතාවට විශේෂත්වයක් සහිත ආණ්ඩුවක් තමයි, මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව. අපි පසුගිය වසර දෙක තුළදී මේ රටේ වැඩ කරන ජනතාවට අදාළ වන ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් අය වැය යෝජනා තුළින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එහිදී විශේෂයෙන්ම වැටුප් වැඩි

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කිරීම් සිදු කළා. ඒ වාගේම සජිත් ප්‍රේමදාස, රංජිත් මද්දුම බණ්ඩාර වැනි යහ පාලන ආණ්ඩුවේ හිටපු කැබිනට් ඇමතිවරු එතෙක් මේ රටේ රාජ්‍ය සේවකයාට ලැබුණු විශ්‍රාම වැටුප අහෝසි කළා. ඒ විශ්‍රාම වැටුප යළි ක්‍රියාත්මක කළේ 2026 අවුරුද්දේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අය වැය යෝජනා තුළිනුයි. ඒ නිසා අපේ ආණ්ඩුව මේ රටේ වැඩ කරන ජනතාවට ඉතා වැදගත් ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් මේ රටට අත්කර දුන් ආණ්ඩුවක්; ඒ නිසාම එය වැඩ කරන ජනතාවගේ වැඩි සහාය සහිතව ගොඩනැඟුණු ආණ්ඩුවක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රටේ වැඩ කරන ජනතාවගේ ආශීර්වාදය, ශක්තිය, ජවය සහ බලය ගොඩනැඟීම සඳහා ජාතික ගොවි සමිති ව්‍යාපාරය නියෝජනය කරමින් "වැඩ කරමු - රට හදමු, වැඩ කරන ජනතා බලය සුරකිමු" යන තේමාව යටතේ ජාතික සමිති ජාතික සමුළුව නොවැම්බර් මාසයේ 07වැනි දා කොළඹ පී.ඩී. සිරිසේන ක්‍රීඩාංගණයේදී පවත්වන්න බලාපොරොත්තු වෙනවා. මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ශක්තිමත් කරන, ඒවා ආරක්ෂා කරන, වැඩි-වැඩියෙන් ඒ අයිතිවාසිකම් ලබා දීම සඳහා කටයුතු කරන ජාතික ජන බලවේගය ආණ්ඩුව ශක්තිමත් කිරීම සඳහා එකතු වෙන්න කියා අපි මේ රටේ සමස්ත වැඩ කරන ජනතාවට ආරාධනා කරනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.46]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු මන්ත්‍රීතුමා මර්දනය ගැන කියද්දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගැන වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැනත් කිව්වා. ඔබතුමා ඉතිහාසයේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය නොකළා නම්, ඔබතුමන්ලාගේ නායකයන්ගෙන් ඉතිහාසය ගැන අහලා බලන්න, මහින්ද රාජපක්ෂ මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳගෙන ඔබතුමන්ලා වෙනුවෙන් ඒ කාලයේ මොනවාද නොකළේ කියලා. ජිනීවා යනකොට අන්තිමට සපත්තු අස්සේ තමයි ඒ විස්තර දමාගෙන ගියේ. ඔබතුමන්ලා අලුත් මන්ත්‍රීවරු නිසා දන්නේ නැතුව ඇති, ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ව ආරක්ෂා කරපු හැටි. හැබැයි, ඔබතුමන්ලාගේ ඒ කාලයේ හිටපු ජනතා විමුක්ති පෙරමුණේ අයගෙන් අහන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මොකක්ද කළේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, භාරවලට, එහෙම නැත්නම් trustsවලට විමර්ශනය කරන එක පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, පොලීසියට අනුබද්ධ ආයතන වාගේම ජනතාව දැනුවත් කිරීම, ඒවායේ තිබෙන විනිවිදභාවය - transparency එක - ඇති කිරීම පිළිබඳව අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒක විය යුතු දෙයක්. අපි විශ්වාස කරනවා, ඔය trusts ටික හොයාගෙන, හොයාගෙන යද්දී ගල් අහුරු වංචාවල සල්ලි ගිය shell companies ටිකත් අපට හොයා ගන්න පුළුවන් වෙයි කියලා. කන්ටේනර් වංචාවල සල්ලි ගිය ඒ භාරත් අපට හොයා ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම, ඩොලර් මිලියන 2.5ක් හැකර්ලා හරහා ඒ භාරවලට ගියපු සල්ලිත් අපට හොයා ගන්න පුළුවන් වෙයි. ඒක හින්දා අපට ප්‍රශ්නයක් නැහැ. මේවා විය යුතු දේවල්. හැබැයි, ප්‍රශ්නය මෙකයි. හැමදාම මේ පාර්ලිමේන්තුව තුළ මේ පනත් කෙටුම්පත් හදන්නේ රට වෙනුවෙන්. ඒ වාගේම රටේ අනාගතය වෙනුවෙන් තමයි පනත් හදන්නේ. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනත් අවභාවිත වීම තමයි තිබෙන ප්‍රශ්නය. පනත් මර්දනය සඳහා පාවිච්චි කිරීම තමයි මේවායේ තිබෙන ප්‍රශ්නය.

2023දී දූෂණ විරෝධී පනත සම්මත කළේ අපි. ඒ පනත හැදුවේ අපි. හැබැයි, ඒක පාවිච්චි කරන්නේ අල්ලස හෝ දූෂණය නවත්වන්න නොවෙයි, විපක්ෂය මර්දනය කරන්නයි. එහෙම නැත්නම් ආණ්ඩුවේ කෙනෙක්ව අල්ලස්වලින් ආරක්ෂා කරන්න තමයි මේ වෙනකල් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා ඒ පනත් පාවිච්චි වුණේ.

අපේ විදුලිබල ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න හින්දා හොඳයි. දැන් අපි කථා කරනවා, විනිවිදභාවය - transparency - ගැන. ගරු අමාත්‍යතුමනි, කංචන විජේසේකර මැතිතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වශයෙන් ඉන්නකොට හැම මාසයකම අන්තිමට තෙල් මිල සූත්‍රය මාධ්‍යයට දුන්නා. ඒ තෙල් මිල සූත්‍රය මාධ්‍යයට දුන්නාම බලා ගන්න පුළුවන්, ගොඩබාන තෙල් මිල කීයද, ඒකට අය කරන බදු මුදල කීයද, ඒකේ throughput charge එක කීයද, ඒ වාගේම CPC එකට එන ලාභය කීයද, administration cost එක කීයද කියලා. මේ සියලුම දේවල් බලා ගැනීමේ හැකියාව තිබුණා. හැබැයි, මේ ආණ්ඩුව ආපු දවසේ ඉඳන් අද වෙනකල් ඇයි මේක හංගන්නේ? ජයකොඩි ඇමතිතුමා ඉන්නකල් ඒ මිල සූත්‍රය එළියට දැම්මේ නැහැ. දැන් අනුර කරුණාතිලක මැතිතුමා බලශක්ති ඇමතිතුමා වශයෙන් කටයුතු කරනවා. එතුමාගෙනුත් මිල සූත්‍රය එළියට එන්නේ නැහැ. ඔබතුමන්ලා මේ මාසයේ ඉඳන් ඒ මිල සූත්‍රය එළියට දාන්න. එතකොට ජනතාවට බලා ගන්න පුළුවන්, ගොඩබාන මිලටද දෙන්නේ, එහෙම නැත්නම් මෙච්චර බදු තිබෙනවාද, ඇත්තටම රජය කොච්චර බරක් ගන්නවාද කියලා. එතකොට ඒක බලා ගන්න පුළුවන්. ඇයි, මේක හංගන්නේ? හැබැයි, අපට ලැබෙන තොරතුරු අනුව නම් පෙට්‍රල්වලට රුපියල් 150ක tax එකක් තිබෙනවා. ඒ වාගේම ඩීසල්වලට රුපියල් 126කට ආසන්න ප්‍රමාණයක tax එකක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අංකයක්, දෙකක් වෙනස් වෙලා තිබෙනවා නම් ඔබතුමාට ඒ ගැන කියන්න පුළුවන්. මොකද, දැන් ඒ මිල සූත්‍රය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැබැයි, කැබිනට් මණ්ඩලයේ ඉන්න අමාත්‍යතුමියක් ඊයේ කියනවා මම අහගෙන හිටියා, ලංකාවට දැන් තෙල් දෙන්නේ ගොඩබාන මිලටත් වැඩිය අඩුවෙන්ය කියලා. ගරු අමාත්‍යතුමනි, මම දන්නේ නැහැ, එහෙම දෙන ක්‍රමය මොකක්ද කියලා. ගොඩබාන මිලටත් වඩා අඩුවෙන් තෙල් දෙන විධිය මම නම් දන්නේ නැහැ. හැබැයි, අමාත්‍යතුමිය කියනවා, අපි ගොඩබාන මිලටත් වඩා අඩුවෙන්ලු, දෙන්නේ කියලා. ඇත්ත තත්ත්වය මෙකයි. රුපියල් 150කට වැඩිය බද්දක් එකතු කරලා තිබෙනවා. ඒ බදු හින්දා තමයි තෙල් මිල වැඩි වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත්ත වෙලාවට වැඩිය ඩීසල්, පෙට්‍රල් මිල වැඩි වෙලා තිබෙනවා. පෙට්‍රල් මිල රුපියල් 113කින් වැඩි වෙලා තිබෙනවා. එහි සියයට 36ක වැඩිවීමක් තිබෙනවා. ඩීසල් මිල රුපියල් 114කින් - සියයට 40.3කින් - මේ වෙද්දී වැඩිවීමක් තිබෙනවා. ඔබතුමන්ලා එක පැත්තකින් තෙල් මිල වැඩි කරනවා. අනික් පැත්තෙන් බදු මිල වැඩි කරනවා. හැබැයි, ජනතාව නොමඟ යවනවා, අපි මෙච්චර ප්‍රමාණයක් සහන දෙනවා කියලා. හැබැයි, වෙනදා තිබුණාට වැඩිය බද්ද වැඩි වෙලා තිබෙනවා. සමහර ඒවාට රුපියල් 30ක්, සමහර ඒවාට රුපියල් 50ක් වශයෙන් බදු වැඩි වෙලා තිබෙනවා. භූමිතෙල් - kerosene - මිල රුපියල් 102කින් - සියයට 55කින් - වැඩි වෙලා තිබෙනවා. හැබැයි, මේවා වැඩි වුණාට අනික් පැත්තෙන් ජනතාවගේ ආදායම වැඩි වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු ඩී.වී. චානක මහතා]

ඇමතිතුමා අද උදේ solar power පිළිබඳව කියනවා මම අහගෙන හිටියා. Solar power පිළිබඳව කථා කරනකොට Net Metering, Net Accounting ගැනත් කථා කළා. දවල්ට solar powerවලින් නිපදවන විදුලිය ජාතික විදුලිබල පද්ධතියට දීලා, රෑට එම පද්ධතියෙන් විදුලිය ගත්තකොට ඒ මිල අසාධාරණයි කියනවා. හැබැයි, දවල්ට මිල අඩු වුණේ ඇයි? දවල්ට මිල අඩු වුණේ, solar power නිසා. එහෙම නැතිව ඩීසල් නිසා දවල්ට මිල අඩු වුණේ නැහැ නේ. දැන් මිල අඩු කරපු rooftop solar panels තිබෙන පාරිභෝගිකයින්ට තමයි වන්දි ගෙවන්න වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ගත්තාම මෙගාවොට් 2,500ක්, 2,600ක් ආවේ rooftop solar panelsවලින්. මේක තමයි ඇත්ත. අභිංසක මනුෂ්‍යයකුගේ ගෙදර වහල උඩ සවි කර ගත්ත solar panel එකෙන් තමයි මෙගාවොට් 2,500ක් ආවේ. Ground-mounted solar panelsවලින් ආවේ මෙගාවොට් 500යි. හැබැයි, අද වෙද්දි Net Metering දෙන්නෙත් නැහැ; Net Accounting දෙන්නේත් නැහැ. හැබැයි, යස අගේට ඩීසල් ටික පුච්චනවා. Solar powerවලට අවස්ථාව දෙන්නේ නැහැ. හිටපු අමාත්‍යතුමා පසුගිය අය වැයේදී පොරොන්දු වුණා, tariff එක රුපියල් 46කට batteries එක්ක දෙනවා කියලා. මේ ප්‍රශ්නය විසඳනවා කිව්වා. හැබැයි, අවුරුද්දක් ගියා form එකක් දෙන්න බැරි වුණා. අවුරුද්දක් ගියා approval එකක් දෙන්න. මේ නිසා තමයි අද මේ තත්ත්වයට ඇද ගෙන වැටෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ගරු ජනාධිපතිතුමාට රට වටේ යන්න සෙනඟ නැහැ. පව කියන්න; බොරු කියන්න සෙනඟ ගෙන්වා ගන්න විධියක් නැහැ. කලින් කළේ මොකක්ද? පොලීසියේ OIC මහත්තයාට කථා කරලා කිව්වා, "මෙන්න බස් එකක් එවනවා. මෙන්න මේ කොටියාසයේ ඉන්න පොලිස් නිලධාරිතුමාට බස් එකට සෙනඟ පුරවන්න කියන්න" යනුවෙන්. ඊයේ දිනයේදී, අද තිබෙන "රටම එකට" ජාතික මෙහෙයුම සම්බන්ධයෙන් වන වැඩසටහනට ස්වාමීන් වහන්සේලා වැඩම කරවන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ වුණා. පළමුවෙන්ම, ශාසනාරක්ෂක බල මණ්ඩලවලට ආරාධනා කළා. හැබැයි, එතැනින් ප්‍රතික්ෂේප වෙනවා. ඊට පස්සේ OIC මහත්වරුන්ට කථා කරලා කියනවා, ගමේ පන්සලෙන් පන්සලට ගිහිල්ලා, පන්සල් 10,000කට ගිහිල්ලා කොහොම හරි හාමුදුරුවරු ටික වඩම්මලා දෙන්න කියලා. ඒකත් අසාර්ථක වෙනවා. ඊට පස්සේ මොකක්ද කරන්නේ? මෙන්න තිබෙනවා, මගේ අතේ ලියුම. දිසාපතිතුමා, - දිස්ත්‍රික් ලේකම්තුමා - ඇතුළුව සියලු ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලියුමක් ගහලා කියනවා, හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ස්වාමීන් වහන්සේලා 100ක් වඩම්මලා දෙන්න, ගාල්ලෙන් ස්වාමීන් වහන්සේලා 99ක් වඩම්මලා දෙන්න, ගම්පහෙන් මෙච්චරක් අවශ්‍යයි කියලා. හැම තැනින්ම බදු සල්ලි වියදම් කරලා ස්වාමීන් වහන්සේලා වඩම්මලා දෙන්න කියලා අන්තිමට ප්‍රාදේශීය ලේකම් ළඟට ගිහිල්ලා කියනවා. නැත්නම්, ප්‍රතිපාදන ටික නවත්වනවා. පන්සලේ සංවර්ධනය නවත්වනවා. ගරු ජනාධිපතිතුමනි, ඥානසාර හාමුදුරුවන්ගේ ප්‍රශ්නය, ඒ වාගේම මේ ශාසනයට වෙන ප්‍රශ්නය විසඳන්න. එතකොට එයි හාමුදුරුවරු ඕනෑ තරම්. හැබැයි, මේ වාගේ රටේ ජනතාව අවභාවිත කරලා, රටේ මුදල් අවභාවිත කරලා මේ කරන කටයුත්ත නවත්වන්න කියලා ජනාධිපතිතුමාට අපි කියන්න කැමතියි.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.53]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(*மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்*)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම විපක්ෂයෙන් මේ කියන කථා මේ පාර්ලිමේන්තුව ඇතුළේ විතරක් කියන්න පුළුවන් කථා. මොකද, කිසිම සත්‍යතාවකින් තොරව තමයි මේ ප්‍රකාශ කරන්නේ. ඒ කියන්නේ context එක සම්පූර්ණයෙන් අමතක කරලා තමයි කථා කරන්නේ. දැන් බලශක්තිය ගැන කථා කළා. බලශක්තිය නැති කළේ පසුගිය ආණ්ඩු ටිකයි ඒ හිටපු ඇමතිවරුනුයි. ඒ අය අපේ රටේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දශක ගණනක් තිස්සේ අකර්මණ්‍ය කරලා තෙල් පිරිපහදුවේ capacity එක වැඩි කරන්නේ නැතිව හිටපු එකේ ප්‍රතිඵල, ප්‍රතිවිපාක තමයි අද අපි භුක්ති විඳින්නේ. පිරිපහදු කරපු තෙල් ගෙනැල්ලා ලංකාවේ බෙදලා තරගකාරිත්වය ඇති කරන්න බැහැ කියලා පොඩි දරුවෙක් වුණත් දන්නවා. මොකද, පිරිපහදු කරපු තෙල් ලෝකයෙන්ම ගෙනෙන්න පුළුවන් එකම මිලකට. සමාගම් හතරක් ආවා කියලා ඒක වෙනස් වෙන්නේ නැහැ. තෙල් අඩුවට දෙන්න පුළුවන් පිරිපහදු කරලා විතරයි. එතකොට, CPC එකේ capacity එක වැඩි කරන්නේ නැතිව CPC එක වහන්න plan කරලා තව දෙන්නෙකුට එන්න කිව්වා තෙල් බෙදන්න. ඒකේ ප්‍රතිවිපාක තමයි මේ භුක්ති විඳින්නේ. අපි කියන්නේ පුළුවන් නම්, ආවා නම් CPC එකත් එක්ක දැන් තරග කරන්න කියලායි.

මේ ක්‍රියාවලිය සමස්තයක් විධියට ගත්තාම, අපේ රටේ ආර්ථිකයේ තිබෙන අසංවිධිතභාවය, අඳුරුභාවය තුළ තමයි මේ අය දේශපාලනය කළේ. මේගොල්ලන්ට දේශපාලනය කොහොමත් බිස්නස් එකක්. ඒ බිස්නස් එක කරන්න විවිධ අරමුදල්, විවිධ ප්‍රතිපාදන අවශ්‍ය වෙලා තිබුණා. ඒ නිසා තමයි බදු නොගෙවූ ආයතන, හොරෙන් මුදල් පන්නපු ආයතන තිබුණේ. ඒ වාගේම මුදල් විශුද්ධිකරණය සම්පූර්ණයෙන් පාතාලය හා දේශපාලනය එක්ක සම්බන්ධ වෙලා තිබුණා. පසුගිය ටිකේ අපි මේවාට වැටකඩුලු බඳිනකොට, ඒවාට අණපනත් එනකොට වේදනාව වැඩි වෙලා තමයි මේ ඉතාම භයියෙන් කෑ ගහන්නේ.

මේ අය අපේ රට දියුණු කරන්න උත්සාහ කරපු කණ්ඩායමක්ය කියලා කියනවා නේ. එතකොට 1917දී ගෙනාපු ආඥා පනතක් ඒ විධියටම අද අපේ රටේ පවතින්නේ කොහොමද? 1917දී ගෙනාපු ආඥා පනතක් සංශෝධනය නොවී පැවති තිබෙනවා. ලෝකය ඉස්සරහට ගිහිල්ලා, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මතයන් අනුව අපි මේ වෙනස්කම කරන්නේ 1917 වැනි කාලයේ ගෙනාපු, යල් පැනපු පනතකට. අපේ Insolvency Ordinance එක අපි වෙනස් කළේ අවුරුදු 150කට පස්සේ. ඒ වාගේම තමයි, විනිමය බිල්පත්, චෙක්පත් පිළිබඳ තිබුණු නීතිත් යල් පැනපු නීති. මේවා තමයි මේ ආණ්ඩුව ඇවිල්ලා වෙනස් කරලා, ජාත්‍යන්තර තලයට ලංකාව ළඟා කර ගන්න උත්සාහ කරමින් ඉන්නේ.

විශේෂයෙන්ම මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය තමයි මේ යෝජනාව ගේන්නේ, විශේෂයෙන්ම අද අපි කථා කරන මේ සංශෝධනය සඳහා. ඉතින් මේ භාරවලින් විශාල සේවයක් ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවලට සිද්ධ වෙනවා. හැබැයි, මේවා ලියාපදිංචි විය යුතුයි. මොකද, මේක අවභාවිත කරලා තියෙනවා. මේ අවභාවිත කිරීම වළක්වා ගන්න අපට අවශ්‍ය වෙනවා. මොකද, 2019දීත් අපිව review එකක් කරලා, අපි බොහොම අමාරුවෙන් තමයි grey list එකෙන් බේරිලා ඉන්නේ. ඒ

කියන්නේ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ලෝකයේ තියෙනවා, Financial Action Task Force එකක්. ඒකෙන් හැම රටක් දිහාම බලාගෙන ඉන්නේ. මේ ළඟදීත් ඒකේ මෑතකාලීන විචරණයක්, නැත්නම් සමාලෝචනයක් සිද්ධ වුණා. ඒ, තුන්වෙනි සමාලෝචනය. අපි බලන්නේ මුදල් විශුද්ධිකරණයට වැට බඳින රටක් විධියට ජාත්‍යන්තරයට යන්නයි. ඒ හරහා තමයි අපේ රටට ආයෝජන එන්නෙත්, අපේ රට ජාත්‍යන්තරව පිළිගැනීමක් ඇති වෙන්නෙත්. ඒ නිසා තමයි මේ වෙනස්කම් ටික අපි සිද්ධ කරගෙන යන්නේ.

විශේෂයෙන්ම මේ භාර ලියාපදිංචි කිරීම, හඳුනා ගැනීම, අධීක්ෂණය, නියාමනය - මේ හතර - කළා කියලා සද්භාවයෙන් කටයුතු කෙරෙන කිසිදු භාරයකට ගැටලුවක් එන්නේ නැහැ. ඉතින් මම දන්නේ නැහැ, ඇයි මේක පන්සල්, පල්ලි එක්ක පටලවන්න හදලා ආයෙමත් අර හැමදාම වාගේ ජාති, ආගම් ගැටලු මෙතැනට ගේන්න උත්සාහ කරලා මේක ගන්නේ කියලා. ඒ වාගේම අපි මේ කරගෙන යන ක්‍රියාවලිය ජනතාව තේරුම් අර ගන්න ඕනෑ. අපරාධ රාජ්‍යයක් නැවත යථා තත්ත්වයට පත් කරන්න තමයි අපි මේ අණපනත් ගේන්නේ. එතකොට සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත වාගේ දේවල් ගේන්නේ අපේ රටට විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් මේවායේ අවශ්‍යතාවන් තිබෙන නිසායි. විශේෂයෙන්ම අපි ඉදිරි අවුරුදු 10ට GSP Plus ඉල්ලන්න ඉන්නේ. ඒකෙත් ගිය අවුරුද්දේ අපට නිර්ණායක 28යි තිබුණේ. දැන් ඒක නිර්ණායක 32ක් වෙලා තියෙනවා. එතකොට forced labour, child labour in military, පරිසරය පිළිබඳ, ILO Convention එක පිළිබඳව සහ සංවිධානාත්මක අපරාධ පිළිබඳවත් මේවා ගෙන ඒමේ අවශ්‍යතාවක් තියෙනවා, අපි මේ ජාත්‍යන්තර ගිවිසුම්වලට යනකොට. ඒවාට ගැළපෙන ප්‍රතිපත්ති නිර්මාණය කරනකොට, නීතිය නිර්මාණය කරනකොට විපක්ෂය මේ පනත් සම්බන්ධයෙන් පවා පටලවාගෙන තියෙනවා.

අද මෙතැන පව්ච කථාවක් කිව්වා. ඒ පව්ච කථාව තියෙන්නේ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ නීතියේ මිසක් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කර ගැනීමේ පනත් කෙටුම්පතේ නොවෙයි. දැන් මේ ඔක්කෝම පටලවාගෙන ඉන්නේ. මේ පැටලෙන්නේ බයට. මොකද, මේගොල්ලන්ට තමයි පාතාලය සම්බන්ධ. 1980 ඉඳලා මෙච්චර කාලයක් පාතාලයට ලංකාවේ වැඩෙන්න දුන්නේ මෙන්න මේ අය. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය අවුරුදු දෙක තුළ ලංකාවේ පොලීසිය විසින් 310,200ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන්. ඒ වාගේම අනීතික වත්කම් සඳහා 450කට නීතිය ක්‍රියාත්මක වෙමින් තියෙනවා. ඒ 450 සමහර වෙලාවට මේ අයට සම්බන්ධත් ඇති. අපි දන්නේ නැහැ. මොකද, ඒ සම්බන්ධතා තියෙනකොට මේ ක්‍රියාවලිය හරහා පුනරුත්ථාපනයට 2,600ක් යොමු කරලා තියෙනවා. ඉතින් එහෙම අයුක්තියක් වුණාද මේ පවතින නීතිය යටතේ?

දැන් අපි PTA එකට විරුද්ධයි; අපි හැමෝම විරුද්ධයි. එතකොට මේ පවතින නීතිය යටතේත් එහෙම නම්, පොලීසියෙන් එහෙම අඩන්තේට්ටම් වෙලා තියෙන්න එපා යැ. තැන් තැන්වල වැරදි වුණාම ඒවාට අදාළ නීතිය ක්‍රියාත්මක වෙනවා. ඉස්සර පොලීසියේදී ඒ වාගේ කරදරයක් වුණොත්, මාධ්‍යයට එන්නෙත් නැහැ; අපි දන්නෙත් නැහැ; ජනතාව එළියට එන්නෙත් නැහැ. හැබැයි, මේ රජය යටතේ ඒ වාගේ පොලීසිය ඇතුළෙදී, පොලීසිය යටතේදී යම්කිසි ක්‍රියාමාර්ගයක් වුණොත්, ඒක සම්බන්ධයෙන් ක්ෂණිකව ඒ අදාළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරලා, ඒ අදාළ නිලධාරීන් වගකීමට පමුණුවලා තියෙනවා. එතකොට මේ ගැන අවිශ්වාසයක් හදා ගන්නේ, මේ ගැන බයක් ගොඩ නඟන්නේ පාතාලයත් එක්ක ජීවත් වෙච්ච දේශපාලන තන්ත්‍රය. ඒ අය තමයි මේකට බය වෙලා මේ පනත් කෙටුම්පත්වලට විරුද්ධව, මුදල් විශුද්ධිකරණය ඉවත් කිරීමට විරුද්ධව මේ කරුණු කාරණා ගෙන හැර දක්වන්න හදන්නේ. හැබැයි, මේකෙත් තාර්කික කරුණු නොවෙයි ගේන්නේ. විශේෂයෙන්ම ඒවා ගේන්නේ මේක සමාජයත් එක්ක කලත්තලා, සමාජයේ තියෙන හැඟීම් දැනීම් පාවිච්චි කරලා, බය ඇති කරවලා මේ පනත් කෙටුම්පත්වලට විරෝධ තත්ත්වයක් ඇති කරන්නයි.

හැබැයි, අපි දන්නවා, ජාතික ජන බලවේගයට ඡන්දය දීපු කිසිම කෙනෙක් මේ අපරාධ රාජ්‍යය සුවපත් කරනවාට විරුද්ධ නැහැ කියලා. ඒ අය දන්නවා, මේ අයට කර ගන්න බැරි වුණා, ඒ අයට නීති සම්පාදනය කර ගන්න බැරි වුණා කියන එක. එහෙම උනන්දුවක් තිබුණෙත් නැහැ. නීති ක්‍රියාත්මක කළෙත් නැහැ. එතකොට වර්තමාන රජය නීති පනවනවා; නීති ක්‍රියාත්මක කරනවා.

ජාතික ජන බලවේගයට සද්භාවයෙන් ඡන්දය දීපු කිසිම කෙනෙකුට ඒකෙන් බලපෑමක් එන්නේ නැහැ. රජය විධියට අපට විශ්වාසයක් තිබෙනවා, අපට මේ රට හදන්න පුළුවන් කියලා. මොකද, අපට ජන වරමක් දුන්නේ පැවැති තත්ත්වය නීති හදලා හරි වෙනස් කරන්න කියලායි. ඒ නිසා අපි මේ රට හදනවා.

ඒ වාගේම තමයි, මේ ගමන යනකොට අපි ජනතාවට ඇහුම්කන් දෙනවා; ජාත්‍යන්තරයට ඇහුම්කන් දෙනවා. මේ සෑදෙන හැම අණ පනතක්ම ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව තමයි හැදෙන්නේ. ලෝකය පුරාම ත්‍රස්තවාදය බිහි වෙලා තිබෙනවා; ත්‍රස්තවාදය පැතිරිලා තිබෙනවා. ඒ නිසා ත්‍රස්තවාදය නැවැත්වීම සඳහා ජාත්‍යන්තරයේත් අණ පනත් හැදිලා තිබෙනවා. ඒවාට සාපේක්ෂව, සමගාමීව තමයි ලංකාවේත් අණ පනත් හැදිලා තිබෙන්නේ සහ හැදෙන්නේ. ඒ වාගේම, සංවිධානාත්මක අපරාධවලට එරෙහිවත් ජාත්‍යන්තර නීති තිබෙනවා. ඒවාට සමගාමීව තමයි මේ රටේත් නීති හැදෙන්නේ. මේවා හොඳ නැත්නම්, මේවා ගැළපෙන්නේ නැත්නම් ජාත්‍යන්තරයෙන් පවා අපට යෝජනා එයි. ඔබතුමන්ලාටත් පුළුවන් අපට යෝජනා දෙන්න. එතකොට ඒ අදාළ සංශෝධනත් සිදු කරගෙන ඉදිරියට යන්න අපට පුළුවන්. නමුත්, මේ කරගෙන යන ක්‍රියාවලිය ගැන, මේ context එක ගැන, අප කරන්න හදන වැඩේ ගැන මහජනතාවට හොඳ අවබෝධයක් තිබෙනවා කියලා අපි හිතනවා.

අද පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ, විශේෂයෙන්ම ගුවන් හමුදාවට අදාළ කාරණයක් වෙනුවෙන්. ගුවනින් ලංකාවට ආරක්ෂාව සපයන්න, ඒ සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගන්න surveillance කරන්න පුළුවන් ශක්‍යතාව 1996න් පසුව යවත්කාලීන වෙලා නැහැ. Unmanned aircraft දෙකයි ලංකාවට තිබිලා තියෙන්නේ. ඒ දෙකෙන් එකක් දැන් සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය වෙලා තිබෙනවා. අනෙක් එකේ system එක 1996 එකක්. ඒ වාගේ දුර්වලතා තියාගෙන, ඒවා මහ හරවන්න ප්‍රමුඛත්වය දෙන්නේ නැතුව තමයි ජාතික ආරක්ෂාව ගැන මේගොල්ලන් පාරම්බාලා තිබෙන්නේ. මේ අය හැමදාම කියනවා, ජාතික ආරක්ෂාව අනතුරේ කියලා. හැබැයි දැන් ඒ වචනය ඇහෙන්නේ නැහැ; ඒ ගැන කථා කරන්නේ නැහැ. ඡන්දයට කලින් නම්, "ජාතික ආරක්ෂාව අනතුරේ. බුදු අම්මෝ! ජාතික ජන බලවේගය ආවොත් ජාතික ආරක්ෂාව අනතුරේ" කියලා කෑගැහුවා. බලාගෙන යද්දී, 1996 ඉඳලා අපේ ගුවන් හමුදාවට තිබුණු unmanned aircraft දෙකවත් update කර ගන්න බැරි වෙලා තිබෙනවා.

මේ රුපියල් බිලියන 4ක පරිපූරක ඇස්තමේන්තුව යටතේ වන මුදල්, විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයක් හරහා තමයි වෙන් කරන්නේ. මේ සඳහා අමතර ප්‍රතිපාදන යන්නේ නැහැ. ඒ මුදල් වෙන් කිරීම අද සිදු වෙනවා. මෙම ThunderB කියන unmanned aircraft දෙක ඊශ්‍රායල රජයට අනුබද්ධ Bluebird Aero Systems කියන ආයතනයකින් තමයි

[ගරු චතුරංග අබේසිංහ මහතා]

මිල දී ගන්නේ. එකක්, ගුවන් නියමුවෙකු නැතිව කිලෝමීටර 150ක් දුර යන්න පුළුවන් යානයක්. දෙවැනි එකට ගුවන් නියමුවෙකු නැතිව කිලෝමීටර 200ක් දුර යන්න පුළුවන්. මේ දෙකෙන් තමයි ගුවනින් ගිහිල්ලා අපේ රටේ වන සිද්ධි, අපේ රටේ ආරක්ෂාවට තිබෙන ගැටලු මොනවාද කියලා සොයා බලන්න අපේ ගුවන් හමුදාවට ශක්තිය ලැබෙන්නේ. මේකත් එක්කම ground control units දෙකක් සහ data terminals දෙකක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප මේ යාවත්කාලීන කරන්නේ පරණ රටක්. මේගොල්ලන්ගේ දේශපාලනය පවා පරණ විධියටයි පවත්වා ගෙන ගියේ. දැන් ඒ දේශපාලනය අහෝසි වෙනවා කියලා මේගොල්ලන්ට ඇස් පනාපිට පෙනෙනවා. මොකද, මෙතැනින් එහාට මේ අලුත් දේශපාලන සංස්කෘතිය ජනතාව සම්මත කරලා තිබෙනවා. ඒ නිසා ජාතික ජන බලවේගයට වඩා හොඳ දේශපාලන සංස්කෘතියක් අරගෙන එන්න මේගොල්ලන්ට සිදු වෙනවා. ඒක කරන්න වෙන්නේත් නැහැ. ඒ වාගේම අපි මුදල් විශුද්ධිකරණය නවත්වනවා. එතැනින් පස්සේ ඔය campaignsවලට යද්දී ඉස්සර වාගේ වියදම් කරන්න වෙන්නේත් නැහැ. මා අහගෙනයි, ඉස්සර මේගොල්ලන්ට කොළඹ මන්ත්‍රී කෙනෙකු වෙන්න රුපියල් මිලියන 800ක් විතර ඕනෑවු. ඉදිරියේදී එහෙම එකක් කරන්න ලැබෙන්නේත් නැහැ. මොකද, පක්ෂය ඇතුළේ තමතමන් තරග කරන්නත් එපායැ. අප මේ කටයුතු කළාට පස්සේ ඔයගොල්ලන්ගේ පරණ දේශපාලනය ඔයගොල්ලන්ට ආයෙත් ජීවිතේට කරන්න වෙන්නේ නැහැ. එක පැත්තකින්, මුදල් අමාත්‍යාංශය බදු මුදල් හරියට එකතු කර ගනිමින් බදු ක්‍රමය විධිමත් කර ගන්නවා. අනෙක් පැත්තෙන්, ආයතන සංවිධිත වෙනවා; රට ඩිජිටල්කරණයට ලක් වෙනවා; මුදල් විශුද්ධිකරණය නවතිනවා. එතකොට ඇත්තටම නවතින්නේ පරණ දේශපාලනයයි. ඒකට තමයි මේ බය වෙලා ඉන්නේ. වෙන එකක් නොවෙයි, පරණ දේශපාලනය නවතිනවා. ඒකට අපට කරන්න දෙයක් නැහැ. ඉතින්, ඔයගොල්ලන් දියුණු දේශපාලනයට ආවොත් විතරක් අපත් එක්ක දේශපාලනය කරන්න පුළුවන්. ඒකට බය වෙලා වැඩක් නැහැ. ඊයේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒ කාලයේ ජාත්‍යන්තර ගිවිසුම්වලට විරුද්ධ වුණේ ජනතා විමුක්ති පෙරමුණයි කියලා. තාත්තාගෙන් අහගන්න කියලාත් කිව්වා. ඇත්තටම ඔයගොල්ලන්ට සැලැස්මක් තිබුණේ නැහැ, අපේ රටේ කර්මාන්ත ආරක්ෂා කරගෙන වෙළෙඳ ගිවිසුම්වලට යන්න. හිතලා බලන්නකෝ, 1970දී ලංකාවේ තිබුණු කර්මාන්ත ප්‍රමාණය ගැන. 1980-1990 කාලයේ ලංකාවේ වැහිලා ගිය කර්මාන්ත ප්‍රමාණයත් බලන්නකෝ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසන්.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
මට තව පොඩි වේලාවක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔයගොල්ලන් එම කර්මාන්තශාලා පෞද්ගලික අංශයට පැවරුවා නම්, ඒවා දියුණු වෙලා තිබෙන්න ඕනෑ; වීදුරු කර්මාන්තය දියුණු වෙලා තිබෙන්න ඕනෑ, දැව කර්මාන්තය දියුණු වෙලා තිබෙන්න ඕනෑ, ටයර් කර්මාන්තය දියුණු වෙලා තිබෙන්න ඕනෑ; බැටරි කර්මාන්තය දියුණු වෙලා තිබෙන්න ඕනෑ. ලංකාවේ වාහනත් හදන්න පුළුවන්කම තිබුණා. ඒ කර්මාන්තශාලා ඔක්කොම වාගේ ගියා නේ. කෝ, මොනවාද දැන් තිබෙන්නේ?

ඔබතුමන්ලා FTAsවලට ගියාද? ඕනෑම රටක් FTAsවලට යන්නේ දේශීය කර්මාන්ත ශක්තිමත් කරමින් ජාත්‍යන්තරයට නිරාවරණය වෙන්නයි. ඔයගොල්ලෝ Commerce Department එකත් වහලා දැම්මා නේ. Commerce Department එක වහලා, trade negotiatorsලා අයින් කරලා, එළියෙන් කට්ටියක් දාගෙන තමයි අන්තිම trade agreements දෙකකට ගියේ. ඔයගොල්ලන්ට පුළුවන් නම් තායිලන්තයේ Agreement එකට, සිංගප්පූරුවේ Agreement එකට අදාළ feasibility study එක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. Feasibility study එකක් කරන්නේ නැතිව නේ FTAsවලට ගියේ. ඉතින් ඒවාට තමයි අපි විරුද්ධ වුණේ. අපි FTAsවලට යනවා, හරි ආකාරයට; ජාත්‍යන්තරයට යන්න ඕනෑ ආකාරයට. අපි විරුද්ධ වුණේ රට සැලැස්මක් නැතිව ඉබාගාතේ ගෙන යෑමටයි. මා කියන්නේ මේ රට දැන් හරි පැත්තට යනවා කියලායි. ඒ සඳහා සහාය දෙන්න. ඔබතුමන්ලාගේ දේශපාලනය වෙනස් කර ගන්න. එහෙම නැත්නම් කොහොමටත් ඔබතුමන්ලාට පැවැත්මක් නැහැ.

කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[2.06 p.m.]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairperson of Committees, the Financial Action Task Force, which is an intergovernmental body supervising money laundering and terrorist financing, has ostensibly wanted some amendments to be adopted during the last evaluation cycle that took place in 2025. And, in keeping with that, the Registrar General's Department as well as the Financial Intelligence Unit of the Central Bank have presented these Amendments to the Trusts Ordinance, which was enacted way back in 1917. It is almost a century-old legislation.

All of us know that the trust jurisdiction in this country follows the English law, and be it a public trust or private trust, their internal affairs are mainly not known to the public. But, now, the State wants to get involved in regulating trusts, and the activities of those trusts, the beneficiaries and all the details will have to be disclosed through the Registrar General. Also, any disputes regarding those and matters relating to supervision could also be challenged.

But be that as it may, first of all, talking about terrorist financing, I would like to point out that the biggest international terrorist, Donald Trump, has faced a

big setback on 04th November, 2026, and that is a big relief to all of us. Due to the terrorism he has engaged in, bringing anarchy to the entire world, all of us are suffering. Now, both the Senate and the Congress of America have been flipped. What is more astounding is that the MAGA movement, which is his base, relied on two important elements. One was his promise not to go to any war, and he broke that promise. With the other one, he tried to stop immigration into the country. Now, as a slap in the face of Trump, several immigrants have become Governors and Senators in the House as well as in the Senate. So, that is how the American people have given a rebuke to Trump, and all of us must celebrate it. We hope that, at least now, he would stop any more war, he would, at least persuade his ally, Netanyahu, also to stop the war with Lebanon and Palestine and ultimately, they would desist from bringing any more destruction to the entire world. Having said that and while celebrating this immense achievement and particularly saluting the American public for having given him this terrible blow, let us now focus on these legislations the Government is seeking to bring in.

Of course, I told you that the Financial Action Task Force is responsible for having recommended these Amendments to the Trusts Ordinance. Be that as it may, I am told that the Government has, over the last year alone, brought in about 25 legislations, of which some are very oppressive and repressive, particularly the Protection of the State from Terrorism Act - we are still to receive the Supreme Court Determination on that Bill - and the Prevention of Organised Crimes Bill, regarding which there was a demonstration yesterday at the entrance to Parliament and which is also being challenged before the Supreme Court right now.

Then, I am also told that the Government is going to regulate NGOs, community service organizations, voluntary groups and community welfare bodies through another legislation. With regulation, certainly, all of us would agree, but control is the purpose of it; that is what the Government is trying to do. Now, every civil activity, the Government seeks to control through these oppressive and repressive legislations that are being brought in. Now, over the PSTB - the Protection of the State from Terrorism Bill - and the Prevention of Organised Crimes Bill, several objections have come up, particularly with the definition, which is overbroad, being asked to be narrowed down. All the Special Mandate-holders of the Human Rights Council have listed out reasons why these legislations are against international best-practice norms. UN experts have also raised alarm regarding the PST Bill. The UN Human Rights Council Mandate-holders, including the Special Rapporteur on counter-terrorism and human rights, the Working Group on Arbitrary Detention, the Working Group on Enforced or Involuntary Disappearances, the Special Rapporteur on extrajudicial executions and the Special Rapporteur on human rights defenders and all of these people have publicly criticized the attempt to bring in this Bill to replace the already agreed draconian PTA. Who is bringing this in? The very same party which suffered under the PTA, under this particular Act and the very President who gave the promise that we must abolish the PTA altogether. "We will abolish it and not replace it" is what he said, whereas now, he has eaten all his words and is trying to, again, bring something much more worse than what was already there. So, what is the meaning of this? Already, the United Nations Human Rights Council has objected. Now, I hear that the Leader of the House is already taking a step backwards and is suggesting, "We will look at some changes or some amendments". You all should have done this right away. You all should have already told the Attorney-General's Department to agree to some amendments before the Supreme Court. Having got seriously reprimanded by all the international organizations, now, you are trying to take a step back. Then, what about the Prevention of Organised Crimes Bill? You are repeating the same thing. There also, it is a very, very overbroad definition of an "organized crime". Every conceivable activity has been brought under it. Every department and everybody is being -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Madam, I will wind up.

Therefore, what is important for us to realize about this type of oppressive and repressive legislation is this. Regulation is okay, but seeking to control civil activity in the country must be desisted from, and that is why all the international organizations, in unison, is stating their objection to what the Government is attempting to do.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.14]

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කලින් අදහස් ප්‍රකාශ කරපු, ඩී.වී. චානක මන්ත්‍රීතුමා රාජපක්ෂවරු සපත්තු අස්සේ දාගෙන ගියපු දේවල් ගැන කිව්වා. රාජපක්ෂවරු එක එක අස්සවල්වල දාගෙන නිටපු දේවල් ගැන දැන් උසාවියේදී එකින් එක දිග හැරෙනවා. කොච්චර දිග හැරෙනවාද කියලා කිව්වොත්, සමහරුන්ට නිල් පාට බස්වල ගමන් බිමන් යන්න සිද්ධ වෙලා තිබෙනවා. මම ඒ ගැන ඊට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

[ගරු අනුර කරුණාතිලක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ කථා කරන ප්‍රධාන මාතෘකාවට කලින් මම එක කරුණක් ගැන අවධානය යොමු කරවන්න කැමැතියි. විශේෂයෙන්ම ඊයේ දවසේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුත්, ඒ වාගේම සමහර මාධ්‍යවලත් ප්‍රකාශයට පත් වුණා, NSO එක විසින් විදුලි බිල ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා කියලා. ඒක සියයට 2.8කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කරන්න යනවාය කියලාත් කිව්වා. නමුත්, අපි දන්නා කාරණය සහ සාමාන්‍ය ක්‍රමවේදය තමයි, ඉදිරි මාස තුනකට අදාළව - quarterly - විදුලි ජනන වියදම පිළිබඳ විස්තරය NSO එක විසින් මහජන උපයෝගිතා කොමිසමට ලබා දෙන්න කටයුතු කරනවා කියන එක. ඒ අනුව ඒ submission එක කරලා, ඊට අමතරව ඔක්තෝබර් මාසයේ 06වැනි දා නැවත වරක් මහජන උපයෝගිතා කොමිසමට ලියලා තිබුණා, generation cost එකේ revision එක හැටියට රුපියල් මිලියන 129,933ක - රුපියල් බිලියන 129ක - අගය රුපියල් මිලියන 125,939 දක්වා අඩු වෙනවා, ඒ අනුව විදුලි බිල වැඩි කිරීමේ අවශ්‍යතාවක් NSO එක දකින්නේ නැහැ කියලා. මම ඒ ඔක්තෝබර් 06වැනි දා යවපු ලිපිය කියවන්නම්. ඒ ලිපියේ එක තැනක cost එක ඉදිරිපත් කරලා, මෙසේ සඳහන් වෙනවා:

> "Accordingly, the forecasted Bulk Supply Cost for 2026 Q4 has reduced from MLKR 129,933 to 125,939, a decrease of MLKR 3,994 (approximately 3 %), driven principally by the reduction in forecasted thermal generation, Generation Capacity costs of EGL owned Power Plants and partially offset by the increase in forecast coal prices."

එහි තවදුරටත් විශේෂයෙන් සඳහන් කරනවා, I quote:

> "This may mitigate the necessity for an upward adjustment of Bulk Supply rate."

ඒ කියන්නේ tariff hike එකක අවශ්‍යතාවක් පැන නගින්නේ නැහැ කියන එක ඉතා පැහැදිලිව NSO එක විසින් ඔක්තෝබර් 06වැනි දා මහජන උපයෝගිතා කොමිසමට යවපු ලිපියේ සඳහන් වෙනවා. නමුත්, අපි දැක්කා ඊයේ දවසේ විවිධ මාධ්‍ය හරහාත් ඒ ගැන වාර්තා කරනවා. ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුත් ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. අපි දන්නවා, මහජන උපයෝගිතා කොමිසම තමයි tariff එක සම්බන්ධයෙන් අවසාන තීරණය ගන්නේ කියලා. නමුත්, මම දැනටමත් සඳහන් කළා වාගේ, NSO එක විසින් කිසිසේත්ම මිල ඉහළ දැමීමක් ඉල්ලා සිටියේ නැහැ. ඒ වෙනුවට ඔවුන් සඳහන් කරලා තිබෙන්නේ, ඔවුන්ගේ අදහස අනුව මිල ඉහළ දැමීමේ අවශ්‍යතාවක් පැන නගින්නේ නැහැ කියලා. නමුත්, අපි දන්නවා, අවසාන වශයෙන් මහජන උපයෝගිතා කොමිසම තමයි තීරණය කරන්නේ, මිල ඉහළ දැමීමක් කරන්න ඕනෑද නැද්ද කියන එක ගැන. ඒ සඳහා මහජනතාවගේ අදහස් විමසීමේ බලයත් - public hearing - ඔවුන්ට ලැබෙනවා, Act එකේ 18 (1) වගන්තිය අනුව. මම ඒක කියවන්නම්. Section 18 (1) of the Act states, I quote:

> " The Commission may, in discharging the functions assigned to it by or under this Act or any other industry Act, and where it deems necessary in the public interest .."

I repeat, "where it deems necessary".

> ".. hold a public hearing in order to investigate or determine any matter."

ඒ අනුව public interest එක වෙනුවෙන් තමයි public hearing එක කරන්නේ. හැබැයි, විදුලි බිල වැඩි කිරීමේ අවශ්‍යතාවක් පැන නොනගී කියලා NSO එක සඳහන් කර තිබියදී, public hearing එකකට යන්නේ ඇයි කියන එක මට පැහැදිලි නැහැ. බොහෝ වෙලාවට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට, පරාජිත දේශපාලනඥයන්ට, සමහර යූටියුබ්කරුවන්ට අවස්ථාව තිබෙනවා, මේ public hearing එකට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න. ඒ සඳහා මහජන මුදල් නාස්ති කරලා මේ public hearings කරන්න ඕනෑද? විශේෂයෙන් විදුලි බිල ඉහළ නැංවීමේ අවශ්‍යතාවක් සඳහන් කරලා නැති වෙලාවක මේ වාගේ public hearing එකක් කරන්න ඕනෑද කියන එක සම්බන්ධයෙන් ඇත්තටම ගැටලුවක් පැන නගිනවා. ඒ වාගේම NSO එක ඊයේ දවසේ නැවතත් PUCSL එකට ලියලා මතක් කළා, 2026 වසරේ අවසාන කාර්තුව සඳහා විදුලි බිල ඉහළ නැංවීමේ අවශ්‍යතාවක් නොමැති බව. මම ඒ ලිපියෙන් කොටසක් උපුටා දක්වන්නම්.

> "Further, NSO has reassessed its rolling energy dispatch forecast for November-December 2026 based on the "Seasonal Outlook" issued by the Meteorological department dated Nov. 01, 2026, and observed that, a higher level of hydro generation could be expected compared to the energy dispatch forecast considered in the Bulk Supply Cost Forecast submitted on October 06, 2026. This is expected to result in a cost reduction of LKR 2.5-3.0 billion (i.e. approximately 2% of the forecasted cost of supply for Q4). Accordingly, NSO is of the view that no electricity tariff increase is required for the fourth quarter of 2026."

I repeat, "Accordingly, NSO is of the view that no electricity tariff increase is required for the fourth quarter of 2026". ඒ කියන්නේ, 2026 වසරේ අවසාන කාර්තුව සඳහා විදුලි බිල ඉහළ නැංවීමේ අවශ්‍යතාවක් නැති බව NSO එක පැහැදිලිව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට දැනුම් දීලා තිබෙනවා. නමුත් මම කලින් කිව්ව හේතු නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ මහජන උපයෝගිතා කොමිසම මේ තීන්දුව ගත්තේ ඇයි කියලා අපට තේරෙන්නේ නැහැ. කොමිසමේ සාමාජිකයන්ද, එහෙම නැත්නම් නිලධාරින්ද මේ තීන්දුව ගත්තේ කියන එක අපට පැහැදිලි නැහැ. විදුලි බිල ඉහළ දැමීම සඳහා අවශ්‍යතාවක් පැන නොනගින කාලයක public hearing එකක් පැවැත්වීම සඳහා මහජන මුදල් නාස්ති කිරීම ඇත්තටම වැරදි ක්‍රියාවලියක්, නොකළ යුතු ක්‍රියාවලියක් හැටියට තමයි අපි දකින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

NSO එකෙන් මේ සම්බන්ධව මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. මම ඒක කියවන්නම්. "2026 වසරේ සිව්වන කාර්තුව සඳහා විදුලි ගාස්තු සංශෝධනයක් නොකෙරේ" කියන එක තමයි එහි මාතෘකාව. "2026 නොවැම්බර් මස 05වැනි දින පැවැති 2026 වසරේ සිව්වන කාර්තුව සඳහා යෝජිත විදුලි ගාස්තු සංශෝධනය පිළිබඳව පාර්ශ්වයන්ගේ උපදේශන සාකච්ඡාවේදී ජලාශවල පවතින ජල සංචිත මට්ටම සහ එල් නිනෝ කාලගුණික තත්ත්වයන් යටතේ පුරෝකථනය කර ඇති සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ වර්ෂාපතනය සැලකිල්ලට ගනිමින් 2026 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල සීමාව සඳහා විදුලි ගාස්තු වැඩිකිරීමක් අවශ්‍ය නොවන බව NSO ආයතනය අවධාරණය කරන ලදී" යනුවෙන් එහි සඳහන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, vested interests තිබෙන අය මේ පිළිබඳව

විවිධ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් අවසාන වශයෙන් රජය සහ මේ අනුප්‍රාප්තික සමාගම් සියල්ල වැඩ කරන්නේ මේ රටේ විදුලි පාරිභෝගිකයින් ගැන කල්පනා කරලා. ඒ නිසා දැනට අපට තිබෙන දත්ත මත සහ අපි පුරෝකථනය කර තිබෙන දත්ත මත අපට දැනෙන්නේ මේ අවුරුද්ද තුළ නැවත වරක් විදුලි බිල ඉහළ දැමීමේ අවශ්‍යතාවක් නැහැ කියන එකයි. මම හිතනවා, ඒක මේ රටේ විදුලි පාරිභෝගිකයින්ට හොඳ ආරංචියක් වෙයි කියලා.

බෙහෙවින්ම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.23]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට ටික වෙලාවකට කලින් ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. එතුමා දැන් නම් සභාවේ නැහැ. එතුමාගේ තාත්තා නම් සභාවේ ඉන්නවා. එතුමා ඒ වෙලාවේ කිව්වා, 1996 වසරේ ගුවන් නියමුවන් නැති ගුවන් යානා තිබුණේ නැහැ, දැන් ගෙනෙන්න හදනවා කියලා. ඒවා ගෙනෙන එකට අපි ස්තුතිවන්ත වනවා. හැබැයි, 1996 වසර වන විට නියමුවන් නැති ගුවන් යානා තිබුණේ රටවල් කිහිපයකට පමණයි. අපි වාගේ දුප්පත් රටකට ඒ කාලයේ ඒවා ගන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ නියෝජ්‍ය ඇමතිතුමා එතකොට ඉපදිලාද දන්නේත් නැහැ. හැබැයි, ඒ කාලයේ බෝම්බ දැම්මේ මොනවායෙන් ගිහින්ද දන්නේ නැහැ. පොල් කෝම්බද දන්නේ නැහැ, උතුරට ගිහිල්ලා අපේ අය දමා ආවේ. මම හිතන විධියට ගුවන් හමුදාවේ හිටපු අයත් මෙතැන ඉන්නවා. ඒ කාලයේ ගිහිල්ලා පොල් කෝම්බද දන්නේ නැහැ දැම්මේ. ඒ නිසා පම්පෝරි ගහන්න එපා. 1996දී ගෑස් පෝලිම් තිබුණේ නැහැ, තෙල් පෝලිම් තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 1996දී ලස්සනට තෙල් මිල අඩුවෙන් තිබුණා; ගෑස් තිබුණා; මිනිස්සුන්ට කඩෙන් ගන්න ඕනෑම භාණ්ඩයක් තිබුණා. මම දැන් ඒවා ගැන කථා කරන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, භාර (සංශෝධන) පනත් කෙටුම්පත කියන්නේ මේ ආණ්ඩුවෙන් ගෙනා එකක් නොවෙයි. මේක IMF එකේ යෝජනාවක්. IMF එක බලපෑම් කර තිබෙනවා, මේ යෝජනාව ගෙනෙන්න කියලා. IMF එකේ එක එක යෝජනා තිබෙනවා, භාර (සංශෝධන) පනත් කෙටුම්පත, අර පනත්, මේ පනත් ගෙනෙන්න කියලා. IMF එක කියන විධියට වැඩ කරන්නේ නැහැ කියපු මිනිස්සු දැන් IMF එකේ නැවිටේ එල්ලිලා තමයි වැඩ කරන්නේ. අර බදුල්ල පැත්තේ ඉන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මහ ලොකුවට ඒ දවස්වල දෙඩෙව්වේ, අපි සුද්දෝ පස්සේ යන්නේ නැහැ කියලායි. ඒ වුණාට දැන් සුද්දෝ පස්සේ තමයි යන්නේ. එහෙම ගිහිල්ලා තමයි IMF එකේ යෝජනා ගෙනෙන්නේ. IMF එක කියන විධියට තමයි දැන් වැඩ කරන්නේ. ඒකත් මේ වෙලාවේදී මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ගැනත් මේ අවස්ථාවේදී මා සඳහන් කළ යුතුයි. මේ රටේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා කවුද? නලින්ද ජයතිස්ස ඇමතිවරයා. එතුමා මාධ්‍ය හමුවකදී කියනවා, එහි තිබෙන්නේ රජයේ මුදල් නොවෙයි කියලා. ඒ මුදල් රජයේ මුදල් නොවන්නේ කොහොමද? ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කියන්නේ රජයේ ආයතනයක්. Cabinet Paper එකක් දමලා මුදල් අරගත්තේ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන්. මේ ආයතනයේ තිබෙන සල්ලි රජයේ සල්ලි නොවෙයි නම් ජනාධිපති අනුර කුමාර දිසානායක මොන එහෙකටද Cabinet Papers දමන්නේ? Cabinet Paper එකක් දමා මේ ආයතනයේ මුදල් අරගෙන තිබෙනවා. මොනවාටද? Welcome drink එකේ වියදමට. මරු! Welcome drink එකට රුපියල් ලක්ෂ 45යි. ඊළඟට, cocktail party එකට රුපියල් ලක්ෂ 50යි. ජනතා විමුක්ති පෙරමුණේ සියයට තුනේ මිනිස්සු දන්නවාද දන්නේත් නැහැ, cocktail බොන්න. Cocktailsවලට විතරක් රුපියල් ලක්ෂ 50යි. *[බාධා කිරීමක්]* අපි නම් ඕවාට යන්නේත් නැහැ. ඔයගොල්ලන්නේ හෝටල්වල පාටි දමා තිබෙන්නේ, අපි නොවෙයි නේ. Cocktail party එකට රුපියල් ලක්ෂ 50යි. මොකක්ද මේ? මේ සල්ලි කාගේද? මේ රටේ මිනිස්සු අද කොච්චර දුක් විඳිනවාද? මේ වනකොට තෙල් පෝලිම්, ගෑස් පෝලිම් තිබෙනවා. රෝහල්වල බෙහෙත් නැහැ. ඒ වාගේම TIN එක ගන්න පෝලිම් තිබෙනවා. අද වන විට ලක්ෂ හතකගේ අස්වැසුම දීමනාව කපලා. ඒකට මිනිස්සු පෝලිමේ ඉන්නවා. එසේ තිබියදී තමයි මෙගොල්ලන් cocktail parties දමන්නේ.

"සිරස" කියන්නේ සල්ලි නැති නාළිකාවක්ද? අද මාධ්‍ය ආයතන කොච්චර තිබෙනවාද? හැම දාම "සිරස" නාළිකාව කළේ ඕක තමයි. කාට හරි කඩේ යනවා. ආණ්ඩුව අල්ලා ගන්නවා, ආණ්ඩුව අල්ලාගෙන පොඩි සන්දර්ශන ටිකක් දමලා සිරසට ඕනෑ විධියට සල්ලි වියදම් කරවාගන්නවා. මේකට විරුද්ධව මේ වනකොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිලි කීයක් තිබෙනවාද? මේක සම්බන්ධව අද වනකොට පැමිණිලි 10කට වඩා ගිහින් තිබෙනවා. මේක අතේ පත්තු වෙච්ච හොරකමක්; අතටම හසු වෙච්ච එකක්. Cabinet Papers දමා සල්ලි දෙන්න ඕනෑ දේවල් තිබෙනවා. මේ වෙලාවේ ගෑස් ගෙන්වා ගන්න, Cabinet Papers දමලා. මේ වෙලාවේ අස්වැසුම අහිමි වෙච්ච ලක්ෂ හතට නැවත අස්වැසුම දෙන්න ඕනෑ, Cabinet Papers දමලා. අද මේ රටේ මිනිස්සුන්ට කොච්චර නම් අගහිඟකම් තිබෙනවාද? එසේ රටේ මිනිස්සුන්ට අගහිඟකම් තිබියදී මේ වාගේ ජොලි දමනවා. මොකක්ද මේ කරන්නේ?

ඊළඟට මොකක්ද තිබෙන්නේ? සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට කියලා විනෝද චාරිකාවක් - trip එකක් - යන්න රුපියල් ලක්ෂ 128යි. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න කියලා විනෝද චාරිකා යනවා. විනෝද චාරිකා ගිහිල්ලා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න බැහැ. අද වනකොට ඇල්ල, හික්කඩුව, මිරිස්ස වැනි සංචාරකයන් බහුලව පැමිණෙන ප්‍රදේශවල පවා සංචාරකයන් දකින්නට නැහැ. කොහේවත් අද සංචාරකයන් නැහැ. මේ, season එක පටන් ගන්න කාලය. Season එක පටන් ගන්න කාලය වුණත් අද වනවිට ඇල්ල ප්‍රදේශයේ එහෙම සංචාරකයෝ නැහැ. හෝටල් වේළෙනවා. *[බාධා කිරීමක්]* ගම්පොල මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් කට වහගෙන ඉන්නකෝ. අපිට "වල් පැළ" කියලා ඔයගොල්ලන් "මල් පැළ" විධියට නේ හිටියේ. ඒ ගරුත්වය තියා ගන්න. ගම්පොල නියෝජනය කරන අපේ මුස්ලිම් මන්ත්‍රීතුමාට මම මේ කියන්නේ. *[බාධා කිරීමක්]* මේ වෙලාවේ කොහේද, සංචාරකයෝ ඉන්නේ? සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් කරනවාට වැඩිය දේවල් කරන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ ආණ්ඩුව කරපු විධියේ එකක් වෙනත් ආණ්ඩුවක් විසින් සිදු කළා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

නම් ඔබතුමන්ලා මොනවා කියයිද? ජංගිවල හිල් තිබෙනවා කියපු මිනිස්සු, කෙසෙල් කැන අරයා දෙනවා කියපු මිනිස්සු අද cocktail partyවලට සල්ලි දෙන්න ඕනෑද? සියයට තුනක් තිබුණු කාලයේ හිටපු මිනිස්සුන්ටත් මොනවත් ලැබිලා නැහැ. මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න අවුරුදු 76ක් තිස්සේ පෝස්ටර් ගහපු ගම්වල අයට මොනවාද ලැබී තිබෙන්නේ? අද වනකොට ඒ අයට ලැබුණු දෙයකුත් නැහැ. නමුත්, අද වෙනකොට "සිරස" ආයතනයත් එක්ක පාටි දමන්න මුදල් වැය කරනවා. ඒ වාගේ දේවල්වලට තිබෙන්නේ මේ ආයතනය විතරද? ITN එක තිබෙනවා. ඒක රජයේ මාධ්‍ය ආයතනයක්. ජනමාධ්‍ය ඇමතිතුමා යටතේ තමයි ඒ මාධ්‍ය ආයතනය තිබෙන්නේ. ඒ වාගේම, ජාතික රූපවාහිනියත් රජයේ මාධ්‍ය ආයතනයක්. ඒක තිබෙන්නේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා යටතේ. එවැනි රජයේ මාධ්‍ය ආයතන තිබියදී පිටස්තර මාධ්‍ය ආයතනයකට මෙවැනි කටයුත්තක් භාර දෙන්නේ කොහොමද? ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළාද? අදාළ ආයතනය තෝරා ගෙනද? ඒ ආයතනය තෝරා ගත්තේ කුමන පදනමක් මතද? දවස් දෙකයි ගත වුණේ. Cabinet Paper එක ඉදිරිපත් කළා, ඊළඟ දවසේ මුදල් ගෙව්වා. ඒ වැඩේට සම්බන්ධ වුණු සියලු ආයතනවලට දැන් මුදල් ගෙවලා ඉවරයි. දැන් කියයිද දන්නේ නැහැ, අපි ඒ මුදල් පැලවත්තෙන් ගෙවන්නම්, මේ Cabinet Paper එක අයින් කර ගන්නම් කියලා. නමුත්, එහෙම අයින් කරන්න බැහැ. ඒ වැඩේ දැන් මුළු රටම දන්නවා. මේ ආණ්ඩුව බලයට පත් වූ දා ඉඳන් විපක්ෂයේ දේවල් හොයමින් කටයුතු කරනවා.

අද අපි සාකච්ඡා කරන භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ගෙනාපු එක හොඳයි. දැන් මේ අය එක එක තැන්වල මුදල් තියාගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා තමයි කිව්වේ එක් එක් ආයතනවලට අයත් accountsවල මුදල් තැන්පත් කරගෙන ඉන්න එපා කියලා. එක එක ආයතන හදාගෙන, එක එක සංවිධාන හදාගෙන, එක එක NGOs හදාගෙන, මේ රටේ මුදල් ඒ ආයතනවලට අදාළ ගිණුම්වල දමාගෙන ඉන්නවා. අන්න ඒවා නියාමනය කරන්න තමයි මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පතේ කිසිම වැරැද්දක් නැහැ, මේක හොඳයි. හැබැයි, මෙම පනත් කෙටුම්පත ගෙනෙනකොට, මුදල් විශුද්ධිකරණය ගැන හොයනකොට, මුදල් විශුද්ධිකරණය ගැන කියනකොට, මහරජා එකට රුපියල් මිලියන 100ක් දුන්නා. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 1,000ක්. මහරාජා එකට රුපියල් ලක්ෂ 1,000ක් නිකම් දුන්නා. කොත්මලේ ජලාශයේ වාන් දොරටු විවෘත කිරීම නිසා ගම්පොල ප්‍රදේශය ජලයෙන් යට වුණා. ඒ නිසා එම ප්‍රදේශයේ මිනිස්සු කීදෙනෙක් අවතැන් වෙලා හිටියාද? කෝ, ඒ අයට සහන දුන්නාද? ගම්පොල නියෝජනය කරන මන්ත්‍රීතුමා පිටුපස ඉඳගෙන කෑ ගහනවා. හැබැයි, ගම්පොල මිනිසුන්ට ලැබුණු දෙයක් නැහැ. "දිට්වා" සුළි කුණාටුවෙන් ගෙවල් විනාශ වුණු සමහර අයට අද වන තුරුත් ලැබුණු දෙයක් නැහැ.

ඊයේ පෙරේදා රත්නපුර ප්‍රදේශයට ගංවතුර තත්ත්වයක් ඇති වුණා. ඒ ගංවතුර නිසා ගෙවල් යට වුණු ජනතාවගේ ගෙවල් හෝදා ගන්න සල්ලි දුන්නාද? නැහැ. එහෙම නම්, මහරාජා එකට මොකටද සල්ලි දෙන්නේ? මහරාජා එකට සල්ලි නැද්ද? රාජමහේන්ද්‍රන්ට සල්ලි නැද්ද? ඔහුගේ පුතාට සල්ලි නැද්ද? ඒ අයගේ වැඩ ඒ අයටම කරගන්න කියන්න. මේ රටේ මහජන මුදල් තිබෙන්නේ එවැනි ආයතනවලට බෙදන්න නොවෙයි. මාධ්‍ය ආයතවලට බෙදන්න නොවෙයි, මේ රටේ මුදල් තිබෙන්නේ. ඒ මදිවාට කැබිනට් මාධ්‍ය සාකච්ඡාවේදී කියනවා, "මම දන්නා විධියට මේක රජයේ ආයතනයක් නොවෙයි" කියලා. ඒක රජයේ ආයතනයක් නොවෙයි නම්, Cabinet Paper ඉදිරිපත් කරන්නේ මොකටද? රජයේ ආයතනයක් නොවෙයි නම්, ඒ සඳහා මොකටද Cabinet Paper? හැබැයි, මේ දේවල් කරනකොට කියන්නේ කොහොමද? "අපි මෙහෙමයි, අපි මෙහෙමයි. අපි විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරනවා. අනික් මිනිස්සු හොරු" කියලා තමයි කියන්නේ. අනික් අය හොරු නිසා නේ මන්ත්‍රීවරු 159දෙනක් පෝලිමට පත් කළේ. මේ සභාවේ ආණ්ඩු පක්ෂය පැත්තත් පුරවලා, විරුද්ධ පක්ෂය පැත්තේ පිටුපස කොටසත් පුරවලා තිබෙනවා. මන්ත්‍රීවරු 159කගෙන් මේ සභාව පිරෙව්වේ ඒ නිසා නේ.

මේ රටේ මිනිස්සු මේ වනකොටත් ගෑස් පෝලිම්වල ඉන්නවා. මේ විධියට ගෑස් පෝලිම් ඇති වෙනවා කියලා මම මේ රටේ ජනතාවට කිව්වේ පසුගිය අවුරුද්දේ දෙසැම්බර් 25වැනි දා. අපි මේ කරුණු පෙන්වා දෙනකොට ගණන් ගත්තේ නැහැ. අපි කොණ්ඩය බැඳපු මිනිස්සු නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒකයි අපි කියපු දේවල් මේ ආණ්ඩුව ඇහුවේ නැත්තේ. අපි මේ දේවල් නිවැරදිව කියලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම මීට වඩා කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ වාගේ අතේ පත්තු වන හොරකම් කරපු මේ ආණ්ඩුවට විරුද්ධව ඉස්සරහට මේ රටේ ජනතාව ඉදිරියේ නඩු වැටෙයි කියමින් මම නිහඬ වනවා.

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතුමා මගේ නම සඳහන් කළා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
ගම්පොල මන්ත්‍රීතුමා කියලාම කිව්වා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමාත් ගම්පොල නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නේ. [බාධා කිරීමක්] ඔබතුමා ගම්පොල වාගේම මෙතුමාත් ගම්පොල මන්ත්‍රීවරයෙක් නේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.33]

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම අපේ මන්ත්‍රීතුමා කියපු විධියට මේ සඳහා නිර්දේශ ලබා දීලා තිබෙන්නේ IMF එක නොවෙයි, FATF - Financial Action Task Force - එහෙම නැත්නම් මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධක බලකාය. මේ ආයතනය තමයි යම් යම් රටවල මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කරන්න ඕනෑ ක්‍රමවේදයන් පිළිබඳව නිර්දේශ ලබා දෙන්නේ. ඒ අනුව මේ නිර්දේශය ලබා දීලා තිබෙන්නේ මෙන්න මේ නිසායි. ඇත්තටම වර්තමාන ලෝකයේ ප්‍රවණතාවක් තිබෙනවා, භාර අස්සේ නීති විරෝධී මුදල් හංගන. "භාර" කියන සංකල්පයේ නෛතිකමය සංකල්පයක් තිබෙනවා. ඒ ක්‍රියාවලිය තිබෙනවා. එවැනි භාරයක් පිහිටුවීමේදී භාර කර්තෘවරයෙක්, භාරකරුවෙක් සහ අර්ථලාභියෙක් ඉන්නවා. එතකොට මෙන්න මේ තුන්දෙනා එකතු වුණාම තමයි භාරයක් හැදෙන්නේ. හැබැයි, සාමාන්‍ය සමාජයට පෙනෙන්නේ භාරකරු විතරයි. සමාජයට භාර කර්තෘ පෙනෙන්නෙත් නැහැ, අර්ථලාභියා පෙනෙන්නෙත් නැහැ. මෙන්න මේ හේතුව නිසා භාරයක් තුළ අනීතික මුදල් හංගන්න පුළුවන් අවස්ථාව ඕනෑ තරම් තිබෙනවා. මෙන්න මේ අවස්ථාව මහ හරින්න තමයි මේ නිර්දේශ ඉදිරිපත් වෙන්නේ.

අද අපි කථා කරන්නේ භාර (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. 1917 අංක 9 දරන භාර ආඥාපනතට ගෙනෙන භාර (සංශෝධන) පනත් කෙටුම්පත හරහා සිද්ධ වෙන්නේ බොහොම සරල දෙයක්. ප්‍රකාශිත භාරයක් නම් ඒ භාරය ලියාපදිංචි කිරීම අනිවාර්යය වෙනවා. භාරත් වර්ග තිබෙනවා. ප්‍රකාශිත භාර තිබෙනවා; පුණ්‍ය භාර තිබෙනවා; ව්‍යංග භාර තිබෙනවා. පුණ්‍ය භාර ලියාපදිංචි කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ප්‍රකාශිත භාරයක් නම් ඒක ලියාපදිංචි කරන්න අනිවාර්යය කරලා තිබෙනවා. සාධන පත්‍රයක් මඟින් සකස් කරන ප්‍රකාශිත භාර අනිවාර්යයෙන්ම ලියාපදිංචි කරන්න ඕනෑ. මේ ප්‍රකාශිත භාරයක් ලියාපදිංචි කළාම තිබෙන වාසිය මොකක්ද? අර සඟවපු, සඟවන්න පුළුවන් භාර කර්තෘ එළිදරව් වෙනවා. සඟවන්න පුළුවන් අර්ථලාභියා එළිදරව් වෙනවා. එතකොට හංගලා වැඩේ කරනවා වෙනුවට ප්‍රකාශිත භාරයක් මත කටයුතු කිරීමේදී ඒ භාරයේ සියලු පාර්ශ්ව අනාවරණය කරන්න අදාළ පාර්ශ්වයන්ට සිද්ධ වෙනවා. එතකොට මේකේ භාරයක් පිහිටුවීමේදී කිසිම බලපෑමක් නැහැ. කලින් භාර පිහිටවපු විධියටම, ඒ ආකාරයටම භාර පිහිටුවාගෙන යන්න පුළුවන්, පුණ්‍ය භාරවලට නොවෙයි. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, "පින් කැටෙටත් ගහනවා" කියලා. එහෙම එකක් නැහැ. පින් කැටෙට සල්ලි දාන එක භාරයක් නොවෙයි. එතුමා භාර පිළිබඳව දන්නේ නැතිව ඇති. ඒ නිසා තමයි එහෙම කියන්න ඇත්තේ. පින් කැටෙට සල්ලි දාන එක භාරයක් නොවෙයි. හැබැයි, පුණ්‍ය භාර කියලා එකක් තිබෙනවා. පුණ්‍ය කටයුතු සඳහා, පුණ්‍ය කටයුතු අරමුණු කර ගනිමින් පිහිටුවන භාර, පුණ්‍ය භාර. හැබැයි, පුණ්‍ය භාර ලියාපදිංචි කරන්න ඕනෑ කියලා මේ සංශෝධනයේ කිසිම තැනක සඳහන් වෙන්නේ නැහැ. ඒ වාගේම, පින් කැටෙට මුදල් දාන එක භාරයක් වෙන්නෙත් නැහැ.

සමගි ජන බලවේගයේම මන්ත්‍රීවරයෙක් කියනවා අපි අහගෙන හිටියා, මේ භාර සංශෝධනය සම්බන්ධයෙන් අපේ කිසිම විරෝධතාවක් නැහැ කියන කාරණය. ඒ අතරතුර සමගි ජන බලවේගයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නැඟිටලා කියනවා, "මේක හරියට පින් කැටෙටත් ගහන්න හදන වැඩක්" කියලා. හැබැයි, මේකෙන් පෙනෙන්නේ අදාළ පක්ෂය තුළවත් මේ පනත් කෙටුම්පත පිළිබඳව ඒකමතිකභාවයක් නැහැ කියන එකයි. ඒ කියන්නේ, ඔවුන් මේ පනත් කෙටුම්පත අධ්‍යයනය කරලා නැහැ. ඒ නිසා තමයි විපක්ෂයේ එක එක මන්ත්‍රීවරු නැඟිටලා තමන්ට කැමති කැමති දේ අදහස් විධියට ප්‍රකාශ කරන්නේ.

ඒ වාගේම, මේ සංශෝධනය හරහා භාරය පිළිබඳ කරුණු අනාවරණය කරගන්න හැකියාවක් ලැබෙනවා. විශේෂයෙන්ම විමර්ශන ආයතනවලට සහ නිශ්චිතව පනතේ දක්වා තිබෙන තැනැත්තන්ට තොරතුරු ලබා ගන්න මේ හරහා ප්‍රතිපාදන සැලසෙනවා. විශේෂයෙන්ම නීතිපතිවරයාට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකයට, විගණකාධිපති දෙපාර්තමේන්තුවට, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ වෙනත් යම් සාපරාධී වරදක් විමර්ශනය කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ වගකීම ඇති පොදු අධිකාරියකට, රාජ්‍ය ප්‍රසම්පාදන අධිකාරියකට, යම් ලිඛිත නීතියක් යටතේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම අධීක්ෂණය කිරීමට හෝ නිරීක්ෂණය කිරීමට නියම කරනු ලැබ ඇති නියාමන අධිකාරියකට මේ තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හරහා ලබා ගන්න හැකියාවක් තිබෙනවා.

ඊට අමතරව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අපේ රටේ පුරවැසියෙකුටත් අයිතියක් ලැබෙනවා, මේ භාර පිළිබඳ යම් ආකාරයෙන් තොරතුරක් දැනගැනීමට අවශ්‍ය වන්නේ නම් එකී තොරතුරු ලබා ගැනීමට. එතකොට වෙන්නේ නීති විරෝධීව යම් කෙනෙක් උපයා ගත්ත මුදල් මේ භාරයක් අස්සේ හංගන්න හදනවා නම් මේ තොරතුරු අනාවරණය වීම තුළ ඒ කාර්යය වැළකෙන එකයි. ඊළඟට, ත්‍රස්තවාදීන්ට මුදල් යෙදවීමත් ඔය "භාර" හරහා කරන්න පුළුවන්.

අපි දන්නවා, මුදල් විශුද්ධිකරණයේදී අනුගමනය කරන ප්‍රධාන උපක්‍රමයක් තමයි shell companies හදන එක. ඒ කියන්නේ, හිස් කොම්පැනි හදාගෙන හදාගෙන ගිහිල්ලා මේ වැඩේ සංකීර්ණ කරලා අදාළ මූල්‍ය වත්කම් ලැබීමේ මූලාශ්‍රය හංගනවා. භාරයන්වලදීත් ඒ විධියටම තමයි කටයුතු කරන්නේ. භාර කිහිපයක් හදලා, එහෙම නැත්නම් අර්ථලාභීන් කිහිප දෙනෙක් නම් කරගෙන නම් කරගෙන ගිහිල්ලා මුදල්වල, වත්කම්වල මූලාශ්‍රය හංගන්න පුළුවන්. හැබැයි, යම් ආකාරයකින් සීමා කිරීමක් ඇති වෙනවා, මේ සංශෝධනය හරහා. අද අපි සම්මත කරගන්න කටයුතු කරන භාර (සංශෝධන) පනත හරහා මේවා ලියාපදිංචි කිරීම තුළ මේ කරුණු අනාවරණය වන නිසා, මුදල් විශුද්ධිකරණය සඳහා භාර කියන සංකල්පය යොදා ගැනීම අවම කරගන්න හැකියාවක් ලැබෙනවා. සියල්ල මේ පනතින් කරන්න පුළුවන් කියලා අපි කියන්නේ නැහැ. නමුත් නිදහසේ යන්න තිබෙන දෙයට බාධා කිරීමක් මේ පනත හරහා ඇතිවෙනවා. ඒ හරහා අපට පුළුවන් වෙනවා, අපේ රට grey list එකට, එහෙම නැත්නම් black list එකට නොවැටී නියාගන්න. ඇත්තටම අර කියපු සංවිධානය, මුදල් විශුද්ධිකරණයට ඉඩකඩ විවර වන රටවල් grey list එකට, එහෙම නැත්නම් black list එකට දාලා තිබෙනවා. අපේ රට මේ lists දෙකටම නොවැටී නියාගන්න උදව්වක් වෙනවා, මේ සංශෝධනය ඇතුළත් කිරීමෙන්.

අද දවසේ අපිට කථා කරන්න තිබෙන්නේ භාර (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වුණාට, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගැනත්, PSTB එක ගැනත් මෙතැනදී කථා වුණා. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මේ කාරණා දෙක පටලවා ගෙන තිබුණා. ටැටූ ගහන එක ත්‍රස්තවාදී

[ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා]

ක්‍රියාවක් විධියට තමයි එතුමා පාර්ලිමේන්තුවේදී කිව්වේ. නමුත් ටැටූ එක ගැන තිබෙන්නේ, - මේක ප්‍රසිද්ධ කාරණයක්, දීර්ඝ කාලයක් තිස්සේ කථා කරපු - සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතේ. මේක හරි නිශ්චිත කාරණයක්. මහෙස්ත්‍රාත්වරයාට යම් පුද්ගලයෙක් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයෙකු ද යන්න තීරණය කරද්දී සලකා බලන්න පුළුවන් කාරණයක් තමයි, ප්‍රකට සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක ප්‍රකට සාමාජිකයන් විසින් භාවිත කරන ටැටූ එකක් අදාළ පුද්ගලයාගේ තිබෙනවාද කියන කාරණය. ඇත්තටම ටැටූ එකක් ගහන්න මේකෙන් බාධාවක් නැහැ. නමුත් යම් පුද්ගලයෙකු ප්‍රකට අපරාධ කණ්ඩායමක සාමාජිකයින් භාවිත කරන ටැටූ එකක් ගහලා තිබෙනවා නම්, ඔහු අදාළ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයෙකු දැයි සලකා බැලීමේදී මහෙස්ත්‍රාත්වරයාට ඒ කාරණයත් සලකා බලන්න පුළුවන්. ඕක තමයි කාරණය. PSTB එකේ තිබෙන්නේ වෙන කාරණයක්. නමුත් ගරු මන්ත්‍රීතුමා අර්ථ නිරූපණය කරනවා, ඒක ත්‍රස්තවාදී ක්‍රියාවක් විධියට. එක්කෝ මේ පනත් කෙටුම්පත් කියවන්නේ නැතිව, එහෙම නැත්නම් ඒ පිළිබඳව අවබෝධයක් නැතිව තමයි මේ සියල්ල කරන්නේ. කොහොම නමුත් අපේ රටේ ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීම සඳහා නීතියක් අවශ්‍යයි. ඒ වාගේම සංවිධානාත්මක අපරාධ වැළැක්වීම සඳහාත් නීතියක් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වුණු කාලය අවසානයි.

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි පිරියන්ත විජේරත්න)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න තමයි මේ නීති දෙකම ගෙනැල්ලා තිබෙන්නේ. මේ වෙනකොට ඒවා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයට භාජන වෙමින් තිබෙනවා. ඒකේ තීන්දුව දෙයි. ඊට පස්සේ ඒක පාර්ලිමේන්තුවට එනවා. අපි පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කරමු. එතකොට මේවායේ තිබෙන ගුණ අගුණ සියල්ල ම කථා කරන්න පුළුවන් කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(මාණ්පුමිකු සට්ටත්තරණි (සෙල්වි) ලක්මාලි හේමසන්ද්‍රිර)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නිහාල් අපේසිංහ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வைத்திய அதிகாரி உண்மையிலேயே மிகவும் நல்லவர். ஆனால், அவருடைய அண்மைக்கால செயற்பாடு சந்தேகத்தை ஏற்படுத்துகின்றது. ஏனென்றால், கல்முனை வைத்திய சாலையில் நடந்த சம்பவம் தொடர்பில் சம்பந்தப்பட்ட ஒரு வைத்தியருக்கு இன்று பதவி உயர்வு வழங்கப்பட்டு, ஒரு வைத்தியசாலையின் பொறுப்பும் வழங்கப்பட்டிருக்கின்றது. இவ்வாறான பிரச்சினைகளைத் தூண்டினால், தங்களுக்கும் பதவி உயர்வு கிடைக்கும் என்ற அடிப்படையில் சில வைத்தியர்கள் அவ்வாறு செயற்படுகின்றார்களோ என்ற சந்தேகம் எங்களிடம் காணப்படுகின்றது. கிண்ணியா வைத்தியசாலையில் இவ்வாறான ஒரு நிகழ்வு நடந்திருக்கின்றது என்பதை இந்த உயரிய சபையில் பதிவுசெய்ய விரும்புகிறேன். கிண்ணியா வைத்தியசாலையை மத்திய அரசாங்கத்தின்கீழ் கொண்டுவருவதற்கான வேலைத் திட்டங்கள் இப்போதைய அரசாங்கத்தால் முன்னெடுக்கப் பட்டுக் கொண்டிருக்கின்றன. எங்களுடைய அரசாங்க காலத்திலும் இந்த விடயம் முன்னெடுக்கப்பட்டது.

திருகோணமலை மாவட்ட ஒருங்கிணைப்புக் குழு அதற்கு இணக்கம் தெரிவிக்கப்பட்ட நிலையில், இன்று அதைக் குழப்புகின்ற நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. சில அதிகாரிகள் அந்த வைத்தியசாலைக்கு வந்து, இதைத் தரமுயர்த்த வேண்டுமா? அவ்வாறு தரமுயர்த்தினால் உங்களை மத்திய அரசாங்கத்தின்கீழ் உள்வாங்குவார்கள் என்று அங்குள்ளவர்களைப் பயமுறுத்துகின்றார்கள். அரசாங் கத்திடம் மீண்டும் ஒரு விடயத்தை வலியுறுத்து கின்றேன். இவ்வாறான ஒரு நிகழ்வு நடந்திருக்கிறது. ஆகையால்,

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

இதை இனவாதமாக மாற்றுவதற்கு சில அதிகாரிகள் முயற்சிப் பார்களாக இருந்தால், அவர்களுக்கு எதிரான நிலைப்பாட்டை நீங்கள் உறுதிசெய்ய வேண்டும் என்று இந்த இடத்தில் கேட்டுக்கொள்கிறேன்.

மாண்புமிகு ஜனாதிபதி அவர்களும் அமைச்சர்களும் சொல்கின்ற ஒரு விடயம்தான், "திறைசேரியை நிரப்பி யிருக்கிறோம்" என்ற விடயம்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

திறைசேரியை நிரப்புவது மட்டும் போதாது. மக்கள் அனுபவிக்கின்ற கஷ்டத்திலிருந்து அவர்களைப் பாதுகாப்பதற் கான நடவடிக்கைகளையும் மேற்கொள்ள வேண்டும். குறிப்பாக, இன்று வாழ்க்கைச் செலவு அதிகரித்திருக்கின்றது. மூன்று வேளையும் உண்பதற்குக்கூட கஷ்டப்படும் நிலையில் மக்கள் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். தங்களுடைய பிள்ளைகளின் கல்வி விடயங்களில்கூட அவர்கள் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருக்கின்ற இந்த நேரத்தில், உங்களுடைய திறைசேரியை நிரப்புவதை மாத்திரம் கருத்திற் கொள்ளாமல், மக்களுக்கான நிவாரணத்தையும் உதவி களையும் வழங்குவதற்கான முயற்சிகளையும் எடுக்க வேண்டு மெனக் கேட்டு விடைபெறுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.44]

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

අද දින භාර (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන විවාදයේදී කරුණු ඉදිරිපත් කරන්න මටත් අවස්ථාව ලැබී තිබෙනවා. ඇත්තටම, අප මේ සංශෝධනය තුළින් බලාපොරොත්තු වන්නේ, මෙතෙක් කාලයක් තිස්සේ සිදු වුණු අක්‍රමිකතා වළක්වා ඒ සඳහා නීතිමය රාමුව විධිමත්ව පවත්වාගෙන යාමයි. ඒ වාගේම මේ ආඥාපනත සංශෝධනයෙන් බලාපොරොත්තු වන විශේෂ කාරණයක් තමයි මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම අධීක්ෂණය කිරීම.

අද උදේ ඉඳලාම විපක්ෂය මේ ගැන විවාද කරන කොට කථා කරපු කාරණා කිහිපයක් තිබුණා. මට හිතාගන්න බැහැ විපක්ෂයට මේක පැටලිලාද, හිතාමතා පටලවා ගන්නවාද, එහෙම නැත්නම් පසුගිය දවස්වල අප සම්පාදනය කරපු නීති රීති පිළිබඳව අධ්‍යයනයක් කරලා නැද්ද කියලා. මොකද, ඒගොල්ලන් නිතරම කාරණා එකකට එකක් පටලවා ගෙන කථා කරනවා.

අපි ගෙනෙනවා, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත. ඒ සම්බන්ධයෙන් නීති පැනවීම කර තිබෙන්නේ කොහොමද කියන එක ගැන තමයි එහි පැහැදිලි කර තිබෙන්නේ. අපටත් පෙනෙන්න තිබෙනවා, විපක්ෂය ඇතුළුව මේ පාර්ලිමේන්තුවේ හැමෝම එකඟ වෙනවා, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමට අද කාලයේ ඇති අවශ්‍යතාව පිළිබඳව. ඒ වාගේම අප ගෙනෙන අනෙක් පනත් කෙටුම්පත තමයි ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත. මෙතෙක් තිබුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත. අපි ඒ පනත පරිච්ඡින්න - repeal - කරලා නව පනත් කෙටුම්පතක් ගෙන එනවා. මොකද, නීතියක් පැරණියි නම්, කල් පැනගිය නීතියක් නම් ඒක වෙනස් වෙන්න ඕනෑ. ඒ නීතිය ඉවත් කරලා හිස්තැනක් තියන්න බැහැ. ඒ සඳහා අද කාලයට උචිත නීතියක් පනවන්න ඕනෑ. ඉතින්, මේවායේ තිබෙන කාරණා පටලවා ගෙන ත්‍රස්තවාදය සම්බන්ධයෙන් සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් කථා කරමින් පව්ච කෙටුවාම අත්අඩංගුවට ගන්න පුළුවන් වාගේ කතන්දරයක් විපක්ෂයේ සමහරු කියාගෙන යනවා. මා හිතන විධියට, ඒ නොදැනුවත්කම; එහෙම නැත්නම්, ඇත්තටම මේවා ගැන හොයලා බලන්න තිබෙන උනන්දුව නැතිකම. අර කිව්වත් වාගේ ආවා, කෑවා, ගියාද දන්නේත් නැහැ. වුවමනාව වෙලා තිබෙන්නේ ඒකද දන්නේත් නැහැ. ඒ බවක් තමයි අපට හිතෙන්නේ.

අද උදේම අපිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ලොකු බේගලයක් ඇද බෑවා. එතුමා කිව්වේ මොකක්ද? නීතිඥවරුන්ට, නොතාරිස්වරුන්ට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්, ඔප්පු ලියන්න පුළුවන් කියලා මේ භාර (සශෝධන) පනත් කෙටුම්පතේ කියලා නැතිලු. කෙටියෙන්ම ගත්තොත් එතුමාගේ අදහස ඒකයි. 'අපට මේක යටතේ ඔප්පු ලියන්න බැරිද' කියන අපැහැදිලිතාවක් නීති වෘත්තිකයන් අතරේ ඇති කිරීම සඳහා තමයි එතුමා එහෙම කිව්වේ. මොකද, නීති වෘත්තිකයන් හැටියට අපිත් දන්නවා, එහෙම බලපෑමක් ඇති වෙනවා කියලා කිව්වාම ප්‍රජාව තුළ අප්‍රසාදයක් ඇති කරන්න පුළුවන් වෙනවා කියලා. නමුත්, ඉතාම පැහැදිලියි මේ පනත් කෙටුම්පතෙන් අප අරමුණු කර තිබෙන දෙය. නීති වෘත්තිකයන්ට හා සේවා සපයන්නන්ට මේ පනතෙන් ඇති වන බලපෑම සම්බන්ධයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා. භාර සම්බන්ධව සේවා සපයන නීතිඥයන්, ගණකාධිකාරිවරුන් සහ වෙනත් වෘත්තිකයන්ට අදාළ නීතිමය වගකීම පිළිබඳ දැනුවත්භාවය හා අනුකූලතා ක්‍රමවේද - compliance procedures - ශක්තිමත් කිරීමට සිදු විය හැකියි. ඒවා ශක්තිමත් කරන්න වෙන්නේ ඇයි? එහෙම සිදු වන්නේම ඒ වෘත්තිකයන්ට ඒකෙන් පැවරෙන කාර්යභාරය වැඩි වීම නිසායි. එහෙම නැතුව කාර්යභාරය අඩු වීම නිසා නම් නොවෙයි. එතුමා එය නොදැන කිව්වාද කියලා කියන්න මා දන්නේ නැහැ. හැබැයි, හැම කෙනෙක්ම දන්නා දෙයක් තමයි ඔප්පු ලිවීම කියන එක ගැන එක එක පනතෙන් කියලා දෙන්නේ නැහැ කියන එක. ඔප්පු ලිවිය හැක්කේ නීතිඥවරුන්ටය, නොතාරිස්වරුන්ටය; නීතිඥවරුන් වන නොතාරිස්වරුන්ටය; නීතිඥවරුන් නොවන නොතාරිස්වරුන්ටය කියලා එක එක පනතේ වෙන වෙනම දක්වන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අදාළ වන නීතිය වන්නේ, නොතාරිස් ආඥාපනතයි. නොතාරිස් ආඥාපනතේ 31 වගන්තියේ තිබෙනවා, ඔප්පුවක් ලියා සහතික කරන නොතාරිස්වරයෙකුට තිබෙන වගකීම් සහ අනුගමනය කළ යුතු උපචාර මොනවාද කියලා.

ඒ වාගේම වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2වැනි වගන්තියේ පැහැදිලිවම කියනවා, ලිඛිතව ලියා සහතික කරන ඔප්පු, ලේඛන, නොතාරිස්වරුන් විසින් ලියා සහතික කරන සාධන පත්‍ර මේ

ආකාරයේ විය යුතුයි කියලා. ඉතින්, මේ හැම නීතියක් යටතේම හදන සාධන පත්‍ර ලියාපදිංචි කරනවාද, නොකරනවාද, ලියාපදිංචි කළ යුත්තේ මොන වර්ග ද කියන එකට කලින් කලට නීති පැනවෙනවා. නමුත්, ඒ සියල්ල ලියා සහතික කිරීමේ බලය තිබෙන්නේ ශ්‍රී ලංකාවේ පිළිගත් නොතාරිස් වෘත්තිකයන්ට පමණයි. ඒ අයට බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ආයතන තිබෙනවා. රට තුළ ඒ සියල්ල විධිමත්ව සිදු වෙනවා. මේක වෙනම අමුතු කාරණාවක් නොවෙයි. නොතාරිස්වරුන්ට ඔප්පු ලියන්න පුළුවන් කියලා පනත්වල දක්වන්නේ නැහැ. එවැනි දෙයක් කොහේවත් සඳහන් වෙන්නේ නැහැ.

ඒ වාගේම කිසියම්ම ඔප්පු ලේඛනයක් ලියා සහතික කිරීම නොතාරිස්වරුන්ට කළ නොහැකියි කියලාත් සඳහන් වන තැනක් නැහැ. හැබැයි පුංචි ව්‍යතිරේකයක් තිබෙනවා, ඉඩම් සංවර්ධන ආඥාපනත - Land Development Ordinance, LDO එක - යටතේ. ඒ ආඥාපනත යටතේ නම් රජයේ ඉඩම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් සතු බලයක් තිබෙනවා. හැබැයි ඒකෙදීත් අදාළ අවසරය ලබා ගන්නවා නම්, ඒ අවසරයට යටත්ව පැවරුම් ඔප්පු ලියා සහතික කිරීමට නොතාරිස්වරුන්ට බලය තිබෙනවා. ඉතින්, මේ කිසිම දෙයකින් නොතාරිස්වරයාට හෝ වෘත්තිකයන් කෙරෙහි වෙන බලපෑමක් ඇති වෙන්නේ නැහැ. ඒ අය කෙරෙහි බලපෑමක් තිබෙනවා නම් සාධනීය බලපෑමක් විතරයි ඇති වන්නේ. ඔවුන්ගේ වෘත්තීමය කටයුතු වැඩිවීමක් මිසක් අඩුවීමක් වෙන්නේ නැහැ. මේවා නොදැන නොවෙයි, දැන දැන විපක්ෂය බලාගෙන ඉන්නවා, කාට හරි පොඩි සැක සංකාවක් ඇති කරලා මේ වෙලාවේ ගොඩ යන්න. වෙන කර කියා ගන්න දෙයක් නැතිකම නිසා කොහෙන් කොහෙන් හරි, මොකක් හරි පෙන්වනවා. අද දිනයේ මේ විවාදයට නියමිත කාරණාව හැර අනෙක් හැම දෙයක්ම කියලා බොරු බිල්ලෙක් මවලා, නැති ප්‍රශ්නයක් පෙන්වලා මේ පනත් කෙටුම්පත සම්මත වුණොත් අහවල් දේ වෙයි කියලා කියනවා. අපි දන්නවා, මෙතුමන්ලා බය ඇයි කියලා. අපට හිතා ගන්න පුළුවන්, මෙහෙම බය වෙලා දහලන්නේ ඇයි කියලා. මොකද අපි හොඳට දන්නවා, පසුගිය කාලයේ මේ පනත්, අණපනත් අවභාවිත වුණේ කොයි ආකාරයටද කියලා.

අපි දන්නවා, අම්බුලුවාව භාරය ඇති කරගෙන තිබෙන්නේ කොයි විධියටද කියලා. අදාළ අමාත්‍යවරයා මේ රටේ අගමැතිවරයා වශයෙන් වැඩ කරපු කෙනෙක්. අම්බුලුවාව රජයේ දේපළක්; රජයට අයිති ඉඩමක්; රජයේ මුදලින් සංවර්ධනය කරපු එකක්. අදාළ අමාත්‍යවරයා හැටියට තමන්ම තමන්ගේ නමට ලියා ගන්නවා, දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මම දිසානායක මුදියන්සේලාගේ ජයරත්න භාරයට මේ ඉඩම පවරනවා කියලා. අඩු ගණනේ ඒ කාලයේ කටයුතු කරපු අයට අවම සදාචාරයක්වත් තිබිලා නැහැ කියන එක එතුමන්ලා වැඩ කර තිබෙන විධිය අනුව අපට පෙනී යනවා. ඒ වාගේම තමයි අදාළ ඇමතිවරයා ඇමතිකම් දරපු හැම අමාත්‍යාංශයක් යටතටම - අමාත්‍යාංශ හතරකට - අම්බුලුවාව භාරය අරගෙන ගිහින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම හිරිකිතයක්, ලජ්ජාවක් නැතිව ඒ විධියට තමයි රජයේ දේපළ පාවිච්චි කරලා තිබෙන්නේ. අපි ඔප්පුවල ලියනවා වාගේ අවසානයේදී ඒක පරම්පරාවෙන් පරම්පරාවට යන්න, තමන්ගේ පවුලට ඉදිරියේදී ප්‍රතිලාභ ලැබෙන විධියට ලියාගෙන තිබෙනවා. ඒවාට අත උස්සලා, ඒවාට 'හා' කියාගෙන හිටපු උදවිය තමයි අද ඇවිල්ලා මේ හැම එකකම අපේ වැරදි පෙන්වන්නේ. සදාචාරය ගැන කථා කරන්න එතුමන්ලා අවම සදාචාරයක්වත් පවත්වාගෙන ගිහිල්ලා නැහැ. තවමත් ඒකෙන් ආදායම් ලබාගෙන ජීවත් වෙන උදවිය අපේ ආණ්ඩුවෙන් කරන දේවල්වල සදාචාරය ගැන අද කථා කරන්න එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනතා ආණ්ඩුවක්; මහජන ආණ්ඩුවක්. ජනතාවගේ අභිලාෂයන්ට එරෙහිව කටයුතු කරන්න නොවෙයි අපි බලයට ආවේ. හැබැයි, අපි ජනතාවගේ අභිලාෂයන්ට අනුව කටයුතු කරගෙන යනකොට තමන්ට ලැබුණු ලොකු හැන්දෙන් තමන්ට බෙදා ගත්ත අයගේ හිත රිදිලා නිසා තමයි මේ විධියට කටයුතු කරන්නේ.

කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.53]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මම මුලින්ම කියන්න ඕනෑ, භාර (සංශෝධන) පනත් කෙටුම්පතට අපි එකඟයි කියන එක. ඒ වාගේම කිසියම් සංවිධානයක්, කිසියම් පුද්ගලයෙක් මුදල්, වත්කම් රැස් කරගෙන ඉන්නවා නම්, ඒ වත්කම් සමාජයට පෙන්වන්නේ නැතුව විවිධ දේවල්වලට භාවිත කරමින් සිටිනවා නම්, ඒවා නියාමනය කිරීමට කටයුතු කරනවාට සමගි ජන බලවේගය විධියට අපි එකඟයි. ඒ ගැන බොරු මත ඇති කරන්න එපා. අපි ඒ කටයුත්තට බොහොම එකඟයි. අත් දෙක උස්සලා එයට එකඟ වෙනවා. ඒ වාගේම යෝජනා කරනවා, මේ භාරයන් පිළිබඳව නියාමනය කිරීම විතරක් නොවෙයි, මේ රටේ දේශපාලන පක්ෂවල තිබෙන වත්කම් සහ අයථා මුදල් පිළිබඳවත් නියාමනය කරන්න පුළුවන් පනත් කෙටුම්පතක් ගෙනෙන්න කියලා. අපි ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් විශේෂයෙන්ම ඉල්ලනවා, පසුගිය අවුරුදු 20ක විතර කාලය පුරාවටම මේ රටේ දේශපාලන බලය ලබා ගැනීමේදී, ඒ වාගේම විපක්ෂයේ කටයුතු කරද්දී විවිධ සමාගම්, සංවිධානවලින් ගත්ත මුදල් සම්බන්ධව නියාමනය කරන්න පුළුවන් පනත් කෙටුම්පතක් ගෙනෙන්න කියලා. පුළුවන් නම් එවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න කියලා අපි ආණ්ඩු පක්ෂයට අභියෝග කරනවා.

ඊළඟට, මේ කාරණයත් ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ. අද භාර (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනෙනවා වාගේම ඔබතුමන්ලා මීට අවුරුදු දෙකකට කලින් මේ රටේ ජනතාවට වුණු බාරයක් තිබෙනවා. හැබැයි, ජනතාවට වුණු බාරය අමතක කරමින් ඔබතුමන්ලා කටයුතු කරනවා වාගේ තමයි අද පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා එම බාරය හරියට ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරනවා. හැබැයි, ජනතාව නම් දැන් ඉන්නේ දෙයියන්ට බාර වෙන ගමන්. ආර්ථික අතින් පහළට වැටිලා, තුන් වේල කන්න නැතිව ඉතාම අමාරුවෙන් ඉන්න ජනතාව දෙයියන්ට බාර වෙමින් තමයි දැන් ඉන්නේ. ඒ අතරේදී පසුගිය දවසකත් ජනාධිපතිවරයා කියනවා, "අපේ ආණ්ඩුව පත් වුණාට පසුව නම් අලුතින් බදු ගහලා නැහැ" කියලා. මම හිතනවා, එතුමාට අමතක වීමේ ලෙඩේ තිබෙනවා කියලා. මුදල් ඇමතිවරයා විධියට මේ රටේ අලුතෙන් රදවා ගැනීමේ බදු වැඩි කළා. මේ රටේ ඩිජිටල් වෙළෙඳාම වෙනුවෙන් බදු ඇති කළා;

[ගරු සුරංග රත්නායක මහතා]

අලුතෙන් බදු ගැහුවා. ඒ වාගේම VAT එක සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා වන වාර්ෂික පිරිවැටුම් සීමාව අවම කරලා, විශාල ප්‍රමාණයක් ඒ බද්දට අයිති වෙන විධියට ඒ සීමාව පුළුල් කළා කියලාත් ජනාධිපතිවරයාට මතක් කරලා දෙන්න ඕනෑ.

ආණ්ඩුව අලුතින් බදු ගහලා තිබෙනවා වාගේම, මේ රටේ ජනතාව අද බදු බරින් මිරිකෙමින් ඉන්නේ. මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් උපයන සෑම රුපියල් 100කින්ම රුපියල් 15.40ක් බදු විධියට මේ ආණ්ඩුව එකතු කර ගන්නවා. ඒ බදු විධියට එකතු කර ගන්න සෑම රුපියල් 100කින්ම රුපියල් 77.40ක් වක්‍ර බදු විධියටයි අය කර ගන්නේ. එහෙම නම් වක්‍ර බදු ප්‍රතිශතය මෙච්චර ඉහළ ගිහිල්ලා තිබෙන්නේ 2025, 2026 අවුරුදු දෙකේ කියලා ආණ්ඩුවට මතක් කරන්න ඕනෑ. වක්‍ර බදු ප්‍රතිශතය මෙහෙම ඉහළ ගියාම එහි ඍජු බලපෑම තිබෙන්නේ කාටද? එදා වේල හොයා ගන්නා මේ රටේ කම්කරුවන්ට, තමන්ගේ දරුවාගේ අධ්‍යාපනයට ඕනෑ උපකරණ ටික ගන්න මේ රටේ අම්මලාට. මේ රටේ අඩු ආදායම් ලබන පුද්ගලයන්ට තමයි වක්‍ර බදු ගහලා මුදල් හොයන එකේ දැඩි බලපෑම ඇති වෙලා තිබෙන්නේ. 2023 වෙද්දී මේ රටේ වක්‍ර බදු අනුපාතය සියයට 65.6ක්ව තිබුණේ. අද ඒක සියයට 77.40 දක්වා වැඩි වෙලා තිබෙනවා. වක්‍ර බදු ගහලා මේ රටේ ජනතාවගේ සියලු දේ සූරා කන්නේ නැතුව ඍජු බදු අය කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන එක ආණ්ඩුවට අපි මතක් කරනවා.

අද මේ රටේ ජනතාව ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්. ජනාධිපතිවරයා ගිය අවුරුද්දේ මේ අවුරුද්දට අදාළ අය වැය ඉදිරිපත් කරමින් පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ රටේ දරුවන්ගේ ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500 දක්වා වැඩි කරනවා කියලා. හැබැයි, මේ අවුරුද්දේ මේ වෙනතුරු මේ රටේ දරුවන්ට ශිෂ්‍යාධාරය ලැබිලා තිබෙන්නේ වාරික තුනයි. රුපියල් 1,500 ඒවා තුනයි ලැබිලා තිබෙන්නේ. හැබැයි, ඒවා ගැන කථාවක් නැහැ. ඒ වාගේම තමයි අස්වැසුම ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයක් කප්පාදු කරලා තිබෙනවා. හැබැයි, ඒවා ගැන කථාවක් නැහැ. ආණ්ඩුව ලජ්ජා නැතුව, නින්දාසහගත විධියට මේ රටේ පෞද්ගලික සමාගම්වලට කෝටි ප්‍රකෝටි ගණන් මුදල් දෙමින් තිබෙනවා. විජිත හේරත් ඇමතිවරයා එතුමාගේ කැබිනට් පත්‍රිකාවකින් කිසිම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් නැතිව, කිසිම ටෙන්ඩර් කැඳවීමක් නැතිව රුපියල් මිලියන 104.6ක් මේ රටේ පෞද්ගලික සමාගමකට දීලා තිබෙනවා. මේවා දේශපාලන අරමුණින් කරන දේවල්. මේක, තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් මේ රටේ මහජනයාගේ මුදල් සොරා කන වැඩක්. මේ කැබිනට් පත්‍රිකාවට ජනාධිපතිවරයාත් විශේෂයෙන් අනුමැතිය දීලා තිබෙනවා. මේ කැබිනට් පත්‍රිකාවෙන් අනුමැතිය දීලා තිබෙන්නේ මොනවාටද? විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ඒෂියා-පැසිෆික් විද්‍යුත් විකාශකයින්ගේ සංගමයේ සමුළුවක් සම්බන්ධ සත්කාරකත්වය ඉස්සෙල්ලාම ලැබුණේ ජාතික රූපවාහිනියට බව. ඒ, පසුගිය අවුරුද්දේ. නමුත් ජාතික රූපවාහිනිය එය ප්‍රතික්ෂේප කළා, මුදල් නැහැ කියලා. එදා විජිත හේරත් ඇමතිවරයා රටේ ජාතික රූපවාහිනියට නොදීපු මුදල්, අද පෞද්ගලික සමාගමකට දෙනවා. ඒ මුදල් මොනවාටද වියදම් කරලා තිබෙන්නේ?

මේ රටේ ජනතාවට තුන්වේල කන්න බැරිව සිටියදී මේ කැබිනට් පත්‍රිකාවෙන් ඉල්ලා තිබෙනවා, මුළු මුදලෙන් සියයට 60ක් - රුපියල් 62,762,326ක් - සැප්තැම්බර් 30ට පෙර අත්තිකාරම් ලෙස ගෙවන ලෙසත්, ඒ වාගේම ඉතිරි සියයට 40ක මුදල - රුපියල් 41,841,550ක් - නොවැම්බර් 17ට පෙර සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලෙසත්. මොනවාටද, ඒ මුදල් ඉල්ලා තිබෙන්නේ? මොකක්ද, මේකේ අරමුණ? මේකෙන් වියදම් කරන්නේ හෝටල් සහ ආහාරපාන සඳහායි. කොළඹ Cinnamon Life at City of Dreams Sri Lanka සුපිරි හෝටලයේ රැස්වීම් ශාලා සහ ආහාරපාන සඳහා පමණක් රුපියල් 46,540,180ක්, ආරාධිතයින්ට පිළිගන්වන welcome pack එකට පෑන් සිහිවටන සඳහා පමණක් රුපියල් ලක්ෂ 40ක් සහ Stein Studios ඇතුළු නිෂ්පාදන සහ ආලෝකකරණ වියදම් වෙනුවෙන් රුපියල් 24,658,254ක් මේ මහින් වියදම් කරනවා. මේ, රටේ මහජනයාගේ මුදල්. ඒ වාගේම සංගීත රාත්‍රිය, කොක්ටේල් සහ රාත්‍රී භෝජන සංග්‍රහය වෙනුවෙන් තවත් රුපියල් ලක්ෂ 50කට අධික මුදලක්, එක්දින විනෝද චාරිකාවේ ගාල්ල සහ බෙන්තොට ප්‍රදේශවල ජල ක්‍රීඩා සඳහා රුපියල් ලක්ෂ 55ක් සහ දිවා ආහාරය සඳහා රුපියල් ලක්ෂ 70ක් වියදම් කරනවා.

මේ රටේ ජනතාවට තුන්වේල කන්න බැරිව මොකක්ද කරන්නේ කියලා හිතාගන්න බැරිව ඉන්නකොට මේ පෞද්ගලික සමාගම්වලට මේ රටේ මහජනයාගේ බදු මුදල් දීමට විරුද්ධව කවදා හෝ සමගි ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ අදාළ පාර්ශ්ව සියල්ලට දඩුවම් දෙනවා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා කිව්වා, කැබිනට් පත්‍රිකාවක් නිකුත් කළ පමණින් එය නීතියක් වෙන්නේ නැහැ කියලා. එහෙම නම් එතුමාටත් දැන් පුළුවන්, මේ සම්බන්ධව පරීක්ෂණ කරන්න. විනිවිදභාවය තිබෙනවා නම්, මේ රටේ ජනතාවට විනිවිදභාවය පෙන්වන්න ඕනෑ නම්, ඔබතුමන්ලාට පුළුවන්, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ට පුළුවන්, දැන් මේ සම්බන්ධව පරීක්ෂණ කරන්න කියන කාරණය විශේෂයෙන් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.02]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අද මේ විවාදය පැවැත්වෙන්නේ ඉතාම වැදගත් ආඥාපනතක් සංශෝධනය කරන්නයි. මීට ප්‍රථම කථා කරපු ගරු මන්ත්‍රීතුමියක් ප්‍රකාශ කළා, මේ පනත් ගෙනෙන්නේ ස්වේච්ඡා සංවිධාන, ස්වේච්ඡා සේවයේ යෙදෙන අයවලුන්ට සීමා පනවන්න කියලා. ඒ වාගේම ත්‍රස්තවාදියා කියන එක සම්බන්ධයෙන් හරි නිර්වචනයක් දීලා නැහැ කියන එකත්, PST Bill එක සම්බන්ධයෙනුත් එතුමිය සඳහන් කළා. ඇත්තටම මේ පනත් ගෙනෙන්නේ සීමා පනවන්න නොවෙයි. මුදල් විශුද්ධිකරණය ගැන පාර්ලිමේන්තුවේදී මීට ප්‍රථම හෙළිදරව් වුණා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා මඟින් පදනම් විශාල සංඛ්‍යාවක් හදාගෙන දේශපාලකයින් කටයුතු කරලා තිබෙනවා කියලා. මුදල් විශුද්ධිකරණයට - කළු සල්ලි සුදු කරන්න - අවස්ථාවක් දීමට පදනම් සහ විවිධ භාර හදාගෙන කටයුතු කරනකොට, ඒවා නැති කිරීම, ඒවා මැඩ පැවැත්වීම තමයි මෙන්න මේ පනත් ගෙන ඒමෙන් අපි බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදියා කියන එක සම්බන්ධයෙන් නිර්වචනයක් දෙන්න මේ වෙනකල් එක්සත් ජාතීන්ගේ සංවිධානයටත් අපහසු වෙලා තිබෙනවා.

නමුත් එතුමිය අපෙන් බලාපොරොත්තු වනවා, ත්‍රස්තවාදයට, ත්‍රස්තවාදියාට නිර්වචනයක් ලබා දෙයි කියලා. ඒ පනතේ ඒක නැති එක අඩුවක් කියන එක එතුමිය පෙන්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය පැවැත්වෙන්නේ කාරණා දෙකක් වෙනුවෙනුයි. පළමුවෙනි එක තමයි, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම පිළිබඳ කාර්ය සාධන බලකාය විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් යෝජනා කරන ලද සංශෝධන ඇතුළත් කරමින් 1917 අංක 9 දරන භාර ආඥාපනත සංශෝධනය කිරීම. දෙවැනි එක තමයි, ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නියමුවන් රහිත ගුවන් යානා පද්ධතියක්, එහෙම නැත්නම් unmanned aerial vehicle system එකක් හදිසි මිලදී ගැනීමේ පදනමින් අත්පත් කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තුව අනුමත කර ගැනීම. මේ කරුණු දෙක පදනම් කරගෙන තමයි අද මෙම විවාදය පැවැත්වෙන්නේ.

මම ප්‍රථමයෙන්ම පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව කථා කරන්නම්. ජාතික ආපදා අවස්ථාවලදී කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහාත්, සමුද්‍ර නිරීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහාත් මිනිසුන් රහිත ගුවන් යානා පද්ධතියක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිලදී ගන්නට යෝජනා කරලා තිබෙනවා. මේ පද්ධතිය මිලදී ගන්න අපේක්ෂා කරලා තිබෙන්නේ ඊශ්‍රායලයේ BlueBird Aero Systems කියන සමාගම වෙතින්. මේ සඳහා වැය කරන්න අපේක්ෂා කරනවා, ඩොලර් මිලියන 9.5ක මුදලක්. මෙවැනි පද්ධතියක් ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ඩොලර් මිලියන 20ක් පමණ වනවා කියලා තිබෙනවා. ඩොලර් මිලියන 20ක් වැනි මුදලකට තිබෙන පද්ධතියක් ඩොලර් මිලියන 9.5ක මුදලක් වැය කරලා මිලදී ගැනීම තුළින් අපේ රජයට ආර්ථිකමය වශයෙන් වාසියක් අත් වනවා කියන එකත් මම කියන්න කැමැතියි. මේ මිලදී ගැනීම සඳහා අතිරේක වැයක් අවශ්‍ය වන්නේ නැහැ. ඒකට හේතුව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු Mi-17 හෙලිකොප්ටර් හතරකට අදාළව කරන්න නියමිතව තිබුණු අලුත්වැඩියා කටයුතු තාවකාලිකව අත්හිටුවීමෙන් ඉතිරි වී තිබෙන ප්‍රාග්ධනය මේ මිලදී ගැනීම සඳහා යොදාගන්නට අපේක්ෂා කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1917 අංක 9 දරන භාර ආඥාපනතට ගෙනෙන සංශෝධන පිළිබඳව කථා කරන්න ඊළඟට මා බලාපොරොත්තු වනවා. 2018 අංක 6 දරන සංශෝධිත පනත මඟින් අවසන් වරට සංශෝධනය වුණු භාර ආඥාපනතේ තුන්වන වගන්තිය, පස්වන වගන්තිය, හයවන වගන්තිය සහ දහනව වන වගන්තිය සංශෝධනයට ලක් කරන්න මේ පනත් කෙටුම්පත මඟින් කටයුතු කරලා තිබෙනවා.

භාර ආඥාපනත යටතේ, ප්‍රකාශිත භාරයක් කියන්නේ express trust එකක්. දේපළ හිමිකරුවෙකු පැහැදිලිව ප්‍රකාශ කරන අභිප්‍රායයක් වෙනුවෙන් තම දේපළ විශ්වසනීය තෙවන පාර්ශ්වයකට, එහෙම නැත්නම් භාරකරුවෙකුට - නිශ්චිත පුද්ගලයෙකුට - කළමනාකරණයට හෝ භාර දීමට අදාළ සියලුම කටයුතු තමයි ප්‍රකාශිත භාරයක් කියලා හඳුන්වන්නේ.

ප්‍රකාශිත භාරයක් ස්ථාපිත කිරීම සඳහා සාමාන්‍යයෙන් කරුණු 3ක් අවශ්‍ය වනවා. පළමුවැන්න, අභිප්‍රායේ නිශ්චිතභාවය. දෙවැන්න, දේපළේ නිශ්චිතභාවය, එනම් වංචල දේපළද, නිශ්චල දේපළද යන්න. අනෙක් එක, ප්‍රතිලාභීන්ගේ නිශ්චිතතාව. ඒ අනුව අද දින සිදු කරනු ලබන සංශෝධන තුළින් අපි ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වනවා, ප්‍රකාශිත භාර ලියාපදිංචිය අනිවාර්ය කරන්නත්, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සිදු කරනු ලබන අනිවාර්ය ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා පරිපාලන දඩ පැනවීමට, සම්බාධක පැනවීමට විධිවිධාන හඳුන්වා දීමටත්.

ඒ වාගේම 6අ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනයේ ඇති ඕනෑම ප්‍රකාශිත භාරයක් පිළිබඳ තොරතුරු සම්බන්ධව ඉල්ලීමක් කළ විට, නීතිපති, මූල්‍ය බුද්ධි ඒකකය, විගණකාධිපති දෙපාර්තමේන්තුව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමට වගකීම ඇති පොදු අධිකාරියක්, රාජ්‍ය ප්‍රසම්පාදන අධිකාරියක්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම අධීක්ෂණය කිරීමට හෝ නිරීක්ෂණය කිරීමට නියම කරනු ලැබ ඇති යම් නියාමන අධිකාරියක් වෙත තොරතුරු ලබා දීමට හැකිවන ආකාරයට විධිවිධාන සැලැස්වීමත් තමයි මේ සංශෝධනයෙන් බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධනවල සුවිශේෂීම කාරණය වන්නේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමත්, ත්‍රස්තවාදයට මුදල් සැපයීමට ඇති ඉඩකඩ ඇහිරීමත් කියන එකයි. ඒ වාගේම මීට කලින් භාර ආඥාපනත අනුව අධිකරණ කටයුතු ක්‍රියාත්මක වුණේ සිවිල් අධිකරණ කටයුත්තක් වාගේයි. දිසා අධිකරණය මඟින් තමයි ඒ අධිකරණ කටයුතු සඳහා බලතල දීලා තිබුණේ. ඒක අපරාධමය වරදක් බවට පත් කරලා, මහෙස්ත්‍රාත්වරයෙකුට ඒ අධිකරණ බලතල පවරන්නට මේ සංශෝධනය තුළින් බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ අරගෙන එන සංශෝධන යටතේ තිබෙන ප්‍රධාන කරුණු කිහිපයක් ගැන මම කථා කළොත්, ප්‍රධාන ප්‍රඥප්තියේ 5වන වගන්තිය යටතේ නිශ්චල දේපළ ලියාපදිංචි කිරීම වාගේම වංචල දේපළ - මුදල්, කොටස්, සුරැකුම්පත්, රත්න්, රිදී, මුතු, මැණික් - ලියාපදිංචි කරන්නට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබෙනවා. ඒ වාගේම එම වගන්තිය යටතේ ඇති කරනු ලබන භාරයක් සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලැබූ දින සිට මාසයක කාලයක් ඇතුළත ඒ භාරයේ සාධන පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු බවට විධිවිධාන සලස්වා තිබෙනවා.

ඒ වාගේම අන්තිම කැමති පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවකත්, ඒ අන්තිම කැමැති පත්‍රය ලියා මාසයක කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කළ යුතු වෙනවා. ඒ වාගේම වංචල දේපළකට අයිති භාරයක් නම්, අන්තිම කැමැති පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන අවස්ථාවක, ඒ අන්තිම කැමැති පත්‍රය සමඟ ප්‍රොබේට් බලපත්‍රය, ඒ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ දින සිට මාසයක කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කළ යුතු වෙනවා. ඒ වාගේම විදේශ රටක නීතිය යටතේ ඇති කර ගනු ලැබූ භාරයක් නම්, ඒ භාරකරු හෝ පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ භාරය ක්‍රියාත්මක වන දින සිට මාස තුනක කාලයක් ඇතුළත ඒ භාරයේ සාධන පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මෙවැනි පනත් නියමිත ආකාරයෙන් සංශෝධනය නොවීම මත තමයි පසුගිය කාලයේ අපේ රටේ ජනතාවගේ මුදල් නොයෙකුත් ආකාරයේ භාර, එහෙම නැත්නම් පදනම්වලට දාලා විශුද්ධිකරණයකට ලක් කරන්න නැත්නම් අවභාවිත කරන්න කටයුතු කළේ. විශේෂයෙන්ම මේ රට තුළ මුදල් විශුද්ධිකරණය නවත්වන්නටත්, ත්‍රස්තවාදී කටයුතු සඳහා අනාගතයේදී මුදල් යොදවන්නට බලාපොරොත්තුවෙන් ඉන්නවා නම් ඒ සඳහා ඉඩ අහුරන්නටත් මේ පනත සංශෝධනය තුළින් අපට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම තව කාරණයක් මම කියන්න අවශ්‍යයි. දැන් කථා කළා, ටැටූ සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මම විනාඩියකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ටැටූ සම්බන්ධයෙන් ජනතාව තුළ බොරු බියක් ඇති කරන්න උත්සාහ කරනවා. ඇත්තටම අනාගතයේදී එවැනි වාතාවරණයක් ඇති වුණොත් අපට අවශ්‍ය නීති, පනත් කෙටුම්පත් සම්මත කරලා තිබෙන්න අවශ්‍ය වෙනවා. ඒ නීති සම්මත කරලා තිබෙන්න අවශ්‍ය වෙනවා. මෙවැනි වාතාවරණයක් ලෝකයේ බොහෝ රටවල තිබෙනවා. අපරාධ කල්ලිවලට සම්බන්ධ පිරිස් ඒ ටැටූ භාවිත කරනවා. ඒ සඳහා තමයි මේ නීතිය දාලා තිබෙන්නේ. එහෙම නැතුව අපේ ලංකාවේ ටැටූ ගහලා ඉන්න හැමෝම අත්අඩංගුවට ගන්න නොවෙයි කියන එකත් මතක් කරමින්, මේ සංශෝධන සඳහා සියලුදෙනාගේම සහයෝගයත් අපි අපේක්ෂා කරනවා. කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භාරයන් පිළිබඳව කරනු ලබන සංශෝධන ගැන කථා කරද්දී ඇත්තටම අපි මෙවා පිළිබඳව එකඟ වෙනවා කියන එක මම කියන්න ඕනෑ. ඒකට හේතුව මේවා ඉතාම හොඳ සංශෝධන වීමයි. මේවා කාලයෙන් කාලයට ඒ, ඒ පවතින තත්ත්ව අනුව සංශෝධනය විය යුතු දේවල්. ඒ වාගේම, මේ සංශෝධන සියල්ල අතරතුර මේ භාරයන් හරහා රටේ මිනිස්සුන්ට ආණ්ඩුවේ සහයෝගය නැතුව ලබා ගැනීමට සිදු වන උදවු අධෛර්යවත් නොවන ආකාරයට තමයි අපි ඒ සංශෝධන ඇතුළු සියලු දේවල් කළ යුත්තේ. ඒකට හේතුව මෙකයි. සියල්ලම ආණ්ඩුව විසින් කරන්නම් කියලා කයිවාරු ගහලා බලය ලබා ගත්තා. අපිට මතකයි, රෝහලකට ගොඩනැඟිල්ලක් හදද්දීත් කයිය ගැහුවා. ස්වාධීනව කවුරු හරි ඇවිල්ලා පාසලකට මොනවා හරි දෙයක් දෙන්න යද්දීත් කයිය ගැහුවා. අන්තිමට අවුරුද්දක් විතර යනකොට ඒ දේවල් සාමාන්‍ය පරිදි කරගෙන යන්න ඉඩ දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණනාවක පටන් ලංකාවේ විවිධ භාරයන් හරහා මේ රටේ දරුවන්, විවිධ පුද්ගලයන් ඇතුළු සියලු ජනතාවට සහන සහ පහසුදායක දේවල් ලබා දෙනවා. ඒ දේවල් ධෛර්යවත් වන ආකාරයට මිසක් අධෛර්යවත් වන ආකාරයට කටයුතු කරන එක සුදුසු නැහැ කියන යෝජනාවත් මේ වෙලාවේදී මා කරන්න කැමැතියි.

භාර (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවමින් භාර පිළිබඳව වන නීති සංශෝධනය කරන මේ වෙලාවේදී මා කියන්න කැමැතියි, ලංකාවේ මේ වාගේ ප්‍රධාන භාර කිහිපයක් තිබෙන බව. එකක් තමයි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මූල්‍යාධාර ලබා දෙන මහපොළ භාරකාර අරමුදල. අද උදේත් මම දැක්කා, අමාත්‍යවරයා ඒ පිළිබඳව වර්ණනා කරනවා. ඒ වර්ණනා අහන අස්සේම රටේ මිනිස්සුන්ට අපට කියන්න තිබෙන්නේ, 76 අවුරුදු සාපය ඇතුළේ හිටපු නායකයෝ මේ රටට ගෙනා ඉතාම විධිමත් දේවල් මේ අය වර්ණනා කරන බවයි. ඒ අතරතුර ඊයේ නියෝජ්‍ය ඇමති කෙනෙක් කිව්වා, මෙතෙක් කාලයක් රට පාලනය කළේ බෙල්ලේ පාළුවට ඔළුවක් තිබෙන මිනිස්සු විතරයි කියලා. මම හිතන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මිසක් වෙන හේතුවක් නැහැ කියලා හිතෙද්දී අනෙක් නායකයෝත් එහෙමයි කියලා එතුමා හිතන්න ඇති. සිරිමාවෝ බණ්ඩාරනායකලා, ජේ.ආර්. ජයවර්ධනලා, ලලිත් ඇතුලත්මුදලිලා බෙල්ලේ පාළුවට ඔළුව තිබිච්ච මිනිස්සුද කියලා අහන්න ඕනෑ, රටේ මිනිස්සුන්ගෙන්.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කෙනෙක් මිසක්, රට පිළිබඳ දැක්මක් සහිතව අවබෝධයකින් කටයුතු කරන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ බව ඔහුට පෙනෙන්නේත් නැති නිසා එතුමා අනෙක් නායකයෝත් එහෙමයි කියලා හිතනවා වෙන්න පුළුවන්. ඒ නිසා මම කලිනුත් කියා තිබෙන පරිදි, තමන්ගේ නායකයාට ගෞරවය ඕනෑ නම් කරුණාකරලා කලින් හිටපු නායකයන්ට අපහාස කරන එක නවත්වන්න, ඉස්සෙල්ලාම ඒ පූර්වාදර්ශය තියා ගන්න කියා තමන්ගේ ගෝලයන්ට කියන්නය කියලා රටේ ජනාධිපතිට මා පණිවුඩයක් දෙනවා.

ඊළඟ කාරණාව මෙකයි. මේ භාරයන් පිළිබඳව වාගේම මූල්‍ය විශුද්ධිකරණය පිළිබඳව කථා කරද්දී විශේෂයෙන්ම ආණ්ඩුවටත්, අනෙක් සෑම දේශපාලන පක්ෂයකටමත් - අපේ පක්ෂයටත්, ජාතික ජන බලවේගයටත්, ලංකාවේ හැම දේශපාලන පක්ෂයකටම - යුතුකමක් තිබෙනවා, තම පක්ෂ අරමුදලට මුදල් එන විධිය පිළිබඳව සඳහන් කරන්නට. ඒ සම්බන්ධයෙන් වන නීති, අණපනත් හදන්න, මෙම යෝජනාව ගෙනෙන්න කියලා අපි පාර්ලිමේන්තුවට ආපු මුල්ම අවස්ථාවේ අපට සැසි වාරයක් පවත්වද්දි මම කිව්වා මේ 159ට මතක ඇති. ඒ වෙලාවේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාත් කිව්වේ අපට යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරන්න කියායි. ඔයගොල්ලන් ඔය තරමට සුපිරිසිදු නම් ඉස්සෙල්ලාම කළ යුතු වැඩේ මොකක්ද? ලංකාවේ දේශපාලන පක්ෂවලට මුදල් එන විධිය, කොහෙන්ද ඒ මුදල් එන්නේ කියලා විගණනයට ලක් වෙන්න ඕනෑ. හේතුව, ලෝකය පුරා තිබෙන විවිධ ත්‍රස්තවාදී සංවිධාන හරහා, එහෙම නැත්නම් ත්‍රස්තවාදීන්ගෙන් මුදල් ලබා ගැනීම පිළිබඳව,- අර්ච්චුනා මන්ත්‍රීතුමා දිගින් දිගටම චෝදනා කරනවා, කොටි ඩයස්පෝරාව මාලිමාවට සල්ලි දෙනවා කියලා. තමන්ට මුදල් ලැබෙන sources පිළිබඳව, තමන්ට කොහෙන්ද මුදල් එන්නේ කියන එක රටේ මිනිස්සුන්ගේ අවධානයට යොමු කරන්න නම් සහ ඒ පිළිබඳව හැම දේශපාලන පක්ෂයක්ම හොඳින් කටයුතු කරන්න ඕනෑ නම් ඉතාම ඉහළ නූතන නීතිරීති ගෙනෙන්න අවශ්‍යයි.

ඇමෙරිකානු මැතිවරණයට අදාළවත් එක එක පක්ෂයට සල්ලි ලබා දුන්නේ කොහෙන්ද, දුන්නේ කවුද කියන එක පිළිබඳව ප්‍රසිද්ධ කරන්න වෙන තරමට විනිවිදභාවයක් ඒවායේ තිබුණා. ඒ

නිසා මම ඉල්ලීමක් කරනවා. ඉල්ලීමකටත් වඩා මේක අභියෝගයක්. දැන් ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තිබෙන්නේ. ඔයගොල්ලන්ට ආසන 159ක් තිබෙන්නේ. පුළුවන් නම් හැම දේශපාලන පක්ෂයකම තිබෙන මේ වාගේ භාරවලට සල්ලි එන්නේ කොහෙන්ද කියලා සොයා බලන්න. ඒ වාගේම තමයි අරමුදල් රැස් කරනවා. ඒවා ගැනත් සොයා බලන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දිනයේදී ආනයන හා අපනයන (පාලන) යටතේ වන රෙගුලාසි පිළිබඳව, නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳව කථා කරද්දී, මේ නිදහස් වෙළෙඳ ගිවිසුම් කියන්නේ මොනවාද කියලා නියෝජ්‍ය ඇමතිවරයෙක් අපට ලොකු පැහැදිලි කිරීමක් කරන්න උත්සාහ කළා. පසුගිය අවුරුදු 76න්, අවුරුදු 60ක් විතරම හැම නිදහස් වෙළෙඳ ගිවිසුමකටම විරුද්ධව කටයුතු කරපු, මේ රටේ ජාතික ආර්ථිකය කඩා වටිටන්න පුළුවන් හැම කථාවම කියපු මිනිස්සු අද අපට ඒ ගැන lectures දෙන්න එනවා. හැබැයි, අර හර්ෂ මන්ත්‍රීතුමා ඊයේ කිව්වා වාගේ මේ සියලු දේවල් තිබෙන්නේ රැස්වීම්වලයි, කොළවලයි විතරයි. ප්‍රායෝගික භූමිය සෑහෙන අර්බුදවලට මුහුණ දීලා. නිදහස් වෙළෙඳ ගිවිසුම්වල තිබෙන වටිනාම දේ තමයි එක රටක මිල අඩුවෙන් තිබෙන භාණ්ඩයක්, වෙන රටක පාරිභෝගිකයාට වාසි සහගත විධියට ගන්න ලැබීම. හැබැයි, කොළඹ කොටුව ආශ්‍රිතව සිටින වෙළෙඳ සමූහයාට මේ මොහොතේදී මුහුණ පාන්න වෙලා තිබෙන අර්බුද කොයි තරම් විශාලද කියලා මෙතැන ඉන්න ඔය කවුරු හරි මන්ත්‍රීවරයෙකු ගිහිල්ලා ඒ අයගෙන් ඇහුවොත් දැනගන්න ලැබෙයි. විශේෂයෙන්ම අඩු මුදලකට පාරිභෝගිකයන්ට භාණ්ඩ ලබා දෙන කණ්ඩායමක් විධියට තමයි කොළඹ කොටුව ආශ්‍රිත වෙළෙන්දන් ඉන්නේ. ඒ අය ලංකාවට භාණ්ඩ ගෙන්වන එක පුළුවන් තරම් අවහිර කරනවා. ඒ කියන්නේ ඩොලර් ටික රටින් යන එක නවත්වා ගන්නත් ඕනෑ, tax හැටියට සල්ලි එන්නත් ඕනෑ. ඒකට කරන්නේ සුළු හෝ වරදක් සිද්ධ වෙච්ච ගමන් ලොකු penalty එකක් ගහන එකයි. අන්තිමට භාණ්ඩයේ මිල අසාමාන්‍ය ලෙස ඉහළ යනවා. මේ වනවිට ඔවුන් කොතරම් අධෛර්යවත් වෙලා තිබෙනවාද කියා අපි බැලිය යුතුයි. ඒ වාගේම, දුප්පත් මිනිස්සු අඩු මුදලකට භාණ්ඩයක් මිලදී ගන්න, ටී-ෂර්ට් එකක් මිලදී ගන්න කොටුවට යනවා. මේක හංගන්න දෙයක් නොවෙයි. තරුණ කාලයේ අපිත් එහෙම තමයි. අපිත් තරුණ කාලයේදී කොටුවට ගිහිල්ලා ටී-ෂර්ට් එකක්, බැනියමක්, සපත්තු දෙකක්, සෙරෙප්පු දෙකක්, බෙල්ට් එකක් මිලදී ගත් මිනිස්සු. අපි වාගේම අදත් අවුරුදු 20, 22 තරුණ තරුණියන් ඒ තැන්වලට ගිහිල්ලා භාණ්ඩ මිලදී ගන්නවා. හැබැයි ප්‍රශ්නය වෙන්නේ, අසාමාන්‍ය tax එකක් ගහලා, ඒ වාගේම penalty එකක් ගැහුවාම ඒවායේ මුදලත් එක්ක බැලුවාම, "හමීඩියා" හෝ වෙනත් කොහේ හෝ ප්‍රධාන වෙළෙඳ සැල්වල තිබෙන භාණ්ඩවල මිලයි සමාන වන එකයි. අවසානයේදී අමාරුවෙන් නැඟී සිටින තරුණයාට branded ටී-ෂර්ට් එකක්, සෙරෙප්පු දෙකක්, බෙල්ට් එකක් ගන්න නොහැකි වුවත්, ඒ ආසන්න එකක් හෝ මිලදී ගන්න තිබෙන අවස්ථාව අහිමිවෙලා යනවා. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස මා දිගින් දිගටම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, මේ වන විට ආණ්ඩුව නව නීති සහ පනත් කෙටුම්පත් දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. එකක් තමයි, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත. ඒක දැක්කාම මට සතුටකුත් ඇති වුණා. ත්‍රස්තවාදීන්ගෙන් රාජ්‍යය ආරක්ෂා කිරීම සඳහා වන මෙම පනත් කෙටුම්පත ගෙනාවේ, කාලයක් ත්‍රස්තවාදීන් විධියට ඉඳලා, පාර්ලිමේන්තුවට බෝම්බ ප්‍රහාර ගහපු, ජනාධිපතිවරයා මරන්න උත්සාහ කරපු, මන්ත්‍රීවරු මරපු, ඊට අමතරව දෙවතාවක්ම රාජ්‍යය බලෙන් අල්ලා ගැනීමට උත්සාහ කරපු, හරියටම ගැළපෙන කණ්ඩායමක්. ත්‍රස්තවාදීන් ලෙස රාජ්‍ය බලය අල්ලා ගැනීමට උත්සාහ කරපු අය, අවසානයේදී ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලය අල්ලාගෙන, ඒ තුළින් නැවතත් තමන්ගේ ත්‍රස්තවාදී සිහිනයට යන්න උත්සාහ කරනවාද කියලා සමාජයේ කතිකාවක් ඇතිවෙලා තිබෙනවා. ඊට හේතුව තමයි, ස්වාධීනව කටයුතු කරන බොහෝ ආයතන, ස්වාධීන මිනිස්සු සහ සිවිල් සමාජය මේ සම්බන්ධයෙන් විවිධ විවේචන සහ වෙනත් බොහෝ අදහස් ඉදිරිපත් කළත්, ඒවා කෙරෙහි ආණ්ඩුව අවධානයක් යොමු නොකරන බව පෙනී යාමයි.

ඊළඟ විශේෂ කාරණය මෙයයි. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත ඔබ විසින් ගෙන ඒම තුළින් පැහැදිලි වනවා, ත්‍රස්තවාදී ප්‍රහාරවලින් රාජ්‍යය ආරක්ෂා කරගත යුතුයි කියලා. එතැනින් හෙළි වන තව දෙයක් තිබෙනවා. විශේෂයෙන්ම, ජවිපෙ විසින් දිගටම කරන නොවැම්බර් මාසයේ ඉල්මහ විරු සමරුව සමරද්දී දිගටම මතක තබා ගන්න, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීම තමයි 1988-1989 වකවානුවේදී වුණේ කියන එක. ඒ වෙලාවේ තමයි ඔය ත්‍රස්තවාදීන් ටික මිය ගියේ. ඔබ ඔවුන් විරුවන් ලෙස සමරන අතරතුර ඒ පනත යළි ගෙනැල්ලා නැවතත් තවත් විරුවන් කණ්ඩායමකට ඒ අවස්ථාව සලසා දෙන්න ඔබ උත්සාහ කරනවා. හැබැයි, ඔබතුමන්ලා කිව්වේ, "අපි ඒ මිය ගිය අයට අපි සාධාරණයක් කරනවා" කියායි. ඇත්තටම, විජේවීර මහත්මයා ඇතුළු රාජ්‍යය බලෙන් අල්ලා ගැනීමට උත්සාහ කරපු මිය ගිය හැම ජේවීපීකාරයෙක්ම අනිවාර්යයෙන්ම ඊළඟ ආත්මයේදී පවා මේ පනත ගෙනෙන මිනිසුන්ට ශාප කරනවා. ඊට හේතුව තමයි, තමන් සමඟ ඉඳලා, තමන්ව විකුණලා බලය ලබාගෙන, අවසානයේදී ඒ පනත් තව තවත් සක්‍රිය කිරීමට කටයුතු කිරීම. මේ පිළිබඳව අපට විවේචනයක් ඉදිරිපත් කරන්න දෙයක් නැහැ. අපි කොහොමත් කියන්නේ, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කරගත යුතුයි කියන එකයි. හැබැයි, "ත්‍රස්තවාදය" යන්න අර්ථ දැක්වීමේදී සිවිල් සමාජයත් හසුවන පරිදි අර්ථ දැක්වීම තුළම, පොදු මහජනතාව නැඟී සිටින හැම අවස්ථාවක්ම යටපත් කරන්න, විශේෂයෙන්ම ආණ්ඩුවට විරුද්ධව නැඟී සිටින මිනිසුන් යටපත් කරන්නට අණපනත් භාවිත කරනවා නම්, ඒක අසාර්ථක ක්‍රියාවලියක් කියලා කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මම මේ පිළිබඳව සොයා බලනකොට දැන ගන්න ලැබුණා, චීනය, රුසියාව, ඊට අමතරව සිංගප්පූරුව වාගේ රටවලුත් මේ වාගේ විශේෂ අණපනත් යොදාගෙන මේ විධියට පුරවැසියන් හානියට පත් කරපු අවස්ථා තිබෙන බව. අවසාන වශයෙන් තවත් එක් කරුණක් කියලා මගේ කථාව ඉවර කරන්නම්. මේ දිනවල ලෝකයේ විවිධ රටවල මැතිවරණ පැවැත්වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තත්පර 30න් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේ පළාත් සභා මැතිවරණය පවත්වන්නේ නැතුව හිරවෙලා තිබෙනවා. එය පවත්වලා ජනමතය පරීක්ෂා කරන්න කියලා අපි කියනවා. ඒ වාගේම, සභානායකතුමා එක තැනකදී පණිවුඩයක් නිකුත් කරමින්, ලූලා ද සිල්වා මහතාගේ ජයග්‍රහණය පිළිබඳව සුබ පතලා තිබුණා. ඒ පිළිබඳව මා එතුමාට ස්තුතිය පළ කරනවා. "ලූලා ද සිල්වා කියන්නේ පොඩි මිනිහෙක්. හැබැයි, ඔහු ශ්‍රේෂ්ඨ ලොකුයි කියලා ඔප්පු කළා" කියලා එතුමා සඳහන් කරලා තිබුණා. මටත් කියන්න තිබෙන්නේ මෙකයි. අනුර කියන්නේ පොඩි මිනිහෙක්. ජේවීපී එක හිතාගෙන ඉන්නවා අනුර කියන්නේ ශ්‍රී ලංකාව තරම් ලොකු මිනිහෙක් කියලා. අනුර හිතාගෙන ඉන්නවා, ශ්‍රී ලංකාව කියන්නේ හුණ්ඩුවක් කියලා. අන්තිමට බැලුවාම අනුරටම තේරෙනවා තමන් හුණ්ඩුවක් තරම් පොඩි මිනිසෙක් කියලා. එම නිසා මේ ලෝකය දෙස පුළුල්ව බලන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ රට ලෝකය ඇතුළේ ලොකු රටක් බවට පත් කරන්න කියලා ඉල්ලනවා. *[බාධා කිරීමක්]* රිදෙනවා නේද? පොඩි මිනිස්සු රටවල් පාලනය කරද්දී අපටත් රිදෙනවා. ඔබලාටත් රිදෙනවා නේද? ඒක තමයි අපි කියන්නේ, දිගටම ලොකු මිනිස්සු වාගේ දකින්න කියලා. ලෝකය දිහා බලන්න, ලෝකයත් එක්ක එකතුවෙලා වැඩ කරන්න. රට ලෝකය ඉදිරියේ බැබළෙන තත්ත්වයට පත් කරන්න ශක්තිය, ධෛර්යය, වාසනාව හා පින් මහිමය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. පොඩි මිනිසුන්ට ලොකු මිනිසුන් වීමට තව කාලය තිබෙනවා කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නීතිඥ හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. UPUL KITHSIRI left the Chair and THE HON. CHANAKA MADUGODA took the Chair.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය කථා කරන්න. *[බාධා කිරීමක්]* බාධා කරන්න එපා.

[අ.භා. 4.24]

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ, මීට කලින් කථා කළේ, මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටින විපක්ෂ නායකතුමාටත් වඩා ලොකු මිනිසා වෙන්න ඇති. කමක් නැහැ. ඒ කෙසේ වෙතත්, ලොකු කථාවකට පස්සේ මට කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්තරා පක්ෂයක් ගත්තොත්, ඒ පක්ෂයේ ආසන සංවිධායකවරු සංවිධානාත්මක අපරාධකාරයන් එක්ක ඩීල් දානවා. ඒ වාගේම, තමුන්ගේ බලය තිබෙන ප්‍රාදේශීය සභාවල ඉන්න සභාපතිවරු සභාපති කාමරය තුළම වෙඩි තබා ඝාතනය කරනවා. මෙවැනි සාමාජිකයන් ඉන්න පක්ෂයක් තමයි මේ සංවිධානාත්මක අපරාධකරුවන් පිළිබඳව ගෙන එන පනත් කෙටුම්පතට විරුද්ධව ඇඟිල්ල දිගු කරන්නේ. ඒක තමන් දෙසටම ඇඟිල්ල දිගු කර ගන්නවා වාගේ තමයි. ඒ අතරතුර විපක්ෂය විසින් අභියෝගයක් කළා, ලංකාවේ දේශපාලන පක්ෂවලට මුදල් එන විධිය සම්බන්ධයෙන් සොයා බලන්න පනතක් ගේන්න කියලා. ඒක අපි ගේනකම් බලාගෙන ඉන්න ඕනෑ නැහැ. ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට පුළුවන්, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් හැටියට යෝජනාවක් ගෙන එන්න. අපි ඒක සම්මත කරලා දෙන්නම්. ඒක අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 159 දෙනාම අනුමත කරලා දෙන්නම්. ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමනි, ඔන්න ඔබතුමාට බාරයි ඒ පනත් කෙටුම්පත ගෙන එන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්නට කලින්, යම් කරුණු පැහැදිලි කිරීමක් කරන්නට අවශ්‍යයි. පුත්තලම දිස්ත්‍රික් රෝහල ගැන යම්කිසි අදහසක් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළා. පුත්තලම දිස්ත්‍රික් රෝහලේ මෘත ශරීරාගාරයේ cooler එක ක්‍රිය මට්ටමේ තමයි තිබෙන්නේ. කාලයෙන් කාලයට repair කටයුතු කළත්, එය විටින් විට ක්‍රිය මට්ටමට පත් වෙනවා. මාස කිහිපයක ඉඳන් ක්‍රිය මට්ටමේ තිබුණු ඒ cooler එක මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා සහ නගරාධිපතිතුමාගේ මැදිහත් වීමෙන්, මුස්ලිම් ජාතික මරණාධාර සංගමයේ ලේකම්තුමා වෙත ඉල්ලීමක් කරලා, ඒ වාගේම පුත්තලම පල්ලියේ මැදිහත්වීමෙන්, තවත් සම්පත්දායකයන්ගේ මැදිහත්වීමෙන් නවීකරණය කරලා දැන් යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ ආකාරයට සම්පත්දායකත්වය ලබා දුන්නු සෑම දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. විටින් විට මේ යන්ත්‍ර අක්‍රිය මට්ටමට පත්වීම සම්බන්ධයෙන් ආණ්ඩුවක් හැටියට අපිට බලන් ඉන්න බැහැ. නමුත්, ඒවා repair කටයුතුවලට යම්කිසි කාලයක් ගත වෙනවා. ප්‍රසම්පාදනයට යම්කිසි කාලයක් ගත වෙනවා. ඒ හින්දා අපි

ආණ්ඩුවක් හැටියට පුත්තලම රෝහලට පමණක් නොවෙයි, හලාවත මහ රෝහල ඇතුළු රෝහල් දෙකටම රුපියල් කෝටි දෙකකට වඩා වැඩි මුදලක් වැය කරමින් මෘත ශරීර 6ක් එකවර තැන්පත් කිරීමට හැකියාව තිබෙන coolers දෙකක් මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු මේ වන විටත් අවසන් කරලා තිබෙනවා.

ඊට අමතරව අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ පුත්තලම රෝහල දිස්ත්‍රික් රෝහලක් ලෙස නම් කරලා තිබෙනවා. ඊට අමතරව මේ වන විට රුපියල් 27,500,000කට වැඩි මුදලක් රෝහලට අවශ්‍ය අනෙකුත් උපකරණ මිලදී ගැනීමට වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, මෑත කාලයේදී ගොඩනැඟිලි 20කට ආසන්න ප්‍රමාණයක් නඩත්තු කිරීම සඳහා මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරලා ඒ නවීකරණ කටයුතු සිදු කර තිබෙනවා. ඒ වාගේම, lab එකේ අඩුපාඩු රාශියක් තිබුණා. දැන් ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිද්ධ වෙලා, නවීකරණ කටයුතු, භාණ්ඩ මිලදී ගැනීම ඇතුළු කෝටි- ප්‍රකෝටි ගණන්වලින් සංවර්ධන කටයුතු පුත්තලම රෝහලේ සිද්ධ වෙනවා. ඒ කෙසේ වෙතත්, මම කලින් සඳහන් කළ ආකාරයට මෘත ශරීර තැන්පත් කිරීම සඳහා අවශ්‍ය cooler යන්ත්‍ර ලබාදීම සම්බන්ධයෙන් සම්පත්දායකත්වය සැපයීමට මැදිහත් වුණු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. විපක්ෂයේ ගරු තාණීර් මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධයෙන් යම්කිසි මැදිහත්වීමක් සිදු කළ බව ප්‍රකාශ කළා. එම නිසා ඒ සම්බන්ධයෙන් එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, ආණ්ඩුවක් හැටියට අපි කරලා තිබෙන දේ පිළිබඳව, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන්ට පැහැදිලි කිරීමක් කළ යුතුයි. මොකද, මේක ජනතාවාදී ආණ්ඩුවක්.

අද දවසේ මේ සාකච්ඡා කරන භාර ආඥා පනතට ගෙනෙන සංශෝධනය ගැන විපක්ෂය උදැසනම ලොකු බිල්ලෙක් මැව්වා. ඒ බිල්ලාව මවලා එම තර්කය ගෙනාපු කෙනා missing. මේ සම්බන්ධයෙන් කෙටියෙන්ම කියන්න තිබෙන්නේ, නොතාරිස් ආඥා පනත එක්කත්, අනෙක් අණපනත් එක්කත් මේ භාර (සංශෝධන) පනත් කෙටුම්පතේ වගන්ති ටික කියවලා බලන්න කියන එකයි. එතකොට ඔය මවපු බිල්ලා ගැන කොයි කාටත් හොඳාකාරයෙන්ම පැහැදිලි වෙයි.

මොකද, මේ භාරයක් කියන දේ සම්බන්ධයෙන් සමහර මන්ත්‍රීවරු හරි හැටි අවබෝධ කරගෙන නැති බව පේනවා. භාරයක් කියලා කියන්නේ, කවුරු හරි පුද්ගලයෙක් තමන්ට තිබෙන දේපළක් හෝ වත්කමක් යම්කිසි පුද්ගලයෙකුට හෝ ආයතනයකට යම්කිසි නිශ්චිත කාර්යයකට කළමනාකරණය කරන්න පවරා දෙන එකටයි. එහෙම නැතිව මේක දේවාලයකට හෝ පන්සලකට ගිහිල්ලා ගැටගහන බාරයක් නොවෙයි. සමහරු හිතාගෙන ඉන්නේ ඒ බාරයයි, මේ භාරයයි දෙකම එකයි කියලා. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා හිතාගෙන ඉන්නේ, මේ පනත හරහා කියන්නේ සුදු රෙද්දක ඔතලා ගැටගහන බාර ගැනයි කියලා. එහෙම නම් එතුමාට වැරදිලා. ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා මම අහගෙන හිටියා, භාර (සංශෝධන) පනත් කෙටුම්පත ගේන්නේ පැහැදිලිවම දේශපාලන අරමුණු මත පදනම් වෙලා කියලා. ඒ වාගේම ජනතාව මර්දනයට පාර කපලා තිබෙනවාලු. තවත් සමහරු කියනවා, මෙය ගෙනෙන්නේ IMF එකේ අවශ්‍යතාව අනුවයි කියලා.

මේ භාර ආඥාපනතට සංශෝධනයක් අවශ්‍ය බව 2021/2022 ජාතික අවදානම් තක්සේරුව අනුව තමයි රටට මුලින්ම අවධාරණය කර තිබෙන්නේ. ඒ වනවිට IMF එක ලංකාව පැත්ත පළාතේ ඇවිල්ලාවත් නැහැ. 2021, 2022 මේ ගොල්ලන්ගේ ආණ්ඩුව තිබුණු කාලයේ තමයි මේ අවදානම ගැන පැහැදිලි කරලා තිබෙන්නේ. ඒ කාලයේ නොකරපු නිසා තමයි අද දවසේ අපට මේ කාර්යය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම, Financial Action Task Force එකේ නිර්දේශවලට අනුකූල වීමද මෙහි අරමුණක් වනවා. මොකද, ලංකාව ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් මධ්‍යම පාන්තික රටක් බවට අනාවරණය වෙලා තිබෙනවා. අන්න ඒ නිසා තමයි අපි මේ සංශෝධනය ගෙන එන්නේ. මේ හරහා විශේෂයෙන්ම ආදායම් සහවාගෙන ඉන්න අය භය වෙනවා; දේපළ සහ වත්කම්වල සැබෑ හිමිකාරත්වය වහගෙන ඉන්න අය භය වෙනවා; ඒ වාගේම, බදු පැහැර හැරලා ඉන්න අයත් භය වෙනවා. සැක කටයුතු වත්කම් හුවමාරු පිළිබඳවත් මේ හරහා විමර්ශන සිද්ධ වෙනවා. එතකොට එහෙන් මෙහෙන් මතු වන ගෙවල්, එහෙන් මෙහෙන් මතු වන දේපළ, අයිතිකාරයන් නැතිව අත් හැරලා යන දේපළ ගැන අයිතිකාරයන් භය වන එක, මේ පනත් කෙටුම්පත් ගෙන එද්දී ඒ අයට බියක් දැනෙන එක, ඒ නිසා සද්දය වැඩි වන එක සාමාන්‍යයි.

ඒ වාගේම මේ කාරණයත් මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. මේ පනත් කෙටුම්පත පිළිබඳ කථා බහ අස්සේ සමහරුන්ට පෙට්‍රල්, ඩීසල් මිල මතක් වෙනවා. ඒවායේ මිල වැඩි වෙලාලු. ඉන්ධන මිල වැඩි වන්නේ කුමක් නිසාද? භූගෝලීය දේශපාලනය දෙස බලන්න. අන්තර්ජාතික ප්‍රවෘත්ති දෙස බලන්න. ඒත් ඉතින් ඒ අයට වෙලාවක් නැහැ නේ, ඒ දේවල් ගැන බලන්න. මොකද, බන්ධනාගාරයට යෑමේ ඒමේ කටයුතු ටික කළමනාකරණය කර ගන්න තිබෙනවා නේ. ජාතික දේශපාලනය ගැන බලන්න, ජාත්‍යන්තර දේශපාලනය ගැන සොයා බලන්න ඒ අයට වෙලාවක් නැහැ. කොහෙන් හෝ මොකක් හරි එකක් අහගෙන ඇවිල්ලා කියනවා මිසක් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න දැනුම නැහැ. මොකද, ඒ අයට වැලිකඩ කටයුතු කළමනාකරණය කිරීමට තිබෙනවා.

ඒ අය කියන තවත් කාරණයක් තිබෙනවා. සංචාරක කර්මාන්තය බිඳ වැටිලාලු. සංචාරකයෝ ලංකාවට එන එක අඩු වෙලාලු. 2026 ඔක්තෝබර් මාසයේදී තමයි ලංකා ඉතිහාසයේ ඔක්තෝබර් මාසයක් තුළ වැඩිම සංචාරක පිරිසක් පැමිණිලා තිබෙන්නේ. ඉතින් එහෙම තිබියදී කොහොමද කියන්නේ, සංචාරකයන්ගේ පැමිණීම අඩුයි කියලා. මා හිතන්නේ, ඒ අදාළ කාරණය අවධාරණය කරපු මන්ත්‍රීතුමාට හෝටල් එහෙම ඇති. හැබැයි, එතුමාට ඒ කටයුතු කළමනාකරණය කර ගන්න බැහැ. මොකද, මේ දවස්වල බන්ධනාගාර ගත වෙලා නේ ඉන්නේ. මා හිතන්නේ, එතකොට කළමනාකාරවරු වැරැදි තොරතුරු සපයනවා ඇති. මම ඒ මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, ඔක්තෝබර් මාසයේ සංචාරකයන් 168,625දෙනෙකු ඇවිල්ලා තිබෙන බව. ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි ඔක්තෝබර් මාසය තමයි, මේ වසරේ ඔක්තෝබර් මාසය.

මේ පනත් කෙටුම්පතට අමතරව අද දවසේ පරිපූරක ඇස්තමේන්තුවක් ද ඉදිරිපත් කර තිබෙනවා, ගුවන් නියමුවන් රහිත යානා 4ක් මිල දී ගැනීම සම්බන්ධයෙන්.

ගුවන් හමුදාවම උපයාගත් රුපියල් මිලියන 4,261ක් වැය කරලා ශ්‍රී ලංකා රජය මැදිහත් වීමෙන් ඊශ්‍රායල රජය හරහා නියමුවන් රහිත ගුවන් යානා මිලට ගැනීමට කටයුතු කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීම අද දවසේ සිද්ධ වන බව කියන්න සතුටුයි. මොකද, මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ වාගේම රටේ තිබෙන මුහුදු සීමාව ආශ්‍රිත ප්‍රදේශවල විශේෂයෙන්ම ධීව අනතුරට පත් වනවා. ඒ වාගේ අවස්ථාවලදී අපට හෙලිකොප්ටර් යානා තමයි පාවිච්චි කරන්න වෙන්නේ. නමුත් දීර්ඝ කාලයක් ඒවායේ රැදී සිටීමේ අපහසුතාවක් පවතිනවා. හැබැයි, මෙකී නියමුවන් රහිත යානා භාවිත කිරීම හරහා, අනතුරට පත් වන ධීවරයන් පිළිබඳව සොයා බැලීමට, නිතරම ආපදාවට ලක් වන කඳුකර ප්‍රදේශවල, නිරන්තරයෙන් ජලගැලීම්වලට ලක්

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

වන ගංගා ආශ්‍රිත ප්‍රදේශවල දත්ත ටික එකතු කරගෙන ආපදා කළමනාකරණය කර ගන්න, ඒ ජනතාවට සේවයක් සලසන්න මේ යානා මිල දී ගැනීම් ඉතා වැදගත් වන බව මම මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම, ඒවායෙහි තවත් සුවිශේෂත්වයක් තිබෙනවා. එම ගුවන් යානා ඕනෑම තැනක ඉඳන් ඉතා කෙටි කාල සීමාවක් තුළ ක්‍රියාත්මක කිරීමටත්, ගුවන්ගත කිරීමටත් හැකියාව තිබෙනවා. මේ විශේෂත්වයන් මත පදනම් වෙලා මේ පරිපූරක ඇස්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන ගුවන් හමුදාව ඔවුන් විසින්ම උපයාගත් මුදල් ප්‍රතිපාදන තුළින් සකසා ගැනීම බෙහෙවින් අගය කොට සලකනවා. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

භාර (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කථා කරද්දී මට අද සතුටු හිතෙන කථාවක් අහන්න ලැබුණා. මට පෙර කථා කළ මන්ත්‍රීතුමිය ඇහුවා, සජිත් ප්‍රේමදාස මැතිතුමාට වඩා ලොකු මිනිහෙක් ඉන්නවාද කියලා. ඒ කියන්නේ ඇත්තටම ආණ්ඩුව පිළිගෙන තිබෙනවා, සජිත් ප්‍රේමදාස කියන්නේ ලොකු මිනිහෙක් කියලා. ඒක පිළිගත්තු එක ගැන, එය එතුමියගේ කථාවේදීම් කියපු එක ගැන අපි සතුටු වෙනවා.

ඒ වාගේම, තව කාරණාවක් කියන්න ඕනෑ. පව්ච ගැනත් මෙහිදී කථා කරනවා. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත් දෙක ගැනත් කථා කරනවා. පව්ච ගැන කථා කරද්දි මීට පෙර කථා කළ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා, අදාළ පනත් කෙටුම්පතට පව්ච ගැන අතුළත් කරලා තිබෙන්නේ, ඉදිරි අනාගතයේදී යම් කණ්ඩායමක් පව්ච ගහගෙන යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් ඒකට අවශ්‍ය කරන නීතිමය කටයුතු කරන්නයි කියලා. ඒ කියන්නේ, පව්ච ගහන එකා ඇතුළට දමනවාමයි කියලායි කෙළින්ම කියා තිබෙන්නේ. ඒක තමයි අපි කිව්වේ. අපි වෙන දෙයක් කිව්වේ නැහැ. හැබැයි තමුන්නාන්සේලා මේක මතක තියාගන්න. තමුන්නාන්සේලා විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධ සම්බන්ධව නීතියක් ගේනවා නම්, පනත් කෙටුම්පතක් ගේනවා නම් කරුණාකර ඉස්සෙල්ලාම අතීතයේ ඉඳලා හිටපු සංවිධානාත්මක අපරාධ කල්ලි මොනවාද කියලා හඳුන්වා දෙන්න; වැරැදිකාරයන් විධියට මෙන්න මේ මේ කල්ලි ටිකට විරුද්ධව තමයි ඉදිරියේදී අපි නීතිය ක්‍රියාත්මක කරන්නේ කියලා කියන්න. ඒ වාගේම ආණ්ඩුවට කියන්න පුළුවන්, අහවල් පව්චය ගැහුවොත් වැරැදිකාරයෙක් වෙනවා කියලා. එහෙම නැති වුණොත් මිනිස්සු පව්ච ගහගන්න එකත් නතර කරයි. එතකොට පව්ච ගහන අයගේ රැකියාවත් නැති වෙනවා, කොල්ලන්ට පව්ච ගහන්න තිබෙන අවස්ථාවත් නැතිව යනවා. ඒ සියල්ල නැති වනවා. ඔබතුමන්ලා මුළු ලෝකයේම තිබෙන අවස්ථා ටික නැති කරනවා. මතක තියාගන්න, ඔබතුමන්ලා සූදානම් වන්නේ අපරාධ මැඩ පවත්වන්න නොව, ආණ්ඩුවට විරුද්ධව නැඟිටින ජනතාවගේ විරෝධතාව නවත්වන්න බව. මොකද, ජනතාවට දැන් ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ?

පසුගිය ඔක්තෝබර් මාසයේ 28වන දා පළවූ "Daily Mirror" පුවත්පතෙහි මෙසේ සඳහන් වනවා:

"Sri Lanka's indirect taxes are among the highest in the world."

ඒ කියන්නේ, ලෝකයේ වක්‍ර බදු පනවන රටවලින් වැඩිම වක්‍ර බදු පනවන රට ශ්‍රී ලංකාව කියන එකයි. මේ වක්‍ර බදු පනවන්නේ කොහොමද? අපේ ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාත් මේ ගැන කිව්වා. වක්‍ර බදු පැනවීම ගැන කථා කරද්දී අපි උදාහරණයකට ගනිමු, මෝටර් සයිකලයක් තිබෙන, සාමාන්‍ය ආදායමක් උපයන, දුප්පත්, අහිංසක මනුස්සයෙකුට කොයි වාගේද බදු පනවන්නේ කියලා. සමහර වෙලාවට ඔහුගේ වැටුපටත් බද්දක් පනවනවා. ඊළඟට VAT එක පනවනවා. ඔහු කන බොන දේවල් ගන්න කොටත් VAT එක ගෙවනවා. ඊළඟට SSCL කියලා සියයට 2.5ක තවත් බද්දක් තිබෙනවා. සිගරට් එකක් බිව්වත් බදු ගෙවනවා. අරක්කු ටිකක් බිව්වත් බද්දක් ගෙවනවා. ඊළඟට, Sri Lanka Customs එකෙන් clear කරලා ඔහු මොනවා හරි බඩුවක් ගෙනැල්ලා විකුණනවා නම් කස්ටම් බද්දත් ගෙවනවා. Telephone bill එක ගෙව්වාම, ඒකේත් බද්දක් තිබෙනවා. Telephone card එකට ගෙවන සල්ලිවලත් බද්දක් තිබෙනවා. බැංකු කාඩ් පත ATM එකට දමලා එක පාරක් සල්ලි ටික ගත්තාම ඒකටත් බද්දක් ගෙවන්න තිබෙනවා. මෝටර් සයිකලය ලයිසන් කරන්න ගියාම ඒකටත් බද්දක් ගෙවන්න ඕනෑ. පෙට්‍රල් ටිකට බද්දක් ගෙවන්න ඕනෑ, විදුලි බිලට බද්දක් ගෙවන්න ඕනෑ, වතුර බිලට බද්දක් ගෙවන්න ඕනෑ, වරිපනම් බද්ද ගෙවන්න ඕනෑ. ඇඳුම් පැළඳුම් ගත්තාම ඒකට තවත් බද්දක් ගෙවන්න ඕනෑ. බූමිතෙල් ටිකක් ගත්තොත් ලිපක් පත්තු කර ගන්න, ඒකටත් බදු ගෙවන්න ඕනෑ; ගෑස් ටික ගත්තොත් ඒකටත් බදු ගෙවන්න ඕනෑ. මේ රටේ අහිංසක මිනිසුන් ගෙවන බදු ගැනයි මම මේ කිව්වේ. ඒ දුප්පත් මිනිසුන්ගේ ඉස්සරහට ගිහිල්ලා ටින් එක පාලා, ටින් එකට ශත පනහ, රුපියල, රුපියල් 10 එකතු කර ගත්තා තමුන්නාන්සේලා එහෙම තමයි හැදිලා ආවේ. අද ටින් එකකින්ම මිනිසුන්ගේ ඔළුව පැළෙන්න ගහලා කියනවා, "උඹලාගේ සාක්කුවේ තියෙන බදු ඔක්කෝම මේ ටින් එකට දාපල්ලා" කියලා. ඒකෙන් ජීවත් වෙච්ච තමුන්නාන්සේලා, ඒ දුප්පත් අහිංසක මිනිසුන් දිහා බැලුවාද? තමුන්නාන්සේලාට ඒ මිනිසුන් දිහා බලන්න බැරුව ගියා. ඒ නිසා තමුන්නාන්සේලා හොඳ පරීක්ෂාවෙන් වැඩ කටයුතු කරන්න මතක තියා ගන්න. එහෙම කියන්න හේතුවක් තිබෙනවා.

තමුන්නාන්සේලා මේ රටෙත්, විදේශ රටවලත් ඇතැම් අයට සල්ලි දීලා, කණ්ඩායම් හැදුවා - මුදල් ගෙවලා කණ්ඩායම් හැදුවා - තමුන්නාන්සේලාට විරුද්ධව කථා කරන විපක්ෂයේ හැම කෙනෙකුටම social media හරහා ගහන්න. ඒ සමහර ඒවා මහා වනචර කණ්ඩායම්. ඒ ගොල්ලන් පාවිච්චි කරන භාෂාව සම්පූර්ණයෙන්ම කුණුහරුප. අම්මලාට පාවිච්චි කරන්නේ කැත වචන. ඒ වාගේම කාන්තාවන්ට පාවිච්චි කරන්නේ කැත වචන. දේශපාලනය කරන කණ්ඩායමට විතරක් නොවෙයි, රාජ්‍ය සේවකයන්, නායකයන් ආදි සියලුදෙනාට කථා කරන්නේ කැත වචනවලින්. මතක තියා ගන්න, අද ඒ අය ආපස්සට හැරිලා බරපතළ විධියට, වනචර විධියට කුණුහරුප කියලා තමුන්නාන්සේලාටම ගහනවා. අද ජනාධිපතිවරයාට ගහනවා, නරක වචන කියලා. ඩිජිටල් ත්‍රස්තවාදය කියන්නේ ඕකට තමයි. අද ජනාධිපතිවරයාට එහෙම කුණුහරුපෙන් ගහන කොට අපේත්

ඇහ වෙව්ලනවා. මොකද, මේ අපේ රටේ ජනාධිපති. හැබැයි, ජනාධිපතිටත් කුණුහරුපෙන් ගහන සම්ප්‍රදාය මේ රටේ හැදුවේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා ආණ්ඩුව ගත්තාට පස්සේ තමයි ඒ සම්ප්‍රදාය මේ රටේ නිර්මාණය කළේ. අද මේ සමාජයම මහා බරපතළ විධියට කඩා වැටිලා තිබෙනවා. ඒ අයගේ විලාසය, විශේෂයෙන්ම භාෂාව හැසිරවීමේ විලාසය තමුන්නාන්සේලා ඉතාම පහත් තත්ත්වයට නිර්මාණය කරලා තිබෙනවා.

තමුන්නාන්සේලා අධ්‍යාපනයට කොච්චර සල්ලි වියදම් කළත් වැඩක් නැහැ, අනෙක් පැත්තෙන් රට විනාශ කරන වැඩසටහන තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරලා ඉවරයි. විශේෂයෙන්ම ජනතාවගේ අදහස් ඉදිරිපත් කිරීමේ අයිතියට එකතු කරලා තිබෙනවා, කුණුහරුපත් කියපන් කියලා. එක එකාව මරනවා කියලාත් කියපන් කියනවා. පිට රටවල ඉන්න සමහර උන් දම්මලා ගස්වනවා, මේ රටේ මිනිසුන්ට. අද තමුන්නාන්සේලාටම ඒක කැරකී කැරකී ඇවිල්ලා තිබෙනවා. හොඳට සූදානමින් ඉන්න. තමුන්නාන්සේලාගේ රෙදි ටික ගලවයි. මොකද, තමුන්නාන්සේලාගේ ඇමතිවරයෙක් කිව්වා, ලංකාව දිහා බලනකොට ඉන්දියන් සාගරයේ තිබෙන මුතු ඇටය ලෙස අපි යටින්මයි ඉන්නේ කියලා. හැබැයි, ඒක අනෙක් පැත්තට හරවලා බලන්නත් කිව්වා. දෙයියෝ සාක්කි! දැන් සිතියම අනෙක් පැත්තට හරවලා බලලා කියනවා, අපි උඩ ඉන්නේ කියලා. ආණ්ඩුව හිතන විධිය බලන්න. ශ්‍රී ලාංකිකයන් විධියට උඩ ඉන්න අදහස් කරන විධිය බලන්න. හැබැයි මතක තියා ගන්න, උඩුබැලි අතට හරවලා බලන කොට තමුන්නාන්සේලා හෙලුවැල්ලෙන් ඉන්නේ. ඒ නිසා ජනතාව හෙලුවැල්ලෙන් තියන්න උඩුබැලි අතට හරවන්න එපා. එහෙම හැරෙව්වාම ඒක වෙනවා.

දැන් ඇමෙරිකාවේ midterm election එකක් පැවැත්වුවා. ඇයි ඒ midterm election එක පැවැත්වුවේ? Midterm election එක තියලා, Senate සහ House of Representatives මැනගත්තා ආණ්ඩුවට තිබෙන ජනතාවගේ පිළිගැනීම. මොකද, ඇමෙරිකාවේ ජනාධිපතිට අවුරුදු හතරකට බලය තිබුණත් අවුරුදු දෙකක් යනකොට බලනවා, ආණ්ඩුව ඇත්තටම නිවැරදි ගමන් මාර්ගයක යනවාද කියලා. ඒක තමයි නියම ප්‍රජාතන්ත්‍රවාදය; ඒක තමයි best practice කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අවසාන කාරණාව කියලා කථාව අවසන් කරන්නම්. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා, තමුන්නාන්සේලා ඔච්චර ලස්සන දේවල්, හොඳ දේවල් මේ රටේ මිනිසුන්ට කරලා තිබෙනවා නම්, මේ රටේ මිනිසුන් විශ්වාස නම්, midterm election එකක් ගන්න; පළාත් සභා ඡන්දය කැඳවන්න. පළාත් සභා ඡන්දය කැඳවලා කොන්ද කෙළින් තියාගෙන "පුළුවන් නම් උඹලා දිනපල්ලා" කියලා අපට දෙන්න challenge එකක්. අපි සූදානම් ඒ challenge එක භාර ගන්න. පුළුවන් නම් ආණ්ඩුවේ එක්කෙනෙක් නැගිටලා ඒ challenge එක භාර ගන්න. අපි තමුන්නාන්සේලාට challenge එකක් දෙනවා, පුළුවන් නම්, කොන්ද පණ තිබෙනවා නම්, ඇමෙරිකාවේ කළා වාගේ midterm election එකක් විධියට ශ්‍රී ලංකාවේ පළාත් සභා ඡන්දය තියලා පෙන්වන්න කියලා. අපි සූදානම් ඒකට ඉදිරිපත් වෙලා තමුන්නාන්සේලාට පෙන්වන්න, තමුන්නාන්සේලා කොච්චර ජනප්‍රියද, අපි කොච්චර ජනප්‍රියද කියලා.

බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.41]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි.

භාර ආඥාපනතට ගෙනැවිත් තිබෙන සංශෝධනය පිළිබඳව වාගේම රජය විසින් ඉදිරිපත් කරලා තිබෙන ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත පිළිබඳව මේ වෙලාවේ රටේ ඇති වෙලා තිබෙන සංවාදය, යම් යම් විවේචන සම්බන්ධවත් අදහසක් ප්‍රකාශ කිරීම වැදගත් කියලා මා හිතනවා. මට හිතෙනවා, පාර්ලිමේන්තුවේ අද කථා කළ මන්ත්‍රීවරු බොහෝ දෙනෙකුට අවබෝධයක් නැහැ කියලා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කියන්නේ මොකක්ද කියලා. ඒක පුදුම සහගතයි. මොකද, විපක්ෂයේ ඉන්න විශේෂයෙන්ම සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ගේ, මන්ත්‍රීවරියන්ගේ මව් පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය තමයි 1979දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, පාර්ලිමේන්තුවේදී තාවකාලික පනතක් හැටියට සම්මත කරන්නේ. 1982 වසරේදී මෙම පනත තාවකාලික බවින් අයින් කරලා ස්ථිර පනතක් - permanent Act එකක් - බවට පත් කරනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, ස්ථිර පනතක් බවට පත් කළ 1982 අවුරුද්දේම තමයි මෙතුමන්ලාගේ බොහොම ප්‍රචලිත ලාම්පු-කළගෙඩි සෙල්ලම - ජනමත විචාරණය - මඟින් මහ මැතිවරණය පැවැත්වීම නවත්වන්නේ. ඊට වසරකට පසුව 1983දී තමයි දේශපාලන පක්ෂ තුනක් කිසිදු හේතුවක් නැතිව තහනම් සංවිධාන බවට පත් කරන්නේ. එතකොට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ 80 දශකයේදී විශේෂයෙන්ම විරුද්ධ දේශපාලන පක්ෂවල ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි වීම අතර සෘජු සම්බන්ධයක් තිබෙනවා.

අපි දේශපාලනය පැත්තකට දමලා මේ පනත දිහා බැලුවොත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කියන්නේ මොකක්ද? අද මෙතුමන්ලා විවේචනය කරන දේවල් මේ පනතේ නැද්ද? මේ පනත මොකක්ද? අද වෙනකොට මේ රටේ නීතියක් බවට පත් වෙලා තිබෙන, අපි ඉවත් කිරීමට සූදානම් වෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇති කර තිබෙන නීති පද්ධතිය මොකක්ද? ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කියන්නේ, ඉතිහාසය තුළ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, වධ හිංසනයට ලක් කිරීම් සහ අධිකරණයෙන් පිටත - අපි කියනවා extrajudicial killings කියලා - මරණයට පත් කිරීම, එහෙම නැත්නම් මිනී මැරුම්වලට පදනම් වෙච්ච, ඒකට නීතිමය පදනම සපයපු පනතක්. මේ හැමෝම කිසිම ලජ්ජාවක් නැතිව, 'ත්‍රස්තවාදියා, ත්‍රස්තවාදියා' කියලා තවමත් කථා කරන්නේ, ජනතා විමුක්ති පෙරමුණට. තුනෙන් දෙකක බලයක් තිබිලත්, ජනාධිපතිවරයෙක් ඉඳලත්, මහජන ආණ්ඩුවක් වෙලත් ත්‍රස්තවාදියා කියලා කථා කරන්නේ ජනතා විමුක්ති පෙරමුණට, මේ විපක්ෂයේ මන්ත්‍රීවරු. දේශපාලනිකව ත්‍රස්තවාදය දෙස ඇත්තටම බලන්නෙත් ඔවුන්, බැලුවෙත් ඔවුන්. අපි ඒක මතක් කර ගන්නට ඕනෑ.

1980 දශකයේ අතුරුදහන් කිරීම්, වධ හිංසනයට ලක් කිරීම්, රඳවා තබාගෙන වධ හිංසනයට ලක් කිරීම් සහ මිනී මැරීම කියන සමස්ත ක්‍රියාවලිය පිටුපස කිසිම නීතියක් නොතිබුණා නොවෙයි.

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

ඒ ක්‍රියාවලිය පිටුපස නීතියක් තිබුණා. ඒ නීතිය තමයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත. ඔබතුමන්ලාත් අද වෙනකොට එම පනත අහෝසි කිරීමට එකඟයි. අපි හැමදාම ඒ පනත අහෝසි කිරීම සඳහා සටන් කරලා තිබෙනවා. මොකද, ඒක ඉතාම දරුණු මෘග පනතක්.

මේ පනත යටතේ මොකක්ද කරන්නේ? මේ එක් එක් සිද්ධියට මේ පනතේ සම්බන්ධයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පනත හරහා රැඳවුම් නියෝගය - Detention Order එක - නිකුත් කරන්නේ ඇමතිතුමා. ඇමතිතුමා විශ්වාස කරනවා නම් පනතේ සඳහන් වරදක් කවුරු හෝ සිද්ධ කරලා තිබෙනවාය කියලා, ඇමතිට බලය තිබෙනවා, එහෙම නැත්නම් ආරක්ෂක ඇමතිට බලය තිබෙනවා, රැඳවුම් නියෝගයක් නිකුත් කරන්න. රැඳවුම් නියෝගය නිකුත් කළාට පස්සේ මාස 18ක් දක්වා - මුල් පනත අනුව මාස 18යි, 2022දී ඒ සීමාව මාස 12කට අඩු කරනවා - රඳවා තබාගන්න පුළුවන්, කිසිදු අධිකරණයකට රැඳවියා ඉදිරිපත් කරන්නේ නැතිව. අඩුම ගණනේ මහෙස්ත්‍රාත් අධිකරණයකට පවා රැඳවුම් නියෝග යටතේ ඉන්න පුද්ගලයා ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ පුද්ගලයා රැඳවුම් නියෝගයක් යටතේ ගත්තා කියලා එයාගේ පවුලේ උදවිය දන්නෙත් නැහැ, අධිකරණය දන්නෙත් නැහැ. ඒ නීතිය තමයි අතුරුදහන් කිරීමටත් පාවිච්චි කරන්නේ. ඒක තමයි අතුරුදහන් කිරීමේ නීතිය. මේ පනත යටතේ උස්සලා, අරගෙන ගිහිල්ලා, වධ හිංසනයට ලක් කරන්න පුළුවන්. ඇමතිතුමාට පුළුවන්, detention centres නම් කරන්න. ඒ detention centresවල තමයි රඳවාගෙන ඉන්නේ. කිසිම අධිකරණයකින් ඒ centres සුපරීක්ෂාවක් සිදුවෙන්නේ නැහැ; ඒ මධ්‍යස්ථාන සුපරීක්ෂාවක් සිදුවෙන්නේ නැහැ. අපි ඒවාට කියනවා, වධකාගාර කියලා. ඒ වධකාගාරවලට කිසිදු ආකාරයකින් අධිකරණයක මැදිහත්වීමක් සිදුවෙන්නේ නැහැ. එතැන ඉන්නේ කවුද කියලාවත්, ගෙනිච්චේ කවුද කියලාවත් කවුරුවත් දන්නේ නැහැ. මෙතැන ඉන්න විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට සහ එක්තරා යුගයක් ගැන දන්න මිනිස්සුන්ට ඒක අමුතුවෙන් කියන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒ කාරණය සිද්ධ කරන්න හැකි වුණේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත නිසායි. ඒක තමයි පනත.

ඒ පනතින් ඇමතිට පරම බලයක් දීලා තිබෙනවා, අධිකරණයෙන් පිටත රඳවා තබා ගැනීමට. රඳවා තබා ගත් මනුස්සයාට මොකක්ද වෙන්නේ කියන එකවත් හොයා ගන්න බැරි වෙන තරමට බලයක් මේ පනතේ තිබෙනවා. ඒක ඉතා දරුණු බලයක්. එහෙම බලයක් තිබෙන්න අවශ්‍ය නැහැ කියලා අපි පිළිගන්නවා. අදටත් මාස 12ක් දක්වා රඳවා තබා ගැනීමේ බලය තිබෙනවා. ඇමතිතුමාට රඳවා තබා ගැනීමට පුළුවන්. 2022දී සංශෝධනයක් කළා, රැඳවුම් නියෝගයක් නිකුත් කළාට පස්සේ අධිකරණයට, මහෙස්ත්‍රාත්තුමාට දැනුම් දෙන්න ඕනෑ කියලා. 2022 පෙබරවාරි මාසයේදී තමයි ඒ සංශෝධනය - Amendment එක - කරන්නේ. දැන් අපි මෙකට මොකක්ද කරන්නේ? PSTB එක යටතේ අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ මොකක්ද? රැඳවුම් නියෝගයක් ඉදිරිපත් නොකර මාස 18ක, එහෙම නැත්නම් මාස 12ක රැඳවුම් කාලයක් තියා ගන්නට දැන් ඇමතිතුමාට බැහැ. පළමුවෙනි කාරණය, ඇමතිතුමා ඒ නියෝගය නිකුත් කරන්නේ නැහැ, ඒ නියෝගය නිකුත් කරන්නේ අමාත්‍යාංශ ලේකම්වරයා විසින්. ඍජුව දේශපාලන අධිකාරියේ තිබුණු බලය මේ තුළින් අපි පරිපාලනමය බලයකට යටත් කරනවා. ඒ අනුව අමාත්‍යාංශයේ ලේකම් තමයි ඒ නියෝගය නිකුත් කරන්නේ. ඒ නියෝගය නිකුත් කරද්දි අමාත්‍යාංශ ලේකම්ට පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් එන්න ඕනෑ. ඒ ඉල්ලීම මත තමයි ආරක්ෂක ලේකම්තුමා මේ නියෝගය නිකුත් කරන්නේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මුලින් මාස 18ක් සහ පසුව මාස 12ක් රඳවා තබා ගැනීමට පුළුවන්. අපි ඒකට කියනවා, විධායක රඳවා ගැනීමක් - executive detention එකක් - කියලා. මේ පනතෙන් ඒ කාලය මාස 2කට අඩු කරනවා. ඒ කාලය තුළත් සැකකරුවා දවස් 14න් 14ට මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිපත් කරන්නට ඕනෑ, මුල් අවස්ථාවේම රැඳවුම් නියෝගය මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන්නටත් ඕනෑ. මහෙස්ත්‍රාත් අධිකරණයකට ඉදිරිපත් කිරීමකින් තොරව රැඳවුම් නියෝගයක් බලාත්මක වන්නේ නැහැ. මේකෙන් මොකක්ද කරන්නේ? මුල් පනතින් අතුරුදහන් කිරීමට ලබා දීලා තිබුණු බලය, මිනිස්සු ඇදගෙන ගිහිල්ලා වධ වේදනාවලට ලක් කිරීමට ලබා දීලා තිබුණු බලය මේ පනත යටතේ අහෝසි කරලා දානවා; එහෙම බලයක් තවදුරටත් නැහැ. මහෙස්ත්‍රාත්ට රැඳවුම් නියෝග ඉදිරිපත් කරන්නට ඕනෑ, දවස් 14න් 14ට රැඳවියාව මහෙස්ත්‍රාත්ට ඉදිරිපත් කරන්නටත් ඕනෑ. ඒ වාගේම තමයි මාස 2ක කාලයකට වඩා රඳවා තබා ගැනීමේ හැකියාවක් ලැබෙන්නේත් නැහැ, විධායක බලතල මත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි 2ක අමතර කාලයක් ලැබෙනවා.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 12ක් එක දිගට රඳවාගෙන ඉන්නට පුළුවන්. PSTB එකෙන් අපි ඉදිරිපත් කරලා තිබෙන නව නීතිය යටතේ මාස දෙකකට පස්සේ රඳවා තබා ගැනීමට නම් මහාධිකරණයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යයි. ඔබතුමන්ලාගේ පනත යටතේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇමතිවරයාට පරම බලයක් ලබා දීලා තිබෙනවා, තමන්ට ඕනෑ කෙනෙකුව අධිකරණයටත් කියන්නේ නැතිව රඳවාගෙන ඉන්නට. ඒ බලය සම්පූර්ණයෙන්ම අධිකරණමය බලයකට, සුපරීක්ෂාවකට, අනුමැතියකට යටත් කරනවා, අපි ඉදිරිපත් කර තිබෙන මේ නව නීතිය හරහා. ඒක තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන නීතිය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ දීර්ඝ කාලයක සිට තිබෙන විශාල ප්‍රශ්නයක් තමයි, ඇප ගන්නට බැහැ, ඇප අයිතියක් සැකකරුවෙකුට නැහැ කියන එක. ඇත්තටම මේක 80 දශකයෙන් පසුව එන ගැටලුවක්. ත්‍රස්තවාදියෙක් කියලා සැකකරුවෙකු අල්ලා ගත්තාට පස්සේ ඒ පුද්ගලයාට ඇප අයිතිය අහිමි වනවා. එලෙස ඇප අයිතිය අහිමි වීම නිසා මාස 18කට පස්සේ, එහෙම නැත්නම් අලුත් නීතිය අනුව මාස 12කට පස්සේ රිමාන්ඩ් භාරයේ තියාගෙන හිටියත් කිසිම දවසක ඇප ගන්නට බැහැ, නීතිපති දෙපාර්තමේන්තුව විසින් එකඟත්වය පළ කරන්නේ නැත්නම්. ඒ පුද්ගලයාට ඇප දෙන්න පුළුවන් අධිකරණයක් නැහැ. එතකොට මොකක්ද මේ තිබෙන ප්‍රශ්නය?

නඩු විභාගය - trial එක - ඉවර වෙනකම් අවුරුදු 10කට වඩා වැඩි කාලයක් රැඳවුමේ සිටින, එක්කෝ රැඳවුම් නියෝග මත, එහෙම නැත්නම් රිමාන්ඩ් නියෝග මත - රිමාන්ඩ් නියෝග කියන්නේ මහෙස්ත්‍රාත්ට ඇප දෙන්න බැරි හින්දා, ඇප බලයක් නැති නිසා රිමාන්ඩ් එකේ තබා ගැනීම - ඉතා දීර්ඝ කාලයක් - ඒකට කියනවා, prolonged detention කියලා - රැඳවුම් භාරයේ සිටීමට මේ පනත යටතේ සැකකරුවෙකුට සිද්ධ වනවා. නමුත්

අපි ඉදිරිපත් කරලා තිබෙන නව නීතියෙන් ඇප අයිතිය නැවත සැකකරුවාට ලබා දෙනවා. ඒ අනුව මහාධිකරණයෙන් සැකකරුට ඇප ලබා ගත හැකියි. මේ කෙටුම්පත හරහා ඉතා දීර්ඝ කාලයක් රැඳවුමේ තියාගන්න බැහැ, ත්‍රස්තවාදයට සම්බන්ධ සැකකරුවෙක් වුණත්. අපි මෙක තේරුම් ගන්නට ඕනෑ. අපි මේ පනතෙන් ත්‍රස්තවාදය නිර්වචනය කරලා තිබෙනවා. මේ පනත පාවිච්චි වන්නේ, ක්‍රියාත්මක වන්නේ දේශපාලන අරමුණු සඳහා යම් යම් ප්‍රචණ්ඩකාරී ක්‍රියා කළොත් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙව්ය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව තත්පර 30ක් ලබා දෙන්න.

එසේ වුවත් ත්‍රස්තවාදය ගැන යමෙකු අත්අඩංගුවට ගත්තත්, ත්‍රස්තවාදී ක්‍රියාවක සැකකරුවෙක් වුණත්, ඒ පුද්ගලයාටත් මේ පනත යටතේ අයිතිවාසිකම් තිබෙන බවට පිළිගන්නවා. අයිතිවාසිකම් නැති, කිසිදු ආකාරයක සෝදිසියක් නැති, අධිකරණමය බලයට යටත් නොවන, ඇමතිගේ පරම බලය යටතේ අතුරුදහන් කරන්න පුළුවන්, වධ වේදනාවට ලක් කරන්න පුළුවන්, මිනී මරන්න පුළුවන් පනතක් තමයි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත. අපි ඒ පනත අහෝසි කරලා දාලා මේක නීතිමය රාමුවකට යටත් කරනවා. දැඩි නීතිමය රාමුවක් තමයි. නමුත්, නීතිමය රාමුවකට යටත් කිරීමක් සිද්ධ කරනවා. මේ පනත ගැන ඒ ආකාරයෙන් කථා කරමු. ඔබතුමන්ලාගේ පනතට වඩා අපේ පනත මානුෂීයයි. ඒ යටතේ ත්‍රස්තවාදී සැකකරුවකුට වුණත් අයිතිවාසිකම් තිබෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, විනාඩි 8ක කාලයක් තිබෙනවා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ශ්‍රීතරන් මන්ත්‍රීතුමා නැත්නම් එතුමා වෙනුවට කවුරු හෝ කථා කරන්න, විනාඩි 8ක් ඉතිරි වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාට අමතර කාලය ලබා දෙන එක ගැන තවම එකඟත්වයක් නැහැ. ඔබතුමා විනාඩි 3ක කාලය තුළ කථාව කරගෙන යන්න. ඔබතුමාට අමතර කාලයක් ලබා දෙනවා නම් පසුව එය ලබා දෙන්නම්. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ කථාවේ කාලය ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමාට වෙන් කර තිබෙන්නේ. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථා කරනවා නම් කථා කරන්න පුළුවන්.

[අ.භා. 4.54]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම දැන් කථා කරන්නම්. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ දේශපාලනයට අලුත් නේ. හැබැයි, මට අද කට්ටිය දෙයක් කිව්වා. දේශපාලනයේදී එක මෝඩයෙක් නම් එක මෝඩයයි. මෝඩයෝ දෙන්නෙක් නම් මෝඩයෝ දෙන්නයි. හැබැයි, මෝඩයෝ වැඩි නම් ඒ දේශපාලනය පක්ෂ දේශපාලනයක් වෙනවා කියනවා. මට මේක කියන්න තිබෙන්නේ ජෙප්පොන්ට. දෙකකට වඩා වැඩියි නේ. අපි එකයි නේ. ඔයගොල්ලන් දෙකට වැඩියි නේ, 159ක් නේ. මතක තබාගන්න, මේ PSTB එක වාගේ මේ ඔක්කෝම පනත් ටික ගෙනැල්ලා, ඔයගොල්ලන් මේ පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා ගියාට පස්සේ ඒ ඔක්කෝම ටික පාවිච්චි කරන්න වෙන්නේ තමුන්නාන්සේලාට නේ. තමුන්නාන්සේලා අර සිරසට දීලා තිබෙනවා, රුපියල් කෝටි 4ක්. ගල් අහුරු කාලා තිබෙනවා; කාලා බලලාත් නැව් 19ක් ගිලලා තිබෙනවා. තමුන්නාන්සේලා කන්ටේනර් 323ක් ගෙනැල්ලා ඒකත් කාලා තිබෙනවා. දැන් හිතලා බලන්නකෝ. මේ වාගේ පනත් ගෙනැල්ලා අන්තිමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

යන්නේ තමුන්නාන්සේලාට නේ.

මම මේ ජනතාවට එකක් කියන්න කැමැතියි. කරුණාකර මගේ මුහුණ මතක තබාගන්න. මම ජෙප්පෙක් නොවෙයි. මම මේ පාර්ලිමේන්තුවට ජෙප්පෝ විධියට ආවේ නැහැ. ඒ නිසා අවුරුදු 2ක් ගියාට පස්සේ කරුණාකරලා කොහේ හෝ පාරක දැක්කොත්, අර කලින් මරලා දැම්මා වාගේ මාව මරලා දමන්න එපා. මම මේ පාර්ලිමේන්තුවෙන් තව මාස දෙක තුනකින් ඉවත් වෙනවා. ඊට පස්සේ මම අත් දෙකම ඔසවලා පාරේ යනවා; මම ජෙප්පෙක් නොවෙයි කියලා අත් දෙකම ඔසවලා පාරේ යනවා. හැබැයි, තමුන්නාන්සේලාට හැංගෙන්න වෙනවා, මේ පනත් දෙක ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තොත්. මතක තබාගන්න, හෝමාගම පොලීසියට ගෙනැල්ලා දවසක් තබාගෙන ඔහොම ගහලා මැරෙනවා නම්, මීට පස්සේ මොකද වෙන්නේ?

මගේ තාත්තාත් වැඩ කළේ පොලීසියේ. මම මේ uniform එකෙන් ඉපදිච්ච කෙනා. මගේ තාත්තා 1966දී Police Football Team එකේ Captain. හැබැයි තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාට ඕනෑ ඕනෑ විධියට පනත් ගෙනැල්ලා දාලා, ඔය හොරු ඔක්කෝම ටික අහුවෙනකොට මොකක්ද කරන්න යන්නේ? ඒ වෙලාවේත් "නාමල්, නාමල්, නාමල්" කිය කියා ඉන්න එපා. තමුන්නාන්සේලා ගෙදර ගිහිල්ලා wifeටත් කියනවාද දන්නේ නැහැ, "නාමල්, මේ තේ ටිකක් දාන්න" කියලා. දැන් වාමර සම්පත් දසනායකට හැම දාම බණිනවා.

බලන්න, දැන් TIN එක ගන්න ඉන්න පෝලිම. මම මේ TIN එක ගැන කථාව කියන්නම්. මට දැන් call එකක් ආවා, "Doctor,

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

මේ ගැන පොඩ්ඩක් පාර්ලිමේන්තුවේ කියන්න" කියලා. TIN එකේ online application ගන්නකොට single ද, married ද කියලා විතරයි අහලා තිබෙන්නේ. දැන් අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පු අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ගිහිල්ලා කොහොමද TIN එක ගන්නේ? එයා single ද, married ද? එයා divorced. එතකොට බලන්න ඕනෑ, legally separated ද, නැත්නම් divorced ද, නැත්නම් living-togetherද කියලා. ඒවා බම්බුවක් තියෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා, තව තත්පර කිහිපයක් දෙන්න.

Online පුරවන්න බැරිව, TIN එක ගන්න මිනිස්සු පෝලිමේ ඉන්නවා. ගෑස් පෝලිමේත් මිනිස්සු ඉන්නවා. අද news එකක් ආවා, සිනොපෙක් එකෙන් පෙට්‍රල් මිල රුපියල් 20කින් වැඩි කළා කියලා. මම නම් අත ඔසවාගෙන යනවා, මම ජෙප්පෙක් නොවෙයි කියලා. පුළුවන් නම් ලොකු බෝඩ් එකක් දාලා, මම ජෙප්පෙක් නොවෙයි කියලා පාරෙන් බෙරෙනවා. හැබැයි, තමුන්නාන්සේලා එන්න, දුවගෙන එන්න, ඒ කාලය වෙනකොට. කොහේද යන්නේ? පොඩ්ඩක් කල්පනා කරලා, මේක දාන්න පුළුවන් පනතක් ද කියලා බලලා දාන්න. මේක දාලා ඉවර වෙලා තමුන්නාන්සේලා කොහොමද පාරට යන්නේ? බලමු, ඒ කාලය වෙද්දි.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
අද දිනට නියමිත විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.

[ப.ப. 4.58]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්‍රු ඉච්සපෙයිල් සමර්ප්පික්කප්පට්ටුල්ළ නම්පික්කෛප් පොරුප්පුක්කළ් (තිරුත්තම්) සට්ටමූලම් මීතාන විවාතත්තිල් කලන්තුකොළ්වතෛයිට්ටු මකිළ්ච්සියටෛකින්‍රේන්. නල්ල විටයංකළුක්කු නාම් එන්‍රුම් ආතරවාක ඉරුප්පෝම්. අන්ත වකෛයිල්, නාම් ඉතනෛ ඒර්රුක්කොළ්කින්‍රෝම්. අත්තෝටු, එමතු මාවට්ටම් චාර්න්ත චිල මුක්කිය විටයංකළෛ ඉන්ත වේළෛයිල් කුරිප්පිට විරුම්පුකින්‍රේන්.

මුල්ලෛත්තීවු, ඔට්ටුසුට්ටාන් පිරතේචත්තිල් අමෛන්තුළ්ළ ඉලංකෛ මට්පාණ්ටක් කූට්ටුත්තාපනත්තුක්කුරිය ඕට්ටුත් තොළිර්චාලෛයිල් පණිපුරින්තෝරුක්කාන වේතනම් අල්ලතු නට්ටෛඋටු වළංකප්පට වේණ්ටුම්. ඔට්ටුසුට්ටාන් ඕට්ටුත් තොළිර්චාලෛයිල් පණියාට්රිය 74 පණියාළර්කළ් 1990ආම් ආණ්ටු පෝර්ච් සූළල් කාරණමාක තංකළතු තොළිලෛ ඉළන්තුළ්ළනර්. අන්ත 74 පේරිල් තර්පෝතු 20 පේර් වරෛයිලේයේ ඉරුක්කින්‍රනර්; ඒනෛයෝර් උයිරින්තුළ්ළනර්. තර්පෝතු ඉරුප්පවර්කළුම් වයෝතිපර්කළාකවුම් නෝයාළිකළාකවුම් එව්විත වරුමානංකළුමින්‍රි වරුමෛයිල් වාටුකින්‍රනර්. විසුවාසමාකවුම් අර්ප්පණිප් පෝටුම් පණියාට්රිය ඉවර්කළුක්කු තොළිල්පුරින්ත කාලත්තුක්කුරිය වේතනමෝ, නට්ටෛටෝ ඉතුවරෛ කිටෛක්කවිල්ලෛයෙන අප්පණියාළර්කළ් කවලෛයෝටු තෙරිවික්කින්‍රනර්. ඉතු තොටර්පිල් කෛත්තොළිල් අමෛච්චරිටම් නේරටියාකත් තම්මාල් මකජර් කෛයළික්කප්පට්ටපෝතුම් ඉතුවරෛ තමක්කු එන්තප් පතිලුම් කිටෛක්කවිල්ලෛයෙන අවර්කළ් තෙරිවික්කින්‍රනර්.

ඉතේපෝන්‍රු, යුත්ත චූළ්නිලෛ කාරණමාක මූටප්පට්ට ඒනෛය තොළිර්චාලෛකළිල් පණියාට්රිය පණියාළර්කළුක්කු කුරිප්පාක, ආනෛයිරවු උප්පළම්, පරන්තන් ඉරචායනක් කූට්ටුත්තාපනම්, කාංකේචන්තුරෛ චීමෙන්තුත් තොළිර්චාලෛ පෝන්‍රවර්රිල් පණියාට්රිය වර්කළුක්කු නට්ටෛඋටුකළ් වළංකප්පට්ටුල්ළපෝතුම් තමක්කු නට්ටෛඋටුකළ් වළංකප්පටවිල්ලෛයෙන අවර්කළාල් චුට්ටික් කාට්ටප්පටුකින්‍රතු. එනවේ, ඉතනෛක් කරුත්තිර්කොණ්ටු ඉවර්කළුක්කුරිය වේතනත්තෛයෝ අල්ලතු නට්ටෛට්ටෛයෝ

வழங்குவதற்கு அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டுமென அந்த மக்கள் சார்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, முக்கியமானதொரு விடயமான வட பகுதி மீனவர்கள் படும் அவலம் பற்றி குறிப்பிட விரும்புகிறேன். சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளால் வடக்கு கடற்பரப்பு மிக மோசமாகப் பாதிக்கப்படுகின்றது. சட்டவிரோத இந்திய மீனவர்கள் ஒருபுறம், இலங்கை சட்டவிரோதிகள் மறுபுறம் என கடல் முழுவதும் சட்டவிரோதிகளின் கூடாரமாக மாறிவிட்டது. "வடக்கு மீனவர்களின் பொறுப்பில் வடக்கு கடல் பகுதியைத் தாருங்கள்! கூடிய விரைவில் சீராக்கிக் காட்டுகின்றோம்" என மீனவர்கள் தெரிவிக்கின்றார்கள். நீங்கள் கொஞ்சம் அங்குள்ள மீனவக் குடும்பங்கள் பற்றி சிந்தித்துப் பாருங்கள்! அவர்கள் உழைப்பதில்லையா? சாப்பிட வேண்டாமா? அவர்களின் பிள்ளைகள் கல்வி கற்க வேண்டாமா? எனவே, அவர்களின் வாழ்வாதாரத்தை எண்ணிப் பாருங்கள்! வட பகுதி மீனவர்களையும் வாழ விடுங்கள் என்றுதான் கேட்கின்றோம்.

முல்லைத்தீவு, யாழ்ப்பாணம், தீவுப்பகுதி, மன்னார் மற்றும் கிளிநொச்சி மீனவர்கள் இலங்கையின் பிரஜைகள் இல்லையா? நீதியான, நேர்மையின் வழியில், ஒழுங்கான, சீரான வகையில் கடற்றொழில் செய்துவரும் மீனவர்கள் ஏன் வஞ்சிக்கப்படுகின்றார்கள்? சட்டவிரோதிகளின் ஆதிக்கத்தை வடபகுதி கடலில் ஏன் அனுமதிக்கின்றீர்கள்? இந்திய இழுவைமடிப் படகுகளும் இலங்கை சுருக்குவலைகளும் எமது கடலை அழித்துக்கொண்டிருக்கின்றன; வெளிச்சம் பாய்ச்சி மற்றும் 'டைனமைட்' வெடி வைத்து மீன்பிடிக்கும் சட்டவிரோதிகள் எமது கடலை அழித்துக்கொண்டு இருக்கின்றார்கள். மேலும், இந்திய இழுவைமடிச் சட்டவிரோதிகளால் எமது கடல் வளங்கள் மட்டுமல்ல, மீன்பிடி வலைகளும் முற்றாக அழிக்கப்படுகின்றன. இவர்களா எம்மைக் காப்பவர்கள்? என்று கேட்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது நவம்பர் மாதம்! தமிழ்த் தேசிய இனத்தின் விடிவுக்காக தமது இன்னுயிரை ஈகம்செய்து எமது இதயம் எல்லாம் நிறைந்துநிற்கும் எம்முயிர் வீரர்களை நாம் போற்றி வணங்கும் புனித மாதம்! எம்மினத்தின் விடுதலைக்காக ஈடிணையற்ற ஈகங்களைப் புரிந்த எம் மாவீரச் செல்வங்களுக்கு இந்தப் பேரவையில் தலைசாய்த்து அஞ்சலிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். நவம்பர் மாதம் தொடங்கியதும் தமிழர் தாயகம் எங்கும் மாவீரர்கள் நினைவால் எழுச்சி கொள்கின்றது. மாவீரர் துயிலும் இல்லங்கள் வழிபாடுகளுக்காகத் தயார்படுத்தப்படுகின்றன. எனினும், சில மாவீரர் துயிலும் இல்லங்கள் இதுவரை விடுவிக்கப்படாத நிலையிலேயே காணப்படுகின்றன. மாவீரர் துயிலும் இல்லங்கள் இராணுவ முகாம்களாகப் பயன்படுத்தப்படுகின்றன. குறிப்பாக, முல்லைத்தீவு மாவட்டத்தில் முள்ளியவளை மாவீரர் துயிலும் இல்லம், அளம்பில் மாவீரர் துயிலும் இல்லம் உள்ளிட்ட பல மாவீரர் துயிலும் இல்லங்கள் தற்போது இராணுவ முகாம்களாகப் பயன்படுத்தப்படுகின்றன. இதனால் மாவீரர்களை விதைத்த இடத்தில், மலர்தூவி, சுடரேற்றி அஞ்சலி செலுத்த முடியாமல் அவர்களின் பெற்றோரும் உறவினர்களும் தவிக்கின்றனர்.

யுத்தம் மௌனிக்கப்பட்ட கையோடு தமிழர் தாயகப் பரப்பிலிருந்த அனைத்து மாவீரர் துயிலும் இல்லங்களும் இடித்தழிப்புச் செய்யப்பட்டன. நாங்கள் கோயில்களாகப் போற்றும் துயிலும் இல்லங்களை இடித்தழிப்புச் செய்துவிட்டு, நாங்கள் தெய்வங்களாக மதிக்கின்ற மாவீரர்களின் மேல் இராணுவத்தினர் சப்பாத்துக் கால்களுடன் உதைபந்து விளையாடும்போது, இந்த நாட்டில் இனங்களுக்கிடையில் நல்லிணக்கம் ஏற்படுமென எவ்வாறு எதிர்பார்க்கின்றீர்கள்? இனவாதத்துக்கு முற்றுப்புள்ளி வைக்கின்றோம், இனங்களுக்கு இடையில் நல்லிணக்கத்தை ஏற்படுத்துகின்றோம் எனக் கூறிக்கொண்டு ஆட்சிக்கு வந்த இந்த அரசாங்கம் விடுவிக்கப்படாத மாவீரர் துயிலும் இல்லங்களை விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இடித்தழிப்புச் செய்யப்பட்ட மாவீரர் துயிலும் இல்லங்களை மீள நிர்மாணிப்பதற்கும் ஒத்துழைப்பு நல்க வேண்டுமென இச்சபையின் ஊடாகக் கேட்டுக்கொள்கின்றேன்.

அண்மையில் இந்திய உச்ச நீதிமன்றத்தில் நடைபெற்ற ஒரு வழக்கின்போது, இலங்கை மீனவர்கள் தமது கடலையும் அதன் வளங்களையும் சிறப்பாகப் பராமரிப்பதாகவும் அங்கு கடல்வளம் தூய்மையாக உள்ளதால் இலங்கை கடல் பகுதியில் மீன்வளம் அதிகரித்திருப்பதாகவும் இந்திய நீதியரசர்கள் சுட்டிக்காட்டியுள்ளனர். இது இலங்கைக்குப் பெருமையாகும். மேலும், வடபகுதி மீனவர்கள் தங்களது கடற்பகுதியை மிகவும் சுத்தமாக வைத்திருப்பதாக அவர்கள் சுட்டிக்காட்டியுள்ளனர். இந்திய கடல் பகுதி அசுத்தம் அடைந்துள்ளதால் அங்கு மீன்வளம் அழிந்துவிட்டதாகவும் குறிப்பிட்டுள்ளனர். மீன்வளத்தைத் தேடி இந்திய மீனவர்கள் இலங்கை கடல் பிராந்தியத்துக்குள் சென்றால் நிச்சயம் கைது செய்யப்படுவார்கள் எனவும், கைது நடவடிக்கையைத் தவிர்க்க வேண்டுமெனில் இலங்கை கடல் பிராந்தியத்துக்குள் செல்வதைத் தவிர்க்க வேண்டும் எனவும் இந்திய நீதியரசர்கள் சுட்டிக்காட்டியுள்ளனர்.

இந்திய நீதியரசர்கள்கூட எமது கடற்பரப்பில் தவறானதொரு விடயத்தை இந்திய மீனவர்கள் செய்துகொண்டு இருக்கின்றார்கள் என்பதைச் சுட்டிக் காட்டியும், இலங்கை கடற்படையானது அத்துமீறும் இந்திய மீனவர்களைக் கைதுசெய்யாமல் இருக்கிறது. அதாவது, அதிகமானவர்களைக் கைதுசெய்யாமல், ஓரிருவரைக் கைது செய்கின்றது. அவர்களைக் கைதுசெய்யாமல் இப்படியான போக்குகளைக் காட்டிவருவது மிகவும் கேவலமானது என்பதை இங்கு சுட்டிக்காட்டி விடைபெறுகின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.06]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින අනුමත කර ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ, ජාතික ආපදා ප්‍රතිචාර සහ සමුද්‍රීය නිරීක්ෂණ හැකියාව තව තවත් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් මිනිසුන් රහිත යානා පද්ධතියක් ප්‍රසම්පාදනය කරගැනීමටයි. මේ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න වෙන්නේ අපේ මූල්‍ය රෙගුලාසි යටතේ ප්‍රාග්ධන වියදම් ක්ෂේත්‍රය යටතේම නඩත්තු

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කටයුතු සඳහා වෙන් කර තිබූ මුදල්වලින් ඉතිරි කරගත්ත ප්‍රතිපාදන තවත් වත්කමක් අත්පත් කරගැනීම සඳහා යොදා ගැනීමටයි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමත කරන්නේ නැතිව ඒ කටයුත්ත සිදු කරන්න බැහැ, මුදල් ප්‍රතිපාදන තිබුණත්. මුදල් ප්‍රතිපාදන තිබෙනවා. ඒ ප්‍රතිපාදන සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමයි අද දවසේ සිදු වන්නේ. මේ ප්‍රතිපාදන ඉතාම වැදගත් වෙනවා. අපට රාජ්‍යයන් අතර ගනුදෙනුවක් විධියට ලැබිලා තිබෙන නියමුවන් රහිත යානා පද්ධතිය නව තාක්ෂණයට ගැළපෙන ආකාරයට යොදා ගැනීම ජාතික ආරක්ෂාව, මත්ද්‍රව්‍ය උවදුර, අපරාධ වැනි දේවල් පිළිබඳ තවදුරටත් තොරතුරු එක්රැස් කරගැනීමට උපකාරී වෙනවා. ඒ අනුව රාජ්‍ය මුදල් වියදම් සීමාව වැඩි කරගන්නේ නැතිව මූල්‍ය විනය ආරක්ෂා කරගනිමින් තමයි ඒ කටයුත්ත සිද්ධ කරන්නේ.

ඊළඟට, භාර (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කරනු ලැබුවා. භාර ආඥාපනත සංශෝධනය විය යුත්තේ ඇයි, මෙහි පසුබිම කුමක්ද, මෙහි තිබෙන වැදගත්කම මොකක්ද, අපට ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් අත්පත් කරගන්න පුළුවන් ජයග්‍රහණ මොනවාද කියලා අපි කල්පනා කරලා බලමු. 1917 අංක 9 දරන භාර ආඥාපනත ශත වර්ෂයකට වඩා පැරණි පනතක්. මේ ආඥාපනත නිර්මාණය වෙන්නේම මේකයි. නිශ්චිත අරමුණක් වෙනුවෙන් යම් භාරයක් පවත්වා ගෙන යනවා. ඒ අරමුණ කරා යෑමේදී ප්‍රතිලාභීන් ඉන්නවා. ඒ කාල වකවානුව ගත්තාම, අද ලෝකයේ තිබෙන සංකීර්ණ තත්ත්වය එදා නිර්මාණය වෙලා තිබුණේ නැහැ. ඒ වාගේම භාරයක් විධියට පවතිනකොට එය ස්වභාවික පුද්ගලයෙක් - natural person කෙනෙක් - වෙන්නේ නැතිව legal person කෙනෙක් විධියට පවත්වා ගෙන යන්න පුළුවන්. අතීතයේ තිබුණු තත්ත්වයට සාපේක්ෂව බලනකොට වර්තමානය වනකොට මේ ගනුදෙනුවල සංකීර්ණත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මෙහි තිබෙන ගැටලුව මේකයි. ලෝකයේ නිර්මාණය වෙලා තිබෙන මේ සංකීර්ණත්වය නිසාම අද අපි මුහුණ දෙන අර්බුදවලට උත්තර හොයන අතරතුර, ගෝලීය පරිමාණයෙන් උත්තර හොයන්න සිදු වී තිබෙන ප්‍රශ්න කිහිපයකුත් තිබෙනවා. සංවිධානාත්මක අපරාධ, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, ජන සංහාර අවි සඳහා මූල්‍යකරණය කියන කාරණා සම්බන්ධයෙන් තනි රටක් විධියට, තනි පුද්ගලයෙක් විධියට, එක ආයතනයක් විධියට කටයුතු කරන්න බැහැ. ඒක ජාත්‍යන්තරයම ගැටගැහිලා පද්ධති විධියට තිබෙන්නේ. අපි ආණ්ඩුව භාර අරගෙන අදාළ ප්‍රතිසංස්කරණ කරමින් ඉදිරියට එනකොට අපට මුහුණ දෙන්න වෙලා තිබුණු අභියෝග අතර ප්‍රධානම අභියෝගයක් තමයි, වංචා, දූෂණ සහ අපරාධ ජාලය. ඒ වාගේම තමයි සංවිධානාත්මක අපරාධ ජාලය. මේ සංවිධානාත්මක අපරාධ පිළිබඳව කටයුතු කරනකොට එහි යම් ගැට ගැසීමක් තිබෙන්නත් පුළුවන්, මේ භාර සමඟ. මොකද, ඇත්තටම ඒ භාර පවත්වා ගෙන යන්න අතීතයේ තිබුණු අවස්ථාවම පාවිච්චි කරලා, අද වනකොට ඉඩකඩක් නිර්මාණය වෙලා තිබෙනවා, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන කාරණාවලට. මේ පිළිබඳව විටින් විට අධ්‍යයනයන් සිදු කරලා කරුණු හොයාගෙන තිබෙනවා. ඒ පිළිබඳ වාර්තා, නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා.

උදාහරණයක් විධියට ගත්තොත්, 2018දී අපේ රටවල් පිළිබඳව ජාත්‍යන්තරව කටයුතු කරනකොට මේ මුදල් විශුද්ධිකරණය වැනි කාරණාවලදී මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධන ආයතනය විසින් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාවේ කියනවා, ලංකාවේ මුදල් විශුද්ධිකරණයට යම් ඉඩකඩක් තිබෙනවා කියලා. ඒ නිසා අපි 2018දී අළු ලැයිස්තුවට - grey list එකට - වැටෙනවා. එම නිසා 2018දී භාර ආඥාපනතට යම් සංශෝධනයක් එකතු කරනවා. ඒ සංශෝධනය හොඳ සංශෝධනයක්. ඒ සංශෝධනයේ ප්‍රතිඵලයක් විධියට 2019දී අළු ලැයිස්තුවෙන් එළියට එන්න අපට හැකියාව ලැබෙනවා. හැබැයි, එතැනින් පමණක් මේ කාරණය සිද්ධ වෙන්නේ නැහැ. ඒ කරන ලද සංශෝධනයෙන් සිදු වුණේ මේ භාර සතුව තිබෙන තොරතුරු ටික ඇතුළත් ලේඛනයක් - registry එකක් - පවත්වාගෙන යාම පමණයි. නමුත්, එලෙස පවත්වාගෙන යන ලේඛනයේ තිබෙන තොරතුරු උකහාගෙන වෙනත් කටයුත්තක් කර ගැනීමේ ඉඩකඩ ඇහිරී තිබුණා.

විශේෂයෙන්ම පසුගිය වසර 10ක වාගේ කාලයක් තුළදී තාක්ෂණය භාවිත කරලා ඉතාම සූක්ෂම විධියට මුදල් විශුද්ධිකරණය කියන කාරණාව සිද්ධ වෙනවා. ඒ නිසාම මේ භාර වාගේම අපි නිරන්තරයෙන් කියන සැඟවුණු සමාගම් - shell companies - ඇති කර ගන්න පුළුවන්. අපට පෙනෙන මේ ස්වාභාවික තැනැත්තන් වාගේම සමාගමක් කියලා කියන්නේත් පුද්ගලයෙක්. එයා නීතිය ඉදිරියේ පුද්ගලයෙක්. හැබැයි, එයාව අල්ලන්න බැහැ, පෙනෙන්නේ නැහැ. ඒ වාගේම තමයි භාරයක් කියන්නෙත්. එයා භෞතිකව සිටින, ස්වාභාවික තැනැත්තෙක් - පුද්ගලයෙක් - නොවෙයි. එම නිසා එවැනි දේවල් පාවිච්චි කරමින් තිබෙනවා. ඒ සඳහා ඉඩකඩ වැඩි වෙලා තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකාය විසින් මේ තත්ත්වය අධ්‍යයනය කරලා නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිර්දේශ ඇතුළෙත් පැහැදිලිව කියනවා, භාරයන්ගේ තොරතුරු මේ සම්බන්ධව මැදිහත් වීම සිද්ධ කරන්නේ කොහොමද කියලා.

අපි එතැනට එන්න කලින් අපේ ආණ්ඩුව යටතේ 2025දී සමාගම් පනතටත් යම් සංශෝධනයක් ගෙනාවා. මොකද හේතුව, සමාගමක අයිතිකරු තවත් සමාගමක් වෙන්න පුළුවන්, තවත් සමාගමක් වෙන්න පුළුවන්. අවසාන හිමිකරු, අර්ථලාභියා කවුද කියන එක සමාජයෙන් සඟවා තියා ගන්න පුළුවන්. මුදල් විශුද්ධිකරණය වැනි අපරාධවලදී අපට වැදගත් වෙනවා, මේ අවසාන අර්ථලාභියා කවුද කියලා හොයා ගන්න එක. එම නිසා ඒ සංශෝධනයත් අපි ගෙනාවා. ඒ වාගේම මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පරමාර්ථයෙන් අපි අපරාධයකින් උත්පාදිත ධනය අත්පත් කර ගැනීම පිළිබඳ පනත් ගෙනාවා. අපි මෙවැනි කාරණාවලට මැදිහත් වෙන්නේ ඇයි? අපට අවශ්‍ය කරනවා, ජාතික වශයෙන් හැම කෙනාටම තමන්ගේ කටයුතු සිද්ධ කරමින් හොඳින් ජීවත් වෙන්න පුළුවන් සමාජයක් මේ රට තුළ හදන ගමන්ම, ජාත්‍යන්තර වශයෙනුත් ඉහළින් පිළිගන්න රාජ්‍යයක් බවට පරිවර්තනය කරන්න. එම නිසා අපි ජාත්‍යන්තර නීතිරීති, අණපනත් භාවිතයන්ට එකඟයි. අපි ඒවා සඳහා අනුකූලතාව දක්වනවා. ඒ අනුව ලබා දුන් නිර්දේශයක් ඉෂ්ට කර ගැනීම සඳහා තමයි මේ කටයුත්ත සිද්ධ කරන්නේ.

මෙහිදී විශේෂත්වය වෙන්නේ, අපි නිවැරදි කාර්යයක් කරනවා නම් භාරය සතුව තිබෙන තොරතුරු; මේ භාරය පටන් ගත්තේ කවුද, ඒ භාරයට අරමුදල් දෙන්නේ කවුද, භාරකරු කවුද, සම භාරකරුවන් ඉන්නවාද, ඒකේ අර්ථලාභීන් කවුද, එය කළමනාකරණය කරන්නේ කවුද කියන මේ තොරතුරු තබා ගැනීම, යම් පරීක්ෂණ කටයුත්තකට ඒ තොරතුරු ලබා දීම කිසිදු ගැටලුවක් වෙන්නේ නැහැ කියලා අපි කියනවා. මොකද, සාමාන්‍යයෙන් භාර පිළිබඳ කථාවේදී පුංචි භයක් හදනවා. කාගේ හරි අධ්‍යාපන කටයුත්තක්, වෙනත් කෙටි පරමාර්ථයක් වෙනුවෙන් පවුලක තිබෙන වත්කමක්, කණ්ඩායමක තිබෙන වත්කමක් සම්බන්ධව අනවශ්‍ය බියක් හදනවා, ඒවා කරන්න දෙන්නේ නැහැ කියලා. එහෙම එකක් නොවෙයි තිබෙන්නේ. අපි සද්භාවයෙන්, පරිත්‍යාගයෙන් සමාජයට වැඩක් කරනවා නම්, ඒ දරුවන් වෙනුවෙන් වැඩක් කරනවා නම් ඒ භාරයන් පිළිබඳව

තොරතුරු තබා ගන්න ඕනෑ වාගේම ඒ තොරතුරු ඉදිරිපත් කිරීමෙන්, ලබා දීමෙන් කිසිදු ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. ගැටලුවක් පැන නඟින්නේ ඒ තොරතුරු ඉදිරිපත් කරන්නේ නැත්නම් පමණයි. එම නිසා මේ සංශෝධනයේදී කරන්නේ, තොරතුරු වාර්තා කරලා තියා ගන්න, ඒ තොරතුරු යාවත්කාලීන කරන්න, ඒ තොරතුරු නිවැරදිව ඉදිරිපත් කරන්න වාගේම පරීක්ෂණ කරන ආයතනවලට නිසි පරිදි ඒ තොරතුරු ලබා ගැනීමේ බලතල ලබා දීමයි.

කලින් අවස්ථාවේදී ඒ තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබුණේ නැහැ. විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධ සහ වංචා, දූෂණවලදී හැම තැනින්ම තොරතුරු ලබා ගන්න ගියාම නීතිමය අඩුපාඩු තිබෙනවා නම් එක් ආයතනයකින් තව ආයතනයකට තොරතුරු ලබා ගන්න වෙන්නේ නැහැ. මේ පනතේ සංශෝධනය මඟින් අපේ නීතිපති දෙපාර්තමේන්තුව, රේගුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව වැනි පරීක්ෂණ පවත්වන කණ්ඩායම්වලට ගැටලුවකින් තොරව ඒ තොරතුරු භාවිත කරන්න පුළුවන්. ඒ තොරතුරු භාවිත කරලා අදාළ ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත් වෙන්න පුළුවන්. ඒ අනුව, මේ සංශෝධනය මුදල් විශුද්ධිකරණය වාගේම ත්‍රස්තවාදයට මුදල් සැපයීම අවහිර කිරීමේ කාරණා පැත්තෙන් ගත්තාම වඩාත්ම ප්‍රගතිශීලි පනත් සංශෝධනයක් කියලා අපි යෝජනා කරනවා.

මේ පනත් කෙටුම්පතෙන් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් කිහිපයක් තිබෙනවා. මේ තොරතුරුවල ප්‍රමාණාත්මකභාවය, නිවැරදිබව, යාවත්කාලීනභාවය වැදගත් වෙන්නේ තොරතුරු පවත්වාගෙන යාම තුළයි. එහෙම නැතිනම් සපයන තොරතුරුවලින් ඵලක් නැතිව යනවා. ඒ තොරතුරේ අදාළත්වය ඉහළින් පවත්වා ගැනීමට තමයි තොරතුරු පවත්වා ගැනීම අනිවාර්යය කරලා තිබෙන්නේ.

ඒ වාගේම භාර සම්බන්ධයෙන් ගත්තොත්, ඒ භාරයෙන් ප්‍රතිලාභ ලබන කණ්ඩායම්වලට අමතරව ඒ භාරයට සේවා සපයන අයත් ඉන්නවා. උදාහරණයක් විධියට ගත්තාම විගණකයින්, නීතිඥයන්, වෙනත් උපදේශකයින්, බදු උපදේශකයින් වාගේ විවිධාකාරයට සේවා සපයන අය ඉන්නවා. එම නිසා හැම තිස්සේම මේක ඇතුළේ ඉඩකඩක් නිර්මාණය වෙනවා, අන්න අර මුදල් විශුද්ධිකරණය සඳහා මෙවැනි ආයතන භාවිත කරන්න. එහෙම නම්, අන්න ඒ භාරයකට තොරතුරු සපයන, සේවා සපයන පුද්ගලයන් පිළිබඳවත් තොරතුරු තබා ගන්න ඕනෑ. ඒ වාගේම ඒ තොරතුරුවල යම් වෙනසක් සිදු වෙනවා නම් මේ තොරතුරු ලේඛනය - registry එක - යාවත්කාලීන කරන්න ඕනෑ. දැන් ලෝකය ඉතාම උපක්‍රමශීලියි. තාක්ෂණය භාවිත කරමින් පවතින නීතියෙන් රිංගලා යන්න පුළුවන්. "නිවැරැදි තොරතුරු පවත්වාගෙන යනවා. අපි භාරයක් පටන් ගත්තා. මෙන්න මේගොල්ලන් තමයි ප්‍රතිලාභීන්, මේගොල්ලන් තමයි සම්බන්ධ වෙලා ඉන්නේ" කියලා තොරතුරු පවත්වාගෙන යනවා. හැබැයි, මාසයක් විතර ගිහිල්ලා මේක වෙනස් කරන්න පුළුවන්. අපි මේ සංශෝධනයෙන් කියනවා, "ප්‍රායෝගික අවශ්‍යතාව අනුව ඒ තොරතුරු වෙනස් කරන්න පුළුවන්. හැබැයි, වෙනස් කරන තොරතුරු දවස් 14ක් ඇතුළත යාවත්කාලීන කරන්න ඕනෑ" කියලා. අන්න ඒ අනුව, හැම ආකාරයකින්ම මේක ශක්තිමත් කරලා තිබෙනවා, මුදල් විශුද්ධිකරණයට විරුද්ධව වැඩකටයුතු කිරීමට, මුදල් විශුද්ධිකරණයට එරෙහි වීමට සහ භාරයක් වැනි හොඳ පරමාර්ථයකින් භාවිත කරන්න පුළුවන් ඒකකයක් වැරැදි පරමාර්ථයක් වෙනුවෙන් භාවිත වීම වළක්වා ගැනීම සඳහා.

ඒ වාගේම විදේශීය භාරයන් සම්බන්ධයෙනුත් කටයුතු කරනවා. දේශීය භාරයන් විතරක් නොවෙයි, විදේශීය භාරයනුත් තිබෙනවා. විදේශීය භාරයන්ගේ ක්‍රියාකාරකම් ලංකාව ඇතුළේ සිදු වෙනවා. ඒවා මඟින් වඩාත් හොඳ කටයුතු රාශියක් සිදු වෙනවා. හැබැයි, දැනට තියෙන තත්ත්වයේදී, නීතිමය රාමුවක් ඇතුළේ මේ තොරතුරු අනිවාර්යයෙන් ලබාගැනීම, පරීක්ෂා කිරීම සහ මැදිහත් කිරීම සඳහා යම් සීමාසහිත තත්ත්වයන් පැනවිලා තිබෙනවා. ඒ සීමාවනුත් අපි ඉවත් කරලා මේ නීතිය යටතට ඒ විදේශීය භාරයනුත් ඇතුළත් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම බලධාරින්ට සහ පරීක්ෂණ කරන අයට මේ තොරතුරුවලට වේගයෙන් ළඟා වීමේ ඉඩකඩ මේ අනුව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම භාරකරුවන් සතුව තිබෙන තොරතුරු පවත්වාගෙන යෑම ඔවුන්ගේ වගකීමක් බවට පත් කරනවා. මොකද, භාරයක් යම්කිසි වැරදි කටයුත්තකට පාවිච්චි කළා නම්, ඒ භාරය අහෝසි කරලා තොරතුරු විනාශ කරන්න පුළුවන්. නමුත් මේ සංශෝධනය මඟින් අපි කියනවා, යම් භාරයක කටයුතු අවසන් වුණා නම්, ඒ භාරයේ කාර්යය අවසන් වුණත් අවුරුදු පහක් යනතුරු මේ තොරතුරු සුරක්ෂිතව තබාගත යුතුයි කියලා. ඒ වාගේම මේ සංශෝධනයට අනුව භාරය පිළිබඳව කරන කටයුතු, ඒ තොරතුරු පිළිබඳව අපට වසර පහෙන් පහට සමාලෝචනය කරලා, නිරීක්ෂණය කරලා -

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි. මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

මේ ආකාරයට සෑම පැත්තකින්ම මේක ශක්තිමත් කරලා තිබෙනවා කියන කාරණය තමයි මට අවධාරණය කරන්න ඕනෑ. ඒ නිසා මෙය හුදෙක්ම තනි පනතක සංශෝධනයක් හෝ නීතිමය කටයුත්තක් පමණක්ම නොවෙයි. මේ සංශෝධනය ගත්තාම, ඒ පනත් කෙටුම්පත පුංචි එකක්. ඒකේ කරුණු කාරණා පැත්තෙන් කිහිපයක් තිබුණත්, සමස්තයක් වශයෙන් ගත්තාම අපි ජීවත් වෙන සමාජය, ලෝකය සහ මේ තිබෙන සංකීර්ණතා සියල්ල පැත්තෙන් ගත්තාම මේ කරන ලද සංශෝධනය ඉතාම සුවිශේෂීයි. මුදල් විශුද්ධිකරණය පිටු දකින, ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිටු දකින, ජන සංහාරක අවි නිෂ්පාදනයට මුදල් ලබාදීම පිටු දකින, සංවිධානාත්මක අපරාධවලට ඉඩකඩ නිර්මාණය නොකරන, වඩාත් යහපත් සමාජයක් වෙනුවෙන් ගෙන එන ලද ක්‍රියාමාර්ගයක්. මම හිතනවා, ඒ අනුව ලංකාව ඇතුළේ ආයෝජකයන්ට වාගේම අනෙකුත් හැම කෙනෙකුටම, වඩාත් සාධාරණ පදනමින් වැඩ කරන හැම කෙනෙකුටම විශ්වාසය ගොඩනැඟෙනවා කියලා. ඒ නිසා යම් කෙනෙක් පුද්ගලයන්ගේ ප්‍රතිලාභ වෙනුවෙන් හෝ කණ්ඩායමක ප්‍රතිලාභ වෙනුවෙන් හෝ වෙනත් සමාජයීය ප්‍රතිලාභ වෙනුවෙන් පවත්වාගෙන යන, සුළු පවුල් ඒකක පදනම් කරගත් භාරයන් පිළිබඳව කිසිදු බියක්, සැකක් ඇති කරගත යුතු වන්නේ නැහැ. මේ තොරතුරු ලබාදීමත්, තොරතුරු පවත්වාගෙන යෑමත් තමයි අපට වැදගත් වෙන්නේ.

ඒ වාගේම ගෝලීය මූල්‍ය පද්ධතිය තුළ මේ රටේ කීර්ති නාමය ගොඩ නැඟෙන්නේ ඇත්තටම හෙමින් හෙමින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවුරුදු දෙක ඇතුළත අපි කරන ලද කාර්යයන්වලදී, ඉතා වෙහෙසෙන්, අභියෝග මැද, හිමින් හිමින් ගොඩ නඟාගත් ස්ථාවරත්වය තුළ ගෝලීය වශයෙනුත් අපේ රට ඇගැයීමට ලක් කරලා තිබෙනවා. අපි මේ ස්ථාවරත්වයන් ගොඩ නඟන්නේ, නීතියට අනුගත වෙමින් ප්‍රතිසංස්කරණ කරන්නේ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

හෙමින් හෙමින්. හැබැයි, ඒවා එක මොහොතකින්, තත්පරයකින් විනාශ වෙන්න පුළුවන්. අපි ඒ සඳහා ඉඩ නොතබමින් තමයි මේ අදාළ ප්‍රතිසංස්කරණ එකින් එක ගොඩ නඟමින් යහපත් සමාජයක් වෙනුවෙන් මැදිහත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණයත් කියලා මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මේ කාර්යය සඳහා ඇත්තටම වෙහෙස මහන්සි වෙලා වැඩකටයුතු කරපු කණ්ඩායම් ගණනාවක් ඉන්නවා. ඒ අතර අධිකරණ ඇමතිතුමා, ඒ වාගේම අධිකරණ අමාත්‍යාංශයේ නීති කෙටුම්පත් සම්පාදකතුමා, ගරු නීතිපතිතුමා ඇතුළු නිලධාරින් කණ්ඩායම, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් ඉතාම වෙහෙස මහන්සියෙන් මේ වැඩකටයුතු කළා. ඔවුන් වෙනුවෙන් ස්තුතිය පුද කරන ගමන්ම, ඔවුන් කරපු කාර්යයේ ප්‍රතිඵල අපට ඉක්මනින් ලැබෙයි කියලාත් බලාපොරොත්තු වෙනවා. මොකද, මේ ගෙනෙන ලද පනත් කෙටුම්පතෙන් ඇති වන බලපෑම ඇගයීමට ලක් වෙමින් තිබෙනවා. ලංකාවේ මුදල් විශුද්ධිකරණයට තිබෙන පසුබිම යනාදිය පිළිබඳව අධ්‍යයනයක් කරමින් මේ මොහොත වන විටත් ලංකාවේ mutual evaluation එක සිදු කරමින් තිබෙනවා. ඒක හෙට අවසාන වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ඒ evaluation එකේදීත් අප කිසිදු ආකාරයකට අළු ලැයිස්තුවට -grey list එකට - වැටෙන්නේ නැතිව හොඳ රටක් විධියට ඉදිරියට යන්න පුළුවන් හැකියාව සහිත හොඳ සහතික කිරීමක් අපට ලැබෙයි කියලා. ඒ සඳහා දායක වෙච්ච සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙනවා. මෙය අප ඉහළින් අගය කළ යුතු සංශෝධනයක් බව සඳහන් කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

தீர்மானிக்கப்பட்டது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. PRESIDING MEMBER in the Chair.]

1 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 10 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

පරිපූරක මුදල: ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නියමුවන් රහිත ගුවන් යානා පද්ධතියක් ස්ථාපිත කිරීම

குறைநிரப்புத் தொகை: இலங்கை விமானப்படைக்காக ஆளில்லா வானூர்தி முறைமையொன்றை நிறுவுதல்

SUPPLEMENTARY SUM: ESTABLISHMENT OF UNMANNED AERIAL VEHICLE SYSTEM FOR SRI LANKA AIR FORCE

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හාරදහස් දෙසිය හැට එකක් (රු. 4,261,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

ශීර්ෂය	**224**	- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
වැඩසටහන	**01**	- මෙහෙයුම් වැඩසටහන

මූලධන වියදම්	රු. 4,261,000,000
මුළු වියදම	**රු. 4,261,000,000**

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මුජීබුර් රහුමාන් මහතා.

පූනකරි ප්‍රදේශයේ සූර්ය පැනල බලාගාරයක් ඉදි කිරීම සඳහා පෞද්ගලික සමාගමකට ආයෝජන අවස්ථාව ලබා දීමේ ගැටලු
பூநகரியில் சூரிய மின்னுற்பத்தி நிலையத்தை அமைப்பதற்கு தனியார் நிறுவனத்துக்கு முதலீட்டு வாய்ப்பை வழங்குவதிலுள்ள சிக்கல்கள்
ISSUES IN GRANTING INVESTMENT OPPORTUNITY TO A PRIVATE COMPANY FOR BUILDING A SOLA POWER PLANT IN POONAKARY

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනව:

"පූනකරි ප්‍රදේශයේ අක්කර 1200ක ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක් වටිනා සූර්ය පැනල බලාගාරයක් ඉදිකිරීම සඳහා රජය විසින් "සන්පවර් සිස්ටම්ස්" (පුද්ගලික) සමාගමට ආයෝජන අවස්ථාවක් ලබාදී තිබූ නමුත්, එම සමාගම බංකොලොත් වී එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් "යුනයිටඩ් සෝලා" නමින් නව සමාගමක් පිහිටුවා කටයුතු කරගෙන යන බවට වාර්තා වන බැවින්,

මෙම තත්ත්වය තුළ,

- රජයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්තිය උල්ලංඝනය වී ඇති බවත්,
- සුපිළිපන් විනිවිද රාජ්‍ය පාලනය (යහපාලනය) උල්ලංඝනය වී ඇති බවත්,
- සේවකයන්ගේ වරප්‍රසාද හා අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්,
- මෙවැනි ආයෝජන අවස්ථා හරහා සැක සහිත ගනුදෙනු සිදුවන බවත්,
- සුදුසු ආයෝජකයන් හඳුනා ගැනීමට රජය අසමත්ව ඇති බවත්,
- රටේ බලශක්ති සුරක්ෂිතතාව අනතුරේ හෙළා ඇති බවත් මෙම සභාවට හැඟී යනු ඇත.

එබැවින්, මෙම ආයෝජන අවස්ථාව ප්‍රදානය කළ ක්‍රියාපටිපාටිය පිළිබඳ ස්වාධීන විමර්ශනයක් පැවැත්වීමට ද, එවැනි ආයෝජනයක් පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලියක් කෙසේ කළ යුතු ද, මතුව ඇති තත්ත්වය පිළිබඳව ගරු සභාව දැනුවත් කිරීමට ද, ඉදිරි ආයෝජන ප්‍රදානයන් සඳහා විනිවිදභාවයෙන් යුත් නිර්ණායක ස්ථාපිත කිරීමට ද රජය කටයුතු කළ යුතු බව මෙම ගරු සභාව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපි සියලු දෙනාම දන්නවා, අපේ රටේ බලශක්ති ප්‍රශ්නයට විසඳුමක් හැටියට අලුත් රජය විතරක් නොව, මීට කලින් පැවැති රජයන් පවා සූර්ය පැනල - solar panel - බලාගාර ඉදි කරන්න ඕනෑ කියන අදහස දැරූ බව; ඒ සම්බන්ධව දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කර තිබෙන බව; අවශ්‍ය තීන්දු තීරණ ද ගෙන තිබෙන බව සහ ඒ සඳහා ආයෝජනයන් ද පැමිණ තිබෙන බව. ඒ වාගේම, එම ආයෝජන අතර සමහර ඒවා ඉතාම දූෂිත ගනුදෙනු බව අපි දැක්කා. ඒ සමහර ආයෝජන තිබෙනවා, සමාගම් ඉඩ කඩම් ලබාගෙන තුන්වන පාර්ශ්වයට එම ආයෝජන ලබා දෙන්න උත්සාහ කරන. එහෙම තුන්වන පාර්ශ්වයට ආයෝජන ලබා දෙන්න උත්සාහ කරන ගමන් ඔවුන් ඒ ඒ සමාගම්වලින් කොමිස් මුදල් ලබා ගන්නත් යම් යම් ක්‍රියා සිදු කර තිබෙන බව වාර්තා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2023 Sunpower Systems (Pvt.) Limited කියන සූර්ය පැනල බලාගාරය කිලිනොච්චියේ පුනකරි ප්‍රදේශයේ ගොඩනැගීම ඉලක්ක කරගෙන, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක ව්‍යාපෘතියක් ගෙන එන්න තමයි එම ඉඩම් ප්‍රමාණය වෙන් කර ගත්තේ. නමුත් 2023 ඉඳන් අද වනකල් ඒ ව්‍යාපෘතියේ කිසිදු ආකාරයේ වැඩ කටයුත්තක් ආරම්භ කර හෝ එහෙම නැත්නම් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාදාමයන් ගත්තු බවක් හෝ අපට පෙනෙන්නේ නැහැ. විශේෂයෙන්ම මේ ගැන සොයා බලන කොට අපට පෙනෙනවා, එම සමාගම දැන් United Solar Systems කියලා සමාගමකුත් ලියාපදිංචි කර තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම සමාගම් දිහා බලන කොට අපට පෙනෙනවා, විශේෂයෙන්ම එම සමාගම් පසුගිය කාලය පුරාම ඒවායේ සේවය කළ සේවකයන්ගේ EPF, ETF ගෙවීම් පැහැර හැර තිබෙන බව. ඒ නිසාම කොළඹ කොටුව මහෙස්ත්‍රාත් උසාවියේ ඒ සමාගම් සේවකයන්ගේ EPF, ETF ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නඩු 4ක් විතර පවතින බව ද වාර්තා වෙනවා. විශේෂයෙන්ම මෙවැනි අයුතු සමාගම් සියල්ල නියෝජනය කරන්නේ එකම අධ්‍යක්ෂවරුන් පිරිසක්. Sunpower Systems (Pvt) Ltd බංකොලොත් වනකොට, United Solar Systems කියන සමාගම හදා ගන්නවා. ඊළඟට, Sunpower Constructions (Pvt.) Limited කියලා එකක් හදා ගන්නවා. ඊළඟට, Colombo Consultant කියලා එකක් හදා ගන්නවා. ඒ සමාගම් සියල්ලේම ලිපිනයන් දිහා බැලුවාම පෙනෙනවා, ඒවා එකම ගොඩනැඟිල්ලක, එකම ස්ථානයක ලියාපදිංචි වෙලා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

තිබෙන බව. එකම පුද්ගලයන් තමයි ඒවායේ අධ්‍යක්ෂවරුන් හැටියට පත් වෙලා ඉන්නේ. ඉතින් කලින් පැවැති රජය යටතේ කොහොම හරි උත්සාහ කරලා, යම් යම් දේශපාලන සම්බන්ධකම් පාවිච්චි කරමින් ඒ ව්‍යාපෘතිය අරගෙන තිබෙනවා. දැන් එය තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, දැන් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එක්කෝ ඒ ව්‍යාපෘතිය අවලංගු කරන්න ඕනෑ. අවලංගු කරලා නැවත විනිවිදභාවයකින් ඒ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් කැඳවීමක් හරහා ජාත්‍යන්තර මට්ටමේ තත්ත්වයකට ඒ ව්‍යාපෘති ගෙන යන්න ඕනෑ. මොකද, මේ වනකොට එම ව්‍යාපෘතිවලට ලබා දීපු කාලය ඉකුත් වෙලා තිබෙනවා. ඒ ඉකුත් වෙච්ච කාලය නැවත දීර්ඝ කර ඔවුන්ට ලබා දීම හරහා දැන් එම ව්‍යාපෘතිවල තිබෙන වටිනාකම, ඒ වාගේම එම ව්‍යාපෘතිවල තිබෙන විශ්වාසවන්ත බව අඩු වී ඇති බව, ඒ වාගේම එම ව්‍යාපෘතිවලට ජාත්‍යන්තර ආයෝජකයන්ගේ පැමිණීම පවා ඉතාම සැකසහිත කාරණාවක් හැටියට මතු වෙලා තිබෙන බව පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

ඒ පළමු ව්‍යාපෘතිය ලබා ගන්නා සමාගම බංකොලොත් වුණාට පසුව තවත් සමාගමක් ඒ සම්බන්ධව register වෙනවා. එකම අධ්‍යක්ෂවරු. ඊළඟට, තුන්වෙනි පාර්ශ්වයට එම ව්‍යාපෘති ලබා දෙන්න ඩොලර් මිලියන 100ක වාගේ මුදල් ඔවුන් ඉල්ලා සිටිනවා. ඉතින් මා හිතන්නේ, එවැනි විශාල ව්‍යාපෘති එහෙම ගෙන යන්න දෙන්න බැහැ. ඒ හින්දා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, එම ව්‍යාපෘති සම්බන්ධව නිසි විමර්ශනයක් කරන්න කියලා. ඒ වාගේම එවැනි ව්‍යාපෘති ඉදිරියේදී ලබා දීම ජාත්‍යන්තර මට්ටමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් මත කරන්න කියන යෝජනාව මම මේ සභාවට ඉදිරිපත් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.30]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා. ඒ වාගේම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙවන් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව.

විශේෂයෙන්ම ආයෝජන ලබා දීමේදී එම සමාගම් පිළිබඳව නිසි විමර්ශනයක් කර නිර්ණායක සකස් කිරීම වාගේම, ආයෝජන ලබා දීමෙන් පසුවත් එම ක්‍රියාපටිපාටිය පිළිබඳව සමාලෝචනය කිරීම ද අත්‍යවශ්‍ය කාරණාවක්. එතුමා මහජන නියෝජිතයෙක් විධියට ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මෙවැනි ආයෝජනවලදී ටෙන්ඩර් පටිපාටිය නිසියාකාරව ක්‍රියාත්මක කරනවාද කියන කාරණයත් අපි සලකා බැලිය යුතුයි. 2023 අවුරුද්දේ තමයි එම සමාගමත් සමඟ අදාළ එකඟතාවලට ඇවිල්ලා තිබෙන්නේ. ඒ අවස්ථාවේදී නිසි ක්‍රමවේද, ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරලා නැහැ. හැබැයි, යම්කිසි සමාගමක් සමඟ නැවත මෙවන් ගිවිසුමකට එළඹීමේදී අදාළ ටෙන්ඩර් පටිපාටිය හරියාකාරව ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණය අපි විශේෂයෙන් මතක් කරනවා.

මේ, පුනර්ජනනීය බලශක්තිය පිළිබඳව විශාල කථාබහක් ඇති වෙලා තිබෙන වෙලාවක්. විශේෂයෙන්ම 2020 වසරේ සිට ලංකාව තුළ වහල මත සවිකරන සූර්ය පැනලවලින් විදුලිය ලබා ගැනීමේ කටයුත්ත ප්‍රශස්ත මට්ටමට ඇවිල්ලා තිබෙනවා. 2020 වසරේ තිබුණේ මෙගාවොට් 338ක ධාරිතාවක්. 2025 සැප්තැම්බර් වන විට මෙගාවොට් 2,090 දක්වා එය වර්ධනය වෙලා තිබෙනවා. නමුත්, වහල මත සූර්ය පැනල සවි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව, විශේෂයෙන්ම ඒ සැලසුම් පිළිබඳව ජනතාව අධෛර්යට පත් කිරීමේ ක්‍රියාවලියක් සිද්ධ වෙනවාද කියන කාරණයත් අපට දැනගන්න අවශ්‍යයි. මොකද, සැප්තැම්බර් වෙද්දී පසුගිය කාලවල එළැඹුණු කොන්දේසි වෙනස් කර තිබෙනවා. විශේෂයෙන්ම Net Metering ක්‍රමය වෙනුවට Net Plus ක්‍රමය ඇති කරලා තිබෙනවා. ඒ නිසා මහ ජනයාගේ මුදල් වංචාවලට ලක් නොකර, ඩීසල් බලාගාරවලට විශාල ලෙස ඇදී යන්න ඉඩ නොදී, ගල්අඟුරු වංචාවලට ඉඩ සලසන්නේ නැතුව වහල මත සූර්ය පැනල සවිකර බලශක්තිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ධෛර්යවත් කරන්න යම් යම් කටයුතු සිදුවෙනවාද කියන කාරණයත් මම අහනවා.

මේ, 2030 පමණ වන විට සියයට 100ක්ම පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය ලබා ගැනීමට සූදානම් වන රටක්. එම නිසා අපි විශේෂයෙන්ම ආණ්ඩුවට මතක් කරනවා, solar පද්ධති වහල මත සවිකර විදුලිය ලබා ගැනීමේ කටයුත්ත අධෛර්යවත් කිරීමට කටයුතු කරන්නේ නැතුව එම ක්‍රියාවලියට අවශ්‍ය මුදල් යොදවලා, බැටරි ගබඩා පද්ධතිය හරියාකාරව යාවත්කාලීන කරලා, මෙය ධෛර්යවත් කරන්නට අවශ්‍ය ක්‍රියාමාර්ග යොදන්න කියලා. වහල මත සවිකරන සූර්ය පැනල සඳහා බදු පනවා තිබුණේ නැහැ. දැන් අපට දැන ගන්න ලැබී තිබෙනවා, ඒ සඳහා සියයට 45ක බදු සීමාවක් පනවා තිබෙනවා කියලා. ඒ වාගේම තමයි සමාගම් සඳහා බදු නිදහස් කිරීමක් කරලා තිබෙනවා. ඒ නිසා අපි බලශක්ති ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා, වහල මත සූර්ය පැනල සවිකර බලශක්තිය ලබා ගැනීමේ කටයුත්ත මීට වඩා ධෛර්යවත් කිරීමට වැඩකටයුතු කරන්න කියලා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.35]

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව තුළ සාධනීය කාරණා තිබෙනවා. පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරන රජයක්

වන අපට මේ යෝජනාව බැලුව ගමන් තේරෙනවා, පසුගිය රජය විසින් දූෂිත වැඩක් කර තිබෙනවාය කියලා. පසුගිය රජය මඟින් තමයි මෙය EoI - Expression of Interest - projects යටතේ ප්‍රදානය කර තිබෙන්නේ. ගොඩක් වෙලාවට මන්ත්‍රීතුමාගේ කටින්ම කියැවුණා, ඒ ප්‍රදානය කිරීම නිසි ක්‍රියාපටිපාටියෙන් තොරව තමයි සිදු වෙලා තිබෙන්නේ කියලා. දේශපාලන හිතවත්කම් ද සමහර තැන්වල තිබුණා කියන කතන්දරය එතුමාගේ මුහුණෙනුත් පෙනුණා. ඒවා එහෙම තමයි.

ඒ කෙසේ වෙතත්, අපේ ආණ්ඩුව බැලුවේ, කොහොමත් අපි investorsලා අධෛර්යවත් කරන්න හොඳ නැහැ කියලා. Investorsලා ආවා නම්, අපි ඔවුන්ට තිබෙන ගැටලු විසඳා දෙන්න ඕනෑ. නමුත්, ඇත්තටම එම ආයෝජන අවස්ථාව ටෙන්ඩර් පටිපාටිය අනුව නොවෙයි නේ කෙරිලා තිබෙන්නේ. නමුත්, ඒ කාරණාව තුළ වුණත් රජය වශයෙන් බැලුවේ, ඒ ගැටලුව විසඳන්නයි. ඒක විසඳන්න යනකොට නොයෙකුත් ගැටලු මතු වෙනවා. අවසානයේදී ඒ ගැටලුව හිර වෙලා තිබෙන්නේ, ඒකට අධිකරණ ක්‍රියාවලියක් සිද්ධ වෙලා තිබෙන නිසා. ඒ කියන්නේ, නඩුවක් තිබෙනවා. ඒ නඩුවත් එක්ක තමයි මේ ප්‍රශ්නය එන්නේ. එහෙම නැත්නම් රජය පැත්තෙන් ඒකට Cabinet approval අරගෙන, ඊට පස්සේ ඒකට සූදානම් අයට, energy permits නැති අයට energy permits දීලා කරන්න තමයි කරන්න උත්සාහ ගත්තේ. මොකද, පුනර්ජනනීය බලශක්තියට සෙතක් වෙන නිසා. නමුත්, ඒ නඩුව නිසා මේ ක්‍රියාමාර්ගය ඉස්සරහට යන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම නොයෙකුත් ආකාරයෙන් වෙච්ච දූෂිත ක්‍රියා ඒ ආයෝජන අවස්ථාව ඇතුළේත් තිබෙනවා කියන එක පැහැදිලිව පෙනෙනවා.

ඔබතුමන්ලා දන්නවා, දැන් තිබෙන්නේ පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කරන රජයක් නොවෙයි කියලා. පසුගිය කාලයේ රටේ තිබුණු සුළං බලාගාරවල ඒකකයකට ගෙවීවාට වඩා භාගයකටත් වඩා අඩුවෙන් තමයි මේ රජය යටතේ ප්‍රදානය කළේ. ඒවා අහෝසි කරමින් ඊට වඩා පැහැදිලිව වැඩේ වෙනවා. ඒ වාගේම මේ යෝජනාව ස්ථිර කරපු මන්ත්‍රීතුමාගෙන් කියැවුණා, මේවා අධෛර්යවත් වෙනවා වාගේ කථාවක්. කිසිසේත්ම නැහැ. දවල් කාලයේ ලැබෙන සූර්ය විදුලිය ගන්න පුළුවන් සීමාවක් තිබෙනවා. එම විදුලිය රාත්‍රී කාලයේ ප්‍රයෝජනයට ගත්තොත් තමයි, ඩීසල් බලාගාර සඳහා හදිසි මිලදී ගැනීම් වළක්වන්න පුළුවන් වෙන්නේ. නමුත්, එම ක්‍රියාමාර්ග අතීතයේ අරගෙන තිබුණේ නැහැ නේ. ඒක පටන් ගත්තේ අපේ ආණ්ඩුවෙන්. දැනට 40 MWh බැටරි 16ක් යනවා. ඊට පස්සේ 150 MWh Battery Energy Storage System එකක් එනවා. ඒවා හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම 100 MWh බැටරිවලට import duty එක සම්පූර්ණයෙන්ම ඉවත් කරලා තිබෙනවා. මම හිතන්නේ ඉදිරියේදී ඊට වඩා අඩු capacity එකක් තිබෙන බැටරි සඳහාත් සලකා බලමින් යනවා. එම නිසා පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කළා කියන කථාව කිසිසේත්ම පිළිගන්න බැහැ.

අනෙක් එක තමයි, rooftop solar ඇතුළු solarවලින් සියයට 50කට වඩා අපේ ආණ්ඩුවෙන් තමයි පද්ධතියට එකතු කළේ. ඒ කියන්නේ, අනෙක් ආණ්ඩුවලින් අවුරුදු ගණනාවක් තිස්සේ භාගයක් කරනකොට, භාගයකට වඩා කළේ මේ අවුරුදු දෙකේ. ඒ නිසා අපට එහෙම ප්‍රකාශ කිසිසේත්ම පිළිගන්න බැහැ. දැන් හැමදේම ටෙන්ඩර් පටිපාටිය අනුව විනිවිදභාවයෙන් වෙනවා. ඒ නිසා EOI වාගේ ගොඩක් වෙනස්කම් තිබෙන දේවල්වලට, අපට සැක-සංකා තිබෙන දේවල්වලට මේ රජය අත තියන්නේ නැහැ. ඒ වාගේම අපි දන්නවා, පසුගිය කාලයේ කොච්චර solarවලට ගියත්, අවුරුදු 20කට ගිවිසුම් ගැහුවා, ඒකකයට රුපියල් 37 ගණනේ. නමුත්, අවුරුදු 20ක් යනකොට මේ තත්ත්ව වෙනස්. දැනටත් තත්ත්වය වෙනස්. මොකද, solar panelsවල මිල අඩු වෙලා තිබෙනවා. ඩොලරයේ අගය වෙනස් වෙලා තිබෙනවා. ඒ කිසිම දෙයක් ගැන හිතන්නේ නැතුව පසුගිය කාලයේ අදූරදර්ශීව කටයුතු කළා.

ඒ වාගේම තමයි, සූර්ය බල සංග්‍රාම තිබුණාට ඒවා රාත්‍රී කාලයට යොදා ගන්න වැඩ කරලා තිබුණේ නැහැ. දැන් තමයි ජල බැටරි ගැන හිතන්නේ. ඒ වාගේම පුනර්ජනනීය බලශක්තිය ගත්තාම, floating solar power plant එක රටේ යථාර්ථයක් බවට පත් කළා. ඉස්සරහට canal-top solar power ගැන හිතලා තිබෙනවා. ඒ සියලු කාරණා වෙනවා. අතීතයේ ඒ කිසිවක් වුණේ නැහැ. LNG බලාගාර හැදුවා, LNG නැහැ. ඉතින් ඒක තමයි සිද්ධ වුණේ. ඒක නිසා මේ තුළ අපට කියන්න තිබෙන දේ තමයි, මේ යෝජනාව ඇත්තටම හොඳයි. අපි කොහොමත් ආයෝජකයන් අධෛර්යවත් කරන්නේ නැහැ. සූර්ය පැනල බලාගාරය සම්බන්ධයෙන් රජය ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගනිමින් සිටියා. 2026.06.02වැනි දා නීතිපතිවරයාට ලියුමක් යවලා තිබෙනවා, මේකට අදාළ නීති උපදෙස් දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව පොඩි කාලයක් ලබා දෙන්න.

ඒ සඳහා නීති උපදෙස් ඉල්ලා තිබෙන්නේ, එය ඉතාම ශුභවාදී පැත්තට ගන්න. ඒ නිසා අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙයයි. ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ මුලින්ම තිබෙන සමාගමෙන් ආයෝජන අවස්ථාව වෙනත් සමාගමකට දෙනවා කියන කාරණය සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයක්.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.39]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි.

අපේ සජබයේ මන්ත්‍රී, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා අද සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආපු යෝජනාව ගැන විනාඩි 3ක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. හරියටම අවුරුදු එකහමාරකට කලින් මේක ගැන මම documents ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ සම්පූර්ණයෙන්ම submit කරලා තිබෙනවා. United Solar Electrical (Pvt) Limited එකේ Board එකේ documents submit කරලා තිබෙනවා. ඊට පස්සේ කලින් හිටපු Board එකේ documents submit කරලා තිබෙනවා. ඊට පස්සේ ඒක ගැන මම පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා. අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

ඒ විස්තර ටික කියලා තිබෙනවා. ඊට පස්සේ මොකක්ද වුණේ දන්නවාද? මට කිව්වා, CID එකට එන්න කියලා. ඒක තමයි මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න බැරි කේස් එක. මොකක් හරි එකක් ගැන ඇවිල්ලා ඔත්තුවක් දුන්නාම, CID එකට එන්න එන්න කියනවා.

ජනාධිපතිතුමා කිව්වා, අපිට රහස් ඔත්තුවක් ගෙනැත් දෙන්න කියලා. මම ඒ රහස් ඔත්තුව පොඩ්ඩක් මෙතැනට ගෙනැල්ලා දුන්නාට පස්සේ කිව්වා, ඔබතුමා එන්න CID එකට කියලා. මම කිව්වා, "ඒක මම පාර්ලිමේන්තුව ඇතුළේ කරපු කථාව නේ" කියලා. නැහැ, නැහැ, ඔබතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එන්න කිව්වා. මම කිව්වා, "කොයි එකකටවත් මම එන්නේ නැහැ. මෙච්චරයි මට ඔත්තුවක් දෙන්න පුළුවන්. ආයෙත් කිසිම දෙයක් කියන්නේ නැහැ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු එකහමාරකට කලින් මම සම්පූර්ණ documents පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ යෝජනාව පූනකරි DCC එකෙන් සම්මත කරලා, සල්ලි අරගෙන පුතාගේ account එකට සල්ලි දාලා පුතා දැන් රට. පුතා දැන් රට. ඒක කිව්වා කියලා මම දැන් යන්න ඕනෑ, CID එකටයි, වංචා හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමටයි. ඒක තමයි වෙන්නේ. අපේ ජනාධිපතිතුමාගේ වැඩ. මොනවා හෝ රහස් ඔත්තුවක් ගෙනැත් දෙන්නලු. මම දැන් කරන්න ඕනෑ, ජනාධිපතිතුමාගේ කනට ළං වෙලා කියන එක. එහෙම කරන්න බැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේක විතරක් නොවෙයි. උතුරේ තිබුණු මාර වංචා පහක්-හයක් ගැන විස්තර ගෙනැත් දුන්නා, මෙතුමන්ලාට. මෙතුමන්ලා කළේ මොකක්ද දන්නවාද? ඔක්කෝම ටික වැහුවා. ඒගොල්ලන් ළඟට ගෙන්නුවා. ඒගොල්ලන් වැඩිපුර ටිකක් අල්ලා ගත්තා. අන්න පැලවත්තේ account එකට දැම්මා. ඉවරයි, වැඩේ. ඊට පස්සේ ඒක කියපු එකට මම යන්න ඕනෑ, CID එකටයි, CIABOC එකටයි. මාර රටක් තිබෙන්නේ. මේ රට ඇතුළේ තිබෙන ලොකුම ප්‍රශ්නය මොකක්ද ?ඇවිල්ලා වාඩිවෙලා ඉන්නවා, 159ක්. මම මේක කලිනුත් කථාවක කියලා තිබෙනවා. මෝඩයෝ එක්කෙනෙක් නම් එක මෝඩයා, දෙදෙනෙක් නම් මෝඩයෝ දෙදෙනායි. හැබැයි, 159ක් නම් ඒක තමයි JVP ආණ්ඩුව. මම නිකම් කිව්වේ.

මේවා ගැන ඔත්තුව ගෙනැත් දුන්නාට පස්සේත්, මේවා ගැන කිව්වාට පස්සේත් මම CID යන්න ඕනෑ නම්, කවුද මේ පාර්ලිමේන්තුවේ මේගොල්ලන්ට රහස් ඔත්තු දෙන්නේ? ඒකට කලින් හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ගේ සම්බන්ධයක් තිබෙනවා කියලා ඒකේ කියනවා. ඒකේ WhatsApp recordings ඔක්කෝම ටික screen record කරලා මගේ ළඟ තිබෙනවා. හැබැයි, මම CIABOC එකට එන්නේත් නැහැ, CID එකට එන්නේත් නැහැ, එන්නේත් නැහැ. ගියාම වෙන්නේ, මේක කොහොමද කිව්වේ කියලා මට defamatory නඩු වැටෙන එක. එතකොට මම defamatory නඩුවට ගිහිල්ලා මේවා ඔප්පු කරන්න ඕනෑ. අනේ CID එකේ වැඩ ටිකත් මම කරන්න ඕනෑද, CIABOC එකේ වැඩ ටිකත් මම කරන්න ඕනෑද? දැන් මම අත් දෙක එකට ගැහුවා කියලා ඒකටත් නඩු වැටෙයි. ඒ නිසා මම අත් දෙක පිටුපසින් තබාගෙන ඉන්නම්.

මම මේක කියන්නේ රටටම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කිසිම දෙයක් මේ රජයට ගිහින් කියන්න බැහැ. ඔය ඉලංකුමාරන් මන්ත්‍රීතුමා ඉන්නවා, එයා දන්නවා මේක. එයා තමයි මට ඇවිල්ලා කිව්වේ පාර්ලිමේන්තුවේ මේක කථා කරන්න කියලා. අන්තිමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

තිබෙන්නේ. මම මේක කථා කරපු නිසා මට CID එකට යන්න වෙනවා. බලන්නකෝ, අද උතුරේ තිබෙන හැම project එකකින්ම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

සියයට 15ක්, 20ක් ගන්නවා. හැබැයි, අපි ඒවා කියන්න ගියාම වෙන්නේ මොකක්ද? මේගොල්ලන් කරන්නේ අපිට නඩුවක් දමන එක. අපිට නඩුවක් දාලා; පොලීසිය නඩුවක් දාලා අපිව හිර කරනවා.

ගරු කේ. ඉලංකුමාරන් මහතා
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
Madam Chair, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පරයක් ඉන්න, මම කථාව ඉවර කරනකම්.

ගරු කේ. ඉලංකුමාරන් මහතා
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கூத்தாடிகளுக்கு என்ன கதைப்பது என்றே தெரியாது. பொய்யான தகவல்களை இந்த இடத்தில் பரப்ப வேண்டாம். நான் எந்த வகையிலும் இந்தத் தகவல்களை உங்களுக்குத் தெரிவிக்கவில்லை. தமிழரசுக் கட்சியில் இருப்பவர்கள்தான் - சட்டத்தரணி ஒருவர் - அந்த தகவலைத் தந்ததாக அன்று நீங்கள் பாராளுமன்றத்தில் கூறினீர்கள்.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මට කථාව ඉවර කරන්න දෙන්න. අනේ, මගේ කථාව ඉවර කරන්න දෙන්න. කොහේ හරි ගිහිල්ලා පොඩ්ඩක් හරි සිංහල ඉගෙන ගන්න කියන්න. මම කියපු දේ වෙනස් නේ. මෙතුමාට ඒක තේරෙන්නේ නැහැ වාගේ. මට තව තත්පර 10ක් දෙන්න.

මේ ගැන මම අවුරුදු එකහමාරකට කලින් කථා කර තිබෙනවා. මේ ගැන ඕනෑ කරන රහස් ඔත්තු ටික දීලා තිබෙනවා. අන්තිමට මට මේගොල්ලන්ගේ පැලවත්තට ගිහිල්ලා තමයි මේක දෙන්න වෙන්නේ. ඒක කරන්න බැහැ.

මම මේ යෝජනාව සාර්ථක එකක් විධියට පිළිගන්නවා. බොහොම ස්තුතියි, මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[ප.ප. 5.44]

ගරු කේ. ඉලංකුමාරන් මහතා
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ முஜிபுர் ரஹுமான் அவர்களால் கொண்டுவரப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணை தொடர்பாக உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். அதேநேரம், வட பகுதியில் பூநகரி பிரதேசத்தில் இவ்வாறான பிரச்சினை ஒன்று இருக்கின்றது என்பதை இங்கு கொண்டு வந்ததற்கு அவருக்கு நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது அரசாங்கம் பொறுப்பேற்ற காலம் தொடக்கம் புதுப்பிக்கத்தக்க எரிசக்தி தொடர்பாக மிகுந்த கரிசனையுடன் நாங்கள் செயற்பட்டுக்கொண்டு இருக்கின்றோம். 2030ஆம் ஆண்டுக்குள் இலங்கையின் மொத்த மின்னுற்பத்தியில் 70 சதவீதத்தை புதுப்பிக்கத்தக்க எரிசக்தி வளங்கள்மூலம் பெற்றுக்கொள்ளும் இலக்கை அடையும் நோக்குடன் எமது அரசாங்கம் பயணத்தை மேற்கொண்டு வருகின்றது. அதற்கான அமைச்சரவை அங்கீகாரம் 2026ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 02ஆம் திகதி கிடைத்திருக்கிறது. அந்த வகையில், வடக்கு மாகாணத்தை புதுப்பிக்கத்தக்க எரிசக்திக்கு உகந்த பிரதேசமாக இனங்கண்டு இருக்கின்றோம். யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், முல்லைத்தீவு போன்ற பிரதேசங்களில் சூரிய ஒளியின் ஊடாக அதிகளவு மின்சாரத்தைப் பெறக்கூடிய சந்தர்ப்பம் இருக்கின்றது. ஆனால், துரதிருஷ்டம் என்னவென்றால், grid connection உடன் இணைக்க முடியாததால் மின்சாரத்தைக் கொண்டுசெல்வதற்கான வலையமைப்பு போதுமானதாக இல்லை.

இன்று மின்சார சபையுடன் இணைந்து சூரிய மின்கலங்களைப் பொருத்துவதற்காக யாழ்ப்பாணம் உட்பட வடபகுதியில் பெரும்பாலானோர் விண்ணப்பங்களை வழங்கியுள்ளனர். ஆனால், அதற்கான grid connection போதுமானதாக இல்லை. இது தொடர்பில் அரசாங்கம் துரிதமாக நடவடிக்கை எடுக்க வேண்டும். பகலில் solarமூலம் உற்பத்தி செய்யப்படும் மின்சாரத்தை solar power bankஇல் சேமித்து, இரவில் விநியோகிப்பதற்கான நடவடிக்கைகளை முன்னெடுத்து இருக்கின்றோம். அதைவிட, அதிகளவு மின்சாரத்தை உற்பத்தி செய்யக்கூடிய பிரதேசம் என்ற வகையில், வடக்கில் இருக்கின்ற grid connectionஐ மேலும் அதிகரிப்பதற்கான நடவடிக்கைகளை எடுத்துக்கொண்டு இருக்கின்றோம். அதனூடாக, எதிர்வரும் காலங்களில் வட மாகாணம் solarமூலம் மின்சாரத்தை உற்பத்தி செய்யக்கூடிய பிரதேசமாக மாறும் என்பதில் திடமான நம்பிக்கை இருக்கின்றது.

எமது அரசாங்கத்தைப் பொறுத்தவரைக்கும், இலங்கையில் மின்சார ரயிலைக்கூட கொண்டுவருவதற்கு நாங்கள் திட்டமிட்டு இருக்கின்றோம். மின்சாரம் என்பது அத்தியாவசிய மானது. இன்று நாங்கள் நிலக்கரி ஊடாக மின்சாரத்தை உற்பத்தி செய்கின்றோம். அதேநேரம் எரிபொருள் ஊடாகவும் மின்சாரத்தை உற்பத்தி செய்கின்றோம். இதனால் அதிகளவான டொலர்கள் வெளிநாடுகளுக்குச் செல்கின்றன. 2030ஆம் ஆண்டளவில் 70 சதவீதமான மின்சாரத் தேவையை புதுப்பிக்கத்தக்க எரிசக்தி ஊடாகப் பெறுவதே எமது அரசாங்கத்தின் இலக்காகும். வட மாகாணத்தில் அந்த இலக்கை அடைவதற்காக grid connectionஐ அதிகரிப் பதற்குத் தீர்மானித்து இருக்கின்றோம். வட மாகாணத்தில் பெரும் பாலான பிரதேசங்களில் வாழும் தமிழ் மக்களுக்கு வருமானத்தை ஈட்டக்கூடிய ஒரு துறையாக இது மாறும் என்பதில் திடமான நம்பிக்கை இருக்கின்றது. பலர் இன்று அதில் முதலீடு செய்வதற்கு ஆயத்தமாக இருக்கின்றார்கள். முன்னைய அரசாங்கங்களால் பூநகரிப் பிரதேசத்தில் திட்ட மிடப்பட்ட ஒரு செயற்றிட்டம்தான் தற்போது நடைமுறைக்குக் கொண்டுவரப்பட்டுள்ளது. அன்றைய காலகட்டத்தில் சட்டத்துக்கு முரணாகவும் வெளிப்படைத் தன்மை இல்லாமலும் சில செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டதன் விளைவாக இன்று நாங்கள் சிரமங்களுக்கு முகங்கொடுத்துக்கொண்டு இருக்கின்றோம். மேலும், எதிர்வரும் காலத்தில் வட மாகாணத்தில் அதிகளவான மின்சாரத் தேவைகளும் காணப்படலாம்.

ஏனெனில், நாங்கள் பரந்தன் இரசாயனத் தொழிற் சாலையை மீள ஆரம்பிக்க இருக்கிறோம். அதேபோன்று, KKS பிரதேசத்திலும் தொழிற்சாலையை மீள ஆரம்பிக்க இருக்கிறோம். எனவே, அதிகளவான மின்சாரத்தை உற்பத்தி செய்து, அவற்றைக் கொண்டுசெல்வது தொடர்பில் தீர்மானிக்க வேண்டும். இன்று பகல் நேரத்துக்கான மின்சாரத் தேவையானது solar panels ஊடாக நிவர்த்தி செய்யப்பட்டுக் கொண்டு இருக்கின்றது. இவ்வாறான தொழிற்சாலைகள் மீண்டும் இயக்கப்படும்பொழுது, யாழ்ப்பாணத்திலும் அதிகளவான மின்சாரத் தேவை ஏற்படுமென நாங்கள் கருதுகின்றோம். எல்லா தொழிற்றுறைகளையும் இனங்கண்டு, 2030ஆம் ஆண்டளவில் எமது நாட்டுக்குத் தேவையான மின்சாரத்தின் அளவு எவ்வளவு என்பதை எமது அரசாங்கம் இப்போதே calculate பண்ணி வருகின்றது; அதற்கான வேலைத்திட்டங்களையும் ஆரம்பித்திருக்கிறது.

இலங்கையில் சூரிய கலங்கள்மூலம் அதிகளவு மின்சாரத்தை உற்பத்தி செய்யக்கூடிய பிரதேசமாக நாங்கள் வட மாகாணத்தை இனங்கண்டு இருக்கிறோம். அங்கு நாங்கள் அதற்குப் பொருத்தமான இடங்களைத் தெரிவு செய்துகொண்டு இருக்கின்றோம். பூநகரி பிரதேசத்தில்

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

காற்றாலைமூலம் மின் உற்பத்தி செய்வதற்குப் பொருத்தமான இடங்களைத் தெரிவுசெய்து, அதிலிருக்கும் பிரச்சினைகளை நிவர்த்தி செய்வதற்காக கலந்துரையாடல்களை மேற்கொண்டு வருகின்றோம். அதுமாத்திரமல்ல, கூரைக்கு மேல் பொருத்தக் கூடிய solar panels அமைப்பதை மேலும் அதிகரிப்பதற்குத் தீர்மானித்து இருக்கின்றோம். Grid connection அதிகரிக்கும் பட்சத்தில் வட மாகாணத்தில் solar power மூலமான மின் உற்பத்தி மேலும் விரிவுபடுத்தப்படும்.

இன்று இந்த அரசாங்கம் வெளிப்படைத் தன்மையுடன் பயணித்துக்கொண்டு இருக்கின்றது. Battery Energy Storage Systemsக்கான tender call பண்ணப்பட்டது; அதிகளவானவர்கள் ஒப்பந்தம் செய்திருக்கிறார்கள். பூநகரி பிரதேசத்தில் இனங் காணப்பட்டு இருக்கின்ற இடங்கள் இப்போது காற்றாலை மின் உற்பத்திக்காக அடையாளப்படுத்தப்பட்டு இருக்கின்றன. அதேநேரம், solar மூலமான மின் உற்பத்திக்குப் பொருத்தமான இடங்களும் அடையாளப்படுத்தப்படுகின்றன. குளங்களுக்கு மேல் solar panelsஐ விரித்து மின்சாரத்தை உற்பத்தி செய்வதன்மூலம் இடத்தை சிக்கனமாகப் பயன்படுத்தி அதிகளவான மின்சாரத்தை உற்பத்தி செய்ய முடியுமென்ற திடமான நம்பிக்கை இருக்கிறது. எமது அரசாங்கமானது, 2030ஆம் ஆண்டில் புதுப்பிக்கத்தக்க மின்சார உற்பத்தியில் 70 சதவீத இலக்கை அடையும் என்ற திடமான நம்பிக்கை இருக்கின்றது. அந்த வகையில், புத்திஜீவிகளின் கருத்துகளையும் உள்வாங்கிக்கொண்டு, வெளிப்படைத் தன்மையுடன் முன்னோக்கி நகர்வோமென இந்த இடத்தில் கூறி, விடைபெறுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.49]

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, புதுப்பிக்கத்தக்க மின்சக்தி முதலீடுகளின் வெளிப்படைத் தன்மையையும் பொறுப்புக்கூறலையும் வலியுறுத்தும் இப் பிரேரணை வரவேற்புக்குரியது. பூநகரி சூரிய மின்திட்டம் தொடர்பாக எழுப்பப்பட்டுள்ள குற்றச்சாட்டுகள் சுயாதீனமாக ஆராயப்படுவதுடன், முதலீட்டாளரின் நிதித் தகுதி ஒப்பந்தங்கள் மற்றும் திட்டத்தின் தற்போதைய நிலை இச்சபைக்கு வெளிப்படுத்தப்படல் வேண்டும். இத்தகைய திட்டங்கள் அப்பகுதி மக்களின் நீர் வளம், விவசாயம் மற்றும் வாழ்வாதாரத்தைப் பாதுகாப்பதுடன், முதன்மையாக அம்மக்களுக்கு நன்மைகளை வழங்குவதாக அமையவும் வேண்டும். அதேவேளை, பாரிய மின்னுற்பத்தித் திட்டங்களில் கவனம் செலுத்தும் அரசாங்கம், வன்னி மாவட்ட மக்களின் அடிப்படை மின்சாரத் தேவைகளையும் பூர்த்திசெய்ய வேண்டும். முல்லைத்தீவு உள்ளிட்ட வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள மக்கள் மின் இணைப்புக்குரிய கட்டணத்தைச் செலுத்திய பின்னரும், மிக நீண்டகாலமாக மின் இணைப்பின்றி காத்திருக்கின்றனர். மின்மானி இல்லை, இணைப்பு வடம், தூண்கள் இல்லை என்பதே தொடர்ச்சியான பதிலாக உள்ளது. பணத்தைப் பெற்றுக்கொண்ட பின்னர் இணைப்பை வழங்குவதற்கான கால வரையறை என்ன? நிலுவை இணைப்புகளை மிக விரைவாக மேற்கொள்ள வகைசெய்யுங்கள்!

முல்லைத்தீவில் களப் பணியாளர்கள், சாரதிகள் மற்றும் வாகனங்களுக்கான பற்றாக்குறை என்பன மின் வழங்கல் சேவையைப் பாதிக்கின்றது. ஆளணிப் பற்றாக்குறையால் நீண்டகாலமாக இடமாற்றம் இன்றிப் பணியாற்றுவோர் உடல், உள நெருக்கீடுகளையும் எதிர்கொள்கின்றனர். புதிய இணைப்புகளையும் பழுது நீக்கல் சேவைகளையும் தாமதமின்றி மேற்கொள்ள இப்பாற்றாக்குறைகள் தீர்க்கப்பட வேண்டும். மேலும், அமைச்சு இச்சபைக்கு வழங்கும் தரவுகளுக்கும் மாவட்டத் தரவுகளுக்கும் இடையிலான வேறுபாடுகள் சரிபார்க்கப்பட்டு விளக்கம் அளிக்கப்பட வேண்டும். எனது எழுத்துமூல வினாவுக்கு வழங்கப்பட்ட விடைகளில் காணப்பட்ட தவறுகளை எழுத்துமூலமும் வலுசக்தி அமைச்சுக்குச் சுட்டிக் காட்டியுள்ளேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாண்டின் தொடக்க மாவட்டச் செயலகத் தரவுகளின்படி, முல்லைத்தீவில் 244, வவுனியாவில் 1,430, மன்னாரில் 1,207 என வன்னியில் 2,791 வீடுகளுக்கு மின்வசதி இருக்கவில்லை. இவ்வாறு மின்வசதி அற்ற குடும்பங்களுக்கு மின்சாரம் வழங்கப்படுவதில் அடுத்து வரும் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் கூடுதல் முன்னுரிமை அளிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். தொலைவிலுள்ள வீடுகளுக்கும் பண்ணை களுக்கும் இணைப்பு வழங்க மின் வலையமைப்பை நீட்டிப்பதற்கான செலவையும் விண்ணப்பதாரர்களே ஏற்கவேண்டிய நிலை உள்ளது. இது குடும்பங்களுக்கும் சுயதொழில் முயற்சியாளர்களுக்கும் பெரும் சுமை! இச்செலவைக் குறைப்பதற்கான உதவித் திட்டத்துடன் வன்னியின் மின் வழங்கல் குறைபாடுகளைக் களைய அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.53]

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල්තැබීමේ යෝජනාව තුළ පූනකරී ප්‍රදේශයේ අක්කර 1,200ක ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක් වටිනා සූර්ය පැනල බලාගාරයක් ඉදිකිරීම සඳහා රජය විසින් "සන්පවර් සිස්ටම් (පුද්ගලික) සමාගම" වෙත ආයෝජන අවස්ථාවක් ලබා දී ඇති බව සඳහන් වෙනවා. හැබැයි, ප්‍රකාශයක් හැටියට ඒක නිවැරදියි කියලා පිළිගන්න බැහැ. අපි එවැනි අවස්ථාවක් ලබා දීලා නැහැ. නමුත්, එතුමා අවසානයේදී ඉදිරිපත් කරපු යෝජනාව ගැන මම යමක් කියන්න කැමතියි. ඒ තමයි, විදුලිබල ව්‍යාපෘති තරඟකාරී ලංසු කැඳවීම මත විනිවිදභාවයෙන් යුතුව කරන්න ඕනෑය කියන යෝජනාව. ඒක ඉතා හොඳ යෝජනාවක්. නමුත්, ඔබතුමාට මතක ඇති, අලුතින් ගෙනාපු ශ්‍රී

ලංකා විදුලිබල පනත අනුව කිසිම විධියකින් unsolicited ව්‍යාපෘති ගන්න බැහැ කියන එක. ගන්න පුළුවන්කම තිබෙන්නේ තරගකාරී ලංසු කැඳවීම මත, විනිවිදභාවයෙන් යුතු ව්‍යාපෘති විතරයි. ශ්‍රී ලංකා විදුලිබල පනත සම්මත කරද්දී ඔබතුමා ඡන්දය දුන්නාද, නැද්ද කියන එක අවාසනාවකට මට මතක නැහැ.

මෙම ව්‍යාපෘතියේ ඉතිහාසය පිළිබඳව මම කෙටි පැහැදිලි කිරීමක් කරන්නම්. 2023.12.11වැනි දා තමයි කැබිනට් තීරණයක් මඟින් යුනයිටඩ් සෝලා එනර්ජි කියන සමාගමට මෙගාවොට් 134ක සූර්ය පැනල බලාගාරය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී තිබෙන්නේ. එම සමාගම බංකොලොත්ද, නැද්ද කියන කාරණය අප වෙත වාර්තා වෙලා නැහැ. නමුත්, අභිප්‍රාය පළ කිරීමේ ක්‍රියා පටිපාටිය ඔස්සේ එවකට පැවැති රජය විසින් තමයි ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ 2021.08.31වන දින කැබිනට් තීරණයකට අනුව සහ යෝජනා ඉදිරිපත් කිරීමේ ආරාධනාවකට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වන යෝජනාව දීලා තිබෙන්නේ. යුනයිටඩ් සෝලා එනර්ජි සමාගම විසින් තමයි එම යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම සමාගම ඉදිරිපත් කළ යෝජනාව ඇගැයීමට ලක් කරන්න ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙතින් තාවකාලික අනුමැතියක් - provisional approval එකක් - 2022.08.09වන දින ලබාගෙන තිබෙනවා.

ඒ වාගේම, 2023.08.16වන දින ලංකා විදුලිබල මණ්ඩලය විසින් යුනයිටඩ් සෝලා එනර්ජි සමාගම වෙත මෙගාවොට් 134ක සූර්යබල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අභිප්‍රාය ලිපියක් නිකුත් කරලා තිබෙනවා. මෙම ව්‍යාපෘතියට අදාළව යුනයිටඩ් සෝලා එනර්ජි සමාගම විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාව ඇගැයීමට ලක් කිරීම සඳහා 2023.09.11වන දින කැබිනට් අනුමැතිය අරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡා සමුමුති කමිටුවක් - CANC එකක් - වාගේම ව්‍යාපෘති කමිටුවක් පත් කරලා තිබෙනවා.

2023.12.11වන දා අමාත්‍ය මණ්ඩලය තීරණය කරලා තිබෙනවා, යුනයිටඩ් සෝලා එනර්ජි සමාගම වෙත මෙම ව්‍යාපෘතිය පිරිනැමීම සඳහා අනුමැතිය ලබා දෙන්න. නමුත්, ඒ සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමේ අනුමැතිය ලැබී නැහැ. මෙම ව්‍යාපෘතිය සඳහා වලංගු බලශක්ති බලපත්‍රයක් - energy permit එකක් - තවමත් ලබා ගෙන නැහැ. ඒ අනුව, මෙය ව්‍යාපෘතියක් හැටියට ඉදිරියට යන්න තවත් ඉටු කළ යුතු කරුණු ගණනාවක් තිබෙනවා. මේ තත්ත්වය යටතේ එම ව්‍යාපෘතිය මේ වනතෙක් කිසිදු සමාගමකට ප්‍රදානය කර නොමැති බව ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වාගේම, මෙම ව්‍යාපෘතිය අභිප්‍රාය පළ කිරීමේ ක්‍රියාදාමය යටතේ ලද යෝජනාවක් වන අතර, ඒ අනුව ව්‍යාපෘති ගණනාවක් ආවා. ඒ අතරින් එකක් තමයි මෙම ව්‍යාපෘතිය. EoI projects සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් නඩු අංක SC/FR/71/2025 යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරලා තිබෙනවා.

තවද, බලශක්ති අමාත්‍යාංශය විසින් 2026.06.02වන දින ගරු නීතිපතිවරයාට ලිපියක් යොමු කරමින් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව EOI ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව නීති උපදෙස් විමසා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකට හේතුව, අලුත් පනත අනුව යන්න පුළුවන්කම තිබෙන්නේ කලින් තිබුණු තරගකාරී ලංසු කැඳවීම මත කැඳවන ලද විනිවිදභාවයෙන් යුත් ව්‍යාපෘති සඳහා පමණක් වීමයි. නමුත් මේ EoI ව්‍යාපෘති සියල්ල අර වාගේ අභිප්‍රාය යෝජනා යටතේ ඉදිරිපත් වන ඒවා. ඒවාට තරගකාරිත්වයක් තිබෙනවාද, විනිවිදභාවයක් තිබෙනවාද කියන එක තීරණය කරන්න බැහැ. ඒ නිසා තමයි මේ සම්බන්ධව නීතිපතිවරයාගෙන් අදහස් විමසා තිබෙන්නේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මේ වනවිට පවත්නා තත්ත්වයෙන් - status quo - පවත්වා ගෙන යාම සඳහා ගරු අධිකරණය විසින් නියම කර තිබෙනවා. ඒ අනුව මම කලින් සඳහන් කළා වාගේ මෙම සමාගමට හෝ කිසිම සමාගමකට EoI කිසිම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවසර ලබා දීලා නැහැ. සමහර ඒවාට energy permits ලැබී තිබෙනවා. සමහර ඒවාට energy permits ලැබුණත් අරගෙන නැහැ.

මෙම මූලික යෝජනාවේ තිබෙන හරය ගත්තාම, මම කලින් කිව්වා වාගේ ආයෝජන අවස්ථාවක් ලබා දීලා තිබෙන බවට ඇති ඒ අදහස නිවැරදි නැහැ කියන එක තමයි මේ අවස්ථාවේදී මට ප්‍රකාශ කරන්න තිබෙන්නේ. නමුත් ගරු මන්ත්‍රීතුමා අවසානයේ කළ යෝජනාව පරිදිම මම කලිනුත් කිව්වා වාගේ මෙතැනින් පසුව අපි විදුලි ජනනය සඳහා තිබෙන සියලු ව්‍යාපෘති තරගකාරී ලංසු කැඳවීමක් මත විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් හරහා තමයි තෝරා ගන්නේ. ඒ යෝජනාව සම්බන්ධයෙන් අපි සම්පූර්ණ එකඟතාව පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.58ට, 2026 නොවැම්බර් 06වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.58க்கு, பாராளுமன்றம் 2026 நவம்பர் 06, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.58 p.m. until 9.30 a.m. on Friday, 06th November, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනයට අදාළ ග්‍රන්ථ මුද්‍රණය: විස්තර
ஆயுர்வேத, சித்த, யூனானி மற்றும் ஹோமியோபதி மருத்துவம் குறித்த பாடநூல்களை அச்சிடுதல்: விபரம்
PRINTING OF TEXTBOOKS ON AYURVEDA, SIDDHA, UNANI AND HOMOEOPATHIC' MEDICINE: DETAILS

2339/2026

1. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව හරහා "ආයුර්වේද", "සිද්ධ",

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

"යුනානි" සහ "හෝමියෝපති" වෛද්‍ය අධ්‍යාපනයට අදාළ පාඨ ග්‍රන්ථ මුද්‍රණය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, අවසන් වරට පාඨ ග්‍රන්ථ මුද්‍රණය කරන ලද වර්ෂය සහ විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පාරම්පරික වෛද්‍ය ක්‍රම පෝෂණය කිරීම සඳහා පසුගිය වර්ෂ 05 තුළ රජය විසින් මුද්‍රණය කර ඇති පාඨ ග්‍රන්ථ කවරේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම් මත්රුම් වෙකුසන ඌටක අමෙච්සරෛක් කේට්ට විනා:

(අ) (i) සුකාදාර අමෙච්සාල් අරසාඞ්ක අච්චකත් තිණෛක්කළම් අල්ලදු ආයුර්වේදත් තිණෛක්කළත්තිනූඩාක 'ආයුර්වේද', 'සිත්ත', 'යූනානි' මර්රුම් 'හෝමියෝපති' මරුත්තුවක් කල්වියින් අඩිප්පඩෛයිල් පාඩනූල්කළ් අච්චිඩප්පඩුකින්රනවා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, ඉරුතියාකප් පාඩනූල්කළ් අච්චිඩප්පට්ට ආණ්ඩු මර්රුම් පාඩඞ්කළ් යාවෛ එන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) පාරම්පරිය මරුත්තුව මුරෛමෛකළින් වළර්ච්චික්කු තුණෛචෙය්වතර්කාක කටන්ත 5 ආණ්ඩුකළිල් අරසාඞ්කත්තාල් අච්චිඩප්පට්ටුළ්ළ පාඩනූල්කළ් යාවෛ එන්පතෛයුම්;

(ii) ඉන්රෙල්, ඒන් එන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether the Ministry of Health prints textbooks relating to the study of Ayurveda, Siddha, Unani and Homoeopathic medicine through the Department of Government Printing or the Department of Ayurveda; and

(ii) if so, the year in which such textbooks were last printed and the subjects covered by those textbooks?

(b) Will he also inform this House -

(i) the textbooks printed by the Government during the past five years for the promotion of traditional systems of medicine; and

(ii) if not, why?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) ආයුර්වේද, සිද්ධ, යුනානි ග්‍රන්ථ පමණක් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කරනු ලබයි.

(ii)

අනු අංකය	ග්‍රන්ථයේ නම	මුද්‍රණ වර්ෂය
01	Compendium of underutilized Medical plants in Sri Lanka	2024
02	Monograph on herbal raw materials	2024
03	ඖෂධීය ශාක වගාව හා ප්‍රමිති අමුද්‍රව්‍ය සැකසීම අත්පොත II	2022
04	ඖෂධීය සහ පෝෂණ ගුණයෙන් අනූන වූ හෙළ ආහාර හා පාන වට්ටෝරු II	2019
05	ඖෂධීය සහ පෝෂණ ගුණයෙන් අනූන වූ හෙළ ආහාර හා පාන වට්ටෝරු I	2017

(ආ) (i) 2025 වර්ෂයේදී "තල්පතක ඔසු නැණ" නම් වන ග්‍රන්ථය කාණ්ඩ 10කින් නිකුත් කර ඇති අතර, එක් කාණ්ඩයකින් පිටපත් 100ක් බැගින් මුද්‍රණය කර ඇත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

(අ) (i) ආයුර්වේදය, සිද්ධ, යුනානි නූල්කළ් මට්ටුමේ ආයුර්වේද තිණෛක්කළත්තින්කීළ් අරසාඞ්ක අච්චකත් තිණෛක්කළත්තාල් අච්චිඩප්පඩුකින්රන.

(ii)

තොඩරිලක්කම්	නූලින් පෙයර්	අච්චිඩප්පට්ට ආණ්ඩු
01	Compendium of underutilized Medical plants in Sri Lanka	2024
02	Monograph on herbal raw materials	2024
03	ඖෂධීය ශාක වගාව හා ප්‍රමිති අමුද්‍රව්‍ය සැකසීම අත්පොත II	2022
04	ඖෂධීය සහ පෝෂණ ගුණයෙන් අනූන වූ හෙළ ආහාර හා පාන වට්ටෝරු II	2019
05	ඖෂධීය සහ පෝෂණ ගුණයෙන් අනූන වූ හෙළ ආහාර හා පාන වට්ටෝරු I	2017

(ආ) (i) 2025ஆம் ஆண்டில் "தல்பதக்க ஒசு நெண" (ஓலைச் சுவடியிலுள்ள மருத்துவ ஞானம்) எனும் நூல் 10 தொகுதிகளாக வெளியிடப் பட்டுள்ளதுடன், ஒவ்வொரு தொகுதியிலிருந்தும் 100 பிரதிகள் வீதம் அச்சிடப்பட்டுள்ளன.

(ii) எழவில்லை.

(இ) எழவில்லை.

(a) (i) Only Ayurveda, Siddha and Unani books are printed under the Department of Ayurveda through the Department of Government Printing.

(ii)

Serial No.	Name of the Book	Year Printed
01	Compendium of Underutilized Medical Plants in Sri Lanka	2024
02	Monograph on Herbal Raw Materials	2024
03	ඖෂධීය ශාක වගාව හා ජරමිති අමුද්‍රව්‍ය සැකසීම අත්පොත II	2022
04	ඖෂධීය සහ පෝෂණ ගුණයෙන් අනූන වූ හෙළ ආහාර හා පාන වට්ටෝරු II	2019
05	ඖෂධීය සහ පෝෂණ ගුණයෙන් අනූන වූ හෙළ ආහාර හා පාන වට්ටෝරු I	2017

(b) (i) The book titled "Thalapathaka Osu Nena" - Knowledge of Medicine on a Palm-leave manuscript - was published in 2025 in 10 volumes with 100 copies of each volume printed.

(ii) Does not arise.

(c) Does not arise.

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 2340/2026 - පිළිතුර දීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 2340/2026 - விடையளிப்பதற்கு, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்கள் ஒரு மாத கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration has requested for one month's time to reply to Question No. 02 - 2340/2026 - raised by the Hon. Ajith P. Perera, appearing in today's Order Paper.

ශ්‍රම වාසනා අරමුදල මඟින් සපයන ලද සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම: විස්තර

சிரம வாசனா நிதியம் ஊடாக வழங்கப்பட்ட சேவைகளைத் தொடர்ந்தும் வழங்கல்: விபரம்

CONTINUATION OF SERVICES PREVIOUSLY PROVIDED BY SHRAMA VASANA FUND: DETAILS

2393/2026

3. ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "ශ්‍රම වාසනා අරමුදල" මඟින් සපයන ලද සේවාවන් අතරින් කම්කරු අමාත්‍යාංශය විසින් අඛණ්ඩව සැපයීමට නියමිත සේවාවන් කවරේද;

(ii) අමාත්‍යාංශය විසින් තවදුරටත් සෘජුව පවත්වාගෙන නොයන සේවාවන් සහ එම සේවාවන් භාර ගැනීමට නියමිත ආයතන කවරේද;

(iii) එම සේවාවන් පැවරීම සඳහා සංක්‍රාන්ති ක්‍රියාකාරී සැලැස්මක් හා කාලරාමුවක් සකස් කර තිබේද;

(iv) සංක්‍රාන්ති කාලසීමාව තුළ ප්‍රතිලාභීන්ට සේවා හෝ ප්‍රතිලාභ අහිමි නොවීම සහතික කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "சிரம வாசனா நிதியம்" ஊடாக வழங்கப்பட்ட சேவைகளில் தொழில் அமைச்சால் தொடர்ச்சியாக வழங்கப்படவுள்ள சேவைகள் யாவை என்பதையும்;

(ii) அமைச்சால் தொடர்ந்தும் நேரடியாக முன்னெடுத்துச் செல்லப்படாத சேவைகளும், அச்சேவைகளைப் பொறுப்பேற்கவுள்ள நிறுவனங்களும் யாவை என்பதையும்;

(iii) அச்சேவைகளை ஒப்படைப்பதற்காக நிலைமாறுகாலச் செயற்பாட்டுத் திட்டமொன்றும், அதற்கான காலச்சட்டகமொன்றும் தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) நிலைமாறு காலப்பகுதியில் பயனாளிகளுக்கு சேவைகள் அல்லது பயன்கள் கிடைக்கப் பெறுவதை உறுதிப்படுத்துவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) the services that have been planned to be continuously provided by the Ministry of Labour, out of those that were provided by the Shrama Vasana Fund;

(ii) the services that will no longer be directly continued by the Ministry, and the names of the institutions which will take over the said services;

(iii) whether a transitional action plan and a timeframe have been prepared for the transfer of such services; and

(iv) the measures that have been taken to ensure that the beneficiaries do not lose any services or benefits during the transition period?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

(අ) (i) "ශ්‍රම වාසනා අරමුදල" මඟින් සැපයූ සේවාවන් අතරින් පහත සේවාවන් කම්කරු අමාත්‍යාංශය යටතේ ඉදිරියට පවත්වාගෙන යාමට නියමිතයි.

1. සේවා ස්ථානවල සිදු වන වෘත්තීය අනතුරුවලින් මියගිය හෝ සියයට 60 හෝ ඊට වැඩි පූර්ණ ආබාධිත තත්ත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා වන ශිෂ්‍යත්ව වැඩසටහන.
2. සේවා නියුක්තිකයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ වන හෝ කාර්මික ආරවුලක් සම්බන්ධයෙන් නඩු කටයුතු සඳහා සහ කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ විභාග වන නඩු සඳහා මූල්‍ය සහන සැලසීම.
3. පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමීමට තීරණය කරන ලද අතර, ආයතනයක සේවා නියුක්තිකයන් සඳහා කෙටිකාලීන මූල්‍ය සහන ලබාදීම.
4. වෘත්තීය අනතුරු සඳහා ප්‍රතිලාභ ලබාදීම.

(ii) 1. ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.

ව්‍යසන අවස්ථාවලදී සමස්ත රාජ්‍ය යන්ත්‍රණය එනම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආපදා සහන සේවා මධ්‍යස්ථානය වැනි රාජ්‍ය ආයතන.

2. සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

කම්කරු දෙපාර්තමේන්තුවේ සමාජ කතිකා හා වැඩපළ සහයෝගිතා අංශය විසින් සේවක සුබසාධනය සඳහා දායකත්වය ලබාදෙන සේවා යෝජකයන් ඇගයීම සිදු කරයි. මේ කාර්යය අමාත්‍යාංශය මඟින් තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් නොමැත.

(iii) අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇති කාර්යයන් ඉදිරියට ඉටු කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

(iv) සියලු ප්‍රතිලාභ අයදුම්පත් අමාත්‍යාංශය වෙත ගෙන්වා ගෙන අදාළ ප්‍රතිලාභ සලසා දීමට කටයුතු කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

(அ) (i) சிரம வாசனா நிதியத்தால் வழங்கப்பட்ட சேவைகளுள் பின்வரும் சேவைகள் தொழில் அமைச்சின்கீழ் தொடர்ந்து முன்னெடுத்துச் செல்லப்படவுள்ளன.

1. தொழில்புரியும் இடங்களில் நிகழும் தொழிற்றுறை விபத்துக்களால் உயிரிழந்த அல்லது 60% அல்லது அதற்கு மேற்பட்ட முழுமையான ஊனமுற்ற நிலைக்குள்ளான தொழிலாளர்களின் கல்வி பயிலும் பிள்ளைகளின் எதிர்காலக் கல்வி நடவடிக்கைகளுக்கான புலமைப்பரிசில் திட்டம்.
2. ஊழியரொருவரின் ஊழியக் காலத்தை முடிவுக்குக் கொண்டுவருவதுடன் தொடர்புபட்ட அல்லது தொழிற்றுறை தகராறு தொடர்பான வழக்கு நடவடிக்கைகளுக்காகவும் வேலையாளர் நட்டஈட்டு ஆணையாளர் முன்னிலையில் விசாரணை செய்யப்படும் வழக்குகளுக்காகவும் நிதி நிவாரணம் வழங்குதல்.
3. முன்னறிவித்தலின்றி மூடுவதற்குத் தீர்மானிக்கப்பட்ட நிறுவனமொன்றின் ஊழியர்களுக்கு குறுகிய கால நிதி நிவாரணம் வழங்குதல்.
4. தொழிற்றுறை விபத்துக்களுக்கான அனுகூலங்களை வழங்குதல்.

(ii) 1. அனர்த்த சந்தர்ப்பங்களில் ஊழியர்களுக்கு அல்லது அவர்களில் தங்கியிருப்பாளர்களுக்கு நிதி மற்றும் பிற அனுகூலங்களை வழங்குதல்:

அனர்த்த சந்தர்ப்பங்களில் முழுமையான அரச பொறிமுறை, அதாவது பிரதேச செயலகம், மாவட்ட செயலகம், அனர்த்த நிவாரண சேவை நிலையம் போன்ற அரச நிறுவனங்கள்.

2. ஊழியர்களின் நலன்புரிக்காகச் சிறந்த சேவையாற்றிய நபர்களுக்குப் பரிசுகளை வழங்குதல்:

தொழில் திணைக்களத்தின் சமூக உரையாடல் மற்றும் வேலைத்தள ஒத்துழைப்புப் பிரிவால் ஊழியர் நலன்புரிக்குப் பங்களிப்புச் செய்யும் தொழில் வழங்குநர்களை மதிப்பீடு செய்யும் பணி முன்னெடுக்கப்படுகின்றது. இச்செயற்பாட்டை அமைச்சின்மூலம் தொடர்ந்து முன்னெடுத்துச் செல்லவேண்டிய அவசியம் இல்லை.

(iii) அமைச்சுக்குப் பொறுப்பளிக்கப்பட்டுள்ள செயற்பாடுகளைத் தொடர்ந்து முன்னெடுப்பதற்கான நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.

(iv) அனைத்துப் பயனாளி விண்ணப்பங்களும் அமைச்சுக்கு வரவழைக்கப்பட்டு, உரிய அனுகூலங்களை வழங்குவதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன.

(ஆ) எழவில்லை.

(a) (i) The following services previously provided by the Shrama Vasana Fund are to be continued under the Ministry of Labour.

1. Scholarships for further education of children of workers who died in occupational accidents at workplaces or sustained permanent disability assessed at 60 per cent or more.

2. Financial assistance for legal proceedings relating to the termination of an employee's employment or an industrial dispute and for cases heard before the Commissioner for Workmen's Compensation.
3. Short-term financial relief for employees of institutions, where a decision has been taken to close the institution without prior notice.
4. Benefits in respect of occupational accidents.

(ii) 1. During disasters, the entire machinery of Government including public institutions such as Divisional Secretariats, District Secretariats and the Disaster Relief Services Centre.

2. The Social Dialogue and Workplace Cooperation Division of the Department of Labour recognizes employers who contribute to employee welfare. Therefore, there is no need for the Ministry to continue this activity.

(iii) Steps have already been initiated to continue carrying out the functions taken over by the Ministry.

(iv) All applications for benefits have been obtained by the Ministry and arrangements are being made to provide the relevant benefits.

(b) Not applicable.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.